නිර්බාධ ආර්ථිකයක් කරා

සමාජවාදී ක්‍රමයකින් විතැන් වීම: හංගේරියාවේ නිදර්ශනය

ජානෝස් කෝර්නායි

නිර්බාධී ආර්ථිකයක් කරා

යානෝස් කෝර්නායි
හාවඩ් විශ්ව විද්‍යාලයය
සහ
හංගේරියානු විද්‍යා ඇකඩමිය

නිර්බාධ ආර්ථිකයක් කරා

සමාජවාදී ක්‍රමයකින් විතැන් වීම: හංගේරියාවේ නිදර්ශනය

පරිවර්තනය

ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්

සහ

සුනිලා මෙන්ඩිස්

සමාජ විද්‍යාඥයන්ගේ සංගමය
කොළඹ
1993

ප්‍රකාශන අයිතිය

පළමු සංස්කරණය : 1993

ISBN 955-9102-04-4

මුද්‍රණය

සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ
647 කුලරත්න මාවත
කොළඹ 10

පටුන

පෙරවදන

සංවර්ධන ආර්ථික පර්යේෂණ සඳහා වූ ලෝක ආයතනය (WIDER) එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයේ අනුග්‍රහය ඇතිව හෙල්සින්කි නුවර පිහිටුවනු ලැබූයේ 1984 දීය. ආයතනයේ මූලික අරමුණ වන්නේ ලෝක මට්ටමෙන් සහ ක්ෂණික වැදගත්කමකින් යුතුව මතුවන ප්‍රතිපත්තිමය ගැටළු සහ නොයෙක් රටවල් ජාත්‍යන්තර වාතාවරණය තුළ මුහුණ දෙන ගැටළු ද පිළිබඳව කරන පර්යේෂණ උනන්දු කරවීමයි. අපේ පර්යේෂණ වැඩ පිළිවෙලේ එක් ප්‍රමුඛතාවයක් වූයේ සමාජවාදී රටවල්වල දේශපාලන - ආර්ථිකයන් ගැන, ඒ පිළිබඳව තම ජීවිත කාලය පුරාම අධ්‍යයනය කර ඇති මහාචාර්ය කෝර්නායිගේ දෘෂ්ටිපථයට අනුව පෙනෙන ආකාරයේ පරිපූර්ණ විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. අවුරුදු ගණනාවක් තිස්සේ කළ යුතු කාර්යයක් වන සමාජවාදය පිළිබඳව අංග සම්පූර්ණ විග්‍රහයක් සහිත ග්‍රන්ථයක් සම්පාදනය කරනු සඳහා WIDER ආයතනයේ ආරාධිත ශාස්ත්‍රඥයෙකු ලෙස හෙල්සින්කි නුවර ටික කලක් ගත කරන්නට ඔහු පොළඹවා ගැනීමට හැකිවීම භාග්‍යයක් විය. මෙම කාර්යය තවමත් අවසන් නොවූ එකකි. එහෙත් 1989 අගභාගයේ නැගෙනහිර යුරෝපයේ සිදු වූ ක්‍රියාවලියේ බලපෑම හේතු කොටගෙන, මහාචාර්ය කෝර්නායිගේ ප්‍රයත්නයේ අතුරු ප්‍රතිඵලයක් ලෙසයි, මෙම කෘතිය එළි දකින්නේ. අංග සම්පූර්ණ අධ්‍යයනයක් කරන ගමන් ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට බලපෑමක් කළ හැකි ජනප්‍රිය මට්ටමේ කෘතියක් පළකිරීම අවශ්‍යයැයි අපි සිතුවෙමු.

මහාචාර්ය කෝර්නායිගේ මේ පොතේ ඇති එක් සුවිශේෂ ලක්ෂණයක් නම්, හංගේරියාවේත්, අනෙක් සමාජවාදී රටවල් වලත් මතු වී ඇති පැළැස්තර විසඳුම් වලින් සුව කළ නොහැකි සුපුරුදු ගැටළු සමූහයකටම 'එකවර' ප්‍රහාර එල්ල කළ යුතුය යන තර්කය යි. එම ගැටළු සමූහය නම් සාර්ව සැපයුම ඉක්මවා නිරන්තරයෙන් පවතින සාර්ව ඉල්ලුම, දේශීය මූල්‍ය සැපයුම අධිකලෙස ඉහළ යෑම, විවෘත මෙන්ම සැඟවුණු උද්ධමනය සහ බඩු හිඟය, අධි-වටිනාකමෙන් යුත් විනිමය අනුපාතික, මූල්‍ය ඒකක විදේශ මුදල්වලට පරිවර්තනය කළ නොහැකි වීම, සමතුලිත කළ නොහැකි අය-වැය, පාඩු ලබන රාජ්‍ය ආර්ථික ආයතන, පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට දෙන ඉමක් කොනක් නැති සහනාධාර, සාපේක්ෂ මිළ ගණන් පිළිබඳ සාවද්‍ය ව්‍යුහයන්, සහ සම්පත් වැරදි ලෙස බෙදීම යන මේවායි. සමාජවාදී රටවල මේ ප්‍රශ්න ඇතැයි කී පමණින් ඒවා දියුණුවන රටවල දක්නට නැතැයි අදහස් නොවේ. ඒ නිසාම මහාචාර්ය කෝර්නායිගේ ග්‍රන්ථය අප හැමටම පොදුවේ අදාළ වෙයි.

බොහෝ රටවල, ස්ථායීකරණ සහ සාර්ව ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය, සමස්ත දේශපාලන හා සමාජ ව්‍යුහයන් විපරිවර්තනයවීමේ, විශේෂයෙන් දේපළ සම්බන්ධතා වෙනස්වීමේ ක්‍රියාවලියක් හා බැඳී පවතී. මහාචාර්ය කෝර්නායි, බොහෝ කාලයක් තිස්සේම ප්‍රකාශ කර ඇත්තේ,

අපිළිවෙලට සහ ප්‍රතිවිරෝධයන්ට තුඩුදෙන පැලැස්තර ප්‍රතිසංස්කරණ වෙනුවට මහාපරිමාණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බවයි. මේ දැක්ම, සාමාජවාදී ක්‍රමයන් පිළිබඳව ඔහු කර ඇති විග්‍රහයේත්. 'වෙළෙඳ පොළ සමාජවාදය' සම්බන්ධයෙන් කරන ලද අත්හදාබැලීම් පිළිබඳව ඔහු කර ඇති විවේචනයේත්, තාර්කික නිගමනය යි. සාර්ව ස්ථායීකරණය පිළිබඳව ඔහු යෝජනා කරන්නේ මහා පරිමාණ ශල්‍ය කර්මය කි. දේපොළ අයිතිය පිළිබඳ පරිවර්තන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔහු තර්ක කරන්නේ, නිසි ප්‍රතිපත්ති මාර්ගයෙන් වේගවත් කළ හැකි පරිනාමීය ක්‍රියාවලියක් තිබිය යුතුය යන්නයි. සාම්ප්‍රදායික ස්ථායීකරණ සහ ප්‍රතිව්‍යුහ කිරීමේ වැඩ පිළිවෙලවල් පිළිබඳ විවේචනාත්මකව බලන අන් බොහෝ ශාස්ත්‍රඥයින් ද අනුව යමින් මහාචාර්ය කෝර්නායි තර්ක කරන්නේ, සම්පත් අවශ්‍යතරමට තිබේ නම්, පාසැල් සිසුන් සහ විශ්‍රාමිකයින් වැනි විශේෂයෙන් බැට කන සමාජ කණ්ඩායම් ඉලක්ක කොටගත් සමාජාරක්ෂණ වැඩ පිළිවෙලවල් මගින්, ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ඇතිවන වේදනා සමනය කළ හැකි බවයි. එහෙත් මේ පිළියම, මිළ විකෘති කරන සහනාධාර අහෝසි කර ඒ වෙනුවට පාසැල් පොත් සහ මූලික ආහාර ද්‍රව්‍ය ලබාගැනීම සඳහා දීමනා හෝ මුද්දර සැපයීම වැනි දේවල් හඳුන්වා දිය යුතුය යන කොන්දේසියට යටත් ය.

සෑම රටක්ම පළමුකොට තමන් සතු මානව සහ ද්‍රව්‍යමය සම්පත් මත රැඳී සිටිය යුතු අතර, බාහිර සම්පත් ද අත්‍යවශ්‍ය වෙයි. උදහරණයක් හැටියට, මෙම පොතේ විස්තර කරන ආකාරයේ ස්ථායීකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන පෝලන්තයට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ අනෙකුත් අන්තර්-රාජ්‍ය සංවිධානවලින් ලැබෙන බාහිර ආධාර සමූහයක් ම හිමිවී තිබේ. පරිවර්තනයට සහ සාර්ව-ස්ථායීකරණ ක්‍රියාවලියකට ප්‍රවේශ වී සිටින අනෙක් රටවලට ද මෙවැනි අවශ්‍යතාවයන් තිබේ. මෙම කෘතියෙහි විස්තර කර ඇති ආකාරයේ ශල්‍යකර්මයක් සඳහා, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් සාමාන්‍යයෙන් බාහිර සම්පත් වලට වඩා බෙහෙවින් වැඩි සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය වේ.

අවශ්‍යතරම් බාහිර මූල්‍ය සම්පත් සහිතව ක්‍රියාත්මක කරන්නේ නම්, මහාචාර්ය කෝර්නායි යෝජනා කරන රෝගනිවාරණ වැඩ පිළිවෙල තුළින් කෙළවරක් නැති අධි උද්ධමනය සහ අනෙකුත් ආර්ථික අසමතුළිතතාවන්ගෙන් පෙළෙන අප්‍රිකාවේ හා ලතින් ඇමෙරිකාවේ සංවර්ධනය වන රටවල් බොහෝමයකම ඉදිරි බලාපොරොත්තු විප්ලවීය පරිවර්තනයකට භාජනය කළ හැකිය. ජපානය සහ ජර්මනිය සතු මූල්‍ය අතිරික්තයන් ප්‍රයෝජනවත් ලෙස උකහා ගැනීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර තත්ත්වයන් සකස්කර ගැනීම සඳහා ද එමගින් සමාජවාදී සහ සංවර්ධනය වන රටවලට අවකාශ ලැබෙනු ඇත. ලෝක සංහිඳියාවේ වාතාවරණය තුළ එක්සත් ජනපදයේ සහ අනෙකුත් රටවල යුද අවි නිපදවීම සඳහා මෙම අතිරික්තය තව දුරටත් අවශ්‍යවන්නේ ද නැත.

මහාචාර්ය කෝර්නායිගේ කෘතියෙන් ඉදිරිපත් වන ප්‍රවේශයේ ඇති පෘථුල භාවය නිසාම, එය සමාජවාදී සහ සංවර්ධනය වන රටවල ප්‍රතිපත්ති සම්පාදකයින් අනිවාර්යයෙන්ම කියවිය යුතු එකකි.

ලාල් ජයවර්ධන
අධ්‍යක්ෂක, සංවර්ධන ආර්ථික පර්යේෂණ
සඳහා වූ ලෝක ආයතනය (WIDER)

හෙල්සින්කි.
1990 පෙබරවාරි

සිංහල පරිවර්තනය ගැන

මධ්‍යගත රාජ්‍යයකින් පාලනය කෙරුණු ආර්ථික ක්‍රමයක් වෙළෙඳ පොළ විසින් හසුරුවන ලද ආර්ථික ක්‍රමයකට පරිවර්තනය කිරීමේදී හංගේරියාව මුහුණ දුන් ප්‍රශ්න හා ගැටළු සුප්‍රසිද්ධ හංගේරියානු ආර්ථික විද්‍යාඥයකු වන යානොස් කෝර්නායි මේ ග්‍රන්ථයෙන් සාකච්ඡාවට භාජනය කරයි.

මේ සාකච්ඡාව හංගේරියාවේ විෂය මූල අත්දැකීම් මත පදනම් වී අරඹා ඇති නමුත් එය න්‍යායාත්මක තලයකට ගෙන යෑමට ද ආචාර්ය කෝර්නායි සමත් වී සිටී. මේ නිසාම මේ ග්‍රන්ථය සිංහල බසට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කිරීමට අපි පෙළඹුනෙමු.

ලාංකීය ආර්ථිකය ද අද මෙවැනි පරිවර්තනයකට භාජනය වෙමින් පවතී. සමහර ප්‍රශ්න වෙනස් ස්වරූපයක් ගත්ත ද, විදේශීය ධන ආයෝජනය, රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලික අයිතියට පැවරීම වැනි කාරණා මෙරට ආර්ථික විවාදයේ ද ප්‍රමුඛ තැනක් ගනී. උදහරණයක් හැටියට, විදේශීය ආයෝජන ගැන කෝර්නායි මෙසේ සඳහන් කරයි:

"නිලධාරිවාදී තහංචි යොදා විදේශීය ප්‍රාග්ධනය රට ගැන දක්වන උනන්දුව නැති කර දමනු වෙනුවට අප කළ යුත්තේ විදේශීය ප්‍රාග්ධනය පිළිගන්නා සීමාවන් පැහැදිලි ව හා අවංකව ප්‍රකාශ කිරීමත් 'ඕනෑවට වැඩි', ආක්‍රමණශීලී යන අපේ සංකල්ප පැහැදිලි ව පෙන්වා දීමත් ය."

විදේශීය ආයෝජන ගැන අප රටේ කෙරී ගෙන යන විවාදයේ යම් අපැහැදිලි ස්වරූපයන් මේ අනුව යමින් නිරාකරණය කර ගැනීම වැදගත් යයි අපට හැඟේ.

ආර්ථික පරිවර්තනය සාර්ථක කර ගැනීම සඳහා හංගේරියාව ගන්නා ප්‍රයත්නය අපේ අවධානයට ලක් කිරීම වැදගත් වන්නේ යයි ද මේ ග්‍රන්ථය කියවා මේ ප්‍රශ්න ගැන උචිත අන්දමක අවබෝධයකට පැමිණීමට සිංහල පාඨකයන්ට හැකි වන්නේ යයි ද යන විශ්වාසය උඩ අපි මේ පරිවර්තනය ඉදිරිපත් කරමු.

මෙය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට හා මුද්‍රණය කිරීමට අපට ආධාර කළ එක්සත් ජාතීන්ගේ ආර්ථික සංවර්ධන පර්යේෂණ සඳහා වන ජාත්‍යන්තර ආයතනයට (WORLD INSTITUTE OF DEVELOPMENT ECONOMIC RESEARCH) අපි කෘතඥ වෙමු.

සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

ඇමෙරිකානු සංස්කරණයට ප්‍රස්තාවනාව

මෙම පොත මුලින්ම හංගේරියානු පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා ලියැවුණකි. 1990 දී හංගේරියාවේ පැවැත්වීමට තිබුණු ප්‍රථම නිදහස් මැතිවරණයෙන් බලයට පත්වන පාර්ලිමේන්තුවට හා නව ආණ්ඩුවට ක්‍රියාත්මක කළ හැකි, ආර්ථික ප්‍රතිපත්තිමය යෝජනා පිළිබඳ දේශනයක් පැවැත්වීමට මට ආරාධනයක් ලැබුණි. 1989 අගෝස්තු 25 දින පැවැත්වුණු මෙම දේශනයට විරුද්ධ පක්ෂ කීපයක ආර්ථික විශේෂඥයෝ ද වර්තමාන ආණ්ඩුවේ නිලධාරිහු ද රාජ්‍ය සංස්ථාවල කළමණාකරුවෝ ද සහභාගි වූහ. මෙම කුඩා ග්‍රන්ථයේ බීජය වූයේ යට කී දේශනය සඳහා පිළියෙළ කළ සටහන්ය.

මෙහි අඩංගු යෝජනා හංගේරියාවට පමණක් නොව, සමාජවාදී අර්ථ ක්‍රමයක සිට නිර්බාධ ආර්ථික ක්‍රමයකට පියවර නගන කවර රටකට වුව ද ගැලපෙතැයි මම විශ්වාස කරමි. එහෙත් රටවල් සමූහයක විකාශනයේ **පොදු** ලක්ෂණ සාකච්ඡා කිරීමට පළමුව, හංගේරියාවට **සුවිශේෂ** වන ලක්ෂණ විමසා බැලීම සුදුසුය.

1988-1989 වසරවල හංගේරියාවේ ඇරඹුණු සමාජ පෙරළියට පෙරාතුව සිදු වූ වැදගත් සිදු වීම් පෙළක් වෙයි. මේ ගැන සලකා බැලීම කෙතකු ආරම්භ කළ යුත්තේ 1956 විප්ලව සමයෙනි. මෙම විප්ලව කාලයෙහි බහු පාක්ෂික දේශපාලන පද්ධතියක බිහි වීමක් ද, අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ගොඩ නගා ගැනීමේ ජනතා අධ්‍යාශයක් ද, කෙටි කාලයක් තුළ පමණක් වුව, දැකිය හැකි විය. මෙම විප්ලවය සෝවියට් යුද ටැංකිවලින් පරාජය කරන ලද අතර, ඉන් පසු කෘර මර්දන ව්‍යාපාරයක් දියත් කරන ලදී. විරෝධ ව්‍යාපාරයේ කොඳු නාරටිය බිඳ දැමුණු පසු, ඒකාධිපති පාලනයෙහි යම් ප්‍රමාණයක ලිහිල් වීමක් ක්‍රමයෙන් බිහි විණි. හංගේරියාව පරස්පර විරෝධී අංග ලක්ෂණයන් එකට එක්තැන් වූ අමුතුම ආකාරයේ සම්මිශ්‍රණයක් බවට පත් විය. (බටහිර රටවල් තුළ 'ගුලෑග් කොමියුනිස්ට් වාදය' නමින් හැඳින්වුණු) පරිභෝජකයා කේන්ද්‍ර කොට ගත් ආර්ථික ප්‍රතිපත්ති සමඟ, පටි තද කර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක විණි. ('වෙළඳ පොළ සමාජ වාදයක්' බිහි කිරීම සඳහා) රාජ්‍ය ව්‍යාපාරවලට වඩ වඩා කළමණාකරණ නිදහසක් දෙන ලද අතරම, ඒවායේ කටයුතු පිළිබඳ ව දහස් ගණනින් වූ මැදිහත් වීම් පැවැත්විණි. නිර්බාධිත වෙළෙඳ පොළ සමඟ දරදඬු මධ්‍යම පාලනයක් පැවැත්විණි. තවද, එක් අතකින් පුද්ගල දේපොළ අයිතියකට හා පුද්ගලික ආර්ථික කටයුතු සම්බන්ධ නිදහසකට ඉඩ දුන් අතර, අනෙක් අතින්, නිලධාරි වාදය ඒ සම්බන්ධව ඇඟිලි ගැසීමක් විය. මේ පරස්පර විරෝධීතාව සහ අවුල් සහගත භාවය දේශපාලන ක්ෂේත්‍රයේ ද දක්නට ලැබිණි. නිල වශයෙන් කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන ඒකාධිකාරය ආරක්ෂා කැරුණු අතර, පැවැතුණු දේශපාලන ව්‍යුහයටත් මාක්ස් ලෙනින් දර්ශනයටත් විරුද්ධ වූ අයගේ

අදහස්, වරෙක ඉවසා සිටීමේ හා වරෙක මැඩ පැවැත්වීමේ අමුතු ක්‍රියාදාමයක් දක්නට තිබිණි.

1956 න් ඇරඹුණු මෙම දිගු පූර්ව ඉතිහාසය, පළමුවෙන්, පැවතුණු සමාජවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට ද, 1988 - 89 කාලයට පසුව, එකී වෙනස්කම් ප්‍රතිසංස්කරණ සීමාවන් ඉක්මවමින් සමස්ත දේශපාලන හා ආර්ථික පද්ධතියම විශාල වශයෙන් හිංසා විරහිත පරිවර්තනයකට හසු කර ගැනීමට ද ශක්තිය ලබා ගනිමින්, හංගේරියාව, අන් සමාජවාදී රටවලට වඩා පෙරමුණේ සිටීමට හේතු පැහැදිලි කරයි. සිදු වෙමින් පවත්නා මෙම වෙනස්කම් අදාල රටවල් සමාජවාදී මාවතෙන් **ඉවතට මාරු වීමක්** පෙන්නුම් කරයි. එම වෙනස්කම් සඳහා කාලය පැමිණි විට, අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවලට වඩා හංගේරියාව එම වෙනස්කම්වලට සූදානම්ව සිටියහයි කිව හැකිය. ඉහත කී පරිවර්තනයට උරදුන් හා මහ පෙන්වූ කොටස් කීපයක් රටේ සිටියහ. පාලක කොමියුනිස්ට් පක්ෂයේ බලගතු පිරිසක් ප්‍රජාතන්ත්‍රවාදය හා වෙළෙඳ පොළ ආර්ථිකයක් කරා පරිවර්තනයට අනුග්‍රහය දැක්වූහ. තවද, තමන් අතීතයෙහි ගෙන ගිය විරෝධතා උද්ඝෝෂණවලින් අත්දැකීම් ලබා සිටි, සංවිධානය වූ දේශපාලන කණ්ඩායම් ද, ස්වාධීන චින්තනයකට හිමිකම් කිව හැකි වූ බුද්ධිමත්හු ද, ස්ටැන්ලිවාදයට පෙර කාලය කරා දිවෙන ඉතිහාසයකට හිමිකම් කී දේශපාලන පක්ෂ ද වූහ. එමෙන්ම සාපේක්ෂ වශයෙන් පටු ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වූයේ නමුත්, ආර්ථිකය තුළ පුද්ගලික දේපොළ හා පුද්ගලික ව්‍යවසායකත්වය ද පැවැතිණි. මේ සියලු කරුණු හේතු කොට ගෙන හංගේරියානු සමාජ පෙරළිය 'අ' යන්නේ සිට පටන් ගැනීමේ අවශ්‍යතාවක් නොවිණි.

හංගේරියාවට සුවිශේෂ වූ ලක්ෂණ ප්‍රකාශ කළ යුතු වුවද, පැවතුණු හංගේරියානු පසුබිම තුළ අවශේෂ නැගෙනහිර යුරෝපයට පොදු වූ වැදගත් ලක්ෂණ ද පැවැතිණි. මෙහි මුල් පිටපත ලියන අවස්ථාවේදී (එනම් මීට මාස හතරකට පෙර 1989 සැප්තැම්බර් මස) කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන ඒකාධිකාරය නිල වශයෙන් බිඳ වැටී තිබුණු රටවල් වූයේ පෝලන්තය හා හංගේරියාව පමණි. අද මෙම ප්‍රස්ථාවනාව ලියන විට, නැගෙනහිර ජර්මනිය, චෙකොස්ලොවේකියාව, බල්ගේරියාව හා රුමේනියාව මේ ගණයට වැටී ඇත. යුගෝස්ලෝවියාවේ ද එම තත්ත්වයට අවතීර්ණ වීමේ ක්‍රියාදාමයක් දැකීමට ඇත. මෙම රටවල් අතර ඓතිහාසික, සංස්කෘතික, දේශපාලනික හා ආර්ථික වෙනස්කම් තිබුණ ද, මේ සියලු රටවලට පොදු වැදගත් ලක්ෂණ ඇත. එමෙන්ම ඉදිරි කාලයේ දී, ඒවා පොදු දුෂ්කරතාවලට මුහුණ දෙනු ඇත.

මේ හැම රටකම රාජ්‍ය අංශය අතිශයින් ශක්තිමත් තත්ත්වයක පවතී. ඒවා පෞද්ගලික කරණය කරා යාමට තැත් කිරීමේ දී, ඒ නිසා, පොදු දුෂ්කරතා වලට මුහුණ දෙනු ඇත. මේ රටවල නියම වෙළෙඳ පොළ ක්‍රමයක ලක්ෂණ ඉඳහිට දැකිය හැකි වුව ද, මැනවින් ක්‍රියා කරන නිර්බාධී වෙළෙඳ පොළ ක්‍රමයක සාර්ථක භාවයට අවශ්‍ය ආයතන ද, නීතිමය පදනම ද, වෙළෙඳ පොළ සංස්කෘතියක් හා ආචාර ධර්ම ද මේ රටවල නොමැත. ඒවායේ මිල ගණන්, පොළී අනුපාතික හා විනිමය අනුපාතික විකෘති තත්ත්වයක පවතී. මේ රටවල් ලෝක ආර්ථිකයේ ඓන්ද්‍රීය කොටස් බවට පත් වීමට තවමත් උත්සාහ දරමින් සිටින කුඩා විවෘත ආර්ථිකයන්ය. ලෝක ආර්ථිකයෙන් කෙරෙන ඉල්ලුම්වලට ගැළපෙන විදියේ භාණ්ඩ සුදුසු ගුණයන්ගෙන් යුතුව නිපදවීමක් ඒවා තුළ තවමත් කෙරෙන්නේ නැත. ආර්ථිකයේ අස්සක් මුල්ලක් නැර නිලධාරී වාදය

පැතිර ඇත. විවිධ රටවල විවිධ ප්‍රමාණයන්ගෙන් වන නමුත්, නැගෙනහිර යුරෝපීය රටවල් හැමෙකක ම පවත්නා යම් යම් පොදු දුර්වලතා ඒවායේ ආර්ථික ක්‍රම දුර්වල කරයි. නිෂ්පාදනය හා පරිභෝජනය එක තැන පල් වෙමින් පැවතීම, විවෘත වූ හෝ යටපත් කරන ලද හෝ උද්ධමනය, උග්‍ර භාණ්ඩ හිඟකම්, දැඩි විදේශීය ණය බර යනාදී වශයෙනි. එමෙන්ම මේ රටවල සමාජයේ තුලනය නැති කර දැමීමට තුඩු දිය හැකි සමාජ ගැටුම් ඇත. ස්ථායීකරණය සඳහා දිගින් දිගට ජනයා ගෙන් නොයෙකුත් කැප කිරීම් රජය අපේක්ෂා කරන අතර, කම්කරුවෝ ඒ ගැන අප්‍රසාදයට පත් වී සිටිති. ජනගහණයෙන් විශාල කොටසක් දරිද්‍රතාව තුළට වඩ වඩා කිඳා බසිනු දැකිය හැක. ඒ සමඟ ම, කලින් පැවති රාජ්‍ය තන්ත්‍රය මඟින් තෝරා ගැනුණු ශිල්පඥයෝ ද, නිලධාරීහු ද, කළමණාකරුවෝ ද, ආර්ථිකයේ මුර ආයතනවල වෙනස් වීම් ගැන බියෙන් ක්‍රියා කරති.

මෙම පොත ප්‍රතිචාර දැක්වීමට තැත් කරන්නේ, ඉහත කී තත්ත්වයනට මුහුණ දී සිටින මෙම රටවල් තුළ, ඉදිරි වසර දෙක තුන තුළ අනුගමනය කළ යුතු ආර්ථික ප්‍රතිපත්තිය කවරේද යන ප්‍රශ්නයටය. මෙහි ඉදිරිපත් කෙරෙන පිළිතුරු හංගේරියානු තත්ත්වයන්ට අනුරූප වන පරිදි හැඩ ගසා ඉදිරිපත් කෙරෙතත්, එම පිළිතුරුවලින් සෑහෙන කොටසක්, කලින් 'නැගෙනහිර යුරෝපා සමාජවාදී රටවල් කණ්ඩායම' ලෙස හැඳින්වුණු හැම රටකට ම පාහේ ගැළපෙනු ඇත.

දැනට නැගෙනහිර යුරෝපයේ පවතින තත්ත්වයට වඩා බොහෝ සේ වෙනත් තත්ත්වයක ය, නූතන ලෝකයේ විශාලතම සමාජවාදී අධිරාජ්‍ය දෙක වන සෝවියට් දේශය හා චීනය පවතිනුයේ. ඒවායේ තත්ත්වය, බොහෝ දුරට 1989 සිදුවීම්වලට පෙර හංගේරියාවේ, යුගෝස්ලාවියාවේ හා පෝලන්තයේ පැවැති තත්ත්වයන්ට සමානය. සෝවියට් සමූහාණ්ඩුව හා චීනය තුළ සමාජවාදය පිළිබඳ නොයෙකුත් ප්‍රතිසංස්කරණ සිදුවී ඇතත්, එම රටවල් ප්‍රතිසංස්කරණයේ සීමාවන්ගෙන් පිට පැනීමට තැත් කර නැත. සෝවියට් දේශය හා චීනය, කොම්යුනිස්ට් පක්ෂයේ දේශපාලන ඒකාධිකාරය හා රාජ්‍ය අංශයේ ග්‍රහණය යන අඩිතාලම්වලට අත තබන්නේ නැතිව, තම නිෂ්පාදන කටයුතු කාර්යක්ෂම කිරීමට ද, සිය ජනතාවට වඩා හොඳ දිවි පෙවෙතක් ගත කිරීමේ අවස්ථා සලසා දීමට ද හැකි වන පරිදි, පවත්නා ක්‍රමයේ ප්‍රතිසංස්කරණයන් ඇති කිරීමට යොමු වී සිටී. අද නැගෙනහිර යුරෝපයේ සාකච්ඡාවට භාජනය වී ඇති කරුණු, තම රටවල පවත්නා තත්ත්වයන් ඇසුරින් සලකා බැලීම මෙම දෙ රටේ සිටින පාඨකයනට වැදගත් වනු ඇත. අපගේ වර්තමානයෙන් ඔවුන්ගේ අනාගතය ගැන යමක් ඉගෙන ගත හැකි වේ. නැගෙනහිර යුරෝපීය විපර්යාසය මූලික වශයෙන් පෙන්වා දෙන්නේ සමාජවාදය **ප්‍රතිසංස්කරණය** කිරීමත්, සමාජවාදී ක්‍රමයෙන් **ඉවතට මාරු වීමත්** යන දෙකෙහි ප්‍රධාන වෙනසක් ඇති බවයි. එනම් වෙළෙඳපොළ සමාජවාදය හා අව්‍යාජ නිර්බාධී වෙළෙඳ පොළ යන සංකල්ප අතර ඇති වෙනසයි. මීට දශක හතරකටත් වඩා වැඩි කලකට ඉහත ලියන ලද The Road to Serfdom (වහල් භාවයට මඟ) නමැති ග්‍රන්ථයෙහි, හයෙක් පෙන්වා දී ඇති පරිදි, දරදඬු මධ්‍යගත සැලසුම්කරණය, අධික රාජ්‍ය බලය හා පුද්ගලික දේපොළ අයිතිය තහනම් කිරීම, දේශපාලන නිදහසට ද බාධා එල්ල කරන සිදුවීම් වෙයි. හයෙක් ගේ පොතේ නමෙහි දෝංකාරයක් මෙම ග්‍රන්ථයේ ඉංග්‍රීසි සංස්කරණයේ නමෙහි දැක ගත හැකි වේ. මෙහි සාකච්ඡා වනුයේ හයෙක්

ගේ ගමන් මගේ විරුද්ධ පැත්තට යන ගමනකි. යුරෝපා මහාද්වීපයේ නැගෙනහිර කොටසේ ජීවත් වන අපි, නිදහස් ආර්ථිකයක් සහිත නිදහස් සමාජ ක්‍රමයක් කරා ගමන් කරමින් සිටිමු. එම ගමන් මගේ ඇති බාධක ජය ගැනීමට අපි උගත යුතු වෙමු. එල්බා ගඟේ සිට කහ මුහුද දක්වා ඇති විශාල ප්‍රදේශයෙහි ජීවත් වන හැමටම මෙ මහින් උගත හැකි පාඩම් බොහෝය. මෙම ඉංග්‍රීසි සංස්කරණය මෙම රටවල් සියල්ලෙහි වෙසෙන්නන් අතරට පත් වනු ඇතැයි යන්න මගේ අවංක අපේක්ෂාවයි.

මගේ **යෝජනා** මතභේදවලට තුඩු දිය හැකි බවත්, ඒවාට විරුද්ධව දැඩි විවේචන එල්ල වීමට හා විරුද්ධත්වය ප්‍රකාශ වීමට ඉඩ ඇති බවත් මම දනිමි. ඒ කෙසේ වතුදු මෙහි සාකච්ඡාවට භාජනය වී ඇති කරුණු, සමාජවාදී රටවල් මුහුණ දිය යුතු ප්‍රධාන කාරණා අතරට වැටෙන ඒවාය. සාකච්ඡා කර ඇති ප්‍රශ්න ලැයිස්තුව අසම්පූර්ණ වතුදු, මෙහි විමසෙන මාතෘකා එකක්වත් වැදගත් කමින් හෝ අදාළ බවින් තොර යැයි සාකච්ඡාවෙන් බැහැර කළ නොහැකිය. මෙහි පෙන්වා දී ඇති ගැටලු ඉදිරි වර්ෂවලදී විසඳිය යුතුම ඒවා වේ. මෙම ග්‍රන්ථය, පවත්නා අපේ සියලු ප්‍රශ්නවලට ප්‍රාතිහාර්යමය වූ සර්ව සාධාරණ පිළියම් ඉදිරිපත් නො කරතත්, එහි අනුගමනය කර ඇති **විග්‍රහ මාර්ගය**, පරිවර්තනය වෙමින් ඇති සමාජවල ප්‍රශ්න විග්‍රහ කිරීමේ දී පොදුවේ යොදා ගත හැකිය. එකිනෙකට බැඳී පවතින ප්‍රධාන සාධක තුනක වැදගත් කම ඉස්මතු කර පෙන්වා දීම පොතේ අරමුණයි. එනම් දේපොළ අයිතිය පෞද්ගලිකකරණය, (1 පරි.) ස්ථායීකරණය, නිර්බාධීකරණය හා සාර්ව ආර්ථික හැඩගැසුම් ක්‍රියාදාමය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති (2 පරි.) හා ඉහත කී සාධක ශක්තිමත් කරන දේශපාලන ක්‍රමය (3 පරි.) යන කාරණාය. මේ කර්තව්‍යයන්ගෙන් එකක්වත්, අනික්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක නොකර, සතුටුදායක ලෙස සම්පූර්ණ කළ නොහැකිය. අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින මෙම සාධක-වලින් කීපයක් පමණක් අත්තනෝමතිකව තෝරා ගෙන ක්‍රියාත්මක කළහොත්, එය අසාර්ථක ප්‍රතිඵල ජනිත කරනු ඇත. එය රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ හා ප්‍රජාතන්ත්‍රීකරණ ක්‍රියාවලිය අඩාල වීමට තුඩු දෙනු ඇත.

මෙම පොතේ යෝජිත වැඩ පිළිවෙළේ විවිධ කොටස් එකට එකතු වූ කල ලැබෙනුයේ ඵෙන්ද්‍රීය වූ සමස්තයකි. **පරිපූර්ණ** පරිවර්තන සැලැසුමකි. මෙවැනි පරිපූර්ණ සැලැස්මක් ඉදිරිපත් කිරීමට ගැනෙන ප්‍රථම ප්‍රයත්නය බැවින් මෙහි අඩුපාඩු තිබෙනු නොඅනුමානය. එහෙත් මෙම කෘතිය පැලැස්තර ඇලවීම නොව පරිපූර්ණ විසඳුම් යෝජනා කරන බැවින්, එහි එන යෝජනා මුල් කර ගෙන උණුසුම් වාද විවාද බිහි වීමට ඇති ඉඩ කඩ, අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

'නැගෙනහිර' වෙසෙන්නන්ට ග්‍රන්ථයෙන් ලද හැකි ප්‍රයෝජන ඉහතින් පැහැදිලි කර ඇත. එය නැගෙනහිර යුරෝපීයයන්ට පමණක් සීමා කොට තබන්නට නුපුළුවන. ඉන් බැහැර ජීවත් වන අමෙරිකානුවන්ට හෝ වෙනත් බටහිර ජාතීන්ට එහි ඇති වැදගත්කම කුමක්ද? ඔවුන්ට එහි ඇති වැදගත්කම නැගෙනහිර යුරෝපීය පරිවර්තනයේ ඇති ඓතිහාසික වැදගත්කම තුළින් පැන නගී. 'ඓතිහාසික' යන වචනය ඉතාමත් ලිහිල් ලෙස පාවිච්චි කරමින්, අධිකරණ විනිශ්චයක් හෝ බේස්බෝල් ක්‍රීඩා ජයක් හෝ සම්බන්ධයෙන් පවා එය යොදා ගැනීමට අපි පුරුදු වී සිටිමු. එහෙත් එම වචනය එහි පරිසමාප්ත අර්ථයෙන් ම යොදා ගැනෙතොත්, යට කී නැගෙනහිර යුරෝපීය පරිවර්තනය

තරම් 'ඓතිහාසික' වන සිදුවීම් මාලාවක් මෑත කාලයෙන් සොයා ගැනීමට බැරි තරම්. මේ ක්‍රියාදාමය ලොව සැම ගේ ජීවිතවලට යම් කිසි අයුරකින් හෝ බලපාන බැව් නොඅනුමානය. ලෝක සාමය සැබෑ කර ගැනීමට ඇති හැකියාව ඉන් වැඩි කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ක්ෂණිකව නුවුවත්, අනාගතයේ යම් අවස්ථාවක දී, දැනට රාජ්‍ය ආරක්ෂාව සඳහා වියදම් කෙරෙන අති විශාල ධනස්කන්ධය ඉතිරි වනු ඇත. එලෙස ඉතිරි වන මුදල් ආරථික සංවර්ධනය ද, ශුභ සාධනය ද, විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව ද, සිය රට හා පිටරට වෙසෙන දිළිඳු ජනතාවට ආධාර දීම ද සඳහා යොදවා ගත හැකි වනු ඇත.

නැගෙනහිර යුරෝපා පරිවර්තනය පිළිබඳව **සාමාන්‍ය** උනන්දුවක් දක්වන අයට අමතරව, සුවිශේෂ හේතු මුල් කර ගෙන ඒ ගැන උනන්දු වන පුද්ගලයින් ද සිටිය හැක. පළමුවෙන්ම, අධ්‍යයන හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි, කොමියුනිස්ට් ක්‍රම අධ්‍යයනය කිරීමෙහිත්, ඒවා අනිකුත් සමාජ සංවිධාන ක්‍රම හා සංසන්දනය කිරීමෙහිත් යෙදී සිටින විශේෂඥයෝ වෙති. ඔවුහු සමාජවාදී රාජ්‍ය තන්ත්‍රය යටතේ පැවැත, දැන් වෙනත් ක්‍රමයක් කරා මාරු වෙමින් පවතින රටවල සිදු වෙමින් ඇති වෙනස්කම් ගැන පරීක්ෂාවෙන් සිටිති. සමාජවාදය, මධ්‍යම ක්‍රම සම්පාදනය හා සාපේක්ෂ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සියලු අධ්‍යයන පාඨමාලා තුළට, මෙම පරිවර්තන ක්‍රියාදාම පිළිබඳ අධ්‍යයනයක් ඇතුළු විය යුතුමය. අප මෙහි සාකච්ඡා කරන විෂයය ගැන විශේෂ අවධානය දක්වන්නෝ අධ්‍යයන ක්ෂේත්‍රවල නියැලී ඇති විශේෂඥයනට සීමා නොවෙති. ඒ අතර දේශපාලනඥයෝ ද, රජයේ නිලධාරීහු ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද, තානාපතිවරු ද, ජාත්‍යන්තර ආයතනවල නිලධාරීහු ද, ආර්ථික විශේෂඥයෝ ද වෙති. තව ද, සිදු වෙමින් පවතින සමාජ පරිවර්තනය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් අතර, තම තමන්ගේ රටවල ජන මතය හැසිරවීමට උපකාර වන ජනමාධ්‍යකරුවෝ ද වෙති. මේ සමහම මෙම නැගෙනහිර යුරෝපා රටවල වෙළෙඳ පොළ තුළට ඇතුළු වීමේ අධ්‍යාශය ඇති බැංකු කරුවෝ ද, ව්‍යාපාරිකයෝ ද, අපනයනිකයෝ ද වෙති. මේ සියලු කොටස් නැගෙනහිර යුරෝපයේ නව තත්ත්වය තේරුම් ගත යුතු වේ. මේ කණ්ඩායම් තුළට වැටෙන අය බොහෝ දෙනෙක්, මෙම රටවල් කරා ගමන් කොට, ඒවා පිළිබඳ යම් යම් ආකල්පයන් ඇතිව ආපසු පැමිණ සිටිති. යම් යම් අවස්ථාවන්හි දී ඔවුන් ගේ අවබෝධය නිවැරදි විය හැක. සමහර විට එය අහම්බෙන් ලද දැනුමක් විය හැක. ඔවුන්ගේ අවබෝධය ගැඹුරු හා සමබර වන තරමට, නැගෙනහිර යුරෝපීය කටයුතුවල සාර්ථක භාවයට ඔවුන්ගෙන් කෙරෙන දායකත්වය ද වැඩි වනු ඇත.

මෙහි දී පොදුවේ කෙරෙන වරදක් නම් කරුණු ඕනෑවට වඩා සරල ලෙස ඉදිරිපත් කරමින්, අනුකරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමයි. නැගෙනහිර යුරෝපයට එන විදේශිකයෝ ප්‍රජාතන්ත්‍රවාදය හා පුද්ගලික ව්‍යවසායකත්වය ස්ථාපිත කිරීම සඳහා ක්ෂණික වට්ටෝරු ඉදිරිපත් කරති. තම රටවල් අනුකරණය කිරීමට තව සමහරු උපදෙස් දෙති. එසේ කිරීමෙන් අවශ්‍ය දේ ඉටු වන්නට හෝ ඉටු නොවන්නට පුළුවන. සිහි තබා ගත යුතු මූලික කරුණ නම් පරිවර්තන ක්‍රියාදාමයේ **මුල් අවස්ථා** පිළිබඳ විශේෂත්වයයි. මෙම පරිවර්තනය සිදු වන්නේ රාජ්‍ය ව්‍යවසායකත්වය හා නිලධාරී වාදය දැඩි ලෙසින් බල පා ඇති රටවල ය. මේවා තුළ, එක් එක් ව්‍යාපාරික ඒකකය, එක් එක් පවුල හා එක් එක් පුද්ගලයා කෙරෙහි බලපාන, නිලධාරී වාදයේ ලක්ෂ ගණන්

වූ ඒකක වෙයි. පුද්ගලික නිදහස, පුද්ගල දේපොළ හා ව්‍යාපාර අයිතිය, දේශපාලන හා බුද්ධිමය නිදහස, ප්‍රජාතාන්ත්‍රික ආයතන හා නීතියේ පාලනය යනාදිය දශක ගණනක් තිස්සේ යටපත් කර පැවතිණි. ප්‍රජාතන්ත්‍රවාදය හා පෞද්ගලික ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය මෙවැනි මූල කොන්දේසි පෙට්ටියකින් එළියට ගත හැකි ඒවා නොවේ. අන් රටවල සිදු වූ අන්දමට ඒවා ඓතිහාසික විකාශනයක් තුළින් පැන නැගිය යුතුය. එම ක්‍රියාදාමය වේගවත් කළ හැකි හා කළ යුතු වුවද, එය සති කිහිපයකින් කෙළවර විය හැක්කක් නොවේ. මෙහි ලා බටහිර රටවල් ලබා ඇති අත්දැකීම් අපට ප්‍රයෝජනවත් විය හැක. බටහිර රටවලින් ගත යුත්තේ කුමක් ද, නොගත යුත්තේ කුමක් ද යන්න තෝරා බේරා ගත යුතුය. බටහිරින් ගෙන, හෙටම ක්‍රියාත්මක කළ හැකි දේ, දිගු කාලීන පරිණාමයකට පසුව අවශ්‍ය පසුබිම සකසා ගැනීමකින් ඉක්බිතිව පමණක් ක්‍රියාත්මක කළ හැකි දේවලින් වෙන් කොට ගත යුතුය. එසේම ක්‍රියාත්මක කළ නොහැකි (හෝ ක්‍රියාත්මක කිරීමට කිසිසේත් නුසුදුසු) යම් යම් සමාජ රටා, ආයතන හා පුරුදු ප්‍රතික්ෂේප කළ යුතුය. එසේ නොකොට, රටට නොගැලපෙන සමාජ සංස්ථා, කෘත්‍රිම ලෙස කලබලේට ස්ථාපිත කිරීමට යාමෙන් නව ප්‍රතිසංස්කරණ මුළුමනින්ම ප්‍රතික්ෂේප වීමට ඉඩ තිබේ.

විප්ලවකාරී වෙනසක් අවශ්‍ය වන්නේ ආයතනවල පමණක් නොවේ. සිතුම් පැතුම් ක්‍රමවල ද එවැන්නක් අවශ්‍යය. පරම්පරා ගණනාවක් තිස්සේ පැරණි රාජ්‍ය තන්ත්‍රය මගින් පටවන ලද සදාචාර පද්ධතිය වෙනුවට නව සදාචාර පද්ධතියක් ඇති විය යුතුය. අපි මෙහි දී එක් නිදසුනක් පමණක් සලකා බලමු. ව්‍යාපාරික කටයුතුවල දී වෙනත් අයට වඩා සාර්ථක වන කෙනකුට, වැඩිපුර ආදායම් ලැබීමට ඉඩ තිබිය යුතුය යන්න වැනි සුළු දේවල් ගැන මෙම පොතෙහි අවධාරණය කෙරෙන්නේ ඇයිදැයි බටහිර පාඨකයකු පුදුමයට පත් විය හැක. අමෙරිකානු හෝ ස්විස් ජාතික පාඨකයකුට යටකී අයිතිවාසිකම් අමුතුවෙන් කියා පෑ යුතු නොවන මූලික සත්‍යයක් ලෙස පෙනුණ ද, පෝලන්ත හෝ නැගෙනහිර ජර්මන් ජාතිකයකුට එය ස්වාභාවික දෙයක් සේ නො පෙනෙනු ඇත. ඊට හේතුව පුද්ගලික ව්‍යාපාර සංකල්පය හා ලාභ ඉපයීම සමාජවාදී සදාචාර පද්ධතියට එකඟ නොවන බැවිනි. මේ රටවල මිනිසාට බාලාංශයේ සිට මහලු විය දක්වා උගන්වා ඇති පාඩම නම්, එක ම නීත්‍යානුකූල ආදායම් මාර්ගය, ව්‍යාපාර කිරීම නොව ශ්‍රමය වන බවය. යම් ආදායම් විෂමතාවක් පැවතීම ප්‍රෝත්සාහ සඳහා අවශ්‍ය වතුදු, 'ඕනෑවට වඩා' විෂම ආදායම් පැවතීම වැරදි බව ද ඔවුනට උගන්වනු ලැබ ඇත. එහෙත් රාජ්‍ය තන්ත්‍රයේ ප්‍රභුවරුන් කොම්යුනිස්ට් මූලධර්ම කඩ කරමින් වරප්‍රසාද භුක්ති විඳින බැව් සාමාන්‍ය ජනතාවගෙන් වසන් කොට තබා ඇත. කොම්යුනිස්ට් සදාචාර විධි ජනතාවගේ සිත් තුළ කොතෙක් රෝපණය වී ඇත් ද කිවහොත්, අද, කොම්යුනිස්ට් වාදයට විරුද්ධව ව්‍යාපාර මෙහෙයවන නායකයින් තුළින් පවා, සීමාන්තික සමානාත්මතා වාදය පිළිබඳ පැරණි ආකල්ප තවමත් තුරන් වී නැත. ලාභ හෝ ඉහළ ආදායම් ලැබීම සදාචාරයෙන් තොර හැසිරීමක් වෙතැයි ද, සමපේක්ෂණය තුළින් ලාභ ඉපැයීමනිසැකවම සමාජ ද්‍රෝහී තණ්හාවක් වෙතැයි ද ඔවුහු සිතති. මේ ග්‍රන්ථයෙහි ඉදිරිපත් කොට ඇති යෝජනා, පවතින උද්ධමනය, භාණ්ඩ හිඟය, විදේශ ණය බර යනාදියට විසඳුම් සෙවීමට පමණක් ම සීමා නොවේ. නව සමාජ ක්‍රමයකට පාදක වන ප්‍රායෝගික ප්‍රතිපත්තීන්ද, ඒ යටින් දිවෙන සාරධර්ම හා දර්ශනයන් ද අතර සම්බන්ධතාවන් පෙන්වා දීමත් මගේ අරමුණක් වෙයි.

මෙම පොතෙන් දෙන නව දර්ශනය නැගෙනහිර යුරෝපා රටවල හැම දෙනා පිළිගත් දර්ශනයක් නොවේ. එයින් ඉදිරිපත් කෙරෙන්නේ ඇතැම් අය පිළිගන්නා, ඇතැම් අය ප්‍රතික්ෂේප කරන විශේෂිත දර්ශනයකි. මෙම ග්‍රන්ථයේ අමෙරිකානු සංස්කරණය ලිවීමේ දී වැදගත් තැන දී ඇත්තේ ස්වයං පාලනයට ඇති අයිතිය, මානව අයිතිවාසිකම් යනාදිය අන්තර්ගත වන **නිදහස** යන කේන්ද්‍රීය සංකල්පයටය. (ˆලිබරල්ˆ යන වචනය යුරෝපීය සම්ප්‍රදායට අනුව භාවිතා කරතොත්) මෙම පොත ලිබරල් චින්තන මහක් ඉදිරිපත් කරයි. එය රජයේ කාර්යභාරය බොහෝ සෙයින් අඩු විය යුතු බව පෙන්වා දෙයි. රාජ්‍යය ආරක්ෂාකාරීව දරුවන් රකින පියකු ලෙස සලකන, පුරවැසියන් ඥානවන්ත වූ (හෝ අඥාන වූ හෝ කෘර වූ) රාජ්‍යයක් මඟින් රැක ගත යුතු පිරිසක් සේ ගන්නා, කොම්යුනිස්ට් දර්ශනයට විරුද්ධව එය තර්ක කරයි. තම දෙපා මත, ආත්ම ශක්තිය හා උනන්දුව මත නැඟී සිටිය හැකි පුද්ගලයන් පිරිසක් ගොඩ නැංවීම එහි අභිප්‍රායයි. පසු අවස්ථාවක ආණ්ඩුවේ කාර්යභාරය ගැන සලකා බැලිය හැක. පරිවර්තනයේ මුල් අවස්ථාව වන දැන් දැකිය හැක්කේ, රජයේ මැදිහත් වීමේ සීමාන්තික තත්ත්වයන් ද, නිලධාරිවාදයේ ඒකාධිපති බලතල ද සම්පූර්ණයෙන්ම නොරිස්සන තත්ත්වයක ජනතාව සිටින බවය. ඉතිහාසය කෙළින් ඉරක් මෙන් ඉදිරියට නො ඇදේ. එය ඔරලෝසු බට්ටකු මෙන් ගමන් ගනු විය හැක. උපරිම රාජ්‍යයක් පැවති දශක ගණනාවකට පසු දැන් අවශ්‍ය වන්නේ අවම රාජ්‍යයක් දෙසට ගමන් කිරීමකි. සමහර විට ඉදිරි පරම්පරාව වඩා මධ්‍යස්ථ මැදි පිළිවෙතක් සොයා ගනු ඇත.

මීළඟට බැලිය යුත්තේ පොතේ මාතෘකාව වන ˆනිදහස් ආර්ථිකයˆ යන්න කුමක් ද කියාය. සාමාන්‍යයෙන් මේ වචනය භාවිත කෙරෙන්නේ **වෙළෙඳ පොළ** මුල් කර ගත් ආර්ථික ක්‍රමයක් හැඳින්වීමටය. එහෙත් එම වචනයෙහි ගැබ් වී ඇති දර්ශනය ඊට වඩා ගැඹුරු එකකි. වෙළෙඳ පොළ යන්ත්‍රණය ආර්ථික කටයුතු ඒකාබද්ධ කරතැයි යන අදහසට වැඩි දෙයක් ඉන් කියැවේ. වෙළෙඳ පොළට අවතීර්ණ වීමට හා පිට වීමට බාධා නොමැති කමත්, සාධාරණ තරඟයට ඇති නිදහසත් ඉන් අදහස් වේ. නිදහස් ආර්ථිකය යන්නෙන් ආයතනික හා දේශපාලන ව්‍යුහයක් ද, දේපොළ පිළිබඳ පුද්ගලික අයිතිය පිළිගැනීමක් ද අදහස් වේ. පෞද්ගලික දේපොළ අත්පත් කරගැනීම හා ආරක්ෂා කිරීම ඉන් අපේක්ෂිතය. රටේ මුළු නිමැවුමෙන් වැඩි කොටස ලබා ගත යුත්තේ පුද්ගලික අංශයෙනි. එය වනාහී පුද්ගලික අංශයට නීතියේ ආරක්ෂාව ඇති, රජයේ මැදිහත් වීම්වලින් එය රැක ගැනුණු, පුද්ගලික ව්‍යවසායකත්වය හා ආරම්භක ශක්තීන් දිරි ගැන්වෙන ක්‍රමයකි. නිර්බාධී ආර්ථිකය, ප්‍රජාතාන්ත්‍රික දේශපාලන ක්‍රමයක් තුළ ගොඩ නැගුණකි. ඒ යටතේ දේශපාලන බලවේග හා අදහස් අතර නිර්බාධී තරඟයක් පැවැතිය යුතුය. කතීගේ සාරධර්ම පද්ධතිය අනුව, මෙම නිදහස් තත්වයන් පැවතීම ඉතාම වැදගති. ආර්ථික ප්‍රතිපත්ති සාධනයේ දී ඊට ඉතා ඉහළ තැනක් දිය යුතුය.

නැගෙනහිර යුරෝපයේ ඉදිරි ගමන පිළිබඳ **අනාවැකි පළ කිරීම** මේ පොතේ අරමුණ නොවේ. මෙතෙක් කල් මා ලියූ ලියැවිලි පවත්නා සමාජවාදී ක්‍රමවල ලක්ෂණ හා ඒවාට හේතු විග්‍රහ කරන න්‍යායයන් ගොඩ නැංවීමට යොමු වී තිබිණි. හේතු විස්තර කරන ප්‍රතිජානක න්‍යායයක් ගොඩ නැංවීමට යොමු වී තිබිණි. හේතු විස්තර කරන ප්‍රතිජානක න්‍යායයක අනාවැකි පළ කිරීමේ හැකියාවක් ද ඇතැයි සැලකේ. මෙම ග්‍රන්ථය ලිවීමේ අරමුණ ඊට වෙනස්ය.

පාර්ලිමේන්තුව සතු කාර්ය **කුමක් විය හැකිද** යන්න නොව, මා මෙහි දී සොයා බලන්නේ, එය **කුමක් විය යුතුද** යන්න ගැනයි. සමහර පාර්ලිමේන්තු නියෝජිතයන් ප්‍රාදේශීය වූ හෝ යම් යම් පටු අංශයන්ට සම්බන්ධ වූ ජන කොටස්වල ඕනෑ එපාකම් නියෝජනය කරනු විය හැක. ඔවුනතින් යම් යම් දූෂණ සිදු විය හැක. පාර්ලිමේන්තු පරික්ෂාව සාර්ථක වීම සඳහා අවශ්‍ය ප්‍රවීන දැනුම මෙම නියෝජිතයන් සතුව නොතිබීමට පුළුවන. එසේ නමුත්, මෙම පොත යෝජනා කරන්නේ, නිදහසේ තෝරා ගත් පාර්ලිමේන්තුවක් මගින් පාලන කටයුතු අධීක්ෂණය විය යුතු බවත්, විශාල රාජ්‍ය සන්තක අංශය එමගින් අධීක්ෂණය විය යුතු බවත් ය. මගේ අරමුණ, යටත් පිරිසෙයින් අධ්‍යාපනික වුවකැයි කීමෙහි වරදක් නැත. අනාගත මහජන නියෝජිතයන් සිය ජාතික වගකීම් ගැන දැනුවත් විය යුතු බවත්, පටු ප්‍රාදේශීය ඕනෑ එපාකම් ඉක්මවා ජාතික වශයෙන් සිතීමට ඔවුන් පුරුදු විය යුතු බවත්, බලපෑම් හා තර්ජනවලට නතු නොවීමට ඔවුන් උගත යුතු බවත් මම සඳහන් කරමි. වෙනත් නිදසුනක් - වැටුප් විනය හා වෘත්තීය සමිති කාර්ය භාරය - ගනිමු. සිදු විය හැකි දේ ගැන මගේ අදහස් දක්වන සේ ඉල්ලීමක් යමකු කරතොත්, වැටුප්, සීමාවකින් තොරව ඉහළට ඇදී යාමටත්, වැටුප් විනය ලිහිල් වී යාමටත්, ජනප්‍රිය දේශපාලනයට වෘත්තීය සමිති ව්‍යාපාරය නතු වීමටත් අනාගතයෙහි හොඳටම ඉඩකඩ ඇති බව මම පිළිගනිමි. මෙම පොතින් කියා පාන්නේ එම මාර්ගයෙහි ගමන් නොකළ යුතුය කියාය. එම මග කම්කරුවන්ගේ දිගු කාලීන ඕනෑ එපාකම්වලට අහිතකර වෙයි. ස්ථායීකරණය සඳහාත්, විදේශීය වෙළෙඳාමේ ඕනෑ එපාකම්වලට අනුකූල ආර්ථික හැඩ ගැසුම් සඳහාත්, අවසානයේ වෘද්ධිය වේගවත් කිරීම සඳහාත් දැඩි වැටුප් විනයක් පවත්වා ගැනීම අවශ්‍යය. කම්හල් ආදියේ වැඩ කරන කම්කරුවන් ඇතුළුව, සමාජයේ සියලුම ස්ථරයන් ගේ මූර්ත පරිභෝජනය නොකඩවා වර්ධනය කරවීමට නම් ගමන් ගත යුතු ආරක්ෂා සහිතම මාර්ගය මෙය වෙයි. මෙම කෘතියේ මුල් හංගේරියානු ප්‍රකාශනය 'ආර්ථික විපරිණාමයට පක්ෂ භාවපූර්ණ ලියවිල්ලක්' ලෙස නම් කරන ලද්දේ කුමක් නිසාදැයි තවතවත් උදාහරණ දෙමින් විස්තර කිරීමට යත්න දැරීම අනවශ්‍යය. මෙය යමක් 'කරන්නේ කෙසේද' යන්න විස්තර කරන අත් පොතක් මෙන්, සාවධානව ලියැවුණු ලියවිල්ලක් නොවේ. එය පාඨකයන්ගේ බුද්ධිය මෙන් ම, හැඟීම් ද අරමුණු කොට ලියැවුණකි. ක්‍රියාවන් හා ආයතන පිළිබඳව ඇති විය යුතු වෙනස්කම් ගැන මෙන්ම, එය සාරධර්මවල ඇති විය යුතු වෙනස්කම් ගැන ද කතා කරයි. මගේ යෝජනා අතාත්වික නොවන බව මම දනිමි. දැනට පවත්නා දේශපාලන, ආර්ථික හා සමාජ තත්වයන් යටතේ, මෙහි යෝජිත දේ **කළ හැකි** ඒවා වෙයි. එහෙත් ඒවා ඇත්ත වශයෙන් කෙරේ ද යන්න රඳා ඇත්තේ අදාළ සියල්ලන්ගේ අධ්‍යාශය හා කැපවීම මත ය. මෙහි දී අදාළ සියල්ලන් යන්නෙන්, නැගෙනහිර යුරෝපය තුළ සිටින්නෝ ද ඉන් බැහැර සිටින්නෝ ද ගැනෙති. එසේම මා යෝජනා කරන දේ ඇත්ත වශයෙන් කෙරේ ද යන්න, නිර්බාධ ආර්ථිකයක් ගොඩ නැංවීම කරා දිවෙන මග දිගටම හමු වන බොහෝ මාර්ග බාධක ඉවත් කර ගනිමින් ඉදිරියට ම යාමට ඇති සූදානම මත ද රඳා සිටිනු ඇත.

මාගේ ව්‍යායාමය සාර්ථක කර ගැනීමට අත හිත දුන් සැමටත්, ආයතනවලටත් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. වසර ගණනාවක් මුළුල්ලේ, සමාජවාදී දේශපාලන ආර්ථිකය පිළිබඳ මගේ අදහස් සාරාංශ කරන ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ දිගු කාලීන ව්‍යාපෘතියක යෙදී සිටියෙමි. වඩා

විශාල එම ව්‍යාපෘතියේ අතුරු ඵලයකි මෙම කෘතිය. මෙම කෘතිය පළ කිරීමට මා ක්ෂණිකව පෙළඹවූයේ මෑත කාලීන සිදුවීම්වල වේගයයි. යටකී පර්යේෂණ අධ්‍යයනයේ දී, මට ආධාර කළ හංගේරියානු විද්‍යා ආයතනයට ද, හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයට ද, 'ස්ලොන්' පදනමට ද, 'මැක්ඩොනල්ඩ්' පදනමට හා හෙල්සින්කි නගරයේ පිහිටි එක්සත් ජාතීන්ගේ 'වයිඩර්' ආයතනයට ද මගේ අවංක ස්තුතිය පුද කරමි.

මගේ ලියවිලි පිළිබඳ සිය පෞද්ගලික අදහස් දැක්වූ, මා උනන්දු කළ හැම දෙනාට මම ණයගැති වෙමි. විශේෂයෙන්ම එහි දී සුසා ඩැනියෙල් සඳහන් කළ යුතුය. හංගේරියානු ප්‍රකාශනය පළ වූ පසු, ටමාස් බවර්, යානෝස් ගැක්ස්, මිහාලි ලැකී හා අන්ද්‍රාස් නාගි වැනි අයගෙන්, ඒ ගැන මා ලද බොහෝ අදහස් ඉතාමත් ම ප්‍රයෝජනවත් විය.

හංගේරියානු කෘතියේ පළමු ඉංග්‍රීසි අනුවාදය කියවා බලා, ඒ ගැන නොයෙකුත් උපදෙස් දුන් හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයේ ජෙෆ්රි සැක්ස්ට මම ස්තුතිවන්ත වෙමි. සාමාන්‍ය වශයෙන් ස්ථායීකරණ ක්‍රියා මාර්ග ගැන ඔහුගේ පෘථුල දැනුමට අමතර ව, පෝලන්තයේ ස්ථායීකරණ වැඩ පිළිවෙළ තුළින් ඔහු ලද අත්දැකීම් අනුවය, ඔහු ඉදිරිපත් කළ අදහස් මෙහෙයැවුණේ. පෝලන්ත තත්ත්වය ගැන ඔහුගේ ලියවිලි (Sachs, 1989 a හා b) මට ප්‍රයෝජනවත් විය. මෙම සංස්කරණය අනුවාදයක් පමණක් නොවේ. මුල් කෘතියට අතිරේක අදහස් එකතු කිරීමක් ද, මුල් කෘතියේ වූ වැරදි නිවැරදි කිරීමක් ද මෙහි සිදු වී ඇත. වෙනත් වචනවලින් කියතොත්, මෙය මුල් කෘතියේ **සංශෝධනයකි**. මේ සංශෝධනය බිහි කැරුණේ, හංගේරියානුවන්ගෙන් මුල් කෘතියට ලද ප්‍රතිචාර පමණක් නොව, පොලන්තයේ අනුගමනය කැරුණු එඩිතර ස්ථායීකරණ වැඩ පිළිවෙළ ද තුළිනි.

හංගේරියානු අත් පිටපතත්, ඉංග්‍රීසි අනුවාදයේ අත් පිටපතත් පිළියෙළ කර ගැනීමට නන් අයුරින් සහාය වූ මරියා කෝවැක්ස් හා කාලා කෘගර් යන මගේ කිට්ටු සහායකයින්ට මගේ විශේෂ ස්තුතිය පිරිනැමේ. ටිබර් සෙන්ඩෙයි, බ්‍රයන් මැක්ලීන්, ජූලියානා පාර්ටි හා ඇනා සෙලෙනි යනාදී වශයෙන් පරිවර්තන කාර්යයෙහි ලා මට උදව් වූ අය මා සඳහන් කරන්නේ ස්තුති පූර්වකවය.

අවසාන වශයෙන් මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත්කළ, ඩබ්. ඩබ්. නෝටර්න් යන අමෙරිකානු සමාගමට මගේ ස්තුතිය පිරිනැමේ.

කේම්බ්‍රිජ්, මැසචුසෙට්ස්,
1990 ජනවාරි.

හැඳින්වීම

මෙම අධ්‍යයනයේ පරමාර්ථය හංගේරියානු ආර්ථික සංවර්ධනයේ දිගු කාලීන අරමුණු පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීම නොව, ඉදිරි වර්ෂ වල කළ යුතු යම් යම් කාලීන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීමයි. මෙහි ලා,

(1) දේපොළ අයිතිය
(2) සාර්ව ආර්ථික ස්ථායීකරණය හා
(3) ආර්ථිකය හා දේශපාලනය අතර ඇති සබැඳියාව

යන ප්‍රධාන මාතෘකා තුනක් සාකච්ඡා කෙරේ. කෙසේ වුව ද, යටකී තුන් වැදෑරුම් මාතෘකා පිළිබඳව ද පරිපූර්ණ අධ්‍යයනයක් මින් නොකෙරෙන බවත්, මෙම විෂය ක්ෂේත්‍රයෙන් පරිබාහිර වූ ඇතැම් ප්‍රධාන ගැටලු පිළිබඳ විමසීමක් කිසිසේත් සිදු නොකෙරෙන බවත් ම විසින් අවධාරණය කළ යුතුව ඇත.

මෙම කෘතියෙහි දී මම හුදෙක් නව්‍ය හා ස්වතන්ත්‍ර අදහස්වලට පමණක් සීමා නොවෙමි. පසුගිය වසර කිපය තුළ හංගේරියාවේ ලියැවුණු ශාස්ත්‍රීය ලේඛන ද, පක්ෂ ප්‍රකාශන හා දේශපාලන විවාද ද තුළින් වැදගත් අදහස් රැසක් මතු වී ඇත. පොතෙහි අන්තර්ගතය වරෙක කවුරුනුත් හොඳින් දන්නා මෙම අදහස් සමඟ පැහෙන අතර, තවත් විටෙක ඒවාට පටහැණිව යනු ඇත. සමහර අවස්ථාවලදී පවත්නා සංකල්පවලට අභියෝග එල්ල කිරීමට පවා මම පසුබට නොවෙමි.[1]

මෙම කෘතිය හරියාකාරව කරන ලද විද්‍යාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයක් නොවේ. ඒ බව ඒත්තු ගැන්වීම සඳහා එහි මුල් හංගේරියානු ප්‍රකාශනය මා නම් කෙළේ 'හංගේරියාව තුළ විය යුතු විපරිණාමයට පක්ෂ භාවපූර්ණ ලියවිල්ලක්' යනුවෙනි. විද්‍යාත්මක කෘතියක තිබිය යුතු ප්‍රධානතම ලක්ෂණය නම් එහි සාවද්‍යතාව හෝ නිරවද්‍යතාව පරීක්ෂා කර බැලීමට හැකියාවක් තිබීමය. නිශ්කර්ෂණීය විද්‍යාත්මක චින්තනයේ දී, නිශ්චිතව ප්‍රකාශ කැරුණු

---

(1) විශිෂ්ට ගණයේ අධ්‍යයන කීපයක් තුළ මේ ප්‍රශ්නය ගැන සිදු වී ගෙන යන විවාද සාරාංශ කෙරී ඇත. ඊ. හන්කිස් (1989) හා එල්. ලෙන්ගියෙල් (1989) යන කෘති මෙහි ලා සඳහන් කිරීම වටී. මෙයින් දෙවැන්න දීර්ඝ කාලයක් තිස්සේ පළ වී ඇති හංගේරියානු සමාජ විද්‍යා සාහිත්‍යයේ සාරාංශයකි. එසේම විරුද්ධ පක්ෂවල ආර්ථික වැඩ පිළිවෙළ විවරණය කරන එම්. ලකී (1989) ගේ අධ්‍යයනය ද වැදගත් වේ. එහෙත් හංගේරියාවේ සිදු වී ගෙන යන වෙනස්කම් කෙතෙක් වේගවත් ද, එහි දේශපාලන ජීවිතය කෙතෙක් සජීවී ද යත් මෑත කාලීන වෙනස්වීම් සියල්ල අසු වන සේ සාරාංශයන් සැකසීම ඉතා දුෂ්කර බව තේරුම් ගත යුතුය.

ඉහත දැක්වුණු සාරාංශ තුළ විවිධ මති මතාන්තර සලකා බැලෙන අතර, ඒ පිළිබඳව අදාළ දීර්ඝ ග්‍රන්ථ නාමාවලි ඒවායේ ඇතුළත්ය. මෙම රචනාව තුළ මීට කලින් ලියැවුණු සාහිත්‍ය කෘති සවිස්තරව ඉදිරිපත් කිරීමට මම අපේක්ෂා නො කරමි.

උපකල්පන ඔස්සේ යමින් න්‍යාය ගොඩ නඟා ගැනේ. එම නිගමන හේතුවාදී තර්කනයක් තුළින් ඉදිරිපත් කෙරේ. තවත් අවස්ථාවලදී අතීතයෙන් නිශ්චිත තොරතුරු ගවේෂණයට ලක් කොට සාධාරණීකරණයෙන් නිගමනවලට එළඹෙනු විය හැක. එවැනි අවස්ථාවන්හි දී පර්යේෂකයා පාඨකයා වෙත ඓතිහාසික තොරතුරු සම්භාරයක් ඉදිරිපත් කොට එම කරුණු පිළිබඳව තමන් කරන විවරණ හේතු යුක්ත කළ යුතුය. එහෙත් මෙකී මිනුම් දඬු භාවිතා කළ හැක්කේ ශුද්ධ න්‍යාය හා සම්බන්ධ ක්ෂේත්‍රයෙහි පමණි. එසේ නැතහොත් සලකා බැලෙන කරුණු අතීතය හා වර්තමානය ගැන පමණක් අදාළ වෙතොත් පමණි. එහෙත් අනාගතය සඳහා 'කුමක් කළ යුතුද' යන ප්‍රශ්නය විචාරයට ලක් කරන්නෝ, ඉතා දෘඪ හා පටු දෘෂ්ටියකින් විද්‍යාත්මක යැයි කිව හැකි ගවේෂණ මාර්ගයෙන් ඔබ්බට යා යුතු වෙති. ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ කෘතියක් 'පූර්ණ කාලීන' විද්‍යාත්මක පර්යේෂකයකුගෙන් බිහි වුව ද, එහි යම් දේශපාලන **සථාවරයක්** පැවතිය යුතුමය. එබැවින් එය විෂය මූලක හා ආත්ම මූලක අංග ලක්ෂණවල සංකලනයක් වීම නොවැළැක්විය හැකිය. මෙය ලිවීමේදී ද මම විද්‍යාත්මක පර්යේෂණ ශෛලිය යම් තරමකට අනුගමනය කිරීමට පෙළඹුණෙමි. එනම් හේතුවාදී තර්කනය හා සැබෑ තොරතුරු ඇසුරින් නිගමනවලට එළඹීමේ ලක්ෂණයයි. එසේ වුව ද, මාගේ පෞද්ගලික වූ දේශපාලනික හා සදාචාරාත්මක සාර ධර්ම ද, බලාපොරොත්තු හා විශ්වාසයන් ද, අපේක්ෂා හංගත්වයන් ද කෙනකුට මේ තුළ දැකිය හැකි වනු ඇත. මෙම කරුණු සැඟවීමට උත්සාහ කරනවා වෙනුවට ඒවා අවධාරණය කිරීමට මට වුවමනා වූ බැවිනි, හංගේරියානු ප්‍රකාශනයෙහි මාතෘකාව තුළ 'භාවපූර්ණ' යන වචනය අන්තර්ගත කෙළේ.

මගේ ඇතැම් සීමාවන් පාඨකයන්ගෙන් වසන් කිරීමට අවශ්‍ය නොවේ. අප රට මුහුණ පා සිටින ප්‍රධාන ගැටලුවක් වන ණයගැති භාවය පිළිබඳව ද, අන්තර් පක්ෂ සාකච්ඡා තුළින් මතු වී ආ ප්‍රධාන ප්‍රශ්න පිළිබඳව ද මට වඩා විශේෂඥ ඥානයක් ඇති අය බොහෝ වෙති. එහෙත් ඈතක සිට, අදාළ විස්තරත්, එදිනෙදා මතු වන ආර්ථික හා දේශපාලන ගැටලුත් දෙස බලන්නකු ගේ මෙවැනි ලියැවිල්ලකින් පවතින විවාදයට නව ආලෝකයක් ලැබෙතැයි මම බලාපොරොත්තු වෙමි. මා, මා ගැන සිතන්නේ සමාජවාදී ආර්ථික ක්‍රම පිළිබඳ න්‍යායාත්මක පර්යේෂකයකු ලෙසිනි. මෙහි ලා මගේ අවධානය ඇත්තේ 'සාමාන්‍ය වශයෙන්' සමාජවාදී ක්‍රමය ගැනය. හංගේරියානු ආර්ථිකය සමස්ත සමාජවාදී අර්ථ ක්‍රමයේ කොටසක් පමණි. සාමාන්‍ය වශයෙන්, සමාජවාදී ක්‍රමයේ අංග ලක්ෂණ හා එහි ක්‍රියාකාරිත්වය තුළ දැකිය හැකි පොදු රටාවන් න්‍යායික මට්ටමකින් විමර්ශනය කිරීම ය, මෙතෙක් මගේ අරමුණ ව තිබුණේ. මීට ඉහත දී මගේ ලියවිලි තුළ පුන පුනා කෙරී ඇත්තේ සමාජවාදී අර්ථ ක්‍රමය, සමාජවාදී නොවන අර්ථ ක්‍රමයන්, විශේෂයෙන් නූතන ධනවාදී ක්‍රමයන් සමඟ සංසන්දනය කිරීම ය. මේ මඟින් ලබා ඇති මූලික දැනුම භාවිත කරමින් හංගේරියානු අත්දැකීම් විග්‍රහ කිරීමට මම මෙහි දී තැත් කරමි.

මෙම පොතේ සාකච්ඡා වන ප්‍රශ්න කිහිපයක් ම පුළුල් ලෙස විවාදයට තුඩු දී ඇති මාතෘකා ය. මේ සම්බන්ධයෙන් මා යෝජනා කරන දර්ශනය සදොස් බැව් විචාරකයින් පවසනු විය හැකි ය. එසේ වතුදු, ප්‍රකාශ කරනු ලබන අදහස් 'පරිස්සමින්', ඒ නිසා දුර්වල අන්දමින් ඉදිරිපත් කරමින් මගේ පණිවුඩයේ සැර බාල කොට, මෙවැනි විවේචකයින්ගෙන් බේරීමට මට වුවමනාවක් නැත. ඉතා

ම පැහැදිලි ලෙස වේගවත්ව ද, සමහර විට ඉතා තියුණු අන්දමින් ද අදහස් ඉදිරිපත් කරමින් මම විවේචන තර්ජනවලට එක හෙළා මුහුණ දෙමි. අදාළ ප්‍රශ්න නිරවුල් ව සාකච්ඡා කිරීමට හා ඒ ගැන පුළුල් වාද විවාද මතු කිරීමට මෙම ශෛලිය නිසා ඉඩ සැලසෙතැයි යන්න මගේ විශ්වාසයයි.

මෙම කෘතිය ඉදිරි දැක්මක් හෝ පුරෝකථනයක් හෝ නොවේ. හංගේරියාව ඉදිරි අනාගතයේ දී අනුගමනය කරනු ඇති විකල්ප මාර්ග මොනවාද යන්න ගැන හෝ ඉදිරියේ විවිධ තත්ත්වයන් පැන නැගීමට ඇති සම්භාවිතා ගැන හෝ විමසා බැලීමක් මෙහි නැත. අර්බුදයෙන් මිදීමට ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතු යැයි මා විශ්වාස කරන කාර්ය භාරයන් කීපයක් මම ඉදිරිපත් කරමි. එසේම මං මුළා වී නොයා යුතු මාවත් මම පෙන්වා දෙමි. මා වැදගත් කොට පෙන්වා දෙන මෙම කාර්ය භාරයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දේශපාලන කොන්දේසි තුන් වන පරිච්ඡේදය තුළ සංක්ෂිප්ත ව සාකච්ඡා වේ.

මේ පොතේ පසු පිටුවල විස්තර කෙරෙන වෙනස්කම් කවර කාල රටාවක් ඔස්සේ බිහි වනු ඇත්ද, ඒවායේ ගතික ස්වභාව කවරේ ද යන්න පිළිබඳ තවත් එක් අවසාන අදහසක් ඉදිරිපත් කළ යුතුය. යම් යම් ක්‍රියාදාමයන් අවශ්‍යයෙන්ම ක්‍රමික ව ඇති විය යුතු වුව ද, යම් යම් වෙනස් වීම්, සමාජය කම්පනයට පත් කරමින් වුව ද, කෙටි කාලයක් තුළ දී ක්ෂණික ව සිදු වීම නො වැළැක්විය හැක. මෙවැනි ක්ෂණික වෙනස්කම් පිළිබඳ වැඩිපුර සාකච්ඡාවක් දෙවන පරිච්ඡේදයේ දී කෙරෙනු ඇත. මා විශ්වාස කරන්නේ, හංගේරියාව තුළ, ශල්‍යකර්ම ස්වරූපයකින්, දැඩි හා ක්ෂණික වෙනස්කම් ඇති කළ යුතු බවයි. එසේ කළ යුත්තේ එවැන්නක් සාර්ථක වීමට උචිත පරිසරය සකස් කරනු ලැබීමෙන් පසුව බව අමුතුවෙන් කිව යුතු නොවේ.

ඉටු කළ යුතු දේවල් අතුරින් කවරක් කුඩා පියවර ඔස්සේ හෙමින් හෙමින් ක්‍රමික ව සිදු වන්නට ඉඩ හැරිය යුතු ද, කවරක් ක්ෂණික ව ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්ති මාලාවකට අයත් වන්නේ ද යන්න නිවැරදි ව තීරණය කර ගැනීම ඉතා ම වැදගත් වේ. එක් අතකින් බලන කල එක් පෑන් පහරකින් ඇති කළ යුතු ප්‍රතිපත්ති පියවරවල් ඇදි ඇදී තිබෙන්නට ඉඩ හැරීම වැරදිය. අනෙක් අතට, ඉතා ක්‍රමානුකූල ව නිවී සැනසිල්ලේ ගන්නා ක්‍රියා මාර්ග තිබිය යුතු තැන්වල, ක්ෂණික හා හදිසි පිළියම් සෙවීම ද නො කළ යුතුය. මෙම කරුණ පොතේ ඉදිරි කොටස්වලදී පුන පුනා සිහි ගැන්වෙනු ඇත.

1. දේපොළ අයිතිය

මේ මාතෘකාව යටතේ මා මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය වෙතටය. මීට අමතරව, තුන් වන, හතර වන ආදී වශයෙන් වෙනත් අංශ පවතී ද, පැවතිය යුතු ද යන ප්‍රශ්නය ද විමර්ශණය කෙරෙනු ඇත.[2]

1.1 පෞද්ගලික අංශය

අදහස් දැක්වීමේ පහසුව සඳහා පෞද්ගලික අංශයේ අන්තර්ගත වන අනු කොටස් පැහැදිලි කරමින් අප විග්‍රහය ඇරඹීම සුදුසුය. මෙම අනු කොටස් පහත දැක්වේ.

(අ) ආර්ථික ඒකකයක් හැටියට කුඩුම්බය: කුටුම්බයට ඇතුළු වන්නන් ගේ අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා කෙරෙන නිෂ්පාදන කටයුතු හා සේවා මීට ඇතුළත්ය.

(ආ) විධිමත් පෞද්ගලික ව්‍යවසාය: රටේ පවත්නා නීතිරීතිවලට අනුකූලව මේවා නිෂ්පාදන හා සේවා කටයුතු සිදු කරයි. ඒක පුද්ගල ව්‍යාපාරවල සිට මහා පරිමාණ ව්‍යාපාර දක්වා යන වශයෙන් මෙම ව්‍යවසායයන් ගේ ප්‍රමාණය එකිනෙකින් වෙනස් වනු ඇත.

(ඇ) අවිධිමත් පෞද්ගලික ව්‍යාපාර: මේ ගණයට වැටෙනුයේ ආර්ථිකයේ ඇති 'සැඟවුණු අංශයේ' පවතින ව්‍යාපාර ඒකකයන්ය. බලධාරීන්ගෙන් ලබා ගත් විශේෂ බලපත්‍ර නොමැතිව කෙරෙන සියලු නිෂ්පාදන හා සේවා කටයුතුත්, පුද්ගලයන් අතර කෙරෙන සියලු ගනුදෙනුත් මේ ගණයට වැටේ. එසේ ම විධිමත් පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය සඳහා පුද්ගලයන් කරන සියලු අවිධිමත් ආර්ථික කටයුතු ද මේ ගණයෙහි ම ලා සැලකිය හැක.

(ඈ) පුද්ගලික ධනය හා පුද්ගලික ඉතිරි කිරීම් යොදා කෙරෙන හැම දේ: තම පෞද්ගලික නිවාස කුලියට දීමේ සිට පොළියට මුදල් ණයට දීම දක්වා ඇති ආර්ථික කටයුතු මේ වර්ගයට අයත්ය.

ඉහතින් දැක්වුණු සිව් අංශය පූර්ණ වශයෙන් එකිනෙකින් වෙන් කොට දැක්විය නොහේ. එක් වර්ගයක ඇති අංග ලක්ෂණ අනෙක් වර්ගවලද යම් තරමකට තිබීමට පුළුවන. ඉදිරියේ කෙරෙන සාකච්ඡාවේ දී ආර්ථික ඒකක

---

2. පරිච්ඡේදයේ මෙම කොටස ලිවීමේ දී සාමාන්‍ය වශයෙන් දේපොළ අයිතිවාසිකම් න්‍යාය පිළිබඳ ලියවිලි වලින් දැඩි ලෙස ආභාසය ලදිමි. [නිදසුන් ලෙස බලන්න. A.A. Alchian and H.Demsetz (1973); H. Demsetz (1963); E.G.Furubotn and S.Pejovich (1974)]. විශේෂයෙන් ම මෙහිලා, මම, සමාජවාදී ක්‍රමයක් තුළ දේපොළ අයිතිය පිළිබඳ ලියවිලිවලට ණයගැති වෙමි. දෙවන ගණයේ ලියවිලි අතුරින් මේ පිළිබඳ සම්භාව්‍ය කෘති වන L. Von Mises (1920);(1935) යන කෘති ද D.Lavoie (1985) හා G.Schroeder (1988) ද විශේෂයෙන් සඳහන් කළ යුතු වෙයි.

හැටියට පුද්ගලයන් ගැන ද, විධිමත් අවිධිමත් අංශ ගැන ද, වෙන් කොට කතා කිරීමක් නොකෙරෙනු ඇත. ආර්ථික ඒකකයක් ලෙස කුටුම්බය, හුදෙක් පෞද්ගලික අංශයේ කොටසක් ලෙස ගෙන, සාකච්ඡා කෙරෙනු ඇත.

හංගේරියාව තුළ, සාර්ව ආර්ථික තලයෙහි අසමතුලිතතාවන් හා අස්ථායීතාවන් ගහණ බව සැබැවි. එහෙත් හංගේරියාව සමස්තයක් ලෙස ගත් කල, ආර්ථික අර්බුදයකින් පෙළෙන බවට පවතින ප්‍රචලිත මතය එකහෙලා ම පිළිගැනීමට මම නැඹුරු නොවෙමි. ඉහත කී අසමතුලිතතා රටේ ආර්ථික ක්‍රියාවලීන් කෙරෙහි හා සියලු හංගේරියානු ජනයාගේම ජීවිත කෙරෙහි බලපායි. රටේ විශාලතම ආර්ථික ඒකකය වන රාජ්‍ය අංශය ක්‍රියා කරනුයේ අකාර්යක්ෂම ව ය. එහෙත් ආර්ථිකය තුළ එක්තරා සෞඛ්‍ය සම්පන්න අංශයක් ඇත. එනම් පෞද්ගලික අංශයයි. මා පසුව පෙන්වා දී ඇති පරිදි, මෙම අංශය ද බරපතල දුෂ්කරතාවලින් පෙළෙමින් ඇත. එහෙත් අර්බුදයට **නොවැටී** පැවතීමේ ශක්තියක් ඇතිව සිටින අංශය එයයි. නිල සංඛ්‍යා ලේඛනවලින් පෙන්වා දෙනු ලබනවාට වඩා තරමක් හොඳ තත්ත්වයකින් රටේ ආර්ථිකය පවත්නේ, ඇත්ත වශයෙන්, පසු ගිය දශක කීපය තුළ පෞද්ගලික අංශයේ නිෂ්පාදනය හා දේපොළ වර්ධනය වූ නිසාය. ඇත්ත වශයෙන් පෞද්ගලික අංශය වනාහි ආර්ථියේ ඇති ඉතාම වැදගත් 'ස්ථායීකාරකයා' ය. ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ වැදගත් ම ජයග්‍රහණය පෞද්ගලික අංශයේ සංවර්ධනයයි.

නුහුරු නුපුරුදු හා සතුරු පරිසරයක වුව ද වර්ධනය වීමේ අපූරු හැකියාවක් පෞද්ගලික අංශය සතුව පැවතීම එහි සජීවීභාවය සනාථ කරන්නකි. සුප්‍රසිද්ධ හංගේරියානු ලේඛකයකු වන ඉස්ට්වාන් ඕර්කෙනි අතින් ලියැවුණු 'මිනිත්තුවක කථා' අතුරින් ඉතාම බහුල වශයෙන් උපුටා දක්වනු ලැබ ඇති 'බුඩාපෙස්ට්' යන ලියැවිල්ලෙහි, කල්පිත වශයෙන් පරමාණු බෝම්බයක් වැටුණාට පසු දිනයේ හංගේරියානු අගනුවර තත්ත්වය විස්තර කෙරේ. නගරය මීයන් ගේ ආක්‍රමණයකට ලක් වේ. හදිසියේ සුන්බුන් ව ගිය නිවසක පෝස්ටරයක් අලවා තිබෙනු දක්නට ලැබේ. එහි මෙසේ ලියා ඇත. 'ගනු දෙනු කරුවන් ගේ ම බේකන් යොදා මී වසංගතය අවසන් කිරීමට වර්සාන්යි මහත්මිය සූදානම්' ය යනුවෙනි. මේ හා සමාන අත්දැකීම් අපි පසුගිය දශක කීපය තුළ කොතෙකුත් ලබා ඇත්තෙමු. ජනසතු කිරීම්, සාමූහිකකරණයන් හා රාජසන්තක කිරීම් පෙළකට, පෞද්ගලික අංශය, පෞද්ගලික ආරම්භක ශක්තීන් හා පෞද්ගලික දේපොළ ලක් වී තිබිණි. මෙවැනි තත්ත්වයක් යටතේ වුව ද, නීතිය යන්තමින් ලිහිල් කැරුණු වහාම පෞද්ගලික ව්‍යාපාර ලියලා නැගී ආය. නීතිය අකුරටම ක්‍රියාත්මක නොකරන බවත්, නීති කඩන යම් යම් අවස්ථාවල බලධාරීන් අහක බලා ගන්නා බවත් දක්නට තිබීම පමණක් ද්විතීය ආර්ථිකයේ පණ ගැන්වීමට සැහුණි.

පුද්ගලික අංශයේ ප්‍රාණවත් බවට ඇති හොඳ ම නිදසුන එහි ව්‍යාප්තියේ **නිරායාස ස්වරූපය**යි. රාජ්‍ය අංශයේ නම් සංවිධාන ව්‍යුහය, කළමණාකරණය හා ඒකාබද්ධකරණය සඳහා කෘත්‍රිම වශයෙන් ඇති කරනු ලබන මධ්‍යගත ක්‍රියාමාර්ග පෙළක් අවශ්‍යය.

අනෙක් අතට, පෞද්ගලික අංශය නිරායාසයෙන් **ස්වොත්සාහය මතම** වර්ධනය වේ. ඒ සඳහා කේන්ද්‍රගත මෙහෙයවීම් හා උපදෙස් අනවශ්‍යය. **වෙළෙඳ පොළට අනුකූලව** ක්‍රියා කිරීම සඳහා දිරි ගැන්වීම් හෝ නියෝග හෝ පෞද්ගලික අංශයේ ඒකකවලට අවශ්‍ය නොවේ. වෙළෙඳ පොළට අනුකූල ව කටයුතු කරන

සේ, නිතිපතා, දිරි දීම් හා සමහර විට අණ කිරීම් රජය සතු ආයතන සඳහා නම් අවශ්‍යය. එවැනි දෑ මැද්දේ ම වුව මෙම ආයතනවලට නම් එලෙස කටයුතු කිරීමේ හැකියාවක් නැත.

හංගේරියානු ආර්ථිකය තුළ පුද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම්වල නිවැරදි ප්‍රමාණය කිසිවෙකුදු නොදනිති. සංඛ්‍යාලේඛන කොතෙක් ඇතද, මේ පිළිබඳ සමීක්ෂණයක් තවම කෙරී නැත. අවුරුදු දෙක තුනකට පෙර, නොයෙකුත් අනුමාන කිරීම් පදනම් කොට, මේ පිළිබඳ යම් යම් තක්සේරු කිරීම් කරනු ලැබ ඇත. මෙවැනි එක් තක්සේරුවකින් හෙළි වූ තොරතුරු අනුව, ජනයාගේ වැඩ කරන කාලයෙන් තුනෙන් කොටසක් යෙදවනුයේ ඉහතින් යොදා ගැනුණු නිර්වචන අනුව පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු උදෙසා ය.[3] මේ වන විට මෙම අංශයේ ප්‍රමාණය තව දුරටත් වර්ධනය වී ඇතැයි සිතිය හැක. කෙසේ හෝ පෞද්ගලික අංශය දැනට ආර්ථිකයේ ශක්තිමත් අංශයක් වශයෙන් ඉදිරියට පැමිණ ඇතැයි සිතීමට ඕනෑ තරම් සාධක ඇත. මේ ආකාරයෙන් බලන කල, රටේ ආර්ථික වර්ධනයෙහි ලා මතු වන මූලික ම ප්‍රශ්නය වනුයේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය වඩ වඩාත් වර්ධනය වීමට ඉඩ හැරේ ද නැද්ද යන්නයි.

පෞද්ගලික අංශයේ වර්ධනයෙහි අවශ්‍යතාව විවිධ ආර්ථික න්‍යායයන් හා දේශපාලන ව්‍යාපාර තුළ පොදුවේ පිළිගැනී ඇත. එහෙත් මේ පිළිබඳ ප්‍රකාශන බොහොමයක් ඉතා සාමාන්‍ය මට්ටමින්, බොහෝ විට, නොපැහැදිලි ලෙස ඉදිරිපත්ව ඇති ඒවා වෙයි. මේ තත්ත්වය නිසා මේ පිළිබඳව කටයුතු කරන ආර්ථික විද්‍යාඥයනට, දේශපාලනඥයනට හා දේශපාලන පක්ෂයට එහි ලා කැප වීමකින් තොර ව සිටීමට හැකියාව ලැබී ඇත. ඒ නිසා මම පුද්ගලික ව්‍යවසායකත්වය තුළින් රට සංවර්ධනය කිරීමේ දී ඉටු විය යුතු මූලික අවශ්‍යතා 6 ක් නියත වශයෙන් ඉදිරිපත් කරමි. පවත්නා ප්‍රශ්න උඩින් ලිස්සා යාම නොව, ඒවා ඉස්මතු කරලීම ය මගේ අරමුණ. ඒ නිසා මම මෙම කරුණු හය ඉදිරිපත් කිරීමේ දී මගේ වචන ඉතා තියුණු ලෙස යොදවමි. තියුණු ලෙස කෙරෙන ඉදිරිපත් කිරීම් තුළින්, යම් යම් ස්ථාවරයන්ට පක්ෂව තර්ක කරන අය, එකඟ වන හා නොවන තැන්, වඩා හොඳින් තේරුම් ගත හැකි වනු ඇත.

තවත් එක් මූලික හැඳින්වීමක් මෙහි දී අවශ්‍යය. මා අවශ්‍ය යැයි පෙන්වා දෙන දෑ යම් ලෙසකින් ක්‍රියාත්මක කෙරෙන්නේ නම්, ඒ පිළිබඳ යම් යම් තන්හි දී, මා කියා ඇති දේට තරමක් වෙනස් වන ලෙස කටයුතු කිරීමට සිදු වනු ඇත. තාවකාලිකව යම් යම් සම්මුතීන්ට එළඹීම අවශ්‍ය වනු ඇත. මෙලෙස ක්‍රියාවේ දී ඇති විය යුතු ව්‍යතිරේකයන් (exceptions) හා සම්මුතීන් (compromies) ගැන සලකා බැලීම නම් මම මේ පොතේ විෂය ක්ෂේත්‍රයෙන් පරිබාහිර වූවෙකැයි සලකමි. පරිස්සම් විය යුතු තැන් සිය ගණනින් දක්වන්නට ගියහොත් මගේ ප්‍රකාශනවල මුවහත අඩු වෙයි. ඒ නිසා මම එවැනි ව්‍යතිරේකයන් දක්වන්නට යන්නේ නැති ව අදහස් වඩා සරලව ඉදිරිපත් කිරීමට යත්න දරමි.

1. පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම හා සැබැවින්ම නිර්බාධිකරණය කළ යුතුයි.

පෞද්ගලික අංශයේ වැඩ කටයුතුවලට බාධා පනවන නිලධාරිවාදී සීමාවන් කැපී පෙනෙන අයුරින් වෙනස් කිරීම් වස් සිය ගණන් නව රෙගුලාසි

---

3. Janos Timar (1985), Pal Belyo හා Bela Dexler (1985) යන අධ්‍යයන බලන්න.

අවශ්‍ය නොවේ. අත්හැර ලිය යුතු සීමා කවරේද යනුවෙන් සොයා බලමින් වැනි වැනී සිටීමට අවශ්‍ය නැත. මේ ප්‍රශ්නයට විසඳුම් සොයා ගමන් කළ යුත්තේ මීට ප්‍රතිවිරුද්ධ දිශාවෙනි. එනම් රටේ ආර්ථික ක්‍රියාදාමයට සහභාගි වීමට පෞද්ගලික අංශයට අසීමිත අයිතියක් ඇතැයි පැහැදිලිව හා අවධාරණයෙන් සහතික කෙරෙන ව්‍යවස්ථාමය රාමුවක් ගොඩ නැංවීමය.[4] මෙහි දී නීත්‍යනුකූලව ආර්ථික ක්ෂේත්‍රයෙන් බැහැර වන, සමාජයට අහිතකර කටයුතු (නිදසුනක් ලෙස වංචනීය හෝ හිංසාකාරී හැසිරීම්) පිළිබඳ තහනම් පැනවීම් විශේෂ අවස්ථා ලෙස සැලකිය යුතුය. එසේම, ආර්ථිකමය කරුණු මත පදනම් වන යම් යම් නීත්‍යනුකූල සීමාවන් කවුරුනුත් හොඳින් දන්නා දේ නිසා ඒවා පුන පුනා විස්තර වශයෙන් සඳහන් කිරීම අනවශ්‍ය ය. අවධාරණය කළ යුත්තේ මූලික සිද්ධාන්තයයි. එනම් සාමාන්‍ය වශයෙන්, පෞද්ගලික අංශය කිසිම තහනමකට මුහුණ නොදිය යුතුය යන්නයි.[5]

පෞද්ගලික අංශය නිර්බාධීකරණයට පත් කිරීමේ දී කළ යුතු දෑ, කිසිසේත්, ඉබේටම ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ඒවා නොවේ. එය සංරචක ගණනාවකින් සංයුක්ත වන අතර, මෙහි දී ඒවායින් ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ගෙන හැර දක්වමි.

* ආයතනයක් පිහිටුවා ගැනීමට ඇති නිදහස; නිෂ්පාදන ක්ෂේත්‍රයට පිවිසීමට ඇති නිදහස.
* ගැනුම් කරුවා හා විකුණුම් කරුවා අතර ඇති කර ගැනෙන නිර්බාධී සම්මුතීන් මත නියම වන නිර්බාධී මිල ගණන් පැවතීම.
* පෞද්ගලික අයිතිය යටතේ පවත්නා දේපොළ බාධාවකින් තොරව බදු ගැනීමට ඇති අයිතිය; මෙහිදී ද බදු ගන්නා හා දෙන්නා අතර කිසිවකුගේත් බලපෑමකින් තොරව ඇති වන සම්මුතිය වැදගත් වේ.

---

4. මෙම නීති රීති, රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු විය යුතුද, නො එසේ නම් පාර්ලිමේන්තුවෙන් විටින් විට සම්මත කර ගැනුණක් විය යුතු ද යන්න පිළිබඳ නිතිමය වූ වෙන් කොට දැක්වීමක් මෙම අධ්‍යයනයෙන් සිදු නොකෙරේ. කෙසේ වෙතත්, පෞද්ගලික අංශයේ කටයුතු තහවුරු කරන විධියේ මූලික සිද්ධාන්තයක් රටේ නීතියට ඇතුළත් කිරීම දැන් අවශ්‍ය ව තිබෙන බව අවධාරණය කළ යුතුය.

5. මෙයින් අදහස් වන්නේ වෙනස් වෙනස් රෙගුලාසිවලට යටත් වන විවිධ කොටස්වලට පෞද්ගලික අංශය බෙදා දැක්වීමේ සිරිත අත් හළ යුතු බවය. (මත් ද්‍රව්‍ය හෝ ළමයින් සම්බන්ධ වෙළෙඳ කටයුතු වැනි) ආර්ථික නොවන කරුණු මත නීතියෙන් තහනම් කොට ඇති කටයුතු හැර, අන් සියලු කටයුතුවලදී හැම වර්ගයකම පෞද්ගලික ආයතන නීත්‍යනුකූල වන අතර, ඒ කිසිවකටත් විශේෂ අවසර පත්‍ර අවශ්‍ය නො වන බව මින් ඇඟවේ. ආරක්ෂණය, පොදු සුරක්ෂිතතාව හෝ වෙනත් බාහිර ප්‍රතිවිපාක පදනම් කොට සාධාරණීකරණය කළ හැකි තන්හි දී නම්, යම් යම් පෞද්ගලික කටයුතු ලියා පදිංචි කිරීමට හෝ අවසර පත්‍ර වලට හෝ නතු විය යුතුය යන්න අමුතුවෙන් කිව යුතු නොවේ.

   කිසියම් කටයුත්තක් අවසර පත්‍රවලට යටත් කෙරෙතොත් එසේ විය යුතු විශේෂ අවස්ථා නීතියෙන් පැහැදිලි ව දැක්විය යුතුය. එසේ වූ කල, අන් සියලු කටයුතු, විශේෂ අවසර පත්‍ර වලින් තොරව, නීත්‍යනුකූල ව පෞද්ගලික අංශයට කළ හැකි දේ බවට පත් වේ. මෙය දැනට පවතින තත්ත්වයෙන් සම්පූර්ණයෙන් වෙනස් ව යාමකි. පවතින තත්ත්වය යටතේ ආරම්භක ස්ථානය අප ඉහතින් දැක්වූ සිද්ධාන්තයේ සම්පූර්ණ විරුද්ධ පැත්ත වේ. එනම් ලියාපදිංචිය හෝ අවසර පත්‍රය නැති කිසිම ක්‍රියාවක් නීත්‍යනුකූල නොවේය යන ස්ථාවරයයි. පවතින තත්ත්වය යටතේ අපට අපේක්ෂා කළ හැකි ඉතාම හොඳ තත්ත්වය නම්, නිලධාරීන්, ලියා පදිංචි නොවී හෝ අවසර පත්‍ර වලින් තොරව කෙරෙන කටයුතු පස්සේ එළවා යන්නේ නැතිව, ඒවා ගැන ඇස් පියා සිටීමකි.

මෙවැනි නිර්බාධී බදු දීම්වලට පෞද්ගලික අයිතිය යටතේ පවත්නා තට්ටු නිවාස හා වතු පිටි ද ඇතුළත් විය යුතු අතර, අදාළ බද්ද, බදු දෙන්නා හා බදු ගන්නා අතර නිදහසේ තීරණය විය යුතුය.

* සේවා යෝජකයා පෞද්ගලික අංශයට (කුටුම්බයක් හෝ පෞද්ගලික හිමි කමට යටත් ආයතනයක්) අයත් වන සියලුම අවස්ථාවන්හි දී නිර්බාධීව මිනිසුන් සේවයට බඳවා ගැනීමේ අයිතිවාසිකම. මෙහිදී ද වැටුප් පිළිබඳ එකඟත්වයන්ට පැමිණීමේ නිදහස සේව්‍යයා හා සේවකයා සතු විය යුතුය.
* (දුර්ලභ ගණයේ ලෝහ වැනි) ඉහළ වටිනාකමකින් යුක්ත භාණ්ඩ රැස් කර ගැනීමට, විකිණීමට හා මිල දී ගැනීමට පාලනය නොවූ නිදහස.
* පෞද්ගලික අංශය ඇතුළත ද, හංගේරියානුවන් හා විදේශිකයින් අතර ද ඇති වන ගනුදෙනු මගින්, විදේශ විනිමය රැස්කර ගැනීමට, මිලට ගැනීමට හා විකිණීමට නිදහස.
* විදේශීය මුදල් රට තුළට ගෙන ඒමටත්, දේශීය මුදල් රටින් පිටතට ගෙන යාමටත් නිදහස.
* පෞද්ගලික අංශයේ සාමාජිකයින්ට ආනයන අපනයන වෙළඳාමේ යෙදීමට පූර්ණ නිදහස ඇති නිර්බාධී විදේශීය වෙළෙඳ කටයුතු.[6]
* ණය දීමේ අසීමිත නිදහස: ණය දෙන්නාත්, ණය ගනුවාත් අතර ඇති වන නිදහස් ගිවිසුම් යටතේ ණය කොන්දේසි තීරණය විය යුතුය.
* වෙනත් පුද්ගලයින්ගේ පෞද්ගලික ව්‍යාපාරවල මුදල් ආයෝජනය කිරීමට ඇති නිදහස.
* පුද්ගලික නිවාස, වතුපිටි හෝ වෙනත් දේපොළ, නිර්බාධී මිල ගණන් යටතේ, විකිණීමට හෝ මිලදී ගැනීමට හෝ ඇති නිදහස.

පෞද්ගලික නිදහසේ අවශ්‍යතා හැටියට ඉහතින් පෙළ ගැස්වූ කාරණා ලැයිස්තුව අද පවත්නා තත්ත්වය සමඟ සසඳා බැලීම වටී. ඒ සියල්ල එකින් එක ගෙන සන්සන්දනය කිරීමක් මෙහි දී නොකෙරේ. එහෙත් අඟු ලෙස කරන ලද පරීක්ෂණයකින් වුවත්, පෞද්ගලික අංශයේ නියම නිර්බාධීකරණය වළක්වා ලමින් පවත්නා සිය ගණන් නීතිමය බාධක බලා ගත හැකිය. අවිධිමත් ද්විතීය ආර්ථිකය, 'ඡායා ආර්ථිකය', කළුකඩ, අදෘශ්‍යමාන ආදායම් යනාදී විවිධ නම් වලින් හැඳින්වෙන ආර්ථික කටයුතු පවත්නේ, පෞද්ගලික ක්‍රියාකාරිත්වයට හා පෞද්ගලික සම්පත් උපයෝජනයට බාධාකාරී වන සංරෝධකයන් සිය ගණනින් පැවතීම හේතු කොට ගෙනය. අර්ථ විරහිත නීතිමය රෙගුලාසි හා පරිපාලනමය සීමාවන්ට එරෙහිව සිය විරෝධය මුරගා කියන, එක්තරා 'විශේෂ ආකාරයක සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරයක්' හැටියට, අවිධිමත් ද්විතීය ආර්ථිකය හැඳින්විය හැක. රජය තම නිලධාරිවාදී සීමාවන්ගෙන් කොටසක්වත් පෞද්ගලික අංශය මත පැටවීමට අසමත් වූ බැවිනි මෙවැනි තත්ත්වයක් උදා වී ඇත්තේ. වෙනත් වචනවලින් කියතොත් මෙවැනි ආර්ථික කටයුතු කළුකඩ ව්‍යාපාර තරම් නරක නැති ඒවා ලෙස සලකා රජය ඒ පිළිබඳව ඇස් පියා සිටීමක් මෙ මගින් පෙන්නුම් කෙරේ. සියලුම ගණයේ පෞද්ගලික අංශ ආර්ථික කටයුතු පැහැදිලිවම නිත්‍යානුකූල කිරීමට කාලය එළඹ ඇත.

---

6. රේගු බදු අය කර ගැනීමේ අයිතිය රජය සතු වෙතත්, එය ඉහත දැක්වූ අවශ්‍යතාවලට ප්‍රතිවිරුද්ධව නොයයි. මේ ගැන තවදුරටත් පසුව සාකච්ඡා කෙරේ.

පෞද්ගලික අංශයේ එක් සාමාජිකයකු, එම අංශයේම වෙනත් අයකු සමඟ ගනුදෙනු කරන අවස්ථාවලදී පමණක්, නිදහස පිළිබඳව ඉහත සඳහන් කරන ලද විවිධ සංකල්පයන් අදාළ වන බව සැලකීම, මෙහි ලා වැරදි සහගත නිගමනයන්ට එළඹීමෙන් වැළකීම සඳහා අවශ්‍යය. විකුණන්නා හා මිල දී ගන්නා, බදු දෙන්නා හා බදු ගන්නා, හා ණය දෙන්නා හා ණය ගන්නා ආදී වූ අය අතර සබඳතාය, මෙහි දී සැලකිල්ලට ගැනුණේ. රාජ්‍යය හෝ එහි කිසියම් ආයතනයක්, පෞද්ගලික අංශය සමඟ පවත්වන සම්බන්ධතා පොතේ වෙනත් තැනක දී සාකච්ඡාවට භාජනය කෙරේ.

පෞද්ගලික අංශය නිර්බාධීකරණය සඳහා අවශ්‍ය යයි අප අර්ථ දැක්වූ සාධක ගැන වැඩිදුර සලකා බැලීමක් ලෙස, **විදේශ විනිමය ගනුදෙනු** පිළිබඳ ප්‍රශ්නය සැලකිල්ලට ගනිමු. මෙහි දී මුලින්ම එකක් කිව යුතුය. මෙම නිදසුන මා මෙහි දී යොදා ගනුයේ, නිර්බාධීකරණ අවශ්‍යතා අතර විනිමය ගනුදෙනු නිර්බාධීකරණය ප්‍රමුඛ වන බව දැක්වීමට නොව, එමඟින් අදාළ කරුණු ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි වීම නිසාය. ඉදිරියෙහි සාකච්ඡා වන ක්‍රියාමාර්ග තනිව ක්ෂණිකව ක්‍රියාත්මක කළ යුතු යැයි මම යෝජනා නොකරමි. ඒ හා බැඳී පවතින අන්‍ය ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධව මිස මෙය නො කළ යුතුය. පෞද්ගලික අංශයේ විදේශ විනිමය ගනුදෙනු නිර්බාධීකරණය සාර්ථක ව කළ හැක්කේ එය, සමස්ත පෞද්ගලික අංශ නිර්බාධීකරණ ක්‍රියාවලියේ ඓන්ද්‍රීය කොටසක් වශයෙන් සිදු කළහොත් පමණි. මෙයින් අදහස් වන්නේ දෙවන පරිච්ඡේදයෙන් කියැවෙන ස්ථායීකරණ වැඩ පිළිවෙළෙහි ක්‍රියාත්මක වීම සමඟ මෙය බැඳී පවතින බවය. දැන් අපි අපේ නිදසුන දෙසට හැරෙමු.

මා ඉහතින් දැක්වූ 1 වන අවශ්‍යතාවෙන් කියැවෙන්නේ, හංගේරියානු වැසියකු වන මට හංගේරියානු ෆොරින්ට් මුදලට හුවමාරු වශයෙන්, අසීමිත විදේශ විනිමය ප්‍රමාණයක් විකිණීමට රාජ්‍ය බැංකු බැඳී සිටිය යුතුය යන්න නොවේ. රාජ්‍ය බැංකු දේශීය මුදලට විකිණිය යුතු විදේශ විනිමය ප්‍රමාණය හා එහි දී අදාළ වන කොන්දේසි පිළිබඳ කරුණු නිර්බාධීකරණ අවශ්‍යතාවලින් වෙන් කොට තේරුම් ගත යුතුය. (ඉදිරියේ අංක 2.5 කොටසෙහි දී අපි නැවත මේ ප්‍රශ්නය වෙතට යොමු වෙමු.) ඉහත නිදහස සඳහා තිබිය යුතු අවශ්‍යතාවක් හැටියට මා සැලකුවේ, පොලීසිය දැක දැකම නමුත් ඩොලර් නෝට්ටු පාරේදී හෝ වෙනත් තැනක දී හෝ විකිණීමට හා මිලට ගැනීමට මා සතු අයිතියයි. මට අවශ්‍ය යැයි හැඟේ නම් එම මුදල් ඕනෑ ප්‍රමාණයක් නිවසේ තබා ගැනීමට නිදහස තිබිය යුතුය. මෙහි දී මම සොරුන් ගැන බිය විය යුත්තෙමි. එහෙත් නිසැකවම, මට පොලීසියට හෝ විදේශීය විනිමය අධිකාරියට හෝ අසු වේය යන බියක් නොතිබිය යුතුය. තවද, මා එය ලබා ගත් මාර්ග හෙළි නොකර, මාගේ ඩොලර්, රාජ්‍ය බැංකුවට විකිණීමට ඇති අයිතිය ද මට වැදගත් වේ. රාජ්‍ය බැංකුව මට මෙහි දී ගෙවන විනිමය අනුපාතිකය ගැන මට සතුටු විය නොහැකි නම්, ඊට වඩා වැඩි මිලක් ගෙවන කවරකුට වුවද, මා සතු ඩොලර් විකිණීමේ අයිතිය ද මට තිබිය යුතුය. මෙම අයිතිවාසිකම් ම යටතේ, අවශ්‍ය වෙතොත්, මට මගේ හංගේරියානු ෆොරින්ට් මුදල්, වියෙනාහි පෞද්ගලික බැංකුවකට හෝ ඕනෑම පුද්ගලයකුට හෝ ඔස්ට්‍රියානු සිලිං වලට විකිණීමට ද මට නිදහස තිබිය යුතුය. එසේම මගේ හංගේරියානු ෆොරින්ට් මුදල් වියනාවට හෝ වෙනත් ඕනෑම

තැනකට ගෙන යාමට ද, මට ශක්ති පමණින් පරිවර්ත්‍ය වන විදේශීය මුදල් ඕනෑම ප්‍රමාණයක් මිලට ගැනීමට ද නිදහස තිබිය යුතුය.[7]

නීතියෙන් තහනම් වුව ද, මෙවැනි ගනුදෙනු අද පවා සුලභය. එවැනි අවස්ථාවන්හි පොලිසියට අසු නොවී ඒවා කිරීමට මිනිස්සු හැකි තාක් උත්සාහ ගනිති. එහෙත් එවැන්නක් යම් අවස්ථාවක දී පොලිස් නිලධාරියකු දුටුව ද, ඔහු එය නොදුටුවා සේ සිටියි. මේ අවුල් සහගත තත්ත්වය මග හරවා ගැනීමට විකල්ප ක්‍රියා මාර්ග දෙකක් භාවිත කළ හැක. පළමුවැන්න නීතිය අකුරටම ක්‍රියාවේ යෙදවීමය. දෙවැන්න නිදහස් ගනුදෙනුවලට ඇති බාධක රෙගුලාසි ඉවත් කිරීමය. මා යෝජනා කරන්නේ දෙවැන්න ය.

අපි විදේශ විනිමය ගනුදෙනු නිදසුන ගැන තවත් ටිකක් සලකා බලමු. ෆොරින්ට් මුදලේ පරිවර්ත්‍යතාව කෙරෙහි මෙතෙක් කී දෑ බලපාන්නේ කෙසේ ද? විදේශීය විනිමය ගනුදෙනු පිළිබඳ නිදහස, පෞද්ගලික වෙළෙඳ පොළෙහි දී, ෆොරින්ට් හා අනිකුත් පරිවර්ත්‍ය මුදල් වර්ග අතර, සත්‍ය වූ වෙළෙඳ පොළ විනිමය අනුපාතිකයක් වර්ධනය වීමට ඉඩ සලසනු ඇත. මෙහි දී ගැනුම්කරුවෝ විදේශීය මුදල් සඳහා තමාගේ පුද්ගලික මුදල් යොදවති. අවශ්‍ය වනුයේ රහස්‍ය භාවයකින් තොරව කළු කඩ හෝ අලුපාට කඩ හෝ නොව පැහැදිලි සුදකින් [8] යුතු පෞද්ගලික විනිමය අනුපාතිකයක් වර්ධනය වීමට ඉඩ

---

7. පුද්ගලික විනිමය ගනුදෙනු නිර්බාධිකරණය කළ යුතුය යන ඉල්ලුමට විරුද්ධ ව සමහරු පහත සඳහන් ප්‍රතිවිරුද්ධ මත ගෙන හැර පාති. ජනතාව සිය මුදල් පරිවර්ත්‍ය වූ මුදල් වර්ග වලින් ළඟ තබා ගැනීමට නැඹුරු වනු ඇති බවත්, වැඩි වැඩියෙන් දේශීය මුදල් විදේශවල තැන්පත් කිරීමට ඉඩ ඇති බවත් මෙහි දී පෙන්වා දෙනු ලැබේ. මෙය සාවද්‍ය තර්කයකි. එවැනි තර්ක අදාළ කරුණු උඩු - යටිකුරු කර දැක්වීමට සමත් වේ. ජනතාව තමා සතුව ඇති දේශීය මුදල් විදේශීය මුදලකට පරිවර්තනය කිරීමට යොමු වන්නේ එම මුදලේ ක්‍රය ශක්තිය අඩු වේගන යතොත් පමණි. එවැනි අවස්ථාවක මිනිස්සු සිය ධනය, වටිනාකම හැකිතාක් ස්ථාවරව පවත්නා මාධ්‍යයක් ඇසුරින්, තබා ගැනීමට පෙළඹෙති. ඒ අනුව ස්ථිර දේපොළ, කලා කෘතීන්, වටිනා ලෝහ, දෘඪ ව්‍යවහාර මුදල් වර්ග යනාදිය මිල දී ගැනීමට මුදල් යෙදවෙනු ඇත. කිසිම පරිපාලන රෙගුලාසියකින් මෙම ප්‍රශ්නයට විසඳුම් ලද නොහේ. දේශීය මුදලේ ක්‍රය ශක්තිය ස්ථාවරව තබා ගැනීමය මීට ඇති එකම විසඳුම. මේ ප්‍රශ්නය 2 වන පරිච්ඡේදයේ දී වැඩිපුර සාකච්ඡා වනු ඇත.

   දේශීය මුදල් විදේශ කරා ඇදී යාමේ ප්‍රශ්නය ජනයා රටින් පිටට සංක්‍රමණය වී යාමට සම්බන්ධ වී පැවතිය හැක. මෙලෙස මුදල් පිට ගෙන යාමට කෙනකු මහන්සි වනු ඇත්තේ එය තහනම් කර ඇත්නම් ය. දේශ සීමා විවෘත වෙතොත්, ඒ හරහා ගමනාගමනය නිර්බාධී වෙතොත්, බහුතරය රටේ නැවතී සිටීමට තීරණය කරනු නො අනුමානය. හැම හංගේරියා-නුවකුට ම තම දෘඪ ව්‍යවහාර මුදල් වර්ග රටින් පිටට ගෙන යාමට හෝ රට තුළට ගෙන ඒමට නිදහස ඇත්නම්, පෞද්ගලික වෙළෙඳ පොළෙහි තම මුදල් හුවමාරුවට ඔහුට නිදහස ඇත්නම්, තම මුදල් විදේශවල තබා ගැනීමට විශේෂ හේතු සාධකයක් ඔහු නොදකිනු ඇත.

8. යෝජිත වැඩ පිළිවෙළ යටතේ, රාජ්‍ය බැංකු පද්ධතිය ෆොරින්ට්වල පරිවර්ත්‍යතාවට ඉඩකඩ නොසැලසුවහොත් එකිනෙකින් වෙනස් නීත්‍යනුකූල විනිමය අනුපාතික දෙකක් රටේ සමාන්තරව පැවතීම වැළකිය නොහැකිය.

   මින් පළමුවැන්න **පැබෑ වෙළෙඳ පොළ අනුපාතිකය** මේ යැයි පෙන්නුම් කරන පෞද්ගලික විනිමය අනුපාතිකයයි. එය දෘඪ විදේශීය මුදල් ගැනුම්කරුවන් හා විකුණුම් කරුවන් අතර සම්මුති මගින් බිහි වන එකකි. දෙවැන්න, වෙළෙඳ පොළේ බල පෑමෙන් තොරව, රාජ්‍ය **පරිපාලන බලයෙන්**, ඒක පාර්ශික ව නියම කෙරෙන නිල විනිමය අනුපාතිකයයි. රටක විනිමය අනුපාතික දෙකක් පැවතීමේ අමුතු විශේෂයක් නැත. දැනටමත් මහා පරිමාණයෙන් සිදු වන කලු හා අලු පාට විනිමය ගනුදෙනු තුළින් බිහිව ඇති පෞද්ගලික අනුපාතිකයක් රටේ පවතී. ද්විත්ව මිල පද්ධතියක් හංගේරියානු ආර්ථිකයේ අස්සක් මුල්ලක් නැර පැතිර තිබේ. රාජ්‍ය අංශ නිල

හැරීමයි. වෙනත් වචනවලින් කිවහොත්, පෞද්ගලික වෙළෙඳ පොළේ, ෆොරින්ට් මුදලට ද පරිවර්ත්‍ය මුදලක් වීමට අවකාශ සැලසිය යුතුය. ෆොරින්ට් මුදලේ හුවමාරු අගය නිලධාරීන් විසින් තීරණය වන්නක් නොවිය යුතුය. සැබෑ වෙළෙඳ පොළ තත්ත්වයන් යටතේ විදේශීය පරිවර්ත්‍ය මුදල්වල අගය ෆොරින්ට්වලින් තීරණය වීමට ඉඩ හැරිය යුතුය. හංගේරියානු පුරවැසියකු තමන්ගේම මුදලින් ඕස්ට්‍රියානු සිලිමට හෝ ඇමෙරිකානු ඩොලරයට හෝ ගෙවීමට සුදානම් ප්‍රමාණය, එම මුදල් වර්ගවල විනිමය අගය වනු ඇත. මෙහි දී බුඩාපෙස්ට්හි දී වුව, වියෙනාවේදී වුව, සිලිම ඇසුරින් ෆොරින්ට්හි වටිනාකම, (අදාළ ගනුදෙනු පිරිවැය නොතකා හැරි කල) එක සමාන අගයක් ගනු ඇත.

කෙසේ වුව ද, පෞද්ගලික විදේශීය විනිමය සංසරණය නීත්‍යානුකූල කළ පමණින්, විනිමය අනුපාතිකය පිළිබඳ මූලික ගැටළු විසඳේ යයි බලාපොරොත්තු තැබිය නොහැක. ඒ සම්බන්ධයෙන් පරිපූර්ණ වූ ද, විශ්වාසදායක වූ ද විසඳුමක් ලැබෙන්නේ, රාජ්‍ය බැංකු පද්ධතිය මගින්, ඒකීය විනිමය අනුපාතිකයක් සමඟ, විශ්ව සාධාරණ විනිමය පරිවර්ත්‍යතාවක් සහතික කර දුනහොත් පමණි. මීට ඉහත දී සඳහන් කළාක් මෙන්, මේ සම්බන්ධ වැඩිදුර සාකච්ඡාවක් 2.5 කොටසෙහි දී සිදු කෙරේ. විදේශ විනිමය ගනුදෙනු නිර්බාධීකරණය පෞද්ගලික අංශය සතු මූලික ආර්ථික අයිතිවාසිකමක්ය යන අදහසිනි, මේ අවස්ථාවේ දී මා ඒ දෙස බැලුවේ.

අප විසින් මෙතෙක් සාකච්ඡා කරන ලද නිදහස පිළිබඳ අවශ්‍යතා, රජය පුරවැසියන්ට අනුකම්පාවෙන් දෙන තිළිණයක් ලෙස නොව, කාලාන්තරයක් මුළුල්ලේ ඔවුනට අහිමි කරන ලද ප්‍රජා අයිතියක් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස සැලකිය යුතුය. පසුගිය කාලය තුළ ඇති කරන ලද ප්‍රතිසංස්කරණ මුල් කර ගෙන, හංගේරියානු පුරවැසියන්හට යම් ප්‍රමාණයක ආර්ථික නිදහසක් භුක්ති විඳීමට ඉඩ ලැබුණු බව සැබැවි. එහෙත් තවමත් ඉඩකඩ දී ඇති අවස්ථා ප්‍රමාණය සීමාසහිතය. මෙවැනි සීමාසහිත ආර්ථික නිදහස වෙනුවට, අද ඉක්මනින්ම අවශ්‍ය වී තිබෙන්නේ අව්‍යාජ නිර්බාධීකරණයකි.[9]

වශයෙන් අය කරන මිලට අමතරව, පෞද්ගලික ආර්ථික ක්ෂේත්‍රයේ විධිමත් හා අවිධිමත් අංශවල පෞද්ගලික මිල ගණන් ඇත. මා යෝජනා කරන්නේ, මෙම පවතින යථාර්ථය පිළිගනිමින් පෞද්ගලික මිල ගණන් නීත්‍යානුකූල කළ යුතු බවයි. එවිට නීති විරෝධී ලෙස කටයුතු කිරීමේ අවදානමක් නොමැති බැවින් විනිමය අනුපාතිකය ද ඇතුළු, පෞද්ගලික මිල ගණන් පහත වැටීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ.

9. ලොව ධනවාදී රටවල පවා 1 වන නිර්බාධීකරණ අවශ්‍යතාව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉටු වී නැති බව මමෙ දනිමි. නිදහස සීමා කරන නීති රීති පනවන හෝ ඒවා ආරක්ෂා කරන අය, බටහිර හා ඇත පෙරදිග රටවල අත් දැකිමි ගෙන හැර පාති.

මේ තර්ක මගේ අදහසේ හැටියට, දෙ ආකාරයකින් සදොස් වේ. පළමුවැන්න ඓතිහාසික පැත්තයි. වත්මන් ධනවාදී රටවල් ඒවායේ වත්මන් අවධියට අවතීර්ණ වී ඇත්තේ දිගු ඓතිහාසික පරිණාමයකින් පසුව ය. ඊට හාත්පසින්ම වෙනස් වන තත්ත්වයක් අද හංගේරියාවේ පවතී. පෞද්ගලික අංශය සහමුලින් ම විනාශ කර දමන ලද තත්ත්වයක සිට හංගේරියාව ධනේශ්වර ගමන් මගක යාම ආරම්භ කළා පමණි. ධනේශ්වර ක්‍රමයේ ආරම්භයේ පවතින රටක හා එහි පසු අවධියේ පවතින රටක රජය සතු භූමිකාව එකිනෙකට වෙනස් වන බව සිත්හි තබා ගත යුතුය.

දෙවැනි සාධකය, සමකාලීන ධනවාදය ඇගයීම හා බැඳී පවතී. ප්‍රශ්නය මෙයයි. සංවර්ධිත ධනවාදී රටවල පවත්නා කාලීන ව්‍යවහාරයන් හා භාවිතයන් අප අනුගමනය කළ යුතු ඒවා ලෙස සැලකිය යුත්තේ ඇයි? අද මෙම රටවල ප්‍රචලිත පුරුදු විවිධ දෘෂ්ටි කෝණ වලින් දෝෂ දර්ශනයට ලක් වෙමින් පවතී. මේ සමහර විවේචන සමඟ මම ද එකඟ වෙමි. සමහර ධනවාදී

2. පෞද්ගලික ගිවිසුම් නීතියෙන් සහතික කළ යුතුය.

පෞද්ගලික ගිවිසුමක් කඩ කැරුණු විටක දී, ඉන් අලාභ වූ පුරවැසියාට එහි ලා උසාවියක නඩු පැවරීමට හැකි විය යුතු අතර, ගිවිසුම් සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කළ හැකි ඒවා විය යුතුය. මේ සඳහා ප්‍රමාණවත් අධිකරණ යන්ත්‍රණයක්, සෑහෙන නීතිඥයින් පිරිසක්, නවීන හා විස්තර සහිත නීති පද්ධතියක් අවශ්‍ය වේ. එම 'නීතිමය පාදක ව්‍යුහය' නඩත්තු කිරීමේ වියදම් පෞද්ගලික අංශය විසින් දරනු ලැබිය යුතුය. එනම් නීතිඥයා හා ඔහු ගේ ගනුදෙනු කරු අතර ඇති කර ගනු ලබන එකඟතාව මත, සිවිල් උසාවි පිරිවැය දැරීම පුද්ගලික අංශය සතු වගකීමක් වන බවය. අනෙක් අතට බලන කල, පෞද්ගලික ගිවිසුමක් යටතේ කෙනකුගේ අයිතිවාසිකම් නීතිය මඟින් රැක ගත නොහැකි ය යන විශ්වාසක් ඇති වන පරිදි, ඒ අනුව ගිවිසුමේ කොටස්කරුවන් ගිවිසුම් ගණන් නොගන්නා තත්ත්වයට පත් වන පරිදි පෞද්ගලික නඩු දිග්ගැස්සෙන්නට ඉඩ නො හැරිය යුතුය.

මෙහි දී රජයේ කාර්ය භාරය කුමක් ද යනුවෙන්, නිතර නිතර අසනු ලබන ප්‍රශ්නයට දිය හැකි එක් පිළිතුරක් නම්, හැකිතාක් දුරට පුරවැසියන් ගේ කටයුතු වලට ඇඟිලි ගසන්නේ නැතිව, ගිවිසුමකින් බැඳෙන පක්ෂ අතර සිදුවන ගැටීම්වලදී සාධාරණය ඉටු කිරීමේ කාර්යභාරය එහි වගකීමක් වන බවයි.

මින් ඉදිරියට විස්තර වන සාධක හතරටම පදනම් වන්නේ පුද්ගල ඉතිරි කිරීම් හා ආයෝජනයන් සඳහා ප්‍රෝත්සාහක හෙවත් දිරි දීම් අවශ්‍යම ය යන කරුණය. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය වන්නේ , පෞද්ගලික ව්‍යවසායකයන් ලවා සිය කැමැත්තෙන්ම ඉතිරි කරවීමටත්, ආයෝජනය කරවීමටත් සුදුසු පසුබිම සැකසීම මිස ඒ සඳහා ඔවුන් කැමැති කරවා ගැනීමට යත්න දැරීම නොවේ.

3. පුද්ගල දේපොළ පිළිබඳ පූර්ණ ආරක්ෂාව අවධාරණයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය.

පුද්ගල දේපොළ ආරක්ෂාව සහතික කර දීමේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම මේ පොතේ කාර්යය නොවේ. ස්ථිර වශයෙන්ම, පුද්ගලික දේපොළ පිළිබඳ සහතිකයක්, පක්ෂ ප්‍රතිපත්ති, නීති හා රාජ්‍ය නායක ප්‍රකාශන තුළ අන්තර්ගත විය යුතුය.

දේපොළ රාජසන්තක කැරුණු තැන්වල එම ජනසතු කිරීම් අවලංගු කර ලීම දැනට ඇති වැදගත් ම කාර්යය නොවේ. යම් යම් නිශ්චිත වැදගත් අවස්ථාවක දී, නිදසුන් ලෙස ගොවි ඉඩම් සම්බන්ධ අවස්ථාවලදී, එසේ කිරීම

රටවල රාජ්‍ය තන්ත්‍රය පුද්ගල ජීවිත හා පෞද්ගලික ආර්ථික කටයුතු කෙරෙහි සීමාව ඉක්මවා මැදිහත් වන බැව් පෙනේ. ඇතැම් සමකාලීන ධනවාදී රටවල විදේශ විනිමය ගනුදෙනු නිදහසේ සිදු වන අතර, තවත් තැනෙක ඊට බාධක පනවා තිබේ.

මේ සම්බන්ධයෙන් විදෙස්වලින් නිදසුන් සොයන්නෝ, පළමුව, තමන් කුමන රටක ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සුදානම් දැයි නිශ්චිතව ම තීරණය කළ යුත්තාහ. තමන් හංගේරියාව ධනවාදී මඟකට යොමු කිරීමට පෙරමුණ ගන්නත් වෙමුයි පවසන අය, සිහි තබා ගත යුත්තේ, සාමාන්‍ය වශයෙන් 'ධනවාදය' ගැන කථා කිරීමට බැරි බවය. ඒ අය, නිර්බාධිකරණයත් නිලධාරී බලපෑමුත් අතර කවර සංකලනයක් ඇති කර ගැනීමට තමන්ට අවශ්‍ය ද යන්න වඩා නියත වශයෙන් ප්‍රකාශ කළ යුතුය.

වැදගත් බව සැබෑය. එහෙත් අනාගත ආයෝජන දිරි ගැන්වීම සඳහා ඉතාම වැදගත් අවශ්‍යතාව වනුයේ, මින් ඉදිරියට පුද්ගල දේපොළ රාජසන්තක නොවන බව, මහජනයාට ඒත්තු යන අන්දමින්, ප්‍රකාශනයට පත් කිරීම ය.

4. බදු ක්‍රමය පෞද්ගලික ආයෝජන සීමා කරන සුළු නොවිය යුතුය.

බදු පද්ධතිය පොතේ වෙනත් තැනෙක සලකා බැලෙනු ඇත. මේ අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් කාරණා කිහිපයක් ගැන පමණක් සඳහන් කරනු කැමැත්තෙමි. රටේ සමස්ත ආයෝජනයේ ප්‍රතිශතයක් හැටියට පුද්ගල ආයෝජනය ඉහළ යා යුතු යයි තර්ක කරන අය, රටේ සමස්ත ඉතිරි කිරීම්වලින් ද වැඩි වන ප්‍රතිශතයක් පුද්ගල ඉතිරි කිරීම්වලින් සමන්විත විය යුතු බවත් පිළිගැනීමට සූදානම් විය යුතුය. පෞද්ගලික ඉතුරු කිරීම් වැඩි විය හැක්කේ පෞද්ගලික ආදායම වැඩි වීමට අනුකූලවය. මෙයින් අදහස් වන්නේ මිනිසුනට තමන් කැමති පමණින් ආදායම් උපයා ගැනීමට ඉඩ ප්‍රස්තා සලසා දිය යුතු බවය. නවීන ලෝකයේ පවතින සාර්ථක මහා පරිමාණ ව්‍යාපාර තරමට පෞද්ගලික නිෂ්පාදනය වැඩි කිරීම හා නවීකරණය කිරීම සඳහා පෞද්ගලික ධන සමුච්චය විශාල වශයෙන් වැඩි විය යුතුය.

මේ සම්බන්ධයෙන් දේශපාලනඥයින් හා අර්ථශාස්ත්‍රඥයින් දරන අදහස් තුළ අමුතුම ව්‍යාකූලතාවක් ඇත. එක් අතකින්, රජයේ අය වැය දළ ජාතික නිෂ්පාදිතයේ ඉහළ ප්‍රතිශතයක් ගැනීම ගැනත්, අධික රාජ්‍ය බලයක් පැවතීම ගැනත් ඔවුහු මැසිවිලි නඟති. අනෙක් අතින්, පෞද්ගලික අංශය අත අධික ලෙස ආදායම් ගොඩ ගැසීම ගැනත් ඔවුහු දොස් නඟති. කෙනකුට මේ දෙපැත්තට ම තර්ක කළ නොහැක. අප දෙකින් එකක් තෝරා ගත යුතුය. අප විවේචනය කර බැහැර කළ යුත්තේ කුමක් ද?

පසුගිය ඡේද තුළ, අවධාරණයෙන්ම අනුක්‍රමික පුද්ගලික ආදායම් බද්දට එරෙහිව යන තර්ක අන්තර්ගත විය. මෙවැන්නක අවශ්‍යතාව යම් දිනක හංගේරියාවට දැනෙනු ඇත. එදිනට අනාගත නිදහස් පාර්ලිමේන්තුවක් ස්ව කැමැත්තෙන්ම එවැනි බදු ක්‍රමයක් නීතිගත කරනු විය හැක. එහෙත් අද නම්, එය හංගේරියාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කාරණයක් නොවේ.

5. ණය මගින් පෞද්ගලික ආයෝජනයත්, පෞද්ගලික ප්‍රාග්ධනයේ ගොඩ නැගීම හා වර්ධනයත් දිරි ගැන්විය යුතුය.

රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යන දෙකට 'සම අවස්ථා' දිය යුතු යයි නඟන හඬ මා දකින්නේ පුහු ඝෝෂාවක් ලෙසිනි. 1949 දේපොළ ජනසතුවෙන් අනතුරුව මෙම අංශ දෙකට වර්ධනය වීමට ලැබුණු අවස්ථා සමාන නොවීය. විවිධ අංශ අද පවතින්නේ එක සමාන මට්ටමක නොවේ. රාජ්‍ය අංශය තුළ විශාල මූල ධනයක් එක්රැස් වී ඇත. රාජ්‍ය බැංකු පද්ධතිය, නිලධාරී තන්ත්‍රය හා රජයේ ව්‍යාපාර එකිනෙකට බැඳී කටයුතු කරයි. එසේම කිරීමට ඇති දේ කර ගැනීම සඳහා කවර නුල් සූත්තර අවශ්‍ය ද යන්න දන්නේත් රාජ්‍ය අංශයයි. තත්ත්වය මෙසේ පවතිද්දී, අති විශාල දේශපාලන, සමාජයීය හා ආර්ථික බලයක් හිමි රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් අතර සමාන අවස්ථා පැවැතීමක් කෙසේ නම් අපේක්ෂා කළ හැකි ද?

ආර්ථිකයේ මුළු ණය සැපයුමෙන් පෞද්ගලික අංශයට වෙන් කළ යුතු ණය ප්‍රමාණය කෙතෙක් දැයි, රජයේ වාර්ෂික සැලැස්මකට අනුව ව්‍යවස්ථාදායකයෙන් තීරණය විය යුතුය. විවිධාකාර ණය වර්ග එක එකක් තුළ පෞද්ගලික අංශයට වෙන් වන ප්‍රමාණය නියම විය යුතුය. නිදසුන් ලෙස, ඉදිරි මුදල් වර්ෂය තුළ රාජ්‍ය බැංකු සපයන මුළු ආයෝජන ණය පරිමාවෙන් කිනම් ප්‍රතිශතයක් පෞද්ගලික අංශයට ලැබිය යුතු ද යන්න ඉහත කී ව්‍යවස්ථාදායක තීරණය යටතේ පැහැදිලි ව ප්‍රකාශ කිරීම අවශ්‍යය. තවද, පෞද්ගලික අංශයට වෙන් වූ මෙම ණය ප්‍රමාණයෙන් කොටසක් වඩා බලගතු රාජ්‍ය අංශය විසින් උදුරා ගනු ලැබීම සඳහා දරනු ලැබිය හැකි ප්‍රයත්න ව්‍යවර්ථ කිරීමට මාර්ග යෙදීම අත්‍යවශ්‍යය.[10] මෙවැනි යෝජනාවක් රජය විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබුණහොත් එය, හිස් වචන භාවිතයේ සිට, සැබෑ සංඛ්‍යා ලේඛන පිළිබඳ තත්ත්වයකට මාරුවීමක් වනු ඇත. මෙතෙක් සාකච්ඡා කළ නිදසුන ඇසුරින් ම මෙය තව දුරටත් සලකා බලතොත්, නියත වශයෙන් විසඳිය යුතු ප්‍රශ්නය වනු ඇත්තේ, සමස්ත ණය ප්‍රමාණයෙන් 5%, 25%, 50%, හෝ වෙනත් කවර ප්‍රතිශතයක් පෞද්ගලික අංශයට යොමු කළ යුතු ද යන්නයි.

ඉහත දැක්වුණු 5 වන අවශ්‍යතාව මගින් කියැවෙනුයේ, පෞද්ගලික අංශයට ණය ලබා ගැනීමට ඇති අයිතිය රාජ්‍ය අංශය මගින් පැහැර ගනු ලැබීම වැළැක්විය යුතු බවය. එහෙත් අවිචාරවත් ව ණය බෙදා දිය යුතු බවක් මින් අදහස් කෙරෙන්නේ නැත. ණය මූලාශ්‍ර අතර එකක් පදනම් වනුයේ 1 වන අවශ්‍යතාව මත බව මෙහි දී පාඨකයාට සිහිපත් කළ යුතුය. ණය දෙනු ලබනුයේ පෞද්ගලික අංශයේ එක් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුටය. එම ණය දීමේ දී යෙදෙන කොන්දේසි කොහොමටත් දරදඬු ඒවා වෙයි. දෙනු ලබන ණය නැවත අය කර ගැනීමට නොහැකි විණි නම් මුදල් ණයට දීමට, සිහි කල්පනාව ඇති කිසිවකු ද උනන්දු නොවනු ඇත. රාජ්‍ය බැංකු ද මෙපරිද්දෙන් ම දැඩි ණය කොන්දේසි මත ණය දීම කළ යුතුව ඇත. ඕනෑම ණය පද්ධතියක් තුළ දක්නට ලැබෙන සම්ප්‍රදායික උපකරණ වන සුරැකුම්, උගස්, ඇපකර භාවිත කළ යුතුය. අංක 4 අවශ්‍යතාව යටතේ, පෞද්ගලික අංශයේ සාමාජිකයන්ට ඕනෑ තරම් මුදල් ඉපයීමට නිදහස තිබිය යුතු බැව් දැක්විණ. අප මීට එකතු කළ යුතු දෙයක් ඇත. ණය ගන්නවුන් එම ණය නො ගෙවතොත්, ඔවුන්, තම ආයෝජනයත් නැතිව යාමේ අවදානමට මුහුණ දීමටද සූදානම් විය යුතුය. ණය වෙළෙඳ පොළවල දක්නට ලැබෙන සුප්‍රකට රටාවන් අනුව, විවිධ ණය කොන්දේසි විකාශනය වීමට ඉඩ තිබේ. යම් ව්‍යාපාරික කටයුත්තකට අවශ්‍ය මුදල් සපයන්නකු, ආයෝජකයා සිය පෞද්ගලික මුදලින් ආයෝජනය කරන ප්‍රමාණයට සාපේක්ෂව, ඊට වඩා විශාල ණයක් සැපයීමට සූදනම් වනු ඇත්තේ, ණය ගන්නා, තම මුළු පෞද්ගලික වත්කමේ ම ප්‍රමාණයෙන් (අසීමිත වගකීම) තමන් ගන්නා ණය ආපසු ගෙවීමට ගිවිස ගන්නේ නම් පමණි. සීමිත වගකීම යටතේ නම් ණය ආපසු ගෙවීමේ සහතිකය ඇත්තේ පෞද්ගලික ආයෝජන ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකිනි. එවිට ණය තුළින් ලබා ගත හැක්කේ මුළු ආයෝජන පිරිවැයෙන් මුලින් කී අවස්ථාවට වඩා අඩු කොටසකි. විශේෂිත වශයෙන් අදාළ වන ණය කොන්දේසි කවරක් වුව ද, මූල්‍ය දුෂ්කරතාවල දී

---

10. බටහිර සාහිත්‍යයේ දක්නට ලැබෙන 'තෙරපා හැරීම්' ("crowding out") සංකල්පයට සමාන සිද්ධියකි මේ.

තමන් බංකොලොත් භාවයට වැටෙනු ඇතැයි යන බියක් පෞද්ගලික ව්‍යවසායකයන් තුළ තිබිය යුතුය. වෙනත් වචනවලින් කිවහොත්, පෞද්ගලික අංශය සත්‍ය වශයෙන්ම දැඩි අයවැය සංරෝධකවලට මුහුණ දිය යුතුය. අධි ආරක්ෂණය හෙවත් වීදුරු බඳුනක සිටිමින් මෙන් ක්‍රියා කිරීමට පහසු තත්ත්වයන් පැවතීම පෞද්ගලික ව්‍යාපාර තුළ ද, රජයේ ව්‍යාපාර තුළ මෙන් ම දුර්වල ක්‍රියාකාරිත්වයකට තුඩු දෙනු ඇත.

මගේ අදහස අනුව 'ව්‍යවසායකයා' යන යෙදුම භාවිත කළ යුත්තේ සීමාකාරී තේරුමකිනි. රජයේ මුදල් පරිහරණය කරන්නන් හෝ පාඩුව විඳ දරා ගැනීම රජයෙන් අපේක්ෂා කරන්නන් එනමින් හැඳින්වීම වැරදිය; අලාභයක දී තම පෞද්ගලික ධනය පරදුවට තබා ව්‍යාපාර කරන්නකුටම පමණි, 'ව්‍යවසායක' යන යෙදුම භාවිත කළ හැක්කේ.

6. පෞද්ගලික අංශය කෙරෙහි සමාජ ගෞරවය හා සැලකිල්ල වර්ධනය කළ යුතුය.

නොකළ යුතු දේ හැටියට මෙම කරුණ ප්‍රකාශ කළහොත්, ඉන් ඇහවෙන්නේ, පෞද්ගලික අංශයට විරුද්ධ පහරදීම්, ජනතා උසි ගැන්වීම් ආදිය සුළුවෙන් හෝ දැඩි ලෙස හෝ කිරීම නැවැත්විය යුතුය යන්නයි. තම ගෙවතු වගා කරන ගොවීහුද, ගෘහස්ත කාර්මිකයෝ ද අද සමාජ ගෞරවය ලබති. විරෝධතා එල්ල වී ඇත්තේ මොවුනට එරෙහිව නොවේ; කඩ හිමියන් හා පුද්ගලික එළවළු වෙළෙන්දන් ආදීන්ට එරෙහිවය. සාර්ථක ව්‍යාපාරිකයින් ඊර්ෂ්‍යා සහගතව මිනී මෝරුන් ලෙස, ආත්ම ලාභය සොයන්නන් හෝ කෙරාටිකයන් ලෙස, හංවඩු ගැසීම නවතා දැමීමට කාලය එළඹ ඇත. මෙවැනි ධනේශ්වර විරෝධී ආකල්ප වෙළෙඳ පොළ ආර්ථිකයක හරයට විරුද්ධය. යම් ගනුදෙනුවකට පිවිසෙන්නා අඩු මිලට තමන්ට අවශ්‍ය දේ ලබා ගැනීමත්, විකුණුම් කරුවකු වැඩි මිලට විකිණීමත් චෝදනා ලැබීමට සුදුසු වැරදි නොවේ. යම් තැරැව්කරුවකු විකිණීමට ඉදිරිපත් කරන භාණ්ඩයකින් ප්‍රයෝජනයක් ඇත්නම්, ඉල්ලන මිල ගෙවීමට ගැනුම් කරුවා සූදානම් නම්, එම තැරැව්කරුගේ කටයුතු සමාජයට හිතකරය.[11] වැඩි මිලට ගෙන අඩු මිලට විකිණීම වැරදි ව්‍යාපාරික ක්‍රමයකි. රජය විසින් මෙය කරනු ලැබීම නිසා ඇති වූ භාතිය රටේ ජනතාව හොඳාකාරව දනිති. ඒ සඳහා ජාතියම වන්දි ගෙවා ඇත. දක්ෂ ව්‍යාපාරිකයෝ ජාතියේ ගෞරව සැලකිල්ලට මිස ද්වේෂයට පාත්‍ර විය යුතු නොවෙති.

පෞද්ගලික අංශයේ වර්ධනයට ඉවහල් වන මූලික අවශ්‍යතා හය ඉහතින් සාකච්ඡා කෙළෙමු. මෙම කරුණු හයට තවත් කරුණු කීපයක් එකතු කිරීම මෙහි දී සුදුසු යයි හඟිමි.

අපට වඩාත්ම අවශ්‍ය වන්නේ පුද්ගලයන් හැටියට හඳුනා ගත හැකි ව්‍යවසායකයින් ද, පෞද්ගලික බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් ද යන්න පිළිබඳව මේ දිනවල විවාදයක් පවතී. මෙහි දී මම පූර්ණ වශයෙන් පෞද්ගලික අංශයට

---

11. යම් යම් නිශ්චිත අවස්ථාවලදී මෙම සිද්ධාන්තයට පරිබාහිරව යන තැන් තිබීමට පුළුවන. යුද්ධ අවස්ථාවකදී හෝ සාගතයකදී හෝ ජන සංඛ්‍යාවෙන් සැම කෙනකුටම ජීවත් විය හැකි වන පරිද්දෙන් මූලික අවශ්‍යතා රාජ්‍ය නිලධාරීන් යොදා සලාක කොට බෙදා හැරීම නිවැරදිය. මෙම කෘතිය එවැනි විශේෂ අවස්ථා පිළිබඳ සැලකිලිමත් නොවේ.

අයත්, එවැනි සමාගම් පිළිබඳ ව පමණක් අදහස් කීපයක් ප්‍රකාශ කරමි. (රජය හෝ ලාභ අපේක්ෂා නොකරන ආයතන සතු ව්‍යාපාර කොටස් ගැන පසුව සාකච්ඡා කෙරේ.)

මේ ප්‍රශ්නයට පිළිතුරු දීමේ දී, මා අවධාරණය කරන්නේ ප්‍රශ්නයේ නීතිමය අංශ නොව එහි සමාජ ආර්ථික අංශ ය. අප අපේක්ෂා කරන සමාජ පරිවර්තනයේ ඉතාම වැදගත් අංශයක් වනුයේ, සමාජයේ ඉහළට නැගීමට වෙර දරන, කාර්ය ශූර, අරපිරිමැසුම්දායී ව්‍යවසායකයින්ගෙන් යුක්ත නව මධ්‍යම පංතියක වර්ධනයයි. මේ අතර වෙළෙඳ පොළේ සිදු වන ස්වභාවික වරණය තුළින්[12] කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින් අතරින්, රටේ ආර්ථික ප්‍රගතියේ පුරෝගාමීන් ද, විශාල පරිමාණ ව්‍යවසායයන්ගේ ආරම්භකයන් ද බිහි වනු ඇත. ඉන් අනතුරුව, මෙම ව්‍යවසායකත්වය වටා, තමන්ම නව සංවිධාන බිහි කිරීමට ඉදිරිපත් නොවන, එහෙත් ව්‍යාපාර කොටස් මිලට ගනිමින් තම මුදල් රටේ ආර්ථිකය තුළ ආයෝජනය කිරීමට පෙළඹෙන ජනතාවක් වර්ධනය වනු ඇත.

සමාජවාදී රටවල රාජ්‍ය දේපොළ සම්බන්ධයෙන් දක්නට ලැබෙන බරපතලම ඌනතාව දේපොළ අයිතිය අපෞද්ගලික තත්ත්වයක පැවතීමය. රාජ්‍ය දේපොළ හැමෝට ම අයිති යැයි කියනු ලැබෙතත් ඒ ඇත්තෙන්ම කාටවත් අයිති නැත. හංගේරියාවේ අද සිදු වී ගෙන යන විපර්යාසය මධ්‍යයේ දේපොළ පිළිබඳ මේ පරස්පර විරෝධතාව ඉස්මතු කර දැක්වීම වටී. මා දකින්නට කැමැත්තේ පුද්ගලයින් සිය ධනය ම පරදුවට තබා කටයුතු කිරීමත්, එලෙස කරන දේ අසාර්ථක වූ විට, ඔවුන් සැබැවින්ම අලාභ විඳ දරා ගැනීමත් ය. යම් ව්‍යවසායකයකු තම ව්‍යාපාරයේ මුදල් යෙදවීමට වෙනත් අය කැමැති කරවා ගැනීමට සමත් වෙතොත් ඊට ඉඩ තිබිය යුතුය. එසේ ම නිහඬ කොටස් කරුවන් සිය ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමට ද ඔහුට නිදහස තිබීම වැදගත්ය. ව්‍යාපාරවල මුදල් යොදවන අය වෙතොත්, ඔවුන් එම ව්‍යාපාර කවුරුන් සතු ඒවා දැයි පරීක්ෂාකාරී වනු ඇත. කෙටි කාලයේ දී මෙවැනි නිහඬ කොටස්කරුවනට ව්‍යාපාර කොටස් මිලට ගැනීමට හා විකිණීමට උදව් කරනු වස් පවතිනු ඇත්තේ පෞද්ගලික අතරමැදි ආයතන දෙක තුනක් පමණි. එහෙත් මේ තත්ත්වය වර්ධනය වී, වැඩි කලක් නොගොස්, අව්‍යාජ පෞද්ගලික කොටස් ද, නියම පෞද්ගලික බද්ධ ව්‍යාපාර සමාගම් හා සැබෑ පෞද්ගලික ව්‍යාපාර වස්තු වෙළෙඳ පොළවල් ද පැන නැගෙනු ඇත.

මේ සියලු වෙනස්කම් සිදු වනු ඇත්තේ, පෞද්ගලික දේපොළ පිළිබඳ ඓන්ද්‍රීය වූ ඓතිහාසික වර්ධනයට අනුකූලව ය. මෙම ඓතිහාසික වර්ධනයේ පියවරවල් පන්නා ගමන් කිරීම නුසුදුසු ක්‍රියාවක් සේම, කළ නොහැක්කක් ද වේ. උචිත පියවරවල් මඟින් එම ගමන් මග කෙටි කර ගැනීමට නම් පුළුවන. මෙම සිදුවීම් මාලාව සමමිතික නොවේ. පෞද්ගලික අංශය රාජ්‍ය ආඥා මඟින්

---

12. ධනවාදී හිඟිපෙත්තට නැග ඇති, අතිශයින් සංකේන්ද්‍රිත කර්මාන්ත ව්‍යුහයන් ඇති රටවල පවා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ක්‍රියාකාරී වෙමින්, රටේ දළ ජාතික නිෂ්පාදිතයට ප්‍රමාණවත් ප්‍රතිශතයක් එක් කරමින් සිටී. වෙළෙඳ පොළ ආර්ථිකයක පැවැත්මට ඒවා ද අවශ්‍ය බැව් ඉන් සනාථ වේ. D.J. Storey (ed.) (1983) කියවන්න. මේ කෘතිය සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් ගණනාවක කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්ගේ අනුපාත පරීක්ෂා කරයි. පසුගිය දශක කීපය තුළ හංගේරියාවේ තිබූ ජනසතු කිරීම් හා කෘත්‍රිම සංකේන්ද්‍රණය කිරීම් නිසා, මෙවැනි සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අහෝසි වී ගියේය.

නැති කර දැමීමට පුළුවන්කම තිබුණාට, එය යළි ගොඩ නැංවීම එලෙස ම කළ නොහැකිය. දශක ගණනාවක් දිග බෙදීමක් ඉතිහාසයේ ඉදිරි ගමන සම්බන්ධයෙන් ඇති කර තිබිණි. පෞද්ගලික අයිතිය, පෞද්ගලික දේපොළ සහ වෙළෙඳ පොළ ආරක්ෂා කර ලීමට තුඩු දෙමින් පැවැති ප්‍රජා සිද්ධාන්ත හා සාරධර්ම පද්ධතිය මෙරට පරම්පරා ගණනාවකට දැන් අමතක වී ඇත. මෙම පසුබිම නො තකා හළ නොහේ. ලෝකයේ ප්‍රධාන ධනවාදී රටවල පවතින ඉතාම දියුණු නීති හා ව්‍යාපාරික ක්‍රම අනුකරණය කිරීමෙන් පමණක් ඒවා සාමාන්‍ය වශයෙන් භාවිත වන තත්ත්වයක් ඇති කළ නොහැක.[13] අප්‍රිකානු ශ්‍රෝත්‍ර හා ආසියාවේ නොදියුණු ගම් කෙළින්ම කොමියුනිස්ට් ක්‍රමයකට පරිවර්තනය කිරීමට ගිය තැන්වල ද සිදු වී ඇත්තේ එවැන්නකි. එ වැනි 'මහා පිම්මක්' පැනීමට නැවත ප්‍රයත්න දැරීම නුසුදුසුය.

කාලීන දේශපාලන සංවාද තුළින් අද විවාදයට ලක් වන කරුණක් තිබේ. එනම්, හංගේරියාව වැළඳ ගත යුත්තේ 19 වන සිය වසේ වෙළෙඳ පොළ ආර්ථික රටාව ද, එසේ නැතහොත් 20 වන සිය වසේ එම රටාව ද යන්නයි. ඇත්ත වශයෙන්ම, අපගේ අවශ්‍යතාව නම් දෙවැන්න බව අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙත් එක් පසෙකින් අපගේ වුවමනාවන් ද, අනික් පසින් අපේ සංවර්ධනයේ වත්මන් අවධිය හා සාපේක්ෂ ව බලන කල, සිදුවන වෙනස්කම් පිළිබඳව යථාර්ථවාදී ලෙස අපේක්ෂා කළ හැකි වේගය ද අතර විශාල පරතරයක් ඇත. හංගේරියාවේ පෞද්ගලික අංශයේ වර්තමාන තත්ත්වය දෙසට දැන් අපි හැරෙමු. ව්‍යතිරේකයන් කිහිපයක් හැරුණු කල, අද තත්ත්වය බොහෝ සෙයින් සමාන කළ හැක්කේ දහනව වන සිය වස අග බෝල්කන් රටවල හෝ සංවර්ධනය වෙමින් පවතින රටවල දැන් හෝ පවත්නා තත්ත්වයටයි. ඩෙන්මාර්කයේ හෝ අමෙරිකා එක්සත් ජනපදයේ හෝ පෞද්ගලික ගොවීන් භාවිත කරන මෙවලම් හා ගොඩනැගිලි හංගේරියාවේ ගොවීන් සතු එවැනි දේ සමඟ සසඳන විට පෙනෙන වෙනස අතිවිශාලය. හංගේරියානු ගොවියාට ට්‍රක් රථ, ට්‍රැක්ටර් හෝ ධාන්‍ය ගබඩා නැත. එපමණක් ද නොව ඔහුට දුරකථනයකට හිමිකම් කීම සිහිනෙන් පවා සිතිය නොහැකි දෙයකි. අප අවට බැලුවොත් දක්නට ලැබෙන්නේ කුමක්ද? කාර්මික ශිල්පීන් හිර වී වැඩ කරන කම්මල්, පදික වේදිකාවේ ගරා වැටුණු කඩපිල්, අසංවිධිත කඩ සාප්පු යනාදියයි. පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතුවලින් සෑහෙන කොටසක් තවමත් කෙරෙන්නේ අර්ධ වශයෙන් පමණක් නීත්‍යානුකූලවය. ඒවා කෙරෙන්නේ අසම්පූර්ණ යන්ත්‍ර උපකරණ හා රාජ්‍ය අංශයෙන් ණයට ගන්නා ලද හෝ සොරා ගන්නා ලද මෙවලම් යොදා ගනිමිනි. බොහෝ අංශයන්ගෙන් හංගේරියාවේ පෞද්ගලික අංශය අද පවත්නේ, 19 වන සියවස අග භාගයේ පැවැති තත්ත්වයට ද වඩා පහළ මට්ටමකය. හංගේරියානු පෞද්ගලික අංශය එය දැනට පවත්නා ඌන සංවර්ධිත, දුගී දුප්පත්, කැඩී බිඳී ගිය ස්වභාවයෙන් මිදී, 20 වන සියවසෙහි බටහිර ධනවාදී රටවල පෞද්ගලික අංශය හා සමතැන් ගැනීම යනු රජයට දින නියම කොට කළ හැකි දෙයක් නොවේ. මේ තත්වය ලබා ගනු පිණිස සංවර්ධනය වේගවත් කිරීම

---

13. මින් අදහස් කරන්නේ නූතන ධනවාදී රටවල අත්දැකීම් අප අමතක කළ යුතු බවක් නොවේ. අපගේ පසුබිමට ගැළපෙන ඕනෑම අත්දැකීමකින් පාඩම් ඉගෙන ගැනීමේ වරදක් නැත. නූතන ධනවාදයෙන් ලබා ගත හැකි දේ තම අත්දැකීම් බවට පත් කොට නොගෙන, දුක් විඳිමින් ධනවාදය අලුතෙන් 'නැවත සොයා ගැනීමට' හංගේරියාව තැත් කරතොත් එය අනුවණ කමකි.

අවශ්‍යය. ඒ සඳහා මූලික වශයෙන් ඉහතින් කියැවුණු සාධක මුදුන් පමුණුවා ගැනීම කළ යුතුය. (රාජ්‍ය දේපොළවලින් කොටසක් පෞද්ගලික අංශයට පවරා දීම වැදගත්ය. මේ කරුණ පිළිබඳව පසුවට සාකච්ඡා කරමු.) ඒ කෙසේ වෙතත් සත්‍යය වනුයේ කලබලේ පිම්මේ යාමට තැතනීම අතාර්කික වන බවය. ඉදිරියෙහි දීර්ඝ කාලයක් යන තුරු පෞද්ගලික අංශයේ විවිධ ව්‍යාපාරික ඒකක, නීතිමය ස්වරූපය අතින් ද, ව්‍යාපාරික ක්‍රම හා තාක්ෂණික හැකියාව යනාදිය අතින් ද ලබා ඇති නවීකරණය අනුව විවිධ මට්ටම්වල පැවතිය හැක. මේවා අතර සමහරක් පසුගිය සියවසට අයත් වන ඒවා වන අතර, අනික්වා ඉතා නවීන තත්ත්වයේ ඒවා වනු ඇත.

මෙම කාරණය තවත් අදහස් දැක්වීමකට තුඩු දෙයි. පෞද්ගලික අංශයේ දියුණුව පියවරෙන් පියවර ඉදිරියට යාමක් තුළින් ජනිත වන්නෙකි. පෞද්ගලික දේපොළ ක්‍රමය සමාජයේ ස්ථාපිත කිරීම ආක්‍රමණ ස්වරූපයකින් කළ නොහැකිය. ධනේශ්වරකරණය දිගු ඓතිහාසික ක්‍රියාදාමයකි.[14] හංගේරියාව තුළ එම වර්ධන මාර්ගයේ දෙකඩ වීමක් 1949 දී සිදු විය. ඉන් පසු එම වර්ධනය ඉතා මන්දගාමී විණි. 1960 ගණන්වලදී සමහර ක්ෂේත්‍රවල ධනේශ්වර වර්ධනය පණ ගැන්විණි. ගෙවතු වගාවන් පෙරට වඩා වැදගත් තැනක් ගත් අතර, නීත්‍යානුකූල පුද්ගලික ආර්ථික ක්‍රියාකාරකම්වලට තිබූ ඉඩකඩ වැඩි වී, රටේ ද්විතීයික ආර්ථිකයක් වර්ධනය විය.[15] අද අපට දක්නට ලැබෙන්නේ මෙම ධනේශ්වරකරණය වේගවත් විය හැකි බවයි. මා මුලින් සඳහන් කළ අවශ්‍යතා හය ක්‍රමානුකූලව ඉෂ්ට වෙතොත්, මේ ගමන වඩා වේගවත් වනු නොඅනුමානය. එහෙත් රටේ සැම අංශයක් තුළම මෙම ක්‍රියාදාමය ඒකාකාරව සිදු වෙතැයි බලාපොරොත්තු තැබිය නොහැකිය. ප්‍රාග්ධන - සූක්ෂමතාව අඩු සේවා අංශයේද, දේශීය හා විදේශීය වෙළෙඳාම් ක්ෂේත්‍රයේ ද ධනවාදී ගමන විශේෂයෙන්ම වේගවත් වන්නට ඉඩ තිබේ. ගමන් මඟ වේගවත් වුවද, නිෂ්පාදිතයෙන් වඩා විශාල කොටස බිහි කළ හැකි තත්ත්වයකට පෞද්ගලික අංශය වැඩි දියුණු වීමට වසර ගණනාවක් ගත විය හැකිය. සත්‍ය වශයෙන් වර්ධනය වූද, නම්‍ය වූද, පරිණත වූද පෞද්ගලික අංශයක් මෙරට බිහි වීමට මීට වඩා බොහෝ සේ දිගු කලක් ගත විය හැක.[16]

මාගේ තර්කනය පෞද්ගලික අංශය, විශේෂයෙන් හංගේරියාවේ පෞද්ගලික අංශය, අභිවාදනය කිරීමය යන හැඟීමක් ඇති වීම වළක්වා ලිය යුතුය. තම ගනුදෙනු කරුවන් රවටමින් හෝ රජයට වංචා කරමින් හෝ වුව, ඉක්මනින් පොහොසත් වීමට අර අඳින කැදර ව්‍යවසායකයින් හංගේරියාවේ ඉන්නා බව මම හොඳාකාරව දනිමි. ඉදිරි වසර ගණනාවක් හෝ දශක කිහිපයක් තිස්සේ ක්‍රියාත්මක වන පරිදි සිය ව්‍යාපාරයන් කල්පනාකාරී ව හා කැප වීමකින් යුතුව

---

14. මේ සම්බන්ධයෙන් Ivan Szelenyi (1986, 1989) වැදගත් අදහස් හා ප්‍රත්‍යක්ෂ මූලික තොරතුරු රැසක් පළ කර තිබේ. Pal Juhasz (1981), Ivan Peto (1989) යන කෘති ද කියවන්න. ෆෙරෙන්ක් එර්දෙයි හා ඉස්ට්වාන් බීබෝ විසින් මේ සම්බන්ධයෙන් කරන ලද පුරෝගාමී අධ්‍යයනයන් ඉස්මතු කර දැක්වීමට කැමැත්තෙමි.

15. Istvan R. Gabor (1979) සහ Istvan R Gabo and Peter Galasi (1981) කියවන්න.

16. හංගේරියාවේ පෞද්ගලික අංශයේ නවීකරණය හා පරිණත වීම රඳා පවත්නේ එරට යුරෝපීය හා ලෝක ධනවාදී රුධිර සංසරණයට බද්ධ වූ තරමටය. බටහිරින් අප වෙත ගලා එන ආර්ථික සංස්කෘතිය, ගුණාත්මක භාණ්ඩවලට ඇති බටහිර පාරිභෝගික ඉල්ලුම, බටහිර හවුල්කරුවන් හා එක්ව කරන නිෂ්පාදන හා ව්‍යාපාර කටයුතුවල ඇති සංවිධාන ශක්තීන් හා විනය මෙරට ආර්ථික ක්‍රියාදාමය කෙරෙහි යහපත් බලපෑම් ජනිත කරනු ඇත.

ගොඩ නගා ගැනීමට වෙහෙසෙනවා වෙනුවට හැකිතාක් කෙටි කාලයකින් පුළුවන් තරම් වැඩි ලාභයක් ඉපයීමට මොවුහු වෙර දරති. මෙවැනි ව්‍යවසායකයෝ ඵලදායී ආයෝජනයන්හි යෙදෙනවා වෙනුවට සුඛෝපභෝගී පුරුදු ගොඩ නැගීමට මුල් තැන දෙති. ඔවුහු තම ගනුදෙනු කරුවන්ට 'ගන්නවා නම් ගන්න, එපා නම් තියන්න' යන ආකාරයේ හැසිරීම් රටා යටතේ, ආකාරුණික වෙනවා පමණක් නොව, උඩඟු ලෙසින් ද හැසිරෙති. මේ හා සමාන හැසිරීම්, භාණ්ඩ හිඟතාවන් හේතු කොට, රාජ්‍ය අංශයේ ආර්ථික කටයුතුවල ද දක්නට තිබිණි. මෙවැනි හැසිරීම් පෞද්ගලික අංශයට විරුද්ධව මහජන මතය පෙළගැස්වීමට මුල් වේ. මේ මහජන මතය අවංක, කාර්යශූර හා අරපිරිමැසුම්දායක ලෙස සිය ව්‍යාපාරවල වර්ධනය සඳහා කටයුතු කරන ව්‍යාපාරිකයන් කෙරෙහි ද එක ලෙසින්ම හානිකරව බලපායි.

ව්‍යාපාරික කටයුතුවලදී, ඇති කර ගත යුතු සාරධර්ම වශයෙන් අවංක භාවය, අරපිරිමැසුම් සහිත භාවය හා දුරදිග බලා ව්‍යාපාරික කටයුතු කිරීම යනාදී මූලධර්ම පතුරුවා හැරීමත්, වැඩිදුර අධ්‍යාපනයත් ඉහත කී මහජන මතය වෙනස් කර ගැනීමට තුඩු දෙනු ඇත. එසේම පෞද්ගලික අංශයේ සංවිධාන ද සදාචාර විරෝධී හැසිරීම් හෙළා දැකීමට උනන්දු විය යුතුය. එපමණින් නොනැවතී, මේ සම්බන්ධයෙන් නීතිමය රෙගුලාසි පැනවීම ද අවශ්‍ය වනු ඇත. තරහකාරිත්වය අහෝසි කිරීමට තුඩු දෙන කාටල, ව්‍යාපාර සන්ධානයන්, ඒකාධිකාරයන් හා අසාධාරණ තරහකාරිත්වය වැළැක්විය යුතුය. මගේ විශ්වාසය මේ සියල්ලට ඉටු කළ හැක්කේ ද්විතීය වූ කාර්ය භාරයක් වන බවය. කැපී පෙනෙන වෙනසක් ඇති කළ හැක්කේ අප මීට පෙර කථා කළ කොන්දේසි හය සපුරා ලීමෙනි. දිගුකාලීන අරමුණු මුල් කර ගෙන ආයෝජනය කරන්නට පෞද්ගලික අංශය පෙළඹෙන්නේ පෞද්ගලික දේපොළවල සුරක්ෂිත භාවය තහවුරු වේ නම් පමණි. සිය ගනුදෙනු කරුවන් ගැන සැලකිල්ලෙන් ක්‍රියා කිරීමට පෞද්ගලික ව්‍යවසායකයින් හැඩ ගැස්වීමට නම්, භාණ්ඩ හිඟතාවන් සහිත ආර්ථිකය නවතා දැමීම (2.8 කොටස බලන්න), තරගය හා විරුද්ධවාදීන් නැගී සිටීම, ව්‍යාපාර අසාර්ථක වේය යන බිය යනාදී ලක්ෂණ අවශ්‍යයෙන්ම තිබිය යුතුය.

මා අවසාන වශයෙන් සාකච්ඡා කිරීමට සූදානම් වන්නේ විදේශීය ප්‍රාග්ධනය හඳුන්වා දීම පිළිබඳවය. මගේ අදහසේ හැටියට, විදේශීය ධන ආයෝජන දිරි ගැන්වීම සඳහා පළමුව කළ යුත්තේ හංගේරියාවේ පෞද්ගලික අංශය සංවර්ධනය කිරීමයි. විශේෂ වූ සහනදායී කොන්දේසි ලබා දීම මගින් පමණක් විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම මගින් හංගේරියාවේ ආයෝජනය විශාල වශයෙන් වැඩි කර ගත හැකි යැයි මම විශ්වාස නො කරමි. හංගේරියානු පෞද්ගලික ව්‍යාපාරවලට නොලැබෙන විධියේ වාසිදායක සහන රැසක් විදේශීය ධනායෝජකයින්ට සලසන රාජ්‍ය ආඥා කිහිපයක්ම ඇත. එහෙත්, මෙවැනි නීති ක්ෂණිකව අහෝසි කළ හැකි බව සිහි බුද්ධියෙන් යුතු ඕනෑම විදේශීය ආයෝජකයකුට පහසුවෙන් අවබෝධ කර ගත හැකිය. විදේශීය ආයෝජකයකු සිය ප්‍රාග්ධනය හංගේරියාවේ ආයෝජනය කරතොත් එසේ කරනු ඇත්තේ තමන් ගේ ම රජය එම ආයෝජන සහතික කරන්නේ නම් පමණි. මෙසේ බලන කල්හි, විදේශීය ආයෝජන රඳා පවතිනු ඇත්තේ අදාළ ප්‍රාග්ධන හිමි අයගේ රටේ රාජ්‍ය ප්‍රතිපත්ති මතය. දැනටමත් පැහැදිලි වී ඇති මෙම තත්ත්වය යටතේ අපට යම් දුරක් ඉදිරියට යා හැකි වතුදු, ඒ, ඒ තරම් දුරක් නම් නොවේ.

තවද, මේ තත්ත්වය යටතේ ක්ෂණික දැනුම් දීමකින් පිට වීමට සූදානම් වූ ද, ක්ෂණික ලාභ බලාපොරොත්තුවෙන් කටයුතු කරන්නා වූ ද, ප්‍රයෝගකාරී ව්‍යාපාරිකයින් මෙ රටට පැමිණීමට ඉඩ තිබේ. කල්පනාකාරී, විදේශීය ආයෝජකයන් නම් පළමුව සොයා බලනු ඇත්තේ හංගේරියාවේ පෞද්ගලික ව්‍යවසායකත්වයට හිමි තත්ත්වය ගැනය. සෑම හංගේරියානු පුරවැසියකුටම තම ශ්‍රම ශක්තිය, මුදල්, හා ධනය තමන් කැමති ලෙසකට යොදා ගැනීමේ නිදහස තිබේ නම්, නිර්බාධිත ව විදේශීය වෙළෙඳාමේ නිරත වීමට ඔහුට නිදහස තිබේ නම්, එවිට, විදේශීය ආයෝජකයන් බිය වීමට හේතුවක් නොදකිනු ඇත. මෙරටට විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම උදෙසා විදේශවලට ගොස්, හංගේරියානු රාජ්‍ය නායකයින් කරන ආයාචනා මට පෙනෙනුයේ මේ පිළිබඳ බොළඳ වෑයම් ලෙසිනි. පෞද්ගලික ආයෝජනවලට විලංගු දමන දහසකුත් එකක් නිලධාරිවාදී තහංචි නැතැයි ද, තම ප්‍රාග්ධනය මෙරට තුළ ආරක්ෂා සහිත යැයි ද විශ්වාසය ඇති වූ දිනෙක විදේශීය ධනයෝජකයින් ස්වේච්ඡාවෙන්ම හංගේරියාවට පැමිණෙනු ඇත.[17]

1.2 රාජ්‍ය අංශය

පොදු අයිතිය යටතේ ඇති විවිධාකාර වන සියලු කටයුතු මම තාවකාලිකව රාජ්‍ය අංශයට ඇතුළත් කරමි. ඒ පිළිබඳ වඩා සියුම් විවරණයක් පසුවට ඉදිරිපත් කරනු ලැබේ. රාජ්‍ය අංශය පිළිබඳ එක් කැපී පෙනෙන විශේෂ ලක්ෂණයක් වනුයේ ඊට අයත් දේපොළ පෞද්ගලික අයිතිය යටතේ නොපැවතීමය. දේපොළ පිළිබඳ ආර්ථික න්‍යාය ඇසුරින් මේ තත්ත්වය විග්‍රහ කළහොත් අපට පෙනෙන්නේ, අදාළ ඒකකයන් ගේ ආදායම් හා වියදම් අතර පරතරය, ලාභ හැටියට, ස්වාභාවික පුද්ගලයන් අතට පත් නොවීමත්, ඒ දෙකින් වියදම් වැඩි වන තැන අලාභ විඳ දරා ගැනීමට එවැනි පුද්ගලයනට සිදු නොවීමත් ය. මා ඉහතින් සඳහන් කොට ඇති පරිදි රාජ්‍ය දේපොළ සැමටම හිමි අතර, ඒ කිසිවකුටත් අයත් නොවන්නේ වෙයි.

හංගේරියාවේ හා වෙනත් සමාජවාදී රටවල් ගණනාවකම සිදු වෙමින් පැවැති ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයෙහි ලා 'වෙළෙඳපොළ සමාජවාදය' නමැති සිද්ධාන්තය එකී ප්‍රතිසංස්කරණ මෙහෙයවන බලවේගය බවට පත්වී ඇත.[18] සංකීර්ණ න්‍යායයක් වන මේ අදහසෙහි ගැබ් වී ඇති මූලික හරය පමණක් විස්තර කිරීමට මම මෙහිදී නැඹුරු වෙමි. මෙම න්‍යායට අනුව රජයේ ව්‍යාපාර රාජ්‍ය අයිතිය යටතේම පැවැතීමට ඉඩ හරිමින්, ඒවාට හරියට වෙළෙඳ පොළක කොටස් කරුවන් මෙන් ක්‍රියා කිරීමට ඉඩ සලසන පරිදි අවශ්‍ය කොන්දේසි

---

17. නිවැරදි තොරතුරු සැපයීමෙන්ද, හංගේරියාව තුළ ආයෝජනය කිරීමේ වාසි පෙන්වා දීම මගින්ද, විදේශීය ප්‍රාග්ධනය හංගේරියාව තුළ ආයෝජනය කිරීමට පොළඹවා ගැනීමෙන් වැඩක් තිබේද නැද්ද යන්න වෙනම ප්‍රශ්නයකි.

18. 'වෙළෙඳපොළ සමාජවාදය' යන සංකල්පය ගැන ලියැවී ඇති සාහිත්‍යයෙන් පුස්තකාලයක් වුවද පිරවිය හැක. මෙහිලා මා සඳහන් කරන්නේ ඉතාම වැදගත් කෘති කිපයක් පමණි. E. Barone (1935), L. Von Mises (1935), F.M. Taylor (1929), F. Hayek (1935), O. Lange (1936-37). මේ පිළිබඳ විවාදයේ සාරාංශයක් ඒ. බර්ග්සන් ගේ කෘතියේ (1948) දක්නට ලැබේ. D. Lavoie (1985), මේ සම්බන්ධයෙන් වැදගත් සමීක්ෂණයක් කර ඇත. විමධ්‍යගතකරණය පදනම් කර ගත් ප්‍රතිසංස්කරණ අදහස්වල පුරෝගාමීන් වශයෙන් යුගෝස්ලාවියානු ජාතික B. Kidric (1985) හංගේරියානු ජාතික Gy. Peter (1954 a,b, 1956) හා J. Kornai (1957), පෝලන්ත ජාතික W.Brus (1972), සෝවියට් දේශයේ E. Liberman (1972) හා චීනයේ Sun Yefang (1982) සඳහන් කිරීම වටී.

සලසා ලිය යුතුය. මින් ඉදිරියෙහි දී මා 'වෙළෙඳපොළ සමාජවාදය' යන්න භාවිත කරන්නේත්, ඊට අභියෝග එල්ල කරන්නේත් සීමිත අර්ථයකිනි. එනම් රාජ්‍ය දේපොළ + වෙළෙඳ පොළ සම්බන්ධීකරණය = 'වෙළෙඳ පොළ සමාජවාදය' යන තේරුමෙනි.

මෙහිදී මම මාගේ අදහස් සහවා කීමට යත්න නොදරමින් දැඩි වචන භාවිත කරමි. වෙළෙඳපොළ සමාජවාදය යන සංකල්පය හුදෙක් දියවී ගොස් ඇත. එය ක්‍රියාත්මක කිරීමට අසාර්ථක ප්‍රයත්න දැරූ යුගොස්ලාවියාව, හංගේරියාව, චීනය, සෝවියට් දේශය හා පෝලන්තය යනාදී රටවල අත්දැකීම් මෙය පෙන්වා දෙයි. එබැවින් මෙම වෙළඳපොළ සමාජවාදය පිළිබඳ මූලධර්මය අත හැර දැමීමට කාලය එළඹ තිබේ. එය රැක ගැන්මට තවදුරටත් පිටුපස සිට සටන් වදින්නන් ඇතත්, එය හැර ලිය යුතුය. මට නම් ඔවුන් හා එකඟ විය නොහැකිය. ඇත්ත වශයෙන්ම පහත දැක්වෙන කරුණු මෙහි ලා සටහන් කර තැබිය යුතුය.

පෞද්ගලික අංශයේ කටයුතු සම්බන්ධීකරණය කරන ස්වාභාවික සමායෝජකයා වෙළෙඳපොළ යන්ත්‍රණය වෙයි. මෙය වෙළෙඳපොළ යන්ත්‍රණය යටතේ තීරණ ගන්නන්ගේ ස්වාධීනත්වය සමගත්, පෞද්ගලික දේපොළ ආරක්ෂා වීමට හා වෙළෙඳපොළ යන්ත්‍රණයේ ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිදි නිර්බාධී ලෙස ගිවිසුම් ඇතිකර ගැනීමට ඇති නිදහස සමහත් බැඳී ඇත. මෙසේ බලන කල්හි අපට පෙනෙන්නේ, රාජ්‍ය ඒකකයක්, පෞද්ගලික අයිතිය යටතේ තිබෙන වෙළෙඳ පොළ අරමුණු කොට ගත් ඒකකයක් මෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි බවයි. එම නිසා යට කී අදහස සදහටම සිතින් ඈත් කළ යුතුය. දේපොළ පිළිබඳ රාජ්‍ය අයිතිය පවතින තාක් කල්, එය නඩත්තු කිරීමට සදාකාලිකව ම නිලධාරි වාදයක් පවතින බව සිහි තබා ගත යුතු වේ. (රාජ්‍ය ව්‍යාපාරය නිලධාරි වාදයේ ඓන්ද්‍රීය අංගයක් ලෙසින් ඊට බැඳී සිටී.) ප්‍රතිසංස්කරණය දියත් කළ මුල් අවධියේදී, ආර්ථික සැලැස්ම තුළින් ඉදිරිපත් කෙරෙන ආඥා ඉවත් කිරීමෙන් පමණක් රජය සතු ව්‍යාපාර පිළිබඳ වෙළෙඳ පොළ සමායෝජනයක් ඇති වෙතැයි අපි බලා සිටියෙමු. එහෙත් එම අපේක්ෂා ඉටු වූයේ නැත. ඒ වෙනුවට සිදු වූයේ, රාජ්‍ය අංශය පිළිබඳ නිලධාරිවාදී සෘජු පාලනය, වක්‍ර නිලධාරිවාදී පාලනයක් මගින් ආදේශනය වීමකි. 1968 ට පසු කරන ලද නොයෙකුත් ආර්ථික විශ්ලේෂණයන්ගෙන් මේ කරුණ අනාවරණය වී ඇත. විවිධ රාජ්‍ය අධිකාරිහු ව්‍යාපාරවල කටයුතුවලට මැදිහත් වීමට අවශ්‍ය උපක්‍රම සිය ගණනින් සොයා ගැන්මට සමත් වූහ.[19]

කිසියම් උද්ඝෝෂණ ව්‍යාපාරයක් මගින් එක් ආකාරයක මැදිහත් වීමක් ඉවර කර දැමුණු සැණෙකින් තවෙකක් පැන නැගිණි. මේ අයුරින් බලන කල්හි, පෞද්ගලික දේපොළ පිළිබඳව වෙළෙඳපොළ සම්බන්ධීකරණය ක්‍රියාත්මක වන්නේ යම් සේද, එලෙසම රාජ්‍ය දේපොළ පවතින තන්හි ඉබේම හා ස්වාභාවික ලෙස නිලධාරිතාන්ත්‍රික සම්බන්ධීකරණ විධි බිහි වේ. අවුරුදු 20 ක් මුළුල්ලේ හංගේරියාවේ කළ අසාර්ථක අත්හදා බැලීම් සමහ වෙනත් සමාජවාදී රටවල ද අසාර්ථක වූ ප්‍රතිසංස්කරණ මගින් පෙන්වා දෙනු ලබනුයේ ඉහත කී කරුණු තවදුරටත් වාද විවාද කිරීමට අවශ්‍ය මාතෘකා නොවන බව ය.

---

19. වක්‍ර ආර්ථික පාලනය ආර්ථික කළමනාකරණය හා ආයතන අතර ඇති සම්බන්ධතාව විස්තර කෙරෙන L. Antal (1979,1985), T. Bauer (1972), M. Tardos (1981) යනාදී කෘති කියවන්න.

රාජ්‍ය අංශයේ දායකත්වය අඩු කර ගත හැක්කේ හා අඩු කර ගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නය ගැන පසුව තවත් කරුණු ඉදිරිපත් කෙරෙනු ඇත. මෙම ක්‍රියාදාමය කෙළවර වූ තන්හි, රටේ සමස්ත නිෂ්පාදිතයෙන් රාජ්‍ය අංශයේ දායකත්වය පෞද්ගලික අංශයේ දායකත්වයට වඩා අඩු විය හැක. එසේ වීම උචිතය. රජය සතු ව්‍යාපාර පෞද්ගලික ආර්ථිකය නැමැති සාගරයේ කුඩා දූපත් බවට පත් වන්නට ඉඩ හැරියොත්, ඒවාට ද පෞද්ගලික ව්‍යාපාර මෙන් හැසිරීමට සිදු වනු ඇත. කෙසේ වුවද, අද තත්ත්වය මීට වඩා බෙහෙවින් වෙනස් බැවින්, අපට එම ප්‍රශ්නය විවෘත ප්‍රශ්නයක් සේ පසෙක තැබිය හැකිය. වර්තමානයෙහි දීත්, ඉදිරියේ එන දිගු කලක් තුළත්, පවතිනු ඇති ප්‍රශ්නය නම් රාජ්‍ය අංශය නැමැති සාගරයේ කුඩා දූපත් ලෙස පෞද්ගලික ව්‍යාපාර පවතින ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. මගේ ඉදිරි සාකච්ඡා මේ තත්ත්වය පදනම් කොට ඉදිරිපත් කෙරේ. කෙනකුට මා ඉදිරිපත් කරන අදහස් ගැන ප්‍රශ්න කළ හැකිය. එහෙත් 'ප්‍රංශයේ රෙනෝ සමාගම රාජ්‍ය අයිතිය යටතේ පැවතුණත්, එය වෙළෙඳ පොළ හා ලාභ අරමුණු කොට කටයුතු කරන ආයතනයකි' වැනි තර්ක මගින් මාගේ අදහස් බිඳ හෙළීමට තැත් කිරීම වැරදි ය.

හංගේරියාවේ පවතින වර්තමාන තත්ත්වය යටතේත්, සමාජ-විද්‍යාත්මක දෘෂ්ටියකිනුත්, මා රාජ්‍ය ව්‍යාපාර සලකනුයේ රාජ්‍ය නිලධාරිවාදයේම කොටසක් ලෙසිනි. මේවා අයත් වනුයේ 'ව්‍යාපාර' ක්ෂේත්‍රයට නොව 'ආණ්ඩු' ක්ෂේත්‍රයට ය. ඒවා ගැන සලකා බැලිය යුත්තේ ඒ ආකාරයෙනි. රාජ්‍ය අංශය කොන්දේසි විරහිතව 'නිර්බාධීකරණය' නොකළ යුතු ය. අවශ්‍ය වනුයේ ඒ ගැන සුපරීක්ෂාකාරීව සිටීමකි. සෑම රජයේ සංවිධානයක් ම පුරවැසියන් ගේ මුදල් හිතුමතේ වියදම් කිරීමට නැඹුරුවක් දක්වයි. එය වැළැක්විය යුතුය.

මෙම ගැටළුව න්‍යායාත්මක හා ප්‍රත්‍යක්ෂමූලක අධ්‍යයන බොහොමයක් තුළ විමසා බලා ඇත.[20] නිදසුනක් ලෙස තම යුතුකම් ඉටු කිරීමට ඉතා ඉහළ වැදගත් තැනක් දෙන ප්‍රධානියකුගෙන් යුත් කන්තෝරුවක් ගනිමු. මෙවැනි බියුරෝවක ප්‍රධානීන් තමන්ට වැය කිරීමට වෙන් කරනු ලබන මුදල් උපරිම කර ගැන්මට තැත් කරනු ඇත. අනිත් අතට ව්‍යවස්ථාදායකය, බියුරෝවේ අය වැය තීරණය කරන අවස්ථාවේදී, බියුරෝවේ ඉහත කී වැයම ව්‍යාර්ථ කර ලීමට කටයුතු කරනු ඇත.

අපි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් හා රාජ්‍ය පරිපාලනයේ ඕනෑම එක් අංශයක් හා අතර සම්බන්ධතාව දෙස බලමු. ඇමෙරිකානු කොංග්‍රෙසයේ සාමාජිකයෝ, නිදසුන් ලෙස, වැඩි වැඩියෙන් වියදම් කිරීමට පෙන්වගනය දරන උත්සාහය මැඩ පවත්වා ගැනීමට සැලකිල්ලෙන් ක්‍රියා කළ යුතු වෙති. මෙවැනි ප්‍රයත්නයන්ට සීමා පනවා පවත්වා ගැනීමටය රාජ්‍ය අය වැය ක්‍රමයක් බිහි ව ඇත්තේ. මූල්‍ය විනය රැක ගැනීමට එකී සීමා ආරක්ෂා කර ගත යුතුය. කොන්ග්‍රෙසයට මූලික දේශපාලන බලපෑම්වලට යටත් වීමට සිදු වේ. යුද හමුදා ද සිය වැය ශීර්ෂ ඉහළ නංවා ගැන්මට බලපෑම් කරනු ඇත. සමාජවාදී ආර්ථිකයක රජයේ ආයෝජන ක්‍රියාවලිය දෙස බලන විට, යුද හමුදා ක්‍රියාකාරිත්වයේ ස්වභාව පහසුවෙන් වටහා ගත හැක. නව යුද උපකරණයක් තැනීමට හෝ හමුදා අංශයක් ඉදි කිරීමට ඩොලර් බිලියනයක් වැය වෙතැයි මූලික ඇස්තමේන්තු යටතේ ගණන් බලා ඇත. එහෙත් නිෂ්පාදන කටයුතු කර

20. W. Niskanen (1971) මේ සම්බන්ධ පුරෝගාමී අධ්‍යයනයකි.

ගෙන යද්දී ආරම්භක ඇස්තමේන්තු වියදම දෙතුන් ගුණයකින් වැඩි වන බැව් හෙළිදරව් වේ. ඒ අවස්ථාව වන විට, ව්‍යාපෘතිය නැවැත්වීමට ප්‍රමාද වූවා වැඩි ය. ඉහත දැක්වූ තර්කය කොංග්‍රස් පාලනයක අවශ්‍යතාව වැඩි දුරටත් අවධාරණය කරන්නෙකි. හමුදා වැය අධීක්ෂණය සඳහා විශේෂඥ කමිටු ඇත. ඊට අමතරව හමුදා වැය පිළිබඳව විපක්ෂය ද සුපරීක්ෂාකාරී ව සිටී. එමනිසා යම් අයථා ක්‍රියා සිදු වුවහොත් ඒවා එළිදරව් වීමට හොඳ ඉඩකඩක් තිබේ.

නිදහසේ තෝරා ගැනුණු පාර්ලිමේන්තුව හා විධායකය (නිලධාරී තන්ත්‍රය) අතර පවත්නා සබඳතාවේ සාමාන්‍ය ස්වරූපය හෙළි කරන එක් නිදසුනක් පමණකි, අප මීට ඉහත සාකච්ඡා කළ හමුදා - පාර්ලිමේන්තු සම්බන්ධතාව. විධායකය අවශ්‍යයෙන්ම ව්‍යාප්තකාරීය. තම කටයුතු වඩ වඩා පළල් ක්ෂේත්‍රයන්ට පතුරුවා හැරීමට ඊට අවශ්‍ය ය. එබැවින් ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන යුතුකම වනුයේ එම ව්‍යාප්තිය මැඩ පැවැත්වීමයි. නිලධාරී තන්ත්‍රය විසින් වියදම් කරනු ලබන්නේ තම තමන් ගේ පසුම්බිවලින් ගත් මුදල් නොව පුරවැසියන් ගේ මුදල් ය. එහෙයින් එම මුදල් වියදම් කරන ආකාරය අධීක්ෂණය කිරීම පාර්ලිමේන්තුවේ යුතුකමයි.

මීට වසරකට පමණ ඉහත දී නම්, මෙම කරුණ ගැන කථා කිරීමට ඉඩක් නොතිබිණි. එහෙත් අද, මෙය ලියන අවස්ථාවේදී ද, රාජ්‍ය අංශය ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණයට පත් කිරීම සඳහා අවශ්‍ය දේශපාලන හා සංවිධානාත්මක කොන්දේසි තවමත් ගොඩ නංවා ගෙන නැත. මෙවැනි තත්ත්වයක් ළඟා කර ගැනීම උදෙසා තම වගකීම් ගැන කැප වීමකින් වැඩ කරන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත, නිදහස් ඡන්දයකින් තේරුණු පාර්ලිමේන්තුවක් රටට අවශ්‍ය ය. මෙවන් තත්ත්වයක් උදා වීමට අද බොහෝ ඉඩකඩ තිබේ. එමනිසා පහත සඳහන් යෝජනාව බැරෑරුම් ලෙස ඉදිරිපත් කිරීමට දැන් අවස්ථාව එළඹී තිබේ. එනම් 'රාජ්‍ය ව්‍යාපාර භාර කළමණාකරුවනට අසීමිත බලය නො දෙමු' යන යෝජනාවයි.

රජය සතු ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ නිර්බාධීකරණ පිළිවෙතට පක්ෂව කථා කරන අය බොහෝ විට හංගේරියාවේ රාජ්‍ය ව්‍යාපාරයක කළමනාකරු, සංවර්ධිත ධනවාදී රටක, බද්ධ ව්‍යාපාර වස්තු සමාගමක, වැටුප් ලබන කළමනාකරුවකු හා සම තත්ත්වයේ ලා කථා කරති. මෙම දෙදෙනාගේ සමාජ තත්ත්වයන් සමානය යන පදනම්නි ඔවුන් තර්ක කරනුයේ. මෙම අදහස සහමුලින්ම වැරදි ය. පුද්ගලික සමාගමක් භාර කළමණාකරුවකු අතින් වන වැරදි නිසා වන පාඩු විඳ දරා ගත යුත්තේ එහි පෞද්ගලික අයිතිකරුවන් ය. නීතිමය අර්ථයකින් කථා කළහොත්, මූල්‍යමය බංකොලොත් භාවයක පිරිවැය දරා ගන්නා වූ මොවුහු ස්වාභාවික පුද්ගලයෝ වෙති. හංගේරියාවේ පවතින්නේ මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. එතැන කළමනාකරුවා රාජ්‍ය නිලධාරි තන්ත්‍රයේ මැද මට්ටමේ නිලධාරියෙකි. ඔහු අතින් වරදක් සිදු වුවහොත් එම වරදින් පීඩා විඳිනු ලබන්නා කවරකු දැයි සොයා ගත නොහැක්කේ, පතුලක් නොපෙනෙන රාජ්‍ය භාණ්ඩාගාරයෙන් එම පාඩු දරා ගන්නා බැවිනි.

ආර්ථිකයේ නිර්බාධීකරණයට පක්ෂව තර්ක කරන්නකු හැටියට මම තම මුදල් ආයෝජනය කර අවදානමට මුහුණ දෙන පුරවැසියන් හා පෞද්ගලික ව්‍යාපාර හිමියන් ගැන ලිබරල් ආකල්ප ඇත්තෙක්මි. එහෙත් රටේ බඳු ගෙවන්නන් ගේ මුදල් වියදම් කිරීමේ දී තද පාලනයක් තිබිය යුතු බව මම විශ්වාස කරමි. මේ අතින් රාජ්‍ය ව්‍යාපාර කළමනාකරුවකු මා දකින්නේ රාජ්‍ය

නිලධාරියකු ලෙසිනි. ඔහු කාර්යක්ෂමව වැඩ කරයි නම් ඉහළ වැටුපක් ඔහුට ගෙවීම ගැන මගේ විරුද්ධතාවක් නැත. (මේ සම්බන්ධයෙන් පසුවට කථා කරමු.) ඔහු ගේ වැඩ අකාර්යක්ෂම නම් එතැනින් ඔහු ඉවත් කළ යුතු වේ. රාජ්‍ය ව්‍යාපාරයක කළමනාකරුවා ව්‍යවසායකයකු යයි අප සිත් තුළට කා වැදී ඇති සාවද්‍ය මතය ඉවත් කර ගත යුතුය. රජයේ ආයතනවල වෙනත් ප්‍රධානීන් මෙන්ම, මොහුද වැය පක්ෂය හැකිතාක් වැඩි කර ගැනීමට නැඹුරු වූවෙකි. රාජ්‍ය ව්‍යාපාරයක කළමණාකරුවකුට, එසේම, ආයෝජනය වැඩිකර ගැනීමට ද විනිමය වැඩි වැඩියෙන් ලබා ගෙන වැඩි වැඩියෙන් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයනය කර ගැනීමට ද වුවමනා ය. සිය මිතුරන්ට ද එම ඉඩ සලසමින් ම, ඔහු විදේශීය සංචාරවල වැඩි වැඩියෙන් යෙදීමට ප්‍රිය කරයි. සේවකයින් අතර ජනප්‍රිය වීම මගින්, ආයතනයේ සාමයක් පවත්වා ගැනීමට ඔහු සේවක වැටුප් වැඩි කරනු ඇත. මෙතෙක් ඔහුට මෙලෙස හැසිරීමට පුළුවන් වූයේ, තම මුදල් නාස්තිකාරී ලෙස වියදම් නොකර තම මුදල් ආරක්ෂා කර ගන්නා පෞද්ගලික අයිතිකරුවකු ඔහුට ඉහළින් නො සිටිය බැවිනි. මෙම කළමණාකරු සීමාව ඉක්මවා වියදම් කළ ද, ඔහුට සහන ලබා ගත හැකි මාර්ගයක් තිබිණි. රාජ්‍ය අය-වැය හෝ බැංකු පද්ධතිය ඔහු ගලවා ගැනීමට ඉදිරිපත් වීමට හොඳටම ඉඩකඩ තිබුණු බැවිනි. රාජ්‍ය අංශය ජාතික ආර්ථිකයේ ප්‍රබල අංශය වශයෙන් පවතින තාක් කල්, රාජ්‍ය ව්‍යාපාර සිය කැමැත්තෙන්, අභ්‍යන්තර හේතු උඩ, ඇති කර ගන්නා දෘඪ අය වැය සංරෝධකයනට මුහුණ නොදේ. මේ නිසා පවතින මෙම තත්ත්වය වෙනස් නොකර මූල්‍ය පාලනය දැඩි කළ හැකිය යන මතය දැන්වත් බැහැර කළ යුතුය.

මගේ අදහස් ඕනෑවට වඩා සරලව හෝ සීමාන්තිකව හෝ ඉදිරිපත් කිරීමට මම අදහස් නොකරමි. රජයේ ව්‍යාපාර වනාහී පොලිස් දෙපාර්තමේන්තුව හෝ බදු කාර්යාලයය හෝ වැනි රටේ ඇති විවිධ රජයේ කාර්යාලවලින් කිසිසේත් වෙනස් නොවන, හුදෙක් එවැනි රාජ්‍ය ආයතන අතර එකක්ය යන අදහස මා දරන්නේ නැත. තවද, රාජ්‍ය ව්‍යාපාරවල කළමණාකරුවන් ගේ ආකල්ප සෑම අතකින්ම නගරාධිපතිවරයකුගේ හෝ නාගරික පොලිස් ප්‍රධානියකුගේ හෝ ආකල්ප වලට වඩා කිසිසේත් වෙනස් නොවෙතැයි මම නොකියමි. රාජ්‍ය ව්‍යාපාර තම නිෂ්පාදන මුදලට විකුණයි; ආදායම් හා පිරිවැය ගැන සැලකිලිමත් ව ක්‍රියා කරයි; විකුණුම් කරුවන් හා ගැනුම් කරුවන් අතර සම්බන්ධතාවක් පවත්වා ගනී. මෙසේ බලන කල, රජයේ ව්‍යාපාර භාර අධ්‍යක්ෂකවරුන් ගේ කටයුතුවල ව්‍යාපාරික ගති ලක්ෂණ ඉස්මතු වී පෙනෙනු ඇත. 1968 ප්‍රතිසංස්කරණවලින් අනතුරුව ගත වූ දශක දෙකේදී මේ ගති ලක්ෂණ වඩාත් ශක්තිමත් වී ඇති බැව් අවිවාදයෙන් පිළිගැනීමට සිදු වේ. ඔවුන් තුළ වැඩි දියුණු වී ඇති මෙම ගති ලක්ෂණ අඩපණ කිරීමට යමකු උත්සාහ දරන්නේ නම් එය කණගාටුවට හේතුවකි. ඒ සමඟම තව කිව යුත්තක් ඇත. එනම් ව්‍යාපාරයක පහළම තත්ත්වයේ සිට ඉහළම තත්ත්වය දක්වා ඇති කළමණාකරුවන් ඇතුළත්, වගකිවයුතු තත්ත්වයන් දරන සෑම අධ්‍යක්ෂවරයකුම සිහියේ තබා ගත යුත්තේ, තමා රජයේ අරමුදල් වියදම් කිරීම සම්බන්ධ වගකීමක් දරන රාජ්‍ය නිලධාරියකු වන බවය. මේ සම්බන්ධයෙන් ඔවුහු හැම සම්පූර්ණ වගකීමට යටත් විය යුතුය. පුරවැසියන්ගේ නියෝජිතයින් ඔවුන් ගේ කටයුතු අධීක්ෂණය කිරීම මේ අනුව යුක්තිසහගතය.

මෙම සාකච්ඡාව තුළින් ප්‍රායෝගික යෝජනා කීපයක් මතු වී එයි. මෙම යෝජනා පිළිබඳ ශිල්පීය හා පරිපාලනමය ලක්ෂණ විස්තරාත්මකව ඉදිරිපත් කිරීම මේ ග්‍රන්ථයට අයත් කටයුත්තක් නොවේ. ඒ පිළිබඳ මූලික සිද්ධාන්ත පමණක් මම කෙටියෙන් පහත දක්වමි.

(1) පහත දැක්වෙන තීරණ සම්බන්ධයෙන් රජයේ ව්‍යාපාරයක අධ්‍යක්ෂවරයකුට පූර්ණ නිදහස තිබිය යුතුය: තම නිමැවුමේ සංයුතිය හා ප්‍රමාණය තීරණය කිරීම, නිෂ්පාදනයේ දී යොදා ගැනෙන යෙදවුම් හා උචිත තාක්ෂණ විධි තේරීම, යෙදවුම් සපයන්නන් හා නිමැවුම් ගැනුම්කරුවන් සමඟ ගිවිසුම් ඇතිකර ගැනීම හා ශ්‍රමිකයන් සේවයට ගැනීම හා සේවයෙන් පහ කිරීම.

යටකී තීරණ ගැනීම සඳහා නාමික බලයක් රාජ්‍ය ව්‍යාපාර අධිකාරියට තිබුණ ද, භාවිතයේ දී ඊට ඉහළින් සිටින විවිධ අංශ නොයෙක් මාර්ගවලින් එහි ලා මැදිහත් වෙයි. මා අනුමත කරනුයේ, රජයේ ව්‍යාපාරවල කටයුතු සම්බන්ධ වඩා සම්පූර්ණ නිදහසක් තිබීම ය. දියුණු ධනවාදී රටවල විශාල පුද්ගලික සමාගම් තුළ පවතින තනි තනි කම්හල් භුක්ති විඳින නිදහසට සමාන නිදහසක් මේවාට ද දිය යුතු යයි මම කියා සිටිමි. මේ තනි තනි උප ඒකකයක කටයුතු සම්බන්ධයෙන් ස්වාධීන තීරණ ගැනීමට කළමණාකරුවනට පුළුවන්කම ඇත. ඒවායේ ප්‍රධාන මූල්‍යමය ඉලක්ක පිළිබඳ තීරණ ගැනීම පමණි ව්‍යාපාර මූලස්ථානය මගින් කැරෙනුයේ.[21]

(2) නිෂ්පාදනයක විකුණුම් මිල තීරණය කිරීම අධ්‍යක්ෂවරයා ගේ ස්වාධීන තීරණ ගැනීමේ බලයට යටත් විය යුතුය. වෙළෙඳ ආර්ථිකයක නිෂ්පාදකයා තම නිෂ්පාදිතවල හා සේවාවල මිල නියම කරන්නාක් මෙන්, නිලධාරි මැදිහත් වීමකින් තොරව මෙම මිල ගණන් තීරණය කිරීමට රජයේ ව්‍යාපාර අධ්‍යක්ෂවරයාට ද පුළුවන්කම තිබිය යුතුය. වෙළෙඳ පොළ සම්බන්ධතා පවතින තැනක විකුණුම්කරුවන් හා ගැනුම් කරුවන් ස්වේච්ඡාවෙන් මිල නියම කරන්නාක් මෙන්, රජයේ ව්‍යාපාර තම ස්වාධීන බලය පාවිච්චි කොට තමන් ගේ ගැනුම් කරුවන් සමඟ මිල එකඟතාවන්ට පැමිණීම වැදගත් ය. මෙම ගැනුම් කරුවන් රාජ්‍ය ව්‍යාපාර හෝ පෞද්ගලික ගැනුම් කරුවන් හෝ විය හැකිය.

මේ අතර යම් යම් යුක්ති සහගත අවස්ථාවන්හි දී රජයේ බලධාරීන් මිල නියම කරන අවස්ථා තිබෙන්නට පුළුවන. එනමුත් ඒවා අවශ්‍යයෙන්ම විශේෂ අවස්ථාවලට සීමා කිරීම වටී. මෙවැනි විශේෂ අවස්ථා 2.4 කොටසෙහි සලකා බැලේ.

යම් යම් ක්ෂේත්‍ර තුළ රජයේ ව්‍යාපාරවල නිදහසට **සීමා** පැණවිය යුතු යයි මම විශ්වාස කරමි. එම ක්ෂේත්‍ර මොනවාදැයි බලමු.

---

21. විශාල ධනවාදී ව්‍යාපාර තුළ ඇති කුඩා ඒකක භුක්ති විඳින අර්ධ ස්වාධීනතාව පිළිබඳ අධ්‍යයන ගණනාවක් ප්‍රකාශයට පත් කර ඇත. මෙම අර්ධ ස්වාධීනතාවයෙන් හඟවන්නේ ඒවා ස්වයං වගකීමෙන් යුතුව තමන්ගේම ලාභය උදෙසා මෙන් නිෂ්පාදන කටයුතු කරන බවයි. කෙසේ වුවද සැබෑ තතු මෙය නොවේ. ඒවායේ නියම අයිතිකරු වන විශාල ව්‍යාපාර සැම විටම පසු පසින් සිටින බැවිනි.

(3) පළමුව, රාජ්‍ය බැංකු රාජ්‍ය අංශයට දෙන ණය පිළිබඳ දැඩි පාලනයක් ඇති කිරීම ඉතාම වැදගත් වේ. මේ සම්බන්ධයෙන් පැමිණෙන කිසිම බලපෑමකට යටත් නොවී දෘඪ මූල්‍ය පාලනයක් ගෙන යාම අත්‍යවශ්‍ය ය.

(4) රාජ්‍ය භාණ්ඩාගාරය හා රාජ්‍ය ව්‍යාපාර අතර සම්බන්ධතාවන්හිදී ද දැඩි ෆිස්කල් විනයක් පවත්වා ගැනීම අවශ්‍ය ය. පාඩු විඳින රාජ්‍ය ව්‍යාපාරවලට පිහිටාධාර දීම සහමුලින්ම නවත්වා දැමීම පිළිබඳ සාකච්ඡාවක් 2 වන පරිච්ඡේදයේ ඇත. මෙතැන දී මා අවධාරණය කරන්නේ, ඉහත කී තත්ත්වය එන තුරු, පාඩු විඳින ව්‍යාපාරවලට වන්දි ගෙවීම තදින් සීමා කර ගත යුතුව ඇති බවත්, මේවායින් බදු එකතු කර ගැනීම කළ යුතු බවත් ය. රාජ්‍ය ව්‍යාපාර, භාණ්ඩාගාරය සමඟ වැඩිපුර මුදල් සඳහා කේවෙල් කිරීම සහමුලින්ම නවත්වා දැමිය යුතුය.

(5) රජයේ ව්‍යාපාර අනුගමනය කරන වැටුප් ප්‍රතිපත්ති ලිහිල් නොකටයුතුය. වැටුප් සම්බන්ධයෙන් තීරණ ගැනීමටද රාජ්‍ය ව්‍යාපාරයට පූර්ණ නිදහසක් දිය යුතුය යන පොදු මතයේ යුක්ති සහගත බවක් මට නොපෙනේ. මේ ගැන මාගේ යෝජනාවට පක්ෂ කරුණුත්, සාමාන්‍ය වශයෙන් වැටුප් විනයක අවශ්‍යතාවත් ගැන මෙම කෘතියේ දී විටින් විට ඔබට කියවන්නට ලැබෙනු ඇත.

(6) ස්වාධීන රාජ්‍ය ව්‍යාපාර, දෙන ලද නිදහසින් ප්‍රයෝජන ගනිමින්, ඉවක් බවක් නැතිව, ආනයන මත විදේශ විනිමය වැය කිරීමේ අවදානමක් ඇත. විදේශීය විනිමය සඳහා ගෙවීමට අවශ්‍ය ෆොරින්ට් සපයා ගැනීමට කෙසේ හෝ පුළුවන්ය යන විශ්වාසයකින් මෙසේ කෙරෙනු ඇත. මේ තත්ත්වය වළකා ලීමට මා ඉදිරිපත් කරන යෝජනා විකල්ප දෙකකින් යුක්ත වේ.

(අ) දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කෙරෙන ස්ථායීකරණ වැඩ පිළිවෙළ සම්පූර්ණ වුවහොත්, එසේම රාජ්‍ය ව්‍යාපාරවලට සපයන ණය දැඩි ලෙස සීමා කර ගත හැකි වෙතොත්, එපමණක් ද නොව, ෆොරින්ට් සඳහා නියම යථාර්ථවාදී විනිමය අනුපාතිකයක් ගොඩ නැගෙතොත්, එවිට, (එවිට පමණක්) විදේශීය විනිමය මිලට ගැනීමේදී රාජ්‍ය අංශය පිළිබඳව පැනවෙන විශේෂ තහංචි ඉවත් කළ හැකි වේ. එවිට රාජ්‍ය ව්‍යාපාර අතට ලැබෙන ෆොරින්ට් ප්‍රමාණය සීමාසහිත වී, විදේශීය විනිමය සඳහා වන ඉල්ලුම සීමා කර පවත්වා ගත හැකි වේ.

(ආ) ඉහත (අ) යටතේ කෙටියෙන් විස්තර වුණු කොන්දේසි මුදුන් පමුණුවා ගත නොහැකි වුවහොත් රාජ්‍ය ව්‍යාපාර මගින් විදේශීය විනිමය මිලට ගැනීම් පරිපාලන නීති මගින් පාලනය කර ගැනීම අවශ්‍ය වේ.

(7) තමන්ගේම ඉතිරි කිරීම්, බැංකු ණය හෝ ප්‍රාග්ධන වෙළෙඳ පොළින් ලබා ගත් මුදල්, ව්‍යාපාර කටයුතු සඳහා ආයෝජනය කිරීමට රාජ්‍ය ව්‍යාපාරයකට නිදහස තිබිය යුතුය. එහෙත්, මධ්‍යම ආණ්ඩුවේ හෝ

ප්‍රාදේශීය ආණ්ඩුවේ අය වැයෙන් මුදල් සැපයේ නම් හෝ ගනු ලැබූ ණය රජයේ ඇපකරයක් යටතේ ලබා ගැනුණේ නම් හෝ එම තත්ත්වයන් යටතේ, අදාළ ආයෝජන ව්‍යාපෘති අදාළ ව්‍යවස්ථාදායක සභාව (පාර්ලිමේන්තුව, ප්‍රාදේශීය සභාව) විසින් අනුමත කිරීම අවශ්‍ය ය. ජාත්‍යන්තර කොන්ත්‍රාත්තු හා සම්බන්ධ ආයෝජනයන් කිරීමේ දී ද, පාර්ලිමේන්තු තීරණ අවශ්‍ය වේ. නිදසුන් ලෙස බොස් නැගිමාරොස් ඩැනියුබ් විදුලි බල මධ්‍යස්ථානය හෝ සෝවියට් දේශයේ සයිබීරියන් ගෑස් නළ හෝ ඉදි කිරීමේ දී හංගේරියානු සහභාගිත්වය ලබා දීම වැනි, වර්තමාන හා අනාගත පරම්පරාවන් උගස් තබනු ඇති, දැඩි ලෙස විවේචනයට ලක් කැරුණු ව්‍යාපෘති සඳහා අවසර නොලබා ආයෝජනය කිරීමට මින් ඉදිරියට ඉඩ දිය යුතු නොවේ. යම් ආයෝජනයක් පාඩු ලද හැකි එකක් වේ නම් හෝ වෙනත් අතකින් භයානක යයි සිතන්නේ නම් එය අත්හැර දැමීමට පාර්ලිමේන්තුවට ඉඩ තැබිය යුතුය. පාඩු විඳීමට ඉඩ ප්‍රස්ථා ඇති ඉහත සඳහන් කළ අන්දමේ තීරණ ගැනීමට පෙර ගැඹුරට සිතා බැලීම වැදගත් ය. අදාළ ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කිරීමට හෝ රාජ්‍ය පසුම්බිය ඒ සඳහා විවෘත කර දීමට හෝ **පෙර** ඒවා පිළිබඳ වගකිව යුතු තීරණ ගැනීමට මහජන නියෝජිතවරුන්ට අයිතිය පැවරිය යුතුය.

(8) මෙම සාකච්ඡාව සම්පූර්ණ වනු දැකීම සඳහා පහත සඳහන් කරුණ ද මෙහිදී ඉදිරිපත් කරමි. ඉදිරියේ දී එය සවිස්තරව සාකච්ඡා කෙරෙනු ඇත. එනම් රජයේ ව්‍යාපාර විකිණීමේ අයිතිය ඒවායේ කළමණාකරුවනට නැති බව ය. කළමණාකරුවෝ වැටුප් ලබන සේවකයන් මිස එම ව්‍යාපාරවල අයිතිකරුවෝ නොවෙති. ව්‍යාපාරයක් විකිණීමේ අයිතිය ඇත්තේ එහි **අයිතිකරුවන්ට** පමණි.

පාඨකයින් නොමග යැවීමේ වුවමනාවක් මට නොමැත. ඉහත අංක 1 හා 2 යටතේ දැක්වුණු ව්‍යාපාර නිදහස හා අංක 3-8 දක්වා විග්‍රහ කැරුණු එම නිදහසේ සීමාවන් තුළින් කාර්යක්ෂම රාජ්‍ය ව්‍යාපාර පද්ධතියක් බිහි වෙතැයි මම නොකියමි. මේ අදහස **ව්‍යාජ අපේක්ෂාවක්** බැව් මම පැහැදිලිවම ප්‍රකාශ කර සිටිමි. සමාජයේ ප්‍රධානතම ධනහිමියා ලෙස රාජ්‍ය අංශය පවතින තාක් කල්, රාජ්‍ය ව්‍යාපාරයේ ඉරණම වෙනස් කළ නොහැකි ය. එහි උපරිම කාර්යක්ෂමතාව ඇති කරවන දිව ඔසුවක්, එවැනි තත්ත්වයන් යටතේ, සොයා ගත නොහැක. රාජ්‍ය අංශයේ පවතින අකාර්යක්ෂමතා කිසිවකුටත් ගණන් නොගෙන සිටිය හැකි දෙයක් නොවේ. ඉහතින් සඳහන් කළ යෝජනා මේ තත්ත්වය යම් තාක් දුරට අඩු කර ගැනීමට ප්‍රයෝජනවත් වේ යයි සිතමි. මෙතෙක් අප කථා කළ කරුණු තවත් අරමුණු කීපයක් ඉටු කර දීමට ඉවහල් වෙයි. ඉන් දෙකක් මෙහිදී අවධාරණය කරමි.

ඉන් ප්‍රධානතම අරමුණ **පෞද්ගලික අංශය රැක ගැනීමයි**. රටේ සම්පත් සීමිතය. රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකටම ඒවා පරිහරණය කිරීමට අවශ්‍ය ය. එහෙත් සම්පත් බෙදා ගැනීමේ තරගයේදී මෙම දෙපක්ෂය සමාන තරගකරුවෝ නොවෙති. සම්පත්වලට රාජ්‍ය අංශයෙන් ඇති ඉල්ලුම අතෘප්තකර ය. එය ලිහිල් අය වැය සංරෝධයකට යටත් ව ක්‍රියා කිරීමට පුරුදු වී ඇති නිසා ය. එහෙත් දෘඪ අය වැය සංරෝධකයකට මුහුණ පාන පෞද්ගලික අංශය තුළින් සම්පත්වලට කෙරෙන ඉල්ලුම සීමා කර ගැනීමට ඊට සිදුවේ. රාජ්‍ය

අංශයට සම්පත් ලබා ගැනීමට තවත් පහසු වන්නේ, එහි විශාලත්වයත්, බැංකු හා වෙනත් අධිකාරීන් සමඟ එය පවත්වන මනා සම්බන්ධතාවත් නිසා ය. පෞද්ගලික අංශයට ඇති සීමිත සම්පත් ප්‍රමාණය ද ඉන් උදුරා ගැනීමට රාජ්‍ය අංශය තුළ ඇති ප්‍රවණතාව නැති කර ලීමට නම්, රාජ්‍ය ව්‍යවසායයනට දෙන ණය ද ඒවා ගෙවන වැටුප් ද දැඩි පාලනයට යටත් කළ යුතු වෙයි. එසේම ඒවායේ ආයෝජන කටයුතු අධීක්ෂණයට ලක් කළ යුතුය. පෞද්ගලික අංශය දියුණු කිරීමේ අවංක වුවමනාවක් ඇත්නම් සම්පත් බෙදී යාමේදී දේශපාලන හා ආර්ථික බලවේගවලට අහිමත පරිදි නිර්බාධීව හැසිරීමට ඉඩ නොදීමට වග බලා ගත යුතු වේ.

මෙම දෙපක්ෂයම එකිනෙකා සමඟ සම සමව තරග කළ යුතුය යන නිතර ඇසෙන අදහස මම අනුමත නොකරමි. මාගේ තර්කය ජාතික ආර්ථිකයේ සෑම කොටසක්ම එක හා සමාන මට්ටමෙහි ලා නොසැලකිය යුතු බව ය. ස්වකීය වූ වත්කම් යොදා ව්‍යාපාර කටයුතු කරන අයට ලැබිය යුතු අයිතිවාසිකම් ම තමන් ට ද හිමි විය යුතු යැයි ඉල්ලා සිටීමට, මහජන මුදල් වියදම් කරන්නන්ට අයිතියක් නැත. තමන්ගේ ම මුදල් වියදම් කරන පුරවැසියන් කරනුයේ සිය මූලික මානව අයිතිවාසිකම් ක්‍රියාවට යෙදීමකි. එහෙත් රජයේ පසුම්බියෙන් මුදල් ලබා ගන්නා අය සම්බන්ධයෙන් සමාජය දැඩි පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. 'පුද්ගලික අංශයට අත නොතබනු' යන පාඨය සාධාරණ වන්නා සේම, රාජ්‍ය අංශය දැඩි හස්තයකින් පාලනය විය යුතුය යන ඉල්ලීම ද සාධාරණ විය යුතුය.

මෙම ප්‍රතිපත්ති ස්ථාවරය, දැනට පවතින පිළිගැනීම්වලට වඩා බෙහෙවින් වෙනස් ය. අද පිළිගැනෙන්නේ පෞද්ගලික අංශය නිලධාරිවාදී පාලනයට යටත් විය යුතු බවත්, රාජ්‍ය අංශය නිර්බාධීකරණය විය යුතු බවත් ය. මා මෙහිදී ඉදිරිපත් කරන මතය, දැනට පවත්නා ප්‍රතිපත්ති දිගටම පවත්වා ගත යුතු යැයිද ඒවා පුළුල් කළ යුතු යැයිද යන අදහස ප්‍රකාශ කරන නොයෙකුත් ආර්ථික විද්‍යාඥයන් ගේ හා දේශපාලනඥයන් ගේ මතවලට ද විරුද්ධව යයි. මේ අයට අවශ්‍ය වන්නේ පෞද්ගලික අංශය මත්තෙහි සිය ගණන් සම්බාධක පවත්වා ගන්නා ගමන්ම, රාජ්‍ය ව්‍යාපාරවලට අසීමිත නිදහසක් දීමට ය.

සම්පත් සඳහා රාජ්‍ය අංශයේ ඉල්ලුම සීමා කිරීම යුක්ති සහගත කරවන දෙවන වැදගත් අරමුණ වනාහී එය රටේ **සාර්ව ආර්ථික ස්ථායීකරණය** සඳහා අවශ්‍ය වීම ය. දෙවන පරිච්ඡේදයෙන් පැහැදිලි වන අයුරු රජයේ සම්පත් යොදා කරනු ලබන ආයෝජන සම්බන්ධ තීරණ ගැනීමේදී ඉතා පරීක්ෂාකාරීව ඒ ගැන සලකා බැලීමත්, එමෙන්ම ෆිස්කල් හා වැටුප් විනය දැඩි ලෙස පවත්වා ගැනීමත් නැතිවම බැරි දේ වෙයි. මෙම කටයුතුවලදී පාර්ලිමේන්තුවේ කාර්ය භාරය පුන පුනා සාකච්ඡා කොට ඇත. අනාගත හංගේරියාවේ රාජ්‍ය අංශයේ ආර්ථික සැලසුම් කෙබඳු වේද යන්න විස්තර කරමින්, අනාගතයෙහි හංගේරියානු පාර්ලිමේන්තුව හා නිලධාරි තන්ත්‍රය අතර සබඳතා වර්ධනය විය හැකි ආකාරය ගැන දිගින් දිගට කථා කිරීමට මම මෙහිදී අදහස් නොකරමි. මෙම සබඳතා හැඩ ගස්වා ගැනීමේදී, මෙරට පැවති යෝධ සැලසුම්ගත ආර්ථිකය තුළ, ප්‍රධාන දේශපාලන ආයතන හා පහළ මට්ටමේ ආර්ථික ආයතන අතර පැවතුණු, කේවෙල් කිරීමේ හා තොරතුරු විකෘති කිරීමේ ක්‍රියාදාමයන් ඇතුළු සබඳතා ආශ්‍රයෙන් ලැබූ අත්දැකීම් සමුදාය ප්‍රයෝජනයට ගැනීම සුදුසුය. එසේම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වී ඇති රටවල පාර්ලිමේන්තුව හා රාජ්‍ය නිල තන්ත්‍රය අතර සබඳතා ඇසුරෙන් ලබා ගත් අත්දැකීම්වල උචිත, අනුචිත

බවද මෙහි ලා සැලකිල්ලට ගැනීම වටී. සිහි තබා ගත යුතු තවත් වැදගත් කරුණක් නම් අනාගත හංගේරියානු පාර්ලිමේන්තුවට මුහුණ දීමට සිදු විය හැකි බලගතු රාජ්‍ය අංශය වැන්තකට කිසි ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රික රටක් මුහුණ දී නොමැති බවයි. අපේ අනාගත පාර්ලිමේන්තුව ගන්නා තීරණ හුදෙක් නිලධාරි තන්ත්‍රයේ යෝජනා මත එළන රබර් මුද්‍රාවක් නොවන ලෙසත්, කෙළවරක් නැති පාර්ලිමේන්තු විවාදවලින් රාජ්‍ය අංශයේ වැඩ කටයුතු අඩාල නොවන ලෙසත් කටයුතු යෙදීමට අවශ්‍ය නම්, අධික මැදිහත් වීමෙන් මෙන්ම අසීමිත නිර්බාධිකරණයෙන් ද තොර මැද පිළිවෙතක් ගැනීමට, පාර්ලිමේන්තුවට හා රාජ්‍ය අංශය යන දෙපක්ෂය එකඟ විය යුතුය. රාජ්‍ය අංශයේ දෛනික කටයුතු කෙරෙහි අනවශ්‍ය ඇඟිලි ගැසීම් නැතිව, ඒ මත සැබෑ පාලනයක් ගෙන යාමට නම්, රටේ දේශපාලන බලවේග තම තමන්ගේ කුඩා විශේෂඥ කණ්ඩායම් පත් කර ගැනීම නුවණට හුරු ය.

මීට අමතරව, රාජ්‍ය පරිපාලනයට අර්ථවත් ලෙස මුහුණ දිය හැකි, රජයට යටත් නොවන, එහෙත් පාර්ලිමේන්තු අධීක්ෂණය යටතේ ක්‍රියා කරන ආයතන පද්ධතියක් අද අවශ්‍ය ව තිබේ. දැනටමත් වෙනත් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රික රටවල දක්නට ලැබෙන පරිදි, රජයේ වියදම් පිළිබඳ තතු සොයා බැලීමට, රාජ්‍ය විගණන කාර්යාලයයක් අරඹා ඇත. රජයේ දේපොළ පිළිබඳ පුද්ගලිකකරණ කටයුතු කර ගෙන යාමට නිර්මාණය කරන ලද මෙම නව ආයතනය පාර්ලිමේන්තු අධීක්ෂණයට යටත් වනු ඇතැයි සිතිය හැක. එලෙසින්ම රටේ මධ්‍යම බැංකුව වන හංගේරියානු ජාතික බැංකුව ද පාර්ලිමේන්තුවේ පාලනය යටතට ගන්නේ නම් මැනවි. රාජ්‍ය තන්ත්‍රයෙන් නිදහස් මෙවැනි සංවිධාන සෑහෙන ගණනක් රටට අවශ්‍ය බවට සැකයක් නැත.

හංගේරියාවේ අනාගත පාර්ලිමේන්තුව මත ඕනෑවට වඩා වැඩි බලාපොරොත්තු තැබීමට මට අනවශ්‍ය ය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඊට වගකියන ආයතන තම කාර්යයන් පිළිබඳ මනා නිපුණත්වයක් ලබා ගැනීමට දිගු කලක් මුළුල්ලේ ලබන ඓන්ද්‍රීය වර්ධනයක් හා ඉගෙනුමක් අවශ්‍ය වේ. අත්දැකීම් ලබා ගන්නා මෙම කාලය තුළදීත්, ඉන් පසුවත්, රාජ්‍ය අංශය හසුරුවා ගැනීමේ කාර්යයෙහි ලා ප්‍රවෘත්ති පත්‍රවලට හා මහජන මතයට අතිශයින් වැදගත් තැනක් හිමි වනු ඇත. රජයේ ව්‍යාපාරවල ප්‍රතිඵල (ලාභ, අලාභ) සහවා තැබීම නුසුදුසු ය. අවසානයේ දී ලාභ හෝ අලාභ විඳ දරා ගන්නේ පුරවැසියන් ය. ඔවුනට මේ සියල්ල දැන ගැනීමේ අයිතියක් තිබේ.

රාජ්‍ය අයිතිය හා බැඳුණු නිලධාරි වාදයේ ගති ලක්ෂණ පිළිබඳව මෙතෙක් කළ සියලු විස්තරවලින් තර්කානුකූලව කියැවෙන වැදගත් කරුණක් ඇත. එනම් අදාළ රාජ්‍ය ව්‍යාපාර නියත වශයෙන් පුද්ගලයින්ට නො පවරා, එක් රාජ්‍ය ආයතනයක දේපොළ විවිධ නීති රීති විධි මගින් (උදා: කොටස් පවරා දීම) වෙනත් රාජ්‍ය ආයතනයකට පැවරීමක් සිදු වන 'දේපොළ ප්‍රතිසංස්කරණ' ගැන මා දැඩි ලෙස සැක කරන බවයි. 'රාජ්‍ය ප්‍රාග්ධන වෙළෙඳපොළ' යන්න පිළිබඳව මා සිතේ ඇත්තේ මේ ආකාරයේම සැකයකි. එය හංගේරියාවේ සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේම දක්නට ලැබෙන මහා විහිළුවකි. ගත වූ දශක කීපය ව්‍යාජ ප්‍රතිසංස්කරණවලින් ගහණ වූ අතර, අද අප අත්දකින්නේ ද එවැනි ම ව්‍යාජ ප්‍රතිසංස්කරණ රැල්ලකි. රජයේ අරමුදල් වගකීමෙන් තොරව වියදම් කිරීමට බලය ඇති සංවිධානයක් තිබෙන බව දක්නා අපි, ඊට පිළියම් ලෙස, එම රාජ්‍ය සංවිධානය

වෙනත් රාජ්‍ය සංවිධානයකට පවරමු. දෙවැන්න ද පළමු වැන්න මෙන්ම වගකීමෙන් තොරව රජයේ අරමුදල් වියදම් කරනු ඇත.

මා සිත්හි සැක උපදවන සුළු වෙනස්වීම් බොහෝ ය. ඉන් එකකි හංගේරියාව තුළ යෝජනා කෙරෙන 'හරස් අයිතිවාසිකම්' (cross ownership) යන්න. ඒ මගින් රජයේ අයිතිය යටතේ පවතින එක් ව්‍යාපාරයක් හෝ කිහිපයක් තවත් එවැනි ව්‍යාපාරයක සමූහ අයිතිකරුවෝ වෙති. මෙවැනිම තවත් වෙනස් කිරීමක් නම් රජයේ වාණිජ බැංකු හා රජයේ යම් යම් ව්‍යාපාර එකිනෙක සමඟ ඒකාබද්ධ කිරීමය. මින් සිදු වන්නේ රාජ්‍ය බැංකුව රජයේ ව්‍යාපාරවල කොටස් ලබා ගැනීමත්, රජයේ ව්‍යාපාර රාජ්‍ය බැංකුවේ කොටස් කරුවන් වීමත් ය. රටේ සිදුවී ගෙන යන වෙනස්වීම්වල තවත් ස්වරූපයකි, 'ආයතනික අයිතිය'. මේ නමින් සිදු වෙන්නේ රාජ්‍ය අයිතිය යටතේ පවතින රක්ෂණ සමාගමක් හෝ නගර සභාවක් හෝ රජයේ ව්‍යාපාරයක කොටස් මිලට ගැනීම ය.

අඩ වශයෙන් හෝ හඳුන්වා දී ඇති මෙම ප්‍රතිසංස්කරණ විධි සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. හංගේරියාවේ ප්‍රතිසංස්කරණ පිළිබඳ ලියැවී ඇති අධ්‍යයන වාර්තා සමහරක්, කාලයක් තිස්සේ, මෙම ප්‍රවණතා අගය කරමින්, ඒවා ඉදිරියට ගෙන යා යුතු බවට තර්ක ඉදිරිපත් කොට ඇත. තව තවත් අධ්‍යයන එම තර්කය ම ඉදිරිපත්කරමින් ඇත.[22] එවැනි වෙනස්වීම් පිළිබඳ අදහස්, බුද්ධිමය විවාද හා ඒ පිළිබඳ භාවිතය කෙතෙක් ශක්තිමත් වුවද, මම ඒවාට එකහෙළාම විරුද්ධ වෙමි. මෙවැනි ඇස් බැන්දුම්වලට විරුද්ධව නැගී සිටින්නේ මා පමණක් නොවන බව මම හොඳාකාරව දනිමි. අපි දැනටමත් බොරු මවා පෑම් රාශියක අත්දැකීම් විඳ ඇත්තෙමු. රජයේ ව්‍යාපාර ලාභ උපරිම කරන ව්‍යාපාර අනුකරණය කිරීමට තැත් ගනී. රටේ විවිධ නිෂ්පාදන අංශ පිළිබඳ ව්‍යාප්තිය හෝ සංකෝචනය මෙහෙයවන නිලධාරිවාදී කාර්මික ප්‍රතිපත්තිය, එමගින් තරගයේ කාර්ය භාරය ඉටු කිරීමට තැත් ගනී. වෙළෙඳ පොළේ මිල නියම වන ආකාරයට හැසිරෙන්නට මිල පාලන කාර්යාලයය ප්‍රයත්න ගනී. මේ ලැයිස්තුවට එක් කළ හැකි අලුත්ම ප්‍රයෝග වනාහී මවා පානු ලබන ප්‍රාග්ධන වෙළෙඳ පොළ හා බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් ය. හංගේරියාවේ වෝල් වීදියක් ගොඩ නැංවීමට කරන මේ වෑයම පුස්සක් වී ඇත. ලෝක බැංකුවෙන් හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හෝ සතියකට දෙකකට මෙරටට පැමිණෙන අමුත්තෝ ඉහතින් දැක්වූ මවාපෑම්වලට මුලා වෙති. තමන් ගේ රටේ හුරු පුරුදු දේ මෙහිදී දුටු විට ඔවුන් ඒවාට ප්‍රිය වීම පුදුමයට හේතුවක් නොවේ. බුඩාපෙස්ට් නුවර සැරිසරන බටහිර ජාතිකයා, තමන්ට හුරු පුරුදු මැක්ඩොනල්ඩ් ආපන ශාලාවක් දුටු පමණින්, සතුටට පත් වෙයි. මේ අන්දමටම ඔවුනට හුරු බැංකු, බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් හා කොටස් වෙළෙඳ පොළ ඔවුන් ගේ අමන්දානන්දයට හේතු වෙයි. මේ සියල්ල

---

22. මේ අදහස පිළිබඳ ලියැවී ඇති සියලුම කෘති මෙහිදී සමීක්ෂණය කළ නොහැක. එය මේ ග්‍රන්ථයට අයිති කාර්යයක් නොවන බැවින්, ඒ ලියවිලි අතර ප්‍රමුඛතා රටාවක් දීම ද අනවශ්‍යය. මා කල්පනා කරන අයුරු මේ සම්බන්ධයෙන් වැඩිම බලපෑම කර ඇත්තේ එම්. ටාර්ඩෝස් ය. (ඔහුගේ නවතම කෘතීන් කියවන්න : 1988 a, 1988 b) ජේ. සර්කෝසිගේ කෘති (1989) ද මෙහිදී වැදගත් වේ. ආර්ථික කළමනාකරණය පිළිබඳ විශේෂඥ කමිටුවේ "Theses" (1988) තුළද මේ හා සමාන අදහස් ගැබ්වී ඇත. හංගේරියාවේ රාජ්‍ය අංශයේ අයිතිය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව පැවති විවාදයේ හොඳම සමීක්ෂණය අඩංගු වන්නේ ජේ. බාර්සෝනි ගේ ලිපියේ (1989) හා එල්. ලෙන්ජියෙල් ගේ පොත (1989, pp 153-185) තුළ ය.

හුදු මවාපෑම් බව ඔවුනට වැටහී නොයාමට හොඳටම ඉඩ ඇත. මෙතැන සිදු වන්නේ 'මොනොපොලි' ක්‍රීඩාවකි. වෙනස මෙහි ඇති සූදුකරුවන් දරුවන් නොව වැඩිහිටි නිලධාරීන් වීමය; ඔවුන් සෙල්ලම් කරන්නේ කඩදාසි නෝට්ටු සමග නොව රජයේ සැබෑ මුදල් සමග වීමය.

ඕනෑම සාකච්ඡාවකදී මෙම අවස්ථාවට මා පැමිණෙන සෑම විටකදීම මට ප්‍රතිවිරුද්ධව ඉදිරිපත් වෙන තර්කයක් ඇත. 'ඇයි ඔබ වර්තමාන ධනවාදී ලොව දෙස නොබලන්නේ? එම රටවල ද රක්ෂණ සමාගම්, (විශ්‍රාම අරමුදල්, විශ්ව විද්‍යාල) වැනි ලාභ නොලබන ආයතන හා ප්‍රාදේශීය ආණ්ඩු හවුල් වී ඇති, අදාළ කොටස් ප්‍රාග්ධනයෙන් බහුතරය එවැනි ආයතනවලට අයත් වන බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොතෙකුත් ඇත.' සමකාලීන ධනවාදී ලෝකයේ තිබෙනවාට වඩා අඩුවෙන් හංගේරියාව තුළ මෙම පෞද්ගලික නොවන දේපොළ අයිතිය පැවතිය යුතු යයි මා සිතන්නේ කුමක් නිසා ද?

මා විශ්වාස කරන පරිදි, ඉතිහාසය විටෙක දී නැවැත්වීමටත් නැවත කඩිනමින් පෙරට හෝ පිටුපසට ගමන් කරවීමටත් පුළුවන් කමක් ඇති චිත්‍රපටයක් නොවේ. සමාජවාදී රාජ්‍යයක දක්නට ලැබෙන්නේ සියයට 100 ක්ම අපෞද්ගල මට්ටමින් පවත්නා රාජ්‍ය දේපොළ ක්‍රමයකි. මෙම ප්‍රතිශතය 95, 90, 85 යනාදී වශයෙන් ක්‍රමානුකූලව අඩු කරමින් ගොස්, දේපොළ පිළිබඳ මෙම රාජ්‍ය අයිතිය ආ පස්සට හැරවීමට නොහැකිය. එමනිසා චිත්‍රපටය දිවවිය යුත්තේ නැවත එහි ආරම්භයටම කරකවා මුල සිට ය. ධනවාදී ලෝකයේ අතීතය හා එහි වත්මන් වෙනස්කම් දෙස බලමු. වර්තමාන හංගේරියාවේ පවතින පෞද්ගලික අංශය පිළිබඳව ඉහතින් කරන ලද විශ්ලේෂණයේදී මේ ගැන අපි යන්තමින් සඳහන් කෙළෙමු. සිය වස් ගණනක් දිගු ධනවාදී වර්ධනයේ ගතික බව නැවත වරක් මතක් කර ගැනීම වටී.

සෑම රටකම පාහේ, ධනවාදී වර්ධනයේ ප්‍රාථමිකම යන්ත්‍ර වූයේ පුද්ගල ව්‍යවසායකයන් ය. මේ වනාහී සුළුවෙන් ව්‍යාපාරික කටයුතු අරඹා පරම්පරා කිහිපයක් ඔස්සේ හෝ ඉක්මනින් හෝ ප්‍රාග්ධන සමුච්චයක් කර ගැනීමට සමත් වූ කාර්ය ශූර, වාසනාවන්ත පිරිස වූහ. ව්‍යවසායකයෝ ව්‍යාපාර ක්ෂේත්‍රයට ඇතුළු වෙති, පිට වෙති. සමහරකුගේ ව්‍යාපාර සාර්ථක වන අතර, ඇතැම්හු බංකොලොත් වෙති. සමහරු ආරම්භ කළ කුඩා මට්ටමේම වන ව්‍යාපාර ඇත්තෝ වෙති. සමහරු මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර දක්වා සිය ව්‍යාපාර දියුණු කර ගනිති. කිහිප දෙනෙක් යෝධ සමාගම් බවට වර්ධනය වෙති. මේ අතර අපෞද්ගලික මට්ටමින් ප්‍රාග්ධනය රැස් කිරීම නොකඩවා සිදු වෙමින් පවතී. මෙම අපෞද්ගලික ප්‍රාග්ධනය අයත් වන්නේ, තම මුදල් බැංකුවල හා කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන මහජනයාට ය. කෙමෙන් දේපොළ අයිතිය සුරක්ෂිත වී, නීතිමය පාදකව්‍යුහය වැඩි දියුණු වී, ව්‍යාපාර කටයුතු පිළිබඳ සදාචාර ධර්ම පද්ධතියක් ගොඩ නැගුණු විට, පෞද්ගලික නොවන ආයෝජන ක්‍රම ව්‍යාප්ත වී යාමට ඇති ඉඩකඩ වැඩි වේ. මේ සිද්ධිදාමය ශක්තිමත් වීමට නම් අවශ්‍ය තවත් කොන්දේසියක් ඇත. එනම් රටේ කෙරෙන, නිවැරදි හා සාධාරණ ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳ රජයේ ආරක්ෂාකාරී සහතිකය ය.

සමස්තයක් ලෙස ගත් කල, මෙවැනි ආයතනික ආයෝජන පිටුපස අවසාන වශයෙන් අයිතිය හිමි පෞද්ගලික දේපොළ හිමියන් ගේ උනන්දුව ඇත. එහෙයින් ආයෝජනයෙන් කොටසක් හිමි ලාභ නොලබන ආයතනවල ඕනෑ එපාකම් ද ආරක්ෂා වේ. එසේ නැතහොත්, නිදසුන් ලෙස, තමන්ගේම

සම්ප්‍රදායයන් හා නියම ස්වයං පාලන උපකරණ හිමි, විශ්ව විද්‍යාලයක් හෝ පදනම් ආයතනයක් හෝ වැනි කිසියම් ශක්ති සම්පන්න ආයතනයක් පසුබිමෙහි පවතිනු විය හැක. මෙම ආයතන රජයේ අනුග්‍රහය මත යැපෙන්නේ නැති බැවින් ද, මූල්‍ය පාලනයේ ස්වාධීනත්වය ඒවාට ඇති බැවින් ද, සිය ආයෝජනවල සුරක්ෂිතභාවය එමගින් නිසි ලෙස රැක ගැනෙනු ඇත. මේ ක්‍රියාදාමය වැඩි දියුණු වී, කල් යාමේදී, රටේ කෙරෙන ආයෝජන තුළ ඇති අපෞද්ගලික ආයෝජන අනුපාතය ඉහළ නගිනු ඇත.

මෙතෙක් කී කරුණු සම්බන්ධයෙන් වැදගත් වන විශේෂ කරුණු දෙකක් ඇත. ඉන් පළමු වැන්න නම්, ආරම්භ කෙරෙන ව්‍යාපාරය සැබැවින්ම අලුත් එකක් නම්, එය අපෞද්ගලික ආයෝජනයක් වන්නේ කලාතුරකින් වන බවයි. පසුගිය පනස් වසර ඇතුළත බිහි වූ නව නිෂ්පාදන සියල්ල බිහි වූයේ හඳුනා ගත හැකි ව්‍යවසායකයන් ගේ පෞද්ගලික මුදල් ආයෝජනය කිරීමෙනි. මේ සම්බන්ධ ප්‍රධාන ව්‍යාතිරේක වනුයේ යුද්ධමය හා පාදකව්‍යුහමය කටයුතු සම්බන්ධ නවෝත්පාදන ය. නව ගුවන් තොටුපොළක් ගොඩ නැගීමට නම්, මධ්‍යම ආණ්ඩුව, ප්‍රාදේශීය ආණ්ඩු සමග සහයෝගයෙන් ප්‍රාග්ධනය උපයා ගනිතැයි අපේක්ෂා කිරීම ස්වාභාවිකය. එහෙත් මෙවැනි අවස්ථා අව්‍යාජ නව ව්‍යාපෘති අතර දුලභ විශේෂ අවස්ථා වන බව අවධාරණය කළ යුතුය. සාමාන්‍ය තත්ත්වය නම්, නව ව්‍යාපාරයක පුරෝගාමීන් තම නව නිෂ්පාදන වෙළෙඳ පොළට යවා විශාල ලාභයක් ලබා ගන්නවාක් මෙන්ම, ව්‍යාපාරය අසාර්ථක වුවහොත් පාඩුව විඳ දරා ගන්නේ ද ඔවුන්ම වීම ය. එවැනි අවස්ථාවලදී සමහර විට අධික ලාභ බලාපොරොත්තුවෙන් අවදානම් දැරීමට සූදානම් පිටස්තර පෞද්ගලික ආයෝජකයන්, ආරම්භක ව්‍යවසායකයා ගේ ප්‍රාග්ධනයට යම් එකතුවක් කිරීමට නම් පුළුවන.[23]

දෙවන කරුණ, ප්‍රශ්නයක ස්වරූපය ගනී. සමකාලීන ධනවාදී රටවල වර්තමානයෙහි අපෞද්ගලික දේපොළ ක්‍රමය පවතින තරම, හංගේරියාවට මග පෙන්වීමක් විය යුත්තේ මන්ද? ජපානයේ පවතින ආයතනික අයිතිය සියයට 42 ක්ද, එක්සත් ජනපදයේ එය සියයට 37 ක්ද වේ නම් (මේවා කොහොමටත් අනුමාන සංඛ්‍යා ය) අප සියයට 37 සිට 42 දක්වා එම රටාවම අනුගමනය කළ යුතුද? බටහිර රටවල පවතින අපෞද්ගලික දේපොළ අයිතිවාසිකම් ක්‍රම ද විවේචනයට ලක් වෙමින් පවතී. එම විවේචන බොහෝ දුරට නිවැරදි යයි මම සිතමි. අන්‍යෝන්‍ය පරස්පර කාරණයක් වුවද, නූතන ධනවාදය තුළ සමාජවාදයේ බීජ අන්තර්ගත ව ඇත. මේ රටවල රක්ෂණ අංශයේ ද, සෞඛ්‍ය සේවාවන්හි හා බැංකු කටයුතුවල ද දේපොළ අයිතිය ඕනෑවට වඩා අපෞද්ගලික වී ඇති බැව් බොහෝ අය විශ්වාස කරති. එක්සත් ජනපදයේ, නිවාස ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සපයන ඉතිරි කිරීම් හා ණය දෙන සමිති සම්බන්ධව අය - වැය සංරෝධක ලිහිල් වී ඇති අවස්ථා දැකිය හැකිය. මෙවැනි සමිති බොහොමයක් බංකොලොත් වීමට ආසන්නව පසු වේ. එසේ සිදු වී ඇත්තේ, මුදල් තැන්පත් කරුවන් ගේ විශ්වාසය කඩ වන පරිදි ඒවා අවිශ්වාසදායක කොන්ත්‍රාත්කරුවනට අධික ලෙස ණය දීම හේතු කොට ගෙන ය. හංගේරියානු ආර්ථික විද්‍යාඥයකුට නම් මෙය හොඳට අසා පුරුදු එකකි.

---

23. මෙවැනි 'ආරම්භක අවදානම් ප්‍රාග්ධනය' (Venture Capital) සපයමින් ව්‍යාපෘතීන් මූල්‍යණය කිරීමට බැඳී සිටින මූල්‍ය ආයතන අමෙරිකා එක්සත් ජනපදයේත්, වෙනත් දියුණු කාර්මික රටවලත් දක්නට ලැබේ.

මෙවැනි සමිති බංකොලොත් භාවයෙන් ගලවා ගැනීමට දැන් රජය සිය මුදල් යෙදවිය යුතු වේ. රජය එසේ නොකළොත්, තැන්පත් හිමියන් සිය මුදල් ලබා ගැනීමට කලබල වී එම සමිති කරා දිව යාමෙන්, 1929 පරිහාණියේදී සිදු වූවාක් මෙන් මූල්‍ය අර්බුදයක් ඇති විය හැකි බැවිනි. මෙය අප අනුගමනය කළ යුතු පිළිවෙතක් ද? ඇත්තෙන්ම නැත. යටකී සමිතිවල කටයුතු සම්බන්ධයෙන් මූල සිටම දෘඪ සංරෝධක භාවිත විය යුතුව තිබුණු බවත්, රජයේ ඇප වීමේ කොන්දේසි ඉතාම පැහැදිලිව සඳහන් කොට තිබිය යුතු වූ බවත්, බොහෝ අමෙරිකානු ආර්ථික විද්‍යාඥයෝ කියා සිටිති. මෙවැනි දෑ අනුගමනය නො කිරීමට හංගේරියාව වැනි රටක් විශේෂයෙන් පරිස්සම් විය යුත්තේ, රාජ්‍ය අංශයේ අනුග්‍රහශීලී කාර්යභාරය ගැන දැඩි විශ්වාසයක් පසුගිය දශක කිහිපය තුළ රටේ දැඩි ලෙස ගොඩ නැගී ඇති බැවිනි.

රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල කළමනාකරුවන් ගේ වේතන දෙසට නැවත මොහොතකට හැරෙමු. රජයේ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වා ගෙන යන කළමනාකරුවකු මා දකින්නේ තානාපතිවරයකු, නගරාධිපතිවරයකු හෝ හමුදාපතිවරයකු තරම් ම ගරු කටයුතු නිලධාරියකු ලෙසිනි. එහෙත් වරදවා නොසිතන්න. ඔහු ව්‍යාපාරිකයෙක් නම් නොවේ. සිය රැකියාව හොඳින් කරතොත් ඔහුට ඒ වෙනුවෙන් හොඳට මුදල් උපයා ගත හැකි විය යුතුය. එහෙත් ඔහුගේ වැටුප අහස උසට ඉහළ යාමට ඉඩ නොතැබිය යුතුය. එවැනි ඉහළ වැටුප් මා අනුමත නොකරන්නේ අද රට මුහුණ පා සිටින දුෂ්කරතා නිසාම නොවේ. රටේ තත්ත්වය සතුටුදායක ලෙස පැවතුණත්, රාජ්‍ය අංශයේ කළමනාකරුවා රටේ අය-වැයෙන් වැටුප් ලබන නිලධාරියකු මිස, විවිධ පුද්ගලයින් ගේ මුදල් කළමනාකරණයට අවසර ලැබූවෙක් නොවේ. අගමැතිගේත් හමුදාපතිවරුන්ගේත් වැටුප් නියම කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ම, මොවුන්ගේ ද වැටුප්වල උපරිම සීමා තීරණය කළ යුතුය.

මීට ඉහතිනුදු සඳහන් කළ පරිදි, හංගේරියානු ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය තුළින් ඇති වූ අර්ධ විමධ්‍යගතකරණය මුල් කර ගෙන, රජයේ ව්‍යාපාර කළමනාකරුවන් තුළ, අව්‍යාජ ව්‍යාපාරිකයන් තුළ ඇති විය යුතු විධියේ ගති ලක්ෂණ කිහිපයක් වර්ධනය වී ඇති බැව් පෙනේ. මෙම වෙනස්කම් ඔවුන් ගේ මූල්‍යමය හා සදාචාරමය ප්‍රොත්සාහ සම්බන්ධයෙන් ද බලපානු ඇතැයි අපේක්ෂා කළ හැකිය. නඩුවලින් වරදකරුවන් වූ අය සිරගෙයි ගත කරන අවුරුදු ගණනට සාමානුපාතිකව පැමිණිළි පක්ෂ නීතිඥයින්ට බෝනස් දිය යුතු යැයි කිසිවකුත් යෝජනා නොකරනු ඇති වුවත්, සිය වැටුපට අමතරව රජයේ ව්‍යාපාර කළමනාකරුවන්ට බෝනස් ලැබිය යුතුය යන අදහස බොහෝ දෙනකු සාධාරණ ලෙස සලකනු ඇත. එසේ වුවද, මෙම අමතර ගෙවීම් සීමාවන් තුළ තබා ගත යුතුය. අද හංගේරියාවේ ඇත්තේ ඉතාම අත්තනෝමතික වූ ද විකෘතිකාරී වූ ද මිල හා බදු පද්ධතියකි. ඒ යටතේ 'ලාභය' යන වචනයේ ආර්ථික නිර්වචනය දැඩි මතභේදවලට තුඩු දෙන්නකි. ඒ අනුව රාජ්‍ය අංශයේ ව්‍යාපාර කළමනාකරුවකුට ගෙවන ප්‍රසාද දීමනා එම ව්‍යාපාරයෙන් ලැබෙතැයි කියැවෙන ලාභය සමග සම්බන්ධ වූ යම් සූත්‍රයක් ඇසුරින් ගණනය කිරීම අසාධාරණ ය.

හංගේරියාවේ අනාගත පාර්ලිමේන්තුව රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල කළමනාකරුවන් ගේ වේතනවල උපරිම සීමා නියම කළ යුතු යයි මා යෝජනා කළද, එවැන්නක් පෞද්ගලික ව්‍යාපාරයන් හා රැකියා ගිවිසුම්වලට එළඹ ඇති

කළමනාකරුවන් සම්බන්ධයෙන් කළ යුතු යයි මම අදහස් නො කරමි. යම් පෞද්ගලික ව්‍යාපාරයක අයිතිකරුට සිය සේවකයින් අතුරින් එකකුට වසරකට පොරින්ට් මිලියනයක් ගෙවීමට අවශ්‍ය වේ නම් ඔහුට එසේ කිරීමට නිදහස තිබිය යුතුය. එසේ කිරීම වටී දැයි ඔහු නිසැකවම දනී. එහෙත් අදාළ ගෙවීම් සඳහා මුදල් එන්නේ රාජ්‍ය අය-වැයෙන් නම්, එවැනි තැනක, තම සමාගමෙන් අත්තනෝමතිකව තීරණය කළ වැටුප් ප්‍රමාණයක් ලැබීමට හෝ එවැනි වැටුපක් පරිපාලන අධිකාරයක් මගින් අනුමත කරවා ගැනීමට හෝ කිසිවකුටත් අවසර නොතිබිය යුතුය.

මේ පිළිබඳ හොඳ නිදසුනක් මෙහිදී දක්වමි. 1995 දී ලෝක අපනයන ප්‍රදර්ශනය හංගේරියාවේ පැවැත්වීම ගැන විවාදයක් අද රටේ පවතී. මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යාමට නියමිතය. එහිදී ආණ්ඩුව හෝ ආණ්ඩුවේ යම් අංශයක් හෝ ඉදිරිපත් කරනු ඇති යෝජනාවක් ගැන ඡන්දය දීමට මන්ත්‍රීවරුන්ට සිදු වේ. මේ පිළිබඳව මම පහත දැක්වෙන යෝජනාව ඉදිරිපත් කරමි.

එම යෝජනාව සම්බන්ධයෙන් වගකීම දරන රජයේ නිලධාරීන්, කම්වු සාමාජිකයින් හා අමාත්‍යංශ කොමසාරිස්වරුන් තම තමන් සතු මහල් නිවාස, පුද්ගලික නිවාස, දෙවන නිවාස, මෝටර් රථ, කලා කෘති යනාදී පෞද්ගලික වත්කම් ඒ වෙනුවෙන් උගස් තැබිය යුතුය. එම වත්කම් ලැයිස්තුව අදාළ යෝජනාවට අමුණා තැබිය යුතුය. මේ සම්බන්ධයෙන් උගසට නොතබන්නේ තම පෞද්ගලික වත්කම් අතුරින් කවරක් දැයි නිගමනය කිරීමට අදාළ පුද්ගලයින්ට නිදහස තිබිය යුතුය. ඒ සමගම උගසට තබන වත්කම් ඔවුනට ඉතා වටිනා දේ වීමට ද වග බලා ගත යුතු වේ. මෙම වත්කම්වල වටිනාකම අපේක්ෂිත ආයෝජන පිරිවැයෙන් අංශු මාත්‍රයක් වන බව සැබෑ ය. එහෙත් අදාළ පුද්ගලයන් ගේ පැත්තෙන් බලන කල, මෙම උගස්කර, ඔවුන් ගේ ජීවිත කාලය පුරා උපයා ගත් මුළු ධනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වනු ඇත.

අපනයන ප්‍රදර්ශනය සාර්ථක වුවහොත් එම යෝජනාව පිළියෙළ කළ අයට ඉතා ඉහළ ප්‍රසාද දීමනා ලබා ගැනීමේ අවස්ථාව තිබිය යුතුවාක් මෙන්ම, එය අසාර්ථක වුවහොත් උගසට තැබුණු සියලු වත්කම් ඔවුනට අහිමි වීමේ තර්ජනය ද තිබිය යුතුය.

තම පසුම්බියට අවධානම් එල්ල වන විට ඇති වන හැඟීම, යට දැක්වූ කොන්දේසි නිසා මෙම නීති සම්පාදකයින්ට දැනෙනු ඇත. මේ පසුබිම යටතේ යෝජිත ක්‍රියා මාර්ගයෙන් ඉවත් වීමට ඔවුන් තීරණය කරතොත්, එසේ කිරීමට ද ඔවුනට අයිතිය තිබිය යුතුය.

මා වරදවා තේරුම් නොගන්න. හැම රටකම ආණ්ඩුව ඕනෑම නීති කෙටුම් පතක් ඉදිරිපත් කරන විට, යට කී විධියේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතු යයි මම නොකියමි. එම ආදර්ශ කථාව අදාළ වන්නේ **වර්තමාන හංගේරියාවට** ය. පසුගිය අවුරුදු 40 ක් තිස්සේ පොරින්ට් බිලියන ගණන් වැය වන තීරණ හා යෝධ ව්‍යාපෘති, පක්ෂයේ හා රජයේ නිලධාරීන් විසින් එක් පැන් පහරින් ආරම්භ කොට ඇත. එම ව්‍යාපෘති ඵල දැරුවා නම් යෙහෙකි. ඒවා අසාර්ථක වුවද, මෙම නිලධාරීහු කිසි විටෙකත් පැන්සයකවත් වියදමක් නොදැරූහ. මේ නිදසුනෙන් ද අපේක්ෂා කෙරෙන්නේ, තීරණ ගන්නන් ගේ පෞද්ගලික වත්කම් හා ඔවුන් ගන්නා ආර්ථික තීරණ එකට සම්බන්ධ කරන පුරුකක් ඇති කළ යුතු බවයි.

1.3 අංශ දෙක අතර අනුපාතය වෙනස් කිරීම: පෞද්ගලිකකරණ ක්‍රියාවලිය

රටේ ජාතික නිෂ්පාදිතයේ වඩා විශාල කොටස පෞද්ගලික අංශයෙන් ලැබෙන තත්ත්වයක් කරා, පෞද්ගලික අංශයේ දායකත්වය වේගවත්ව වැඩි කිරීම අවශ්‍ය යයි මම සලකමි. කෙසේ වුව ද, මෙවැනි වෙනසක් බිහි කළ හැක්කේ ඓන්ද්‍රීය වූ වර්ධන හා සමාජ විපර්යාස ක්‍රියාවලියක් මගිනි. කලින් ද පෙන්වා දී ඇති පරිදි, මෙම ක්‍රියාවලිය අද ඊයේ වර්ධනය වූවක් නොව දශකයක් දෙකක් ඔස්සේ සෙමින් සෙමින් සිදු වෙමින් පැවතුණු එකකි. අද කිරීමට ඇත්තේ එම කාර්යය කඩිනම් කිරීම සඳහා ප්‍රායෝගික පියවර කීපයක් ගැනීමයි.

මම 'පුනර් පෞද්ගලිකකරණය' යන යෙදුම ප්‍රිය නොකරමි. බ්‍රිතාන්‍යයේ සිදු වූ ජනසතු කිරීම් මධ්‍යයේ නොනැසී පැවතුණ පෞද්ගලික අංශය යළි නගා සිටුවීමේ ප්‍රතිපත්ති, එම සටන් පාඨය යටතේ ක්‍රියාවට නැගීමට මාග්‍රට් තැචර්ට හේතු තිබිණ. තවද, සාධාරණ වෙළෙඳ පොළ මිලකට රාජ්‍ය අංශයේ ව්‍යාපාර මිලට ගැනීමට සැහෙන දේශීය ප්‍රාග්ධනයක් බ්‍රිතාන්‍යයේ ඇත. (එ රටේ ද 'පුනර් පෞද්ගලිකකරණය' දුෂ්කරතාවලට මුහුණ දෙන බව නම් සඳහන් කළ යුතුය.)

හංගේරියාව තුළ අත්පත් කර ගැනීමට සැහෙන ඉඩක් තිබෙන අභිමතාර්ථ මොනවාද? ඉටු කරගත නො හැකි හා නොකළ යුතු දේ මොනවා ද? මම මෙයින් දෙවැන්න පළමුව සාකච්ඡා කරමි.

රාජ්‍ය දේපොළ කාරුණික හැඟීම් උඩ කැමැති කෙනකුට බෙදා දී දේපොළ කොල්ලයක් සිදු නොකළ යුතුය. මෙය විවිධාකාරයෙන් සෑම තැනකම සිදු වේ. නිදසුනක් ලෙස, රජයේ තට්ටු නිවාස සැබෑ වෙළෙඳ පොළ මිලෙන් අංශුවකට කුලී නිවැසියන්ට විකිණීම සම්පූර්ණයෙන්ම අසාධාරණය. මෙහි දී තත්ත්වය වඩාත් නරක් වනුයේ විකුණුම් මිලෙන් ද ගැනුම්කරු තැන්පත් කරන්නේ ඉතා සුළු මුදලක් වීමය. මේ අන්දමට හංගේරියානු අගනුවර ඉතාම වියදම් අධික කොටසක් වන බුඩා හි පිහිටි වර්ග මීටර් සියයක් වන මහල් නිවාසයක් කෙනකුට හුදෙක් වර්ග මීටරයක වෙළෙඳ පොළේ මිලට ලබා ගැනීමට හැකි වෙනු ඇත. අවුරුදු හෝ දශක ගණනාවක් තිස්සේ රජයෙන් සැපයුණු සහනාධාර නිසා අඩු කුලී ගෙවමින් සිටි නිවැසියන්ටම තුට්ටු දෙකට මෙම නිවාස විකිණීම විහිළුවකි.

රජයේ ව්‍යාපාර බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් බවට පත් කිරීමේ දී, පුද්ගලයන්ට ලබා ගත හැකි කොටස් ප්‍රමාණය ගැන මගේ දැනුම අසම්පූර්ණ ය. කළමනාකරුවන්ට හා වෙනත් සේවකයින්ට ඉදිරිපත් කළ ව්‍යාපාර කොටස් ප්‍රමාණ ගැනද මට අවබෝධයක් නැත. යම්තාක් දුරට ඔවුනට විශේෂ සැලකිලි යටතේ කොටස් මිලට ගැන්මට ඉඩ දීම හා ඔවුනට වට්ටම් දීම සාධාරණ යයි සිතේ. එහෙත් කළමනාකරුවකු වුවත්, සේවකයකු වුවත්, වෙනත් අයකු වුවත්, තුට්ටුවට දෙකට ව්‍යාපාරයක කොටස් මිල දී ගැනීමට කෙනකුට අවස්ථාව ලබා දීම වැරදි සහගත ය.

මිනිසුන් ගේ සිවිල් අයිතියක් ලෙස සලකා රජයේ දේපොළ ජනතාව අතර බෙදා දිය යුතු යයි තවත් යෝජනාවක් තිබේ. එවැනි ක්‍රමයක් යටතේ, රාජ්‍ය දේපොළවලින් කුඩා කොටස් පුරවැසියන්ට අයිති වීමත්, එම ප්‍රාග්ධන ප්‍රමාණයන් ආයෝජනය කිරීමට හෝ විකිණීමට ඔවුනට නිදහස ලැබීමත් සිදු වේ. මේ යෝජනාව වැරදි සහගත ය. එය මා දකින්නේ රජය නමැති පියාගේ

අනපේක්ෂිත මරණයෙන් අනතුරුව, පිය උරුමය දරුවන් වන ජන සමාජය අතර සම සේ බෙදා දීමක් ලෙසිනි. එහෙත් රාජ්‍යය ප්‍රාණවත් ව ජීවතුන් අතර සිටී. එම නිසා වඩා ප්‍රවේසම්කාරී ලෙස හා කාර්යක්ෂම ලෙස උරුමය සුරකින අලුත් භාරකරුවකු පැමිණෙන තෙක් පවතින රාජ්‍ය යන්ත්‍රය එම දේපොළ රැක ගත යුතු ය. මෙතැන දී වැදගත් වන්නේ දේපොළ බෙදා හැරීම නොව, සැබැවින්ම වඩා යහපත් අයිතිකරුවකු අතට පත් කිරීමයි. ඒ සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසිය නම්, අව්‍යාජ පෞද්ගලික ව්‍යවසායක ප්‍රොත්සාහක වර්ධනය වී මුල් බැස ගැනීම ය.

මේ සම්බන්ධයෙන් කළ යුතු සේ මා ඉදිරිපත් කරන යෝජනා දෙසට දැන් අපි හැරෙමු.

(1) රාජ්‍ය අංශයේ දේපොළ, සුදුසු අන්දමට කොටස්වලට බෙදා, ඒවා මිල දී ගැනීමේ අවස්ථාව පෞද්ගලික අංශයට ලබා දිය යුතුය. මහල් නිවාස, තනි තට්ටු නිවාස, කුඩා භූමි භාග, සාප්පු යනාදිය වැනි රාජ්‍ය අංශයේ වත්කම් මිල දී ගැනීමට කුටුම්බවලට නිදහස තිබිය යුතුය. රජයේ ව්‍යවසායයන් අයිති කර ගැනීමට පුද්ගලික ව්‍යවසායකයින්හට ද අයිතිය තිබිය යුතුය. රාජ්‍ය අයිතිය යටතේ පවතින විශාල ව්‍යාපාර මිලට ගැනීමට වත්මන් හංගේරියාවේ පෞද්ගලික ව්‍යවසායකයින් සමත් වෙතැයි සිතීම මුලාවකි. එසේ නමුත් කුඩා ව්‍යවසායයන් මිලට ගැනීමට අවස්ථාව ඔවුනට තිබිය යුතුය. කුඩා ඒකක කෘත්‍රිම ලෙස එකතු කර සෑදුණු විශාල හංගේරියානු ව්‍යවසායයන් කොටස්වලට කැඩීමෙන් මේ පහසුකම් පෞද්ගලික ව්‍යවසායකයනට ලබා දිය හැකි වේ. මෙසේ කළ පසුව එම කුඩා ඒකක පෞද්ගලික ව්‍යවසායකයින්ට විකිණීමට පුළුවන. 'මිලට ගන්න නො එසේ නම් ඉවත් වෙන්න' යන සිද්ධාන්තය මෙහි ලා කිසි සේත් භාවිත නො කළ යුතුය. කෘත්‍රිම ලෙස පුම්බන ලද යෝධ ව්‍යාපාරයක් සෞඛ්‍ය සම්පන්න කුඩා ඒකක දහයකට වෙන් කොට, ඉන් ඒකක පහක් විකුණා, ඉතිරිය රජයේ පාලනය යටතේ තබා ගැනීමට වුව පුළුවන.

රජයේ දේපොළ පුද්ගලයන් අතට පත් කිරීමේ දී ඉහතින් කී ලෙස වෙන් කිරීමට නොහැකි විශාල ඒකක නම්, දරුණු ලෙස කඩා බිඳ දැමීම නොකළ යුතුය. වෙනත් දියුණු කාර්මික රටවල් සමඟ සසඳන විට පවා, වර්තමාන හංගේරියානු ආර්ථිකය ඕනෑවට වඩා සංකේන්ද්‍රිත ය. කුඩා ව්‍යාපාර ඒකක නිර්මාණය කිරීමට අවස්ථා රාශියක් තිබුණ ද එය කලබලයෙන් කළ යුතු නැත. තරගයේ ප්‍රතිඵලයක් වශයෙන් ස්වාභාවිකව සංකේන්ද්‍රණය විය යුතු අංශ මොනවා දැයි තේරීමක් සිදු වූ, අව්‍යාජ වෙළෙඳ පොළ ආර්ථිකයන් පවතින රටවල සංකේන්ද්‍රණ ව්‍යූහය හොඳින් විග්‍රහ කොට බැලීම මෙවැනි පසුබිමක සිට කළ යුත්තකි. එවැනි ආර්ථික ක්‍රමවල විශාල, මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායයෝ ද, ගෘහ කර්මාන්තවල නියැලී සිටින්නෝ ද සහයෝගයෙන් හා සහජීවනයෙන් කල් ගෙවති. එවැනි විවිධ ප්‍රමාණයේ ඒකක සියල්ල හංගේරියාවට ද අවශ්‍ය ය.

පුද්ගලිකකරණයේ දී අදාළ ව්‍යාපාර අයත් වන අංශ මොනවාද, ව්‍යාපාරවල ප්‍රමාණ කවරේද යන කරුණු නොතකා ඒකාකාරී

ක්‍රමයකට කටයුතු කිරීම අනුවණ කමකි. රාජ්‍ය අයිතිය යටතේ පවතින එලවළු කඩයක් හෝ මෝටර් රථ අලුත්වැඩියා කරන කුඩා ස්ථානයක් හෝ සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමයට වෙනස් ක්‍රමයක්, යෝධ ව්‍යාපාර සම්බන්ධයෙන් යොදා ගත යුතුය. පහත 2 සිට 8 දක්වා අංක යටතේ දැක්වෙන පුද්ගලිකකරණ විධි අතුරින් සුදුසු ක්‍රම තෝරා ගැනීමේ දී මේ කරුණ සැලකිල්ලට ගත යුතුය. රජයේ අයිතිය යටතේ පවතින කුඩා ඒකක පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායම් හෝ අතට පත් කිරීම වඩාත් පහසු වේ. ඒකකය විශාල වත්ම, මේ සඳහා වෙනත් නීතිමය විධි අවශ්‍ය වේ. (අංක 9 යටතේ ඇති බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් පිළිබඳ විස්තරය කියවන්න.)

(2) රජයේ දේපොළ පුද්ගලික අයිතිකරුවන් අතට පත් වීමේ දී, එහි ප්‍රමාණය කවරක් වුවත්, එය හුවමාරු විය යුත්තේ, සැබෑ වෙළෙඳ මිලකට ය. දේපොළ ප්‍රසිද්ධියේ වෙන්දේසි කොට, භව්‍ය ගැනුම්කරුවන්ට ඒ බැව් ප්‍රසිද්ධියේ දැනුම් දිය යුතු ය. දේපොළ විකුණුම්කරු වන රජයේ ආයතනය නිවැරදි (සුදුසු පරිදි ඉහළ) විකුණුම් මිලක් නියම කරනු ඇතැයි සහතිකයක් සැම විටම දක්නට නැත. එබැවින් රාජ්‍ය අංශය කරන මිල නියම කිරීම්වල දී ඊට ස්වාධීන කණ්ඩායම් සම්බන්ධ කර ගැනීම වඩා ප්‍රයෝජනවත් වේ. සමහර දේපොළ වර්ග අලෙවි කිරීමේ දී ඒවායේ මිල නියම කිරීම පහසු වේ. නිදසුනක් ලෙස මහල් නිවාස අලෙවිය සඳහා මිල නියම කිරීමේ දී එවැනි නිවාස පිළිබඳ පෞද්ගලික වෙළෙඳ පොළේ පවතින මිල මට්ටම් සුදුසු ආරම්භයක් සපයනු ඇත. එහෙත් නිෂ්පාදන ව්‍යාපාර විකිණීමේ දී, මිල නියම කිරීම වඩා දුෂ්කර කාර්යයක් වනු ඇත. මෙවැනි අවස්ථාවක සොයා බැලිය යුත්තේ, විකිණීමට ඇති වර්ගයේ නිෂ්පාදන ව්‍යාපාරයක් අලුතෙන් පිහිටුවා ගැනීමට යතොත් පුද්ගලික ව්‍යවසායකයකුට තම මුදලින් ඒ සඳහා කොපමණක් ආයෝජනය කිරීමට සිදු වේද යන්නයි.

(3) රජයේ දේපොළ පුද්ගලික අයිතිකරුවන්ට අලෙවි කිරීම පහසු කිරීමට ණය දෙන ආයතනයක් පිහිටු විය යුතුය. පහත දැක්වෙන්නේ එවැන්නක් සඳහා දළ සැලැස්මකි. මෙය අදාළ කරුණ වැඩිදුර විස්තර කිරීමට උපයෝගී කර ගත්තක් විනා මැනවින් සැකසූ යෝජනාවක් නම් නොවේ.

පුද්ගලයකුට හෝ කණ්ඩායමකට හෝ පොලාරින්ට් මිලියන 20 ක් වටිනා රාජ්‍ය දේපොළ අයිති කර ගැනීමට වුවමනා යයි සිතමු. (මෙය අංක 2 යටතේ විස්තර වූ විධියේ සැබෑ මිලක් යයි සිතමු). භව්‍ය ගැනුම්කරුවා, විකුණුම්කරුට පොරින්ට් මිලියන 5 ක මූලික ගෙවීමක් කළ යුතු වෙතැයි ද, ඉතිරි මිලියන 15 පොළිය ද සමග සමාන වාරික කිහිපයකින් වසර 5 ක් ඇතුළත දී ගෙවා නිම කළ යුතු වෙතැයි ද සලකමු. මෙම ගනුදෙනුව නිම වූ සැණෙකින් පොරින්ට් මිලියන 20 ක් වටිනා අදාළ රජයේ දේපොළ පෞද්ගලික දේපොළ බවට පත් වුව ද, ඒ සඳහා ගැනුණු ණය ප්‍රමාණයට සරිලන උකසකට මිල දී ගත් පුද්ගලයා යටත් ව සිටී.

මෙම උකස ණයකරු දැඩි ලෙසින් බැඳ තබන එකක් වීම වැදගත් ය. යම් හෙයකින් නව පුද්ගලික හිමිකරුවා තම වාරික මුදල් නිසි කල්හි නොගෙවතොත්, ඔහු මුලින් ආයෝජනය කළ මුදලින් සුදුසු කොටසක් (අවශ්‍ය නීතිමය කටයුතු වලට පසුව) ඔහුට අහිමි විය යුතු අතර, අදාළ දේපොළ ණය ගනුදෙනුව කළ රාජ්‍ය ආයතනයට නැවත පවරනු ලැබිය යුතුය.

මේ නිදසුනේ හරය, එහිදී සඳහන් කැරුණු සංඛ්‍යානමය අනුපාත හෝ අදාළ සංවිධාන විධි හෝ සම්බන්ධ කරුණක් නොවේ. (උකස් ණය දුන් ආයතනය හෝ ණය කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරවන ආයතන හෝ කවරක් ද යන්න මෙහි ලා වැදගත් කරුණක් නොවේ.) මෙම නිදසුන ඉදිරිපත් කිරීමේ දී මගේ අරමුණ වැදගත් ආර්ථික ප්‍රතිපත්ති අවශ්‍යතා දෙකක් පැහැදිලි කිරීමයි. ඉන් පළමුවැන්න, පුද්ගලයින්ට රජයේ දේපොළ අලෙවි කෙරෙන උපරිම සීමාව ඔවුන් අත දැනට පවතින මුළු පුද්ගලික ධනය අනුව තීරණය නොකළ යුතු බවය. 'රජයේ දේපොළ' මිලට ගැනීම සඳහා පෞද්ගලික අංශය අත ඇත්තේ ප්‍රාග්ධන ඒකක සියයක් පමණක් වුවද, අඩුපාඩු මුදල් ණය මගින් පියවා ගෙන, ඊට සියයේ කිහිපයක් වටිනා රාජ්‍ය දේපොළ මිලට ගත හැකි වනු ඇත. මේ ක්‍රමය යටතේ රාජ්‍ය දේපොළ පුද්ගලයන් අතට පත් කිරීමේ ක්‍රියාදාමය කඩිනම් කළ හැකි වේ. දෙවනුව, මෙසේ දෙනු ලබන ණය, අස්පෘශ්‍ය වන කොටස් වෙළෙඳ පොළ මගින් බෙදා හරිනවා වෙනුවට නාමිකව හඳුනා ගත හැකි සැබෑ පුද්ගලයින්ට ලබා දීමේ හැකියාව මේ අනුව ලද හැක. මෙවැනි පුද්ගලයන්ට සැලකිය යුතු ණය ප්‍රමාණයක් ලද හැකි විය යුතු අතර, එම ණය ආපසු ගෙවීමට අපොහොසත් වුවොත් ඔවුන් ගේ මූලික ප්‍රාග්ධනය පවා අහිමි වන තත්ත්වයක් ඇති කළ යුතු ය.

(4) රජයේ වත්කම් පුද්ගලයන්ට බදු දීම දැනටමත් හංගේරියාවේ බහුලව සිදු වේ. මෙවැනි ක්‍රමයක් නියත වශයෙන්ම අවශ්‍ය නමුදු, එසේ කිරීමේ දී වළක්වා ගත යුතු වැරදි දෙවර්ගයක් තිබේ. ඉන් එකක් නම් බදු දෙන්නා ලෙස කටයුතු කරන රජයේ ව්‍යාපාර, තණ්හාධිකව, අයුතු පරිදි අධික බදු කුලියක් ඉල්ලා සිටීමයි. මේ නිසා ඉවක් බවක් නැතිව රජයේ දේපොළ සූරා කෑමට බදු ගන්නා පෙළඹේ. බදු ගත් දේපොළින් ගත හැකි සියල්ල සූරා ගෙන ඔහු තවත් දේපොළකට යනු ඇත. ඉහතින් සඳහන් කරන ලද වැරදි දෙකින් දෙවැන්න නම්, බදු දෙන්නා ඉතා ම අඩු බදු කුලියක් නියම කොට, රජයේ දේපොළ නාස්ති කිරීමය. කෙටියෙන් කියතොත් අය කරනු ලබන බදු කුලිය තත්වානුරූප වූ ද තාර්කික වූ ද එකක් විය යුතුය.

රජයේ අයිතිය යටතේ පවතින දේපොළ පුද්ගලයන්ට විකිණෙන තත්ත්වය කරා පරිවර්තනය වීමේ අවධියක් සේ බදු දීමේ ක්‍රමය හඳුන්වන්නට පුළුවන. එක් අතකින් බලන විට, රජයේ දේපොළ මිලට ගැනීම වටී දැයි තීරණය කිරීමට අවශ්‍ය අත්දැකීම හා හැකියාව මේ ක්‍රමයෙන් බදු ගන්නා ලබා ගනී. අනික් අතට බලන විට, දේපොළ විකිණීමේ දී අපේක්ෂා කළ යුතු සැබෑ මිල කුමක් දැයි යන අවබෝධය

ලබා ගැනීමට මේ නිසා රජය සමත් වේ. දේපොළකින් ලැබෙන බදු කුලී ඇසුරින් එම දේපොළෙහි ප්‍රාග්ධන වටිනාකම ගණනය කිරීමේ දී යොදා ගත හැකි ප්‍රසිද්ධ සූත්‍ර ගණනාවක්ම තිබේ.

(5) හංගේරියාවේ රාජ්‍ය දේපොළ විදේශිකයන්ට අලෙවි කළ හැකි ය. එහෙත් එසේ කළ යුත්තේ ජාතියේ වුවමනා එපාකම්වලට ගැලපෙන පරිදි ය. ආර්ථික දුෂ්කරතා කොතෙක් තිබුණ ද කුණු කොල්ලයට ජාතික ධනය විකිණීම යුක්ති සහගත නොවේ.

අපි විදේශීය ප්‍රාග්ධනයේ ඕනෑ එපාකම් පැත්තෙන් මේ ප්‍රශ්නය දෙස බලමු. හංගේරියාවට විදේශීය ධනය එන්නේ, දයා කරුණාවෙන් නොව ලාභ ලබනු සඳහා ය. මේ සඳහා එය පොළඹවන වෙනත් සාධක ද ඇත. නිදසුනක් වශයෙන් ගතහොත්, විදේශීය ප්‍රාග්ධනය, නැගෙනහිර යුරෝපීය වෙළෙඳ පොළ අල්ලා ගැනීමට, හංගේරියාව ආරම්භක ස්ථානයක් ලෙස ද, ඊට මූලික පුහුණුවක් ලද හැකි තැනක් ලෙස ද සැලකිය හැකිය. ඒ කෙසේ වුව ද, විදේශීය ප්‍රාග්ධනයේ අරමුණ එහි පෞද්ගලික යහපත බව පැහැදිලි ය. එබැවින් විවිධ මතවාදී හෝ සදාචාරාත්මක හෝ ආකල්පයන් හිස මත තබා ගෙන විදේශීය ප්‍රාග්ධනය ඇද ගැනීමේ ක්‍රියාදාමයට අකුල් හෙළීම අනවශ්‍ය ය.

දැන් ප්‍රශ්නය වන්නේ විදේශීය ප්‍රාග්ධනය අපේක්ෂිත ලාභ උපයා ගත් පසුව ඉන් අප රටට ඇති වන සෙත කුමක් ද යන්නයි. මේ පිළිබඳව හොඳ හෝ නරක යයි විශ්ව සාධාරණ පිළිතුරක් නැත. ඉන් වැඩක් හෝ අවැඩක් සිදුවේ දැයි යන්න එක් එක් ගනුදෙනුවේ කොන්දේසි මත රඳා සිටිනු ඇත. කොන්දේසි විරහිතව විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම් වස්, 'කරුණාකර හංගේරියානු රාජ්‍ය දේපොළ මිලට ගන්නැ' යි ආරාධනය කිරීම විහිළුවකි. පළමුවෙන්ම ගැනුම් මිල සාධාරණ නම් හංගේරියාවට වාසි අත් වනු ඇත.[24] එසේම, විදේශීය ප්‍රාග්ධනය නවීන උපකරණත්, කළමණාකරණ, ව්‍යාපාරික හා තාක්ෂණික ඥානයත් රටට ගෙනෙන්නේ නම් ඉන් හංගේරියාවට වාසි ලද හැක. යම් ව්‍යාපාරයක කළමනාකාරිත්වය විදේශීය අයිතිකරුවන් අත පවතී නම්, එතැන ඉහළ මට්ටමේ සංවිධානයක් හා විනයක් පවත්වා ගැනීමට බොහෝ විට ඉඩ තිබේ. එවැනි ආදර්ශ හේතු කොට ගෙන ආර්ථිකයෙහි අවශේෂ අංශ තුළ ද යහපත් ප්‍රතිඵල ඇති විය හැක.

විදේශීය ප්‍රාග්ධනය තුළින් රැකියා ක්ෂේත්‍රයෙහි ඇති විය හැකි බලපෑම් ගැන ද අප සිතා බැලිය යුතුය. මේ අංශයෙන් ද එය වාසි සහගත වීමට ඉඩ තිබේ. එහෙත් ඒ නිසාම මෙම ගනුදෙනුව කළ යුතු යයි සිතීම වැරදි

---

24. බ්‍රිතාන්‍ය සමාගමක් හංගේරියානු ගැන්ස් මෝටර් රථ සමාගම පාලනය කළ හැකි බහුතර කොටස් ප්‍රමාණයක් මිලට ගත් බව එක්තරා පුවත් පතක සඳහන් විය. පවුම් මිලියන 2 ක් මුදලින් ගෙවා ඒ තරම් පස් ගුණයක් වන ඉතිරි මුදල වාරික වශයෙන් ගෙවීමට ද එකඟ වී ඇත. මෙම පවුම් මිලියන දෙක ඉතාමත් අඩු මුදලකි. අමෙරිකා එක්සත් ජනපදයේ බොස්ටන් නුවර වර්ග මීටර් 70 ක මහල් නිවාස 12 කට වඩා එම මුදලින් ගත නො හැකිය. මෙම කම්හලේ භෞතික වත්කම් නොවටින්නේ වුවද, ගැන්ස් වෙළෙඳ නාමය පමණක් වුවද ඉහත සඳහන් මිල මෙන් කිහිප ගුණයක් වටී. මේ අයුරින් ජාතික දේපොළ කුණු කොල්ලයට විකිණීම කිසිසේත් පිළිගත නොහැක.

ය. හංගේරියානුවන් ගේ රැකියා ආරක්ෂා කර ගැනීම උදෙසාම රාජ්‍ය දේපොළ, විදේශිකයන් ඉල්ලන ඕනෑම මිලකට විකිණීම නොකටයුතුය. සේවා නියුක්ති ප්‍රතිපත්තියේ දී යොදා ගත හැකි විවිධ උපක්‍රම තිබේ. මෙම උපක්‍රම අතර ඉතාම හොඳ සංකලනය අවස්ථාවෙන් අවස්ථාව වෙන වෙනම සලකා බලා ඇති කර ගත යුතුය.

විදේශිකයනට මිලදී ගැනීමට ඉඩ ඇති හංගේරියානු රාජ්‍ය සන්තක දේපොළ පිළිබඳ උපරිම සීමාවන් නියම කර තිබීම හොඳ ය.[25] පවත්නා රාජ්‍ය දේපොළ මිල දී ගැනීමේදී විදේශිකයන් මත සීමා පැනවීමක් කළ ද, සෘජු විදේශීය ආයෝජන සීමා කිරීමට පක්ෂව නම්, කිසිම තර්කයක් ඉදිරිපත් කළ නොහැකි ය. එනම් විශාල වශයෙන් විදේශීය සම්පත් භාවිත කරමින්, විදේශීය ප්‍රාග්ධනය හංගේරියාව තුළ නව නිෂ්පාදන පහසුකම් ගොඩ නැංවීමේ ක්‍රියාදාමයට ඉඩ දිය යුතු බවයි.

(6) රජයේ දේපොළ විකිණීමෙහිදී රජයට වැඩිපුර ආදායමක් ලබා ගැනීමේ අරමුණක් නැති බවට සමහරු තර්ක කරති. අය-වැය තුලනය කිරීම පසුගිය වසර කීපය තුළ කොතරම් දුරට නොවැදගත් ලෙස හංවඩු ගැසී ඇත්ද කියතොත්, අයහාරය එකතු කිරීම පවා ලජ්ජා සහගත දෙයක් සේ සැලකේ. මීළඟ පරිච්ඡේදයෙහි අය-වැය පිළිබඳ සවිස්තර සාකච්ඡාවක් ඇත. රජයේ දේපොළ විකිණීම රාජ්‍ය අය-වැයට ප්‍රධාන ආදායම් මාර්ගයක් වන බව දැක්වීම මෙහි දී සෑහේ. එබැවින් විකුණුම් මිල නොසලකා හැරීම නොකටයුතු ය. ඉහළ ආදායම්වලින් අධික බදු අය කළ යුතු ය යන්න අවධාරණය කිරීම වැදගති. මා මීට විරුද්ධව කථා කොට ඇත. මම නැවත ඒ ගැන සලකා බලමි. මෙහිදී ප්‍රකාශ කළ යුතු කරුණ නම්, මෙලෙස ආදායම් පුනර් ව්‍යාප්තිය ගැන කතා කරන්නෝ, රජයේ අයිතිය යටතේ පැවතෙන නිවාස විකුණූ විට කුලී නිවැසියන්ගෙන් කෙතරම් මුදලක් අය කරන්නේ ද යන්න ගැන කථා නො කරති. එසේම ඔවුහු ව්‍යාපාර කොටස් කුමන මිලකට, කාට විකිණිය යුතු ද යන ප්‍රශ්නයෙන් ද පැන යාමට තැත් කරති.

දේශීය හෝ විදේශීය ගැනුම්කරුවන්ට රජයේ වත්කම් හොඳ මිලකට විකිණීම නිසා, එම මුදල් ප්‍රමාණය, බදු මාර්ගයෙන් හෝ උද්ධමනය මාර්ගයෙන් හෝ හංගේරියානු පුරවැසියන්ගෙන් අය කර ගැනීමට සිදු වන විකල්ප තත්ත්වය වැළකේ. මේ රාජ්‍ය අයහාරය වසරින් වසර පුන පුනා එකතු කර ගත හැක්කක් හෝ සදාකාලික එකක් හෝ නොවන බව පැහැදිලිය. එහෙත් මෙය සිදු වන්නේ ස්ථායීකරණ දුෂ්කරතාවලින් ගැලවීමට රට සූදානම් වන අවස්ථාවක බැවින් එලෙස එකතු කර ගැනෙන මුදල් නිසා විශාල සෙතක් සිදු වේ.

---

25. විදේශිකයන් කොරියානු දේපොළ මිල දී ගන්නා විට ඔවුනට එසේ කළ හැකි එකම මාර්ගය හැටියට කොරියානු ආණ්ඩුව 'කොරියා අරමුදල' නම් ආයතනයක් බිහි කර ඇත. අප ඉහත කතා කරන ක්‍රියාදාමය රෙගුලාසිගත කිරීම සඳහා, දකුණු කොරියානු ආණ්ඩුව ඇති කළ ආයතනික හා නීතිමය රාමුව මෙයයි. මෙය පැහැදිලිවම පරීක්ෂාකාරී අධ්‍යයනයට සුදුසු නිදසුනකි.

(7) රජයේ දේපොළ විකිණීමේ දී ඇති වන ෆිස්කල් ප්‍රතිවිපාක අංක 6 යටතේ සාකච්ඡා විණි. දැන් අපි එහි මූල්‍යමය ප්‍රතිවිපාක දෙසට නෙත් යොමු කරමු. රටේ ජන සංඛ්‍යාව ද, පුද්ගලික අංශය ද ප්‍රමාණවත් මුදල් සම්භාරයක් රැස් කර ගෙන ඇත. ඉන් කොපමණක් බලෙන් ඇති කරන ලද ඉතිරි කිරීම්, එනම් ඕනෑවට වඩා විශාල මුදල් සැපයුමක් නිසා ඇති වූ උද්ධමනයේ ඵල විපාකයන්, වෙද්දැයි කිව නොහැකිය. කෙසේ වෙතත් වියදම් නොකැරුණු මෙම මුදල්, වෙළෙඳ පොළට පීඩනයක් වන විට උද්ධමනකාරී බලවේග ජනිත කරනු ඇත. රටක ඇති වියදම් නොකැරුණු මුදල් උරා ගැනීමේ විවිධ ක්‍රම ඇත. ඉන් එකකි, රජයේ දේපොළ විකිණීම.

විකුණුම් ගනුදෙනුවලදී තමන්ගේම මුදල් හා ණයට ගත් මුදල් යෙදවෙන අනුපාතය ෆිස්කල් හා මූල්‍යමය යන අංශ දෙකින්ම වැදගත් වේ. නැවත වරක් අපේ ෆොරින්ට් මිලියන 20 නිදසුන වෙතට හැරෙමු. මේ ගනුදෙනුවේ දී ව්‍යාපාරයට තමන්ගේම මුදලින් ගෙවන මූලික මුදල මිලියන 2 ද 5 ද 8 ද යන්න අපට නො වැදගත් ය. සාර්ව ආර්ථික දෘෂ්ටියකින් මෙලෙස ගෙවන මුල් මුදල හැකි තාක් වැඩි වීම හිතකරය. කෙසේ වෙතත්, ගනුදෙනුවක දී ඕනෑවට වඩා අධික මූලික ගෙවීමක් කළ යුතු යයි බල කිරීම රජයේ දේපොළ විකුණුම් ක්‍රියාවලිය කෙරෙහි බාධක පමුණුවනු නියත ය. ඒ සම්බන්ධයෙන් යම් අත්හදා බැලීමක් වෙළෙඳ පොළේ දී සිදු කළ යුතු බව නම් නිසැක ය.

(8) හංගේරියාවේ දැන් පවතින සංයුක්ත මණ්ඩල (සංස්ථා) නීතිය යටතේ, රාජ්‍ය අයිතිය යටතේ පවතින ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් බවට හරවා, එහි අයිතිය විවිධ හිමිකරුවන් අතට පත් කළ හැක. එම නීතිය නම්‍ය එකක් වන නිසා, වාසිදායක හිමිකම් පරිවර්තනයක් එතුළින් සිදු කළ හැකි අතරම, එය දඩමීමා කර ගෙන ව්‍යාජ වූද, අහිතකර වූද වෙනස්කම් බිහි කළ හැකි ය. මේ ප්‍රශ්නය මුල් කර ගෙන පුළුල් මහජන විවාදයක් දියත් වී ඇත. මේ අනුව අදාළ කරුණු ගැන පෞද්ගලික උනන්දුවක් දක්වන්නෝ ද, බාහිර නිරීක්ෂකයෝ ද මේ පිළිබඳ විවිධ විවේචන දැඩි සේ එල්ල කරති. මේ පිළිබඳව මගේ අදහස පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

රජයේ දේපොළ බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් බවට පත් කිරීම මගින් අපේක්ෂිත අරමුණු ඉටු වීමට නම් සැබෑ පුද්ගලිකකරණයකට අදාළ ආයතනය භාජනය විය යුතුය. රාජ්‍ය අංශයේ එක් ව්‍යාපාරයක කොටස්, එහිම තවත් ව්‍යාපාරයක් අතට මාරු වීම වරදක් නොවේ. එහෙත් එයින් කිසිම ප්‍රගතියක් ඇති නොවේ. පරිච්ඡේදයේ මීට පළමු කොටසෙහිදී මේ සම්බන්ධයෙන් මම මගේ සැක ප්‍රකාශ කෙළෙමි.

ව්‍යාපාරයක කොටස් පුද්ගලයන් අතට පත් කිරීමේ දී මා **වැරදි සහගත** යැයි සලකන ක්‍රියාවලිය මම පළමුවෙන්ම පැහැදිලි කරමි.

මෙතෙක් කල් රජයෙන් වැටුප් ලැබූ වත්මන් කළමනාකරුවන්ට එම ව්‍යාපාරවල අයිතිකරුවන්, වඩාත් නියත වශයෙන්, ඒවායේ අයිතිය හා කළමනාකරණය යන දෙක ඒකාබද්ධ කරමින් අයිතිකාර කළමනාකරුවන්, වීමට ඉඩ දිය නොහැකිය. ව්‍යාපාරවල නව හිමිකරුවන්ට ඒවායේ

කළමනාකාර මණ්ඩලවලට පුද්ගලයින් පත් කිරීමට නිදහස තිබිය යුතුය. ඔවුන් කැමති නම් පැරණි මණ්ඩලයම තබා ගැනීමට හෝ එසේ නැත්නම් අලුත් විධායකයින් පත් කිරීමට හෝ ඔවුනට පුළුවන්කම තිබිය යුතුය. එලෙසින්ම, විධායක නිලධාරීන් ගේ වැටුප් තීරණය කිරීමටත්, වෙනත් මූල්‍යමය දිරි ගැන්වීම් නියම කිරීමටත් අයිතිය ද නව හිමිකරුවන්ට තිබීම වැදගත් ය. කළමණාකරුවන්ට සහන මිලකට කොටස් මිලදී ගැනීමේ ඉඩකඩ ලබා දීම ද ඔවුන්ගේ අයිතියක් විය යුතුය. එහෙත් රජයේ ව්‍යාපාර භාරව සිටි කළමනාකරුවන්ට, නව හිමිකරුවන් සෙවීමේ අයිතිය හෝ තමන්ම ඒවායේ අයිතිකරුවන් අතර ඉහළම තැන්වලට පත් වීමේ අයිතිය හෝ දීම නුසුදුසු ය.

ව්‍යාපාරයක සේවකයින්ට, සහන මිල යටතේ එහි කොටස් ලබා ගැනීමට අවස්ථාව දීමේ වරදක් නැති බව සඳහන් කෙළෙමි. එහෙත් ඒ නිදහස දිය යුත්තේ මුළු කොටස්වලින් සුළු ප්‍රතිශතයක් සම්බන්ධයෙන් පමණි. ව්‍යාපාරයක සේවකයනට මුළු ව්‍යාපාරයම හිමි කර ගැනීමට ඉඩ හැරීම නො කටයුතු ය. (සමහරුන් තර්ක කරන පරිදි, සේවකයන්ට තමන්ගේ ව්‍යාපාරය **නොමිලයේ** ලබා ගැනීමට ඉඩ දීම විශේෂයෙන්ම වැරදිය). මෙලෙස ව්‍යාපාරයක් සේවකයන් ගේ සාමූහික අයිතියට යටත් කළහොත්, එයින් වනුයේ ස්වයං-කළමනාකාරී දේපොළ ක්‍රමයක් බිහි කිරීම ය. මේ තත්ත්වයට විරුද්ධව මම ඊළඟ කොටසෙහි තර්ක කරමි. මෙහි දී මම ගැටලුවේ සදාචාරමය පැත්ත ගැන සලකා බැලීමට කැමැත්තෙමි. රජයේ ව්‍යාපාරයක් පුද්ගලයන් අතට පත් කරන මොහොත වන විට එහි අන්තර්ගත වන්නේ එම ව්‍යාපාරයේ සේවකයන් විසින්ම බිහි කැරුණු ධනයක් නොවේ. මෙහි ලා රටේ සෑම පුරවැසියකුගේම සහභාගීත්වයක් පැවත ඇත. රජය ඒ තුළ කළ ධනායෝජනයන් හා රජය ඊට දී ඇති සහනාධාර තුළින් ඇති වූ සහභාගිත්වයකි ඒ. එම ධනය තෑගි හැටියට පුරවැසියන් කිහිප දෙනකුට ලබා දීම කිසිසේත් සාධාරණ හෝ යුක්තිසහගත හෝ නොවේ. එපමණක් ද නොව, සමහර සේවක කණ්ඩායම්වලට සාර්ථක ව්‍යාපාර ත්‍යාග ලෙස ලැබෙනු ඇති අතර, අනිකුත් කණ්ඩායම්වලට ලැබෙනු ඇත්තේ ණය හරිත 'සෑණ වත්කම්' ව්‍යාපාර ය. වඩා වැදගත් කරුණ වනුයේ දේපොළ අත්පත් කර ගැනීමට ඇති නීත්‍යානුකූල අයිතිය නොව ඒවා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට ඇති ශක්තිය පුද්ගලිකකරණයේදී සලකා බැලිය යුතු ප්‍රධානම කරුණ වන බව ය. මගේ අදහස අනුව රටේ සම්පත් ස්ථිර පදනමක් මත, කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනෙන තත්ත්වයක් බිහි කළ හැක්කේ සැබෑ පෞද්ගලික දේපොළ ක්‍රමයක් තුළින් පමණි.

ව්‍යාපාරික කොටස්වල අයිතිය බෙදා හරිනු ලබන ක්‍රම නීති හා රෙගුලාසි මගින් කල් තියාම නියම කරලිය නොහැක. මට කළ හැක්කේ මෙහිදී වඩාත්ම හොඳ උපනතිය කවරක් දැයි පෙන්වා දීම පමණි. රජයේ අයිතිය යටතේ පැවති යම් ව්‍යාපාරයක ප්‍රාග්ධනය කොටස් 10,000 කට බෙදා ඇතැයි සිතමු. එම ප්‍රාග්ධනය කොටස් කරුවන් 10,000 ක් දෙනා අතර බෙදා දීම හංගේරියාවේ වර්තමාන තත්ත්වය අනුව රටට වැඩදායක නොවේ. එසේ කළහොත් රාජ්‍ය අංශයේ පෙර තිබුණු විධියේ

ම අපෞද්ගලික අයිතිය, පෞද්ගලික අංශය තුළ ද අපෞද්ගලික (Impersonal) අයිතියකට හැරෙනු ඇත. මෙහිදී වඩා හොඳ ක්‍රමය නම් එක් බලගතු කොටස් කරුවකු හෝ කොටස් කරුවන් සුළු කණ්ඩායමක් (අඩු වශයෙන් කොටස් වලින් සියයට 20 හෝ 30 ක් ලබා ගෙන) ව්‍යාපාරයේ අයිතිය ලබා ගැනීමය. එසේ වුවහොත් ව්‍යාපාරය ගැන උනන්දුවක් ඇති, එය අසාර්ථක වුවහොත් නැති වෙන්නට දෙයක් ඇති එක් අයිතිකරුවකු හෝ කිහිප දෙනකු බිහි වනු ඇත. එවිට විධායක නිලධාරීන් පත් කිරීමේ දී හා අධීක්ෂණය කිරීමේ දී තීරණාත්මක පියවර එම අයිතිකරුවනට ගත හැකිය.

මෙම ක්‍රියාමාර්ගය, දෘශ්‍යමාන හා සැබෑ දේපොළ හිමිකරුවන් රටේ සිටිය යුතු ය යනුවෙන් මීට ඉහත ඉදිරිපත් කැරුණු තර්කය හා ගැලපේ. තම පුද්ගලික ආයෝජන (මෙතැනදී, **සැලකිය යුතු** කොටස් ප්‍රමාණයක හිමිකම) පැවතීම නිසා ම ඔවුහු සිය ව්‍යාපාර සාර්ථක කර ගැනීම ගැන විශේෂ උනන්දුවකින් කටයුතු කරති. මෙම බලගතු ව්‍යාපාරික කොටස් හිමි කණ්ඩායම් හංගේරියානුවන් හෝ විදේශිකයන් හෝ විය හැක. අවශ්‍ය වන්නේ යමක් තමන්ට අයිති ව්‍යාපාරයක් ය යන සදජු හිමිකාර උනන්දුවකින් කටයුතු කරන පිරිසක් බිහි කිරීම පමණි. යම් රජයේ ව්‍යාපාරයක් බද්ධ ව්‍යාපාර වස්තු සමාගමකට හෝ එවැනි පුද්ගලික දේපොළ ක්‍රමයකට පරිවර්තනය කිරීමේ ක්‍රියා දාමයක් ඇරඹිය යුත්තේ, ඉහත කී විධියේ පුද්ගලයකු හෝ කොටස් හිමියන් පිරිසක් හෝ ඇතැයි යන විශ්වාසයෙන් යුතුව ය. එවැනි සැබෑ දෘශ්‍යමාන අයිතිකරුවන් ඉදිරිපත් වී, කොටස් විශාල ප්‍රමාණයක් මිලට ගනිමින්, එහිදී අදළ වන අවදානම ඉසිලීමට ඇති කැමැත්ත හා සුදනම ඔප්පු කළ පසු, ඉතිරි කොටස් පසුව නිර්නාමික ගැනුම්කරුවන්ට විකිණිය හැක. මේ වැඩ පිළිවෙළ කණපිට පෙරළමින් පළමුවෙන් ව්‍යාපාර කොටස් ඕනෑම කෙනකුට මිලට ගන්නට හැර, ඒ අනුව කොටස් ප්‍රාග්ධනය කැලිවලට කඩා දමා, පසුව ව්‍යාපාර කළමනාකරණයේදී තම ශක්තිය පෙන්විය හැකි බලගතු අයකු මෙම අයිතිකරුවන් අතුරින් නැගී එතැයි බලාපොරොත්තු තැබීම ගැන මම විශ්වාසයක් පළ නොකරමි.

(9) ජාතික ධනය ප්‍රසිද්ධියේ විකිණිය යුතු අතර එය පහසු කිරීමට නීතිමය ව්‍යුහයක් අවශ්‍ය වේ. කලින් රාජ්‍ය අංශයේ සිටි කළමනාකරුවන් ගේ යුතුකම් හා අයිතිවාසිකම් සීමා කිරීමටත්, පාලනය කිරීමටත් මෙම නීති සමත් විය යුතුය. මෙය ලියන අවස්ථාවෙහි පුද්ගලිකකරණය හසුරුවා ලීමට අවශ්‍ය සංවිධානමය හා ආයතනික ව්‍යුහය සකස් වෙමින් පවතී. පුද්ගලිකකරණ ක්‍රියාවලිය පිළිබඳ අදාළ නීති හරියට ක්‍රියාත්මක වෙත්දැයි අධීක්ෂණය කිරීමටත්, මෙහි ලා වගකීම් උසුලන රාජ්‍ය සංවිධානවල කටයුතු ස්වාධීනව පාලනය කිරීමටත් පාර්ලිමේන්තු කමිටුවක් ද අවශ්‍ය වේ.

පුවත්පත්වලට ද භාරදූර වැඩ කොටසක් හිමි වේ. භව්‍ය ගැනුම්කරුවන්ට හා විකුණුම් කරුවන්ට අවශ්‍ය ව්‍යාපාරික තොරතුරු සපයන ව්‍යාපාරික පුවත්පත් අවශ්‍ය ය. අතරින් පතර සිදු වෙන වෙන්දේසි ගැන තොරතුරු

සැපයීම පමණක් නොව, වර්තමාන වෙළෙඳ පොළ මූකලාන විනිවිද පෙනෙන අයුරින් ව්‍යාපාරික තොරතුරු ජනතාවට සැපයීම මෙවැනි පුවත් පතකින් අපේක්ෂිත ය. රජයට අයත් මහල් නිවාස, කම්හල් හා වෙනත් දේපොළවල විකිණුම් මිල හා ගැනුම් මිල දැන ගැනීමට අයිතියක් මහජනයාට තිබේ. රජය විකුණුම්කරු ලෙස කටයුතු කරන විට ව්‍යාපාරික රහස්වලට සාමාන්‍යයෙන් ඉඩක් නැත. රහස්‍ය භාවය යුක්තිසහගත වන අවස්ථාවන්හි දී පවා අදාළ ව්‍යාපාරික කටයුතු පිළිබඳ අභ්‍යන්තර තොරතුරු සොයා බැලීමට පුළුවන්කම පාර්ලිමේන්තු කමිටුවට තිබිය යුතුය.

ව්‍යාපාරික ලෝකයේ කලින් කලට සිදු වන අක්‍රමිකතා හෙළිදරව් කිරීමේ වගකීම මෙම විශේෂ ව්‍යාපාරික පුවත්පත්වලට පමණක් නොව, වෙනත් සන්නිවේදන මාධ්‍යවලට ද, විරුද්ධ දේශපාලන පක්ෂවලට ද අයත් කටයුත්තකි.

රජයේ දේපොළ විකිණීම, කඩිනම යන සිද්ධාන්තය උඩ නොකළ යුතු බව අවසාන වශයෙන් අවධාරණය කරමි. 'රාජ්‍ය අංශයත් සමග සිටියා ඇති. එයින් ඉවත් විය යුතුය' යන හැඟීමෙන් වැඩ කිරීම වගකීම් පැහැර හැරීමකි. සමහර වැඩ කටයුතු පෞද්ගලික අංශයට වඩා කාර්යක්ෂමව කිරීමේ හැකියාව රාජ්‍ය අංශය සතු තැන්වල, රාජ්‍ය අංශයට අයත් යම් නිශ්චිත කාර්යභාරයක් තිබේ. නිදසුනක් ලෙස, රටේ මහා මාර්ග පුද්ගලික අයිතියට පැවරීමට කිසිවකුත් යෝජනා නොකරනු ඇත. වඩාත් කාර්යක්ෂමව යම් කටයුත්තක් කිරීමට පුළුවන්කම ඇත්තේ රාජ්‍ය අංශයට ද පෞද්ගලික අංශයට ද යන්න ගැන සැක ඇති තැන්වල, විනිශ්චයක් කළ යුත්තේ, අප ඉහතින් දැක්වූ නිර්නායක යටතේ, අදාළ රාජ්‍ය ආයතනය විකිණීම කාර්යක්ෂමතාවට තුඩු දේද යන්න ගැන නිශ්චිත විග්‍රහයක් කිරීමෙන් අනතුරුවය. රජයේ දේපොළ පුද්ගලයන්ට විකිණිය යුත්තේ, එම ගනුදෙනුව සාර්ව ආර්ථික පැත්තෙන් රටට වැඩදායක වෙතොත් හා නව ව්‍යාපාර හිමියා පැරණි හිමියාට වඩා කාර්යක්ෂම ව, සූක්ෂ්ම ආර්ථික වශයෙන් ක්‍රියා කිරීමේ ඉඩකඩක් ඇතොත් පමණි. පුද්ගලිකකරණයෙහි මුඛ්‍ය පරමාර්ථය නම්, පුද්ගලික අයිතිය නිසා ඇති වන **ප්‍රොත්සාහක බලය** ව්‍යාපාර තුළට ඇතුළු කිරීම බව අප අමතක නොකළ යුතුය.

මෙම කෘතියේ හැඳින්වීමෙහි විස්තර වූ වර්ගීකරණයන් හා ගතික විග්‍රහය අනුව බලන කල, මේ සෑම දෙයක්ම දිගු කාලීන ඓන්ද්‍රීය ක්‍රියාවලියක ප්‍රතිඵල වන බව පැහැදිලි ය. එම ක්‍රියාවලීන් ධෛර්‍යයෙන් යුතුව ඉක්මන් කළ යුතු නමුදු, සිහි විකල්ව, කලබලේට, හදිසියේ කළ යුතු සැත්කමක් මෙන් කළ යුත්තේ නම් නොවේ.

1.4 රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සබඳතා

රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර 'බර්ලින් තාප්පයක්' තිබිය නොහැකිය.[26] මේවා අතර විවිධ සබඳතා ගොඩ නැගේ. ඉන් සමහරක් දිරි ගැන්විය යුතු

26. මේ උපහැරණය මා උපුටා ගත්තේ අන්ද්‍රස් නාගි ගෙනි.

පිරිපුන් සබඳතා වන අතර, තවත් සමහරක් හානිකර වේ. හානිකර ඒවා වළකා ලිය යුතුය.

තවද, රජය සතු ව්‍යාපාර හා අනිකුත් රජයේ සංවිධාන හා පෞද්ගලික අංශය අතර ව්‍යාපාර සබඳතා සීමා කරන හෝ සමහර අවස්ථාවල තහනම් කරන සුළු නීතිමය රෙගුලාසි ඉවත් කිරීමට දැන් කාලය එළඹ තිබේ. එමෙන්ම, පෞද්ගලික අංශය සමඟ ඇති කර ගන්නා සමීප ආර්ථික සබඳතා තුළින්, රජයේ ව්‍යාපාරවලට වැඩි නම්‍යතාවකින් යුතුව කටයුතු කිරීමට හැකියාව ලැබෙනු ඇති බවත්, එසේම එමගින් 'අගහිඟකම්' ආර්ථිකය තුළ ඉතිරි වී ඇති අඩුපාඩු වඩා හොඳින් පියවා ලීමට හැකියාව ලැබෙනු ඇති බවත්, මම විශ්වාස කරමි. රජයේ එක් ව්‍යාපාරයක නිම කරන ලද නිෂ්පාදිත භාණ්ඩ ඒවා අවශ්‍ය කරන තවත් රාජ්‍ය ව්‍යාපාරයකට ගෙන යාම වැනි කටයුතු පෞද්ගලික වෙළෙඳුන් අතට පත් කිරීම වඩා හොඳ විය හැක. එමෙන්ම රජයේ ව්‍යාපාරවල යෙදවුම් ආනයනය කිරීමටත්, ඒවායේ නිමැවුම් අපනයනය කිරීමටත් පුද්ගලික වෙළෙඳුන්ට ඉඩ දිය යුතුය.

පෞද්ගලික ව්‍යවසාය හා රාජ්‍ය අංශය අතර සම්බන්ධතා සිදු වන අවස්ථාවල දූෂණ සිදු වීම හැම සමාජයකම දක්නට ලැබේ. රජයේ ව්‍යාපාර රාජ්‍ය අංශයේම කොටසකි. එබැවින් ඒවා පෞද්ගලික ව්‍යාපාර හා ගොඩ නංවන සම්බන්ධකම් මුල් කර ගෙන විවිධ දූෂණ සිදු වෙතැයි බලාපොරොත්තු විය යුතුය. මේ පිළිබඳව දැනටමත් අත්දැකීම් තිබේ. පෞද්ගලික අංශය වඩ වඩා ශක්තිමත් වත්ම, මේ තත්ත්වය වඩාත් උග්‍ර වනු ඇත. පරිවර්තන ක්‍රියාවලියේ දී අනිවාර්යයෙන්ම සිදු විය හැකි, එහෙත් හානිකර වූද, නැති කර දැමිය යුතු වූද මෙවැනි ක්‍රියා සම්පූර්ණයෙන්ම මග හරවා ගත හැකි කිසිම නොවරදින මගක් නැත. එහෙත් ඒවා අඩු කර ගැනීමට උත්සාහ දැරිය යුතුය. ඒ සඳහා මේ දෙ අංශය අතර නිරවද්‍ය, අවංක ව්‍යාපාරික සම්බන්ධකම් සාවද්‍ය හා වංක ඒවායින් වෙන් කොට හඳුනා ගත හැකි වන විධියේ නීතිමය ක්‍රම හා ආචාර ධර්ම පද්ධතියක් ගොඩ නගා ගැනීම අවශ්‍ය වෙයි. නීතිමය රෙගුලාසි හා සදාචාර රීති ක්‍රියාත්මක කරවීමට නම්, අපරාධ පරීක්ෂක බලධාරීන් මෙන් ම, සාමාන්‍ය මහජනතාව ද උනන්දු ව ක්‍රියාකාරී විය යුතුය.

සමහර විට, වර්තමානයෙහි වඩා අවශ්‍ය කාරණය පුද්ගලිකකරණය සාර්ථක කර ගැනීම ය. රාජ්‍ය අංශයේ බලය හින වී යාමත් සමග, වෙළෙඳ පොළේ තරගය මගින් ඇති කරනු ලබන විනය ව්‍යාපාර ලෝකයෙහි පැතිර යනු ඇත. එවිට රාජ්‍ය අංශය සමග කරන ගනුදෙනු තුළින් පෞද්ගලික අංශයේ සමහරකුට අයුතු ප්‍රයෝජන ගැනීමට ඇති අවස්ථා ක්‍රමයෙන් අඩු වී යනු ඇත. එසේම දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති (ඒකාබද්ධ නිර්බාධී මිල පද්ධතියක් ඇති වීම, ඒකාබද්ධ විනිමය වටිනාකමක් ඇති පරිවර්ත්‍ය මුදලක් බිහි කිරීම, උද්ධමනය හා ආර්ථිකයේ බඩු හිඟය දුරු කිරීම වැනි) වෙනස්කම් දූෂණවලට ඇති නැඹුරුව තව දුරටත් අඩු කර ලීමට තුඩු දෙතැයි සිතමි.

අංශ දෙකෙහිම දෙපා තබා ගෙන සිටින අය ගැන මෙහි විශේෂයෙන් සඳහන් කළ යුතුය. තම විවේක කාලයේදී, අලුත්වැඩියා කටයුතුවල යෙදෙන, රාජ්‍ය අංශයේ සේවකයකු දෙස බලමු. ඔහු දෙතැනක වැඩ කිරීම දොස් නැගිය යුතු වරදක් නොවේ. රාජ්‍ය අංශය සේවකයන්ට ලබා දෙන වෘත්තීය සුරක්ෂිතභාවය භුක්ති විඳිමින්, තමාගේ ආදායම් වැඩි කර ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ද සේවය කිරීම අප තේරුම් ගත යුතුය. මෙවැනි දෙබිඩි

සේවක ජීවිත ගත කිරීම, දවසේ දිගු කාලයක් වැඩෙහි නිරත වී සිටිමින්, ස්වයං විලුම්පනයකට නතු වීමක් වෙයි. ඔවුන් කොතරම් දිගු කලක් මෙලෙස ගත කරනවා ද යන තීරණය ගැනීම හුදෙක් ඒ ඒ පුද්ගලයින් ගේ අයිතියකි.

නීතිමය ක්‍රියා මාර්ග හා මහජන මතය තුළින්, මෙවැනි ද්විත්ව සබඳතා පදනම් කොට අයුතු බලපෑම් හා වැරදි ඇති වීම වළක්වා ගත යුතු වෙයි. රජයේ ව්‍යාපාරයක සේවකයකු ඊට අයත් නිෂ්පාදන උපකරණ හොරෙන් තමන් සතු කර ගැනීම හෝ කුලියක් නොගෙවා පුද්ගලික වැඩකට යොදා ගැනීම වැනි ක්‍රියා ද මේ ගණයට වැටේ. මීට වඩා වැඩි දෝෂාරෝපණයට ලක් විය යුත්තේ එවැනි ද්විත්ව කාර්යයන් කරන, රජයේ ව්‍යාපාරවල විධායකයින් වෙත ය. වඩා බරපතල වරදක් වන්නේ ඔවුන් අතිනි. එවැන්නකු එක් අතකින් රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක ප්‍රධානියා ලෙස වැඩ කරන අතර, අනෙක් අතින් පුද්ගලික ව්‍යාපාරයක අයිතිකරු හෝ පඩි ලබන කළමනාකරු හෝ උපදේශක හෝ වන්නේ නම් එය බරපතල වරදකි. මෙවැනි තැන්වල හට ගන්නා ඕනෑඑපාකම් අතර ගැටුම් ද, සදාචාරාත්මක ව අන්‍යෝන්‍ය පරස්පර හැසිරීම් රටා ද නිවැරදිව නිර්වචනය කිරීමටත්, වැළැක්වීමටත් දැඩි රෙගුලාසි අවශ්‍ය වේ. එවැනි රෙගුලාසි දියුණු බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඇති නීති පද්ධති තුළ දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීම එවැනි රෙගුලාසි විධි මෙරට තුළ ද සකස් කිරීම සඳහා විශාල පිටුවහලක් වනු ඇත.

1.5 දේපොළ අයිතිය පිළිබඳ වෙනත් ක්‍රම

වෙනත් ක්‍රම තුනක් මෙහි ලා සාකච්ඡා කෙරේ.

(අ) සමූපකාර ක්‍රමය

පහත සඳහන් සිද්ධාන්ත තුන යටතේ දේපොළ පිළිබඳ සමූපකාර අයිතිය වැඩදායක විය හැක.

1. පිවිසීමට හා පිට වීමට සාමාජිකයාට නිදහස තිබීම.
2. පිට වන විට සාමාජිකයාට, ඔහු මුලදී යෙදූ ප්‍රාග්ධනය පමණක් නොව, ඒකරාශී වී ඇති ප්‍රාග්ධනයෙන් තමන්ට හිමි කොටස ද රැගෙන යාමට නිදහස තිබීම.
3. සමූපකාරය නිර්බාධිව ඡන්දයෙන් පත් වුණු, ස්වයං පාලන ක්‍රමයක් යටතේ කළමනාකරණය වීම.

මේ වර්ගයේ සමූපකාරය, විශේෂ ආකාරයක පෞද්ගලික හවුල් ව්‍යාපාරයකි. ඒ අනුව සමූපකාරය ආර්ථිකයේ අනිත් අංශවලින් ස්වාධීන වන එක් 'විශාල අංශයක්' නොව, පළල් තේරුමකින්, එය 1.1 ඡේදයේ විග්‍රහ කළ පරිදි පෞද්ගලික අංශයේම එක් කොටසක් වෙයි.

මෙවැනි සමූපකාර දැනටමත් රටේ ඇත. ඒවා තව තවත් ව්‍යාප්ත වී යනු දැක්මට මම කැමත්තෙමි. එහෙත් ඒවායේ සංඛ්‍යාව එලෙස වැඩි වේද යන්න සැකසහිතය. ඒවාට කුමක් වේදැයි බලා සිටිමු.

දැනට පවත්නා නොයෙකුත් ආකාරයේ ව්‍යාජ සමූපකාර දෙස මා බලන්නේ මීට වඩා වෙනස් ආකාරයකිනි. නිලධාරිවාදී රාජ්‍ය හිමිකමේ ඇති සෑණ ගති ලක්ෂණ සියල්ල මේවායේ ගැබ් වී ඇත. එබැවින් මේ ව්‍යාජ සමූපකාර

ආයතන ස්වේච්ඡාවෙන්ම එක්කෝ අව්‍යාජ සමුපකාර තත්ත්වයට එසේ නැතහොත් පෞද්ගලික අංශයේ සංවිධානමය හෝ නීතිමය ක්‍රම අනුගමනය කරන තත්ත්වයකට පත් විය යුතුය. අවම වශයෙන් බොරු ඇස් බැන්දුම් හැර ලා, ව්‍යාජ සමුපකාර, රාජ්‍ය ව්‍යාපාර හැටියට විවෘත ව පිළිගත යුතුය. කෙසේ හෝ වේවා හංගේරියානු ආර්ථිකය අවසානයේ මෙම ව්‍යාජ සමුපකාරවලින් මිදිය යුතුය.

(ආ) දේපොළ පිළිබඳ ප්‍රාදේශීය සභා අයිතිය

ගම්සභා, නගර සභා හෝ ප්‍රාන්ත සභා (එනම් වත්මන් රාජ්‍ය ව්‍යුහයට අයත් කවුන්සලය) අයිතිය යටතේ පවතින ආර්ථික ඒකකයක තත්ත්වය විශ්ව සාධාරණ මිනුම් යටතේ ඇගැයිය නොහැකිය. ප්‍රාදේශීය ආණ්ඩුවකට, කෙතරම් දුරට, සැබෑ දේපොළ හිමිකරුවකු ලෙස හැසිරිය හැකි ද යන්නයි ප්‍රශ්නය වනුයේ. මේ සම්බන්ධයෙන් ඇසිය යුතු තවත් ප්‍රශ්න දෙකකි. ඉන් පළමු වැන්න, ප්‍රාදේශීය සභාව සත්‍ය වශයෙන්ම පළාතේ ජන සංඛ්‍යාව දේශපාලන වශයෙන් නියෝජනය කරන ප්‍රජාතාන්ත්‍රික ව්‍යවස්ථාදායකයක් ද යන්නයි. මේ ප්‍රශ්නයට 'නැත' යන පිළිතුර ලැබේ නම්, රටේ සැම තැනකම දක්නට ඇති පරිදි රාජ්‍ය අයිතියේ නිලධාරිවාදී ලක්ෂණ මේවායේ ද නො අඩුව පවතිනු ඇත. දෙවන ප්‍රශ්නය කිසියම් ප්‍රාදේශීය සභාවක විශාලත්වය හා ඉන් පාලනය වන ජන සංඛ්‍යාව ආශ්‍රයෙන් ඇසිය යුත්තකි. රටේ අගනුවර වන බුඩාපෙස්ට් මහා නගර සභාවට තමන් යටතේ ඇති ඉමහත් ව්‍යාපාර සංඛ්‍යාව පාලනය කළ හැකිවාට වඩා හොඳින්, සමහර විට ගම් සභාවකට සිය බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර කිහිපය පාලනය කළ හැකි වනු ඇත. ජාතික මට්ටමින් දැකිය හැකි දැඩි නිලධාරි වාදී ග්‍රහණය සැබැවින්ම අගනුවර කර්මාන්ත පරිපාලනයේ දී අපේක්ෂා කළ හැකි ය.

ප්‍රාදේශීය සභා අයිතිය කෙතෙක් දුරට රාජ්‍ය අංශයේ දැකිය හැකි නිලධාරි වාදී ලක්ෂණ පවත්වා ගනු ඇද්ද, කොතෙක් දුරට පෞද්ගලික අංශයට ආවේණික සැබෑ ව්‍යාපාරික ලක්ෂණ ආරක්ෂා කර ගනු ඇද්ද යන්න කිව හැක්කේ කාලයාට පමණි. මේ තත්ත්වය තුළින් අව්‍යාජ පෞද්ගලික හිමිකාර ව්‍යාපාරික ක්‍රමයක් කිසි සේත් පැන නොනැගෙනු ඇතැයි කීමට මම නොපෙළඹෙමි. එසේ නමුදු එවැනි තත්ත්වයක් පැන නැගීමට එරෙහිව යන බාධක දිගු කාලයක් මුළුල්ලේ බල පැවැත්වීමට ඉඩ තිබේ. කෙසේ වෙතත්, මේ අංශය රටේ සමාජ නිෂ්පාදිතයේ සැලකිය යුතු කොටසක් නිපදවන තරමට බලසම්පන්න වෙතැයි සිතීමට නම් නොහැකි ය.

(ඇ) ශ්‍රම කළමණාකාරිත්වය

දේපොළ අයිතිය පිළිබඳ මෙම ක්‍රමය රටේ ප්‍රබල තත්ත්වයකට පත් විය යුතු යැයි හෝ වත්මන් රාජ්‍ය අංශය ශ්‍රම කළමනාකරණ ස්වරූපයකට පරිවර්තනය කළ යුතු යයි හෝ මම යෝජනා නොකරමි. මේ පිළිබඳ තත්ත්වය කොහොමටත් නො පැහැදිලිය. රජයේ ව්‍යාපාර අංශයේ වැදගත් කොටසක දැනටමත් අර්ධ ශ්‍රම කළමනාකාරිත්වයක් දක්නට ලැබේ. දැනට ආකූල තත්ත්වයකින් පවතින යට කී දේපොළ අයිතිය, නිර්ව්‍යාජ ශ්‍රම කළමනාකාරී තත්ත්වයකට පත් කිරීමට පක්ෂව ගත් කරුවෝ කිහිප දෙනෙක්ම තර්ක ඉදිරිපත් කර සිටිති.

මෙම ක්‍රමයට පක්ෂ හා විපක්ෂ තර්ක බොහෝ ය. මීට විරුද්ධව ඇති මත අතුරින් දෙකක් තීරණාත්මකව පිළිගත හැකි තත්ත්වයේ ඇතැයි මම සිතමි. පළමුවැන්න **වැටුප් විනය** මුල් කර ගත්තකි. ස්ටැලින්වාදී ආඥාදායක ආර්ථික ක්‍රමය මුලිනුපුටා දැමීමට එරෙහිව පවතින ප්‍රධාන බාධකය මෙයයි. පවත්නා ආඥා පද්ධතියට අනුව රජයේ ව්‍යාපාරවල සේවක වැටුප් මට්ටමත් මුළු වැටුප් පිරිවැයත් පාලනය කරන අනිවාර්ය පරිපාලන නියෝග ඇත. අසංඛ්‍ය වූ සැලසුම් නියෝග අතුරින් ඉතා දැඩි උනන්දුවකින් ක්‍රියාත්මක කෙරෙන එකකි මේ. මෙම වැටුප් රෙගුලාසි නියෝග පිළිපදින්නන්ට ප්‍රශංසා හා තිළිණ ලැබෙන අතර, ඒවා කඩ කරන්නන්හට දඬුවම් විඳීමට සිදු වේ. තව දුරටත් ඉදිරියට ගෙන යනු ලබන නිර්බාධීකරණ පිළිවෙත වැටුප් පරිපාලනයේ පරිවර්තනයක් සිදු කරනු ඇත. මෙය වේගවත් වත්ම වැටුප් ඉහළ යාමේ වේගය ද වැඩි වනු ඇත. තවදුරටත් නිලධාරිවාදී බලකිරීම් ක්‍රියාත්මක නොවේ. එසේ නමුදු, තවමත් පෞද්ගලික හිමිකම තුළින්, වැටුප් මෙලෙස වැඩි වීමට එරෙහිව යන තත්ත්වයක් නිලධාරිවාදී බලකිරීම් වෙනුවට තවමත් ශක්තිමත්ව ස්ථාපිතව නැත.

අධික ලෙස වැටුප් ඉහළ නැගීම පෞද්ගලික ධනහිමියන්ගේ ස්වාභාවික ඕනෑඑපාකම්වලට පටහැණිව යන්නෙකි. පෞද්ගලික ව්‍යාපාරිකයා සිතන්නේ වැටුප් ගෙවීමට වැය වන සෑම ශතයක්ම තමන්ගේම පසුම්බියෙන් වැය වෙතැයි කියා ය. සේවකයන්ට ගෙවන හැම අතිරේක මුදල් ඒකකයක් ගෙවීම වටිනවා යැයි ඔහු සිතන්නේ ඉන් තමාට ද එපමණ වාසියක් අත් වෙතොත් පමණි. (සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මකව මෙයින් කියැවෙන්නේ ශ්‍රමිකයාගේ ආන්තික නිෂ්පාදිතය වැටුපට වඩා වැඩි විය යුතු බවය.) මෙවැනි නිරායාස උනන්දුවක් පොදු අයිතිය යටතේ පවතින ව්‍යාපාරවල සේවක වැටුප් සම්බන්ධයෙන් ඇති නොවේ. කළමනාකරු තමන්ගේම මුදල් පාලනය කිරීමක් හෝ පෞද්ගලික හිමිකරුවකුට සේවය කිරීමක් හෝ මෙහි නැති බැවිනි. වැටුප් ගෙවීමට කළමනාකරු වැය කරන්නේ රජයේ අරමුදලිනි. ඇත්ත වශයෙන්ම සේවකයන් අතර ජනප්‍රිය වීමට කළමනාකරුට අවශ්‍ය ය. වැටුප් වැඩි කර දීම මගින් මෙය පහසුවෙන්ම ලද හැක. සේවක නොසන්සුන්තා මැඩ පැවැත්වීමට ඇති පහසුම මග වැටුප් වර්ධක දීමයි. තවද, නිර්බාධීකරණ පරිවර්තනය සිදු වන වකවානුව තුළ පොදු ව්‍යාපාර පවතින්නේ කිසිම පාලනයකින් තොර තත්ත්වයකය. ආඥාදායක ආර්ථිකයේ වැටුප් විනය රැක ගන්නා නිලධාරිවාදී රෙගුලාසි හෝ සැබෑ වෙළෙඳ පොළ ආර්ථිකයක පෞද්ගලික අයිතිය නිසා රැකෙන වැටුප් විනය හෝ මේ කාලය තුළ ක්‍රියාත්මක නො වන බැවිනි. මේ හේතුවෙන් ප්‍රතිසංස්කරණ පවතින හැම රටකම වැටුප් උද්ධමනය දක්නට ලැබේ. සංඛ්‍යා දත්ත නොවළහා පෙන්වා දෙන පරිදි, මෙම සංසිද්ධිය චීනයේ ද, සෝවියට් දේශයේ ද, පෝලන්තයේ හා හංගේරියාවේ ද නිරීක්ෂණය කරනු ලැබ ඇත.

ශ්‍රම කළමනාකාරිත්වය වැටුප් විනය තව දුරටත් පිරිහී යාමට තුඩු දෙනු ඇතැයි මම කල්පනා කරමි. ආයතනයක ප්‍රධානියා තම සේවක මණ්ඩලය විසින්ම තෝරා පත් කර ගනු ලබන තත්ත්වයක් ගනිමු. එවිට තම යටත් සේවකයනට විරුද්ධව ඔහු පියවර ගත යුත්තේ කුමකටද? ඔහු වැටුප් වර්ධනය සීමා කර සේවකයන් අතර අප්‍රසාදයට පත් විය යුත්තේ කුමකටද? මෑතදී හංගේරියාවේ හඳුන්වා දෙන ලද ශ්‍රම කළමනාකරණ ක්‍රම රටේ වැටුප් ක්ෂේත්‍රයේ ලිහිල් වීමකට තුඩු දී ඇත. මෙම සංසිද්ධිය වඩාත් පැහැදිලිව දැක ගත හැක්කේ යුගෝස්ලාවියාවේ ය. දශක ගණනක් මුළුල්ලේ යුගෝස්ලාවියාවේ ක්‍රියාත්මක

වූ ශ්‍රම කළමනාකරණ ක්‍රමය රජය පිළිගත් මූලික දේපොළ අයිතියයි. එවැනි රටක ඉතා වේගයෙන් වැටුප් උද්ධමනය සිදු වීම පුදුමයට කරුණක් නොවේ.

ශ්‍රම කළමනාකරණයට විරුද්ධව එල්ල වන ඊළඟ ප්‍රධාන තර්කය **දේශපාලන** ස්වරූපයක් ගනී. නිෂ්පාදන කටයුතු, දේශපාලන කඹ ඇදිලිවලට සම්බන්ධ නොකළ යුතු යැයි අවධාරණය කරමින් ව්‍යාපාරික ස්ථානවල පක්ෂ ශාඛා තහනම් කරන නියෝග මෑත දී පාර්ලිමේන්තුව විසින් නිකුත් කරනු ලැබ ඇත. මෙය නොයෙකුත් විරුද්ධ පක්ෂ බලවේගවල ඉල්ලීම පිට කරනු ලැබුවකි. ඒ එසේ වුවද, පවත්නා තත්ත්වයන් යටතේ හංගේරියානු ව්‍යාපාරවල සැබෑ කම්කරු කළමනාකරණයක් ඇති වුවහොත්, කළමනාකරුවන් හා සමාගමේ නොයෙකුත් කවුන්සිලයක් පත් කර ගැනීම සඳහා කෙරෙන නිල වරණ දේශපාලන පක්ෂ අරගලයකට පත් වනු නියතය. තම තමන්ගේ අපේක්ෂකයන් ඉදිරිපත් කරමින් විවිධ දේශපාලන පක්ෂ හෝ පක්ෂ සන්ධාන, ඔවුන් වෙනුවෙන් මැතිවරණ ව්‍යාපාර දියත් කරනු ඇත. මෙසේ වැඩි ඡන්දයෙන් තේරී පත් වන ව්‍යාපාර කළමනාකරුවෝ, සුළුතරයේ නොමනාපයට ලක් වෙති. ඒක පාක්ෂික රජයක් පවතින යුගෝස්ලාවියාවේ පැවැත්වෙන ඡන්ද අවංක නැති හෙයින්, මේ ප්‍රශ්න එහි මතු නොවේ. එහි කොම්යුනිස්ට් පක්ෂය ද ඊට හිතවත් වෘත්තීය සමිතිය ද පළල් වශයෙන් නිල වරණ තමන්ට පක්ෂපාති වන ලෙස හැඩ ගස්වා ගනී. අප හංගේරියාව සඳහා අපේක්ෂා කරන්නේ නිර්ව්‍යාජ බහු පක්ෂ ක්‍රමයක් නම්, කළමනාකරුවන් තේරීමේ නිදහස් ඡන්ද, කම්හල් තුළ දේශපාලන පක්ෂ අරගලවලට තුඩු දෙනු නියතය.

එසේම 'සෑදූ' ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්තයට පක්ෂ අයට අවශ්‍ය වන්නේ, අව්‍යාජ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය හෝ එහි අත්‍යවශ්‍ය අංගයක් වන, දේශපාලන පක්ෂ අතුරින් කැමති පක්ෂයක් තෝරා ගැනීමේ නිදහස හෝ වෙනුවට ආදේශකයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවීමට ය. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ස්ථිර ආදේශකයක් ලෙස ශ්‍රම කළමනාකරණය සුදුසු යයි කල්පනා කළ අය ඉක්මනින් හෝ ප්‍රමාද වී හෝ පිළිගනු ඇත්තේ එය බලෙන් පැටවුණු අනුචිත ආදේශකයක් වන බව ය. අවංක බහු පාක්ෂික ක්‍රමයක් නොමැති තැන, වඩා හොඳ විකල්ප නැති නිසා හෝ හුදෙක් ශාස්ත්‍රීය හේතු උඩ හෝ කම්කරු කළමනාකරණය පාවිච්චි කළ යුතු යයි කල්පනා කළ අය, දැන් මෙවැනි නිෂ්ඵල ආදේශක අනවශ්‍ය බැව් තේරුම් ගත යුතුය.

1.6 සාරාංශය : ද්විත්ව ආර්ථිකය

පසුගිය වසර දහයක්, විස්සක් තිස්සේ හංගේරියාවේ වැඩුණු ද්විත්ව ආර්ථිකය සමග ජීවත් වීමට ඉදිරි දශක දෙකේ දීත් අපට සිදු වන බව මගේ විශ්වාසයයි. ඒ අනුව එහි කොටස් දෙක වන රාජ්‍ය හා පෞද්ගලික අංශ අප සමග තව කලක් පවතිනු ඇත.

රාජ්‍ය අංශයේ දායකත්වය අඩු කර ගත හැක්කේ ක්‍රමානුකූලව හෙමිනි. එය වඩා කාර්යක්ෂම කර ගැනීමට මහන්සි ගත යුතු ය. එහෙත් මේ පිළිබඳ නිසරු අපේක්ෂා තබා නොගනිමු. රාජ්‍ය අංශය සැබෑ ව්‍යවසායකත්වයක් බවට පත් කිරීමට හැකි ප්‍රාතිහාර්යමය පිළියම් නැත. අප කැමති වුවද අකමැති වුවද එහි අයහපත් ලක්ෂණ දිගටම පවතිනු ඇත. එම නිසා මේ අයහපත් අංග ලක්ෂණ අවම කර ගැනීමට, දෘඪ මූල්‍ය විනය හා සුදුසු පාර්ලිමේන්තු අධීක්ෂණය මගින් අප මහන්සි ගත යුතුය. එසේම එය

පෞද්ගලික අංශයට අහිතකර වන පරිදි ඕනෑවට වඩා සම්පත් උරා ගැනීම වැළැක්වීමට අප මෙ මගින් තැත් කළ යුතුය.

පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන තත්ත්වයන් ක්‍රමානුකූලව නිර්බාධීකරණය කළ යුතු වේ. ඊට එරෙහිව පනවා ඇති නිලධාරි වාදී තහංචි ඉවත් කළ යුතුය. එය කඩිනමින් හා ධෛර්යයෙන් යුතුව වර්ධනය වනු දැකීමට නම් උචිත පිස්කල් හා මූල්‍යමය උපකරණ අවශ්‍ය වේ. ඒ සමගම මේ ගැන ව්‍යාජ බලාපොරොත්තු පවත්වා ගත යුතු නොවේ. මෙය ද සෙමින් සිදු වන, දිගු කාලීන ක්‍රියාවලියක් බව පිළිගත යුතු ය. ඉදිරි ගමනේදී, පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය අතර අනුපාතය පළමු වැන්නට වාසි වන පරිද්දෙන් නොකඩවා වෙනස් වනු ඇත. (එය ඉක්මනින් ද සිදු වේ යයි අපි අපේක්ෂා කරමු). එනමුත් මේ දෙකේ සහජීවනය සෑහෙන කලක් ඉදිරියට තිබෙන්නට පුළුවන. ගැටීම්වලින් සමන්විත වුවද, මෙම සංකලනයෙන් කලක් යන තුරු අත් මිදෙන්නට නුපුළුවන.

2. ස්ථායීකරණය සඳහා සැත්කමක්

නිදහස් මැතිවරණයක් තුළින් ඉදිරියෙහි දී නව ආණ්ඩුවක් පිහිටුවෙතැයි ද, ඊට පාර්ලිමේන්තුවේ විශ්වාසය හා ඒ අනුව ඡන්දදායකයන් ගේ බහුතරයේ විශ්වාසය ලැබෙනු ඇතැයි ද යන උපකල්පනය මත ඉදිරි පිටුවල ලියැවී ඇති කරුණු රඳා පවතී. මෙම වැදගත් සිද්ධියට තුවූ දෙනු ඇති දේශපාලන කොන්දේසි විග්‍රහ කිරීමවත්, එම තත්ත්වය බිහි වීමට ඇති ඉඩ කඩ ගැන කථා කිරීමවත් මේ පොතේ කාර්යය නොවේ. ආර්ථික ප්‍රතිපත්තිය හා දේශපාලනය අතර සබඳතා පිළිබඳ විමර්ශනයක් අවසාන පරිච්ඡේදයේ ඇත. මේ අවස්ථාවේ මා සලකා බලන ප්‍රශ්නය නම් නව ආණ්ඩුව ක්‍රියාත්මක කළ යුතු ස්ථායීකරණ වැඩ පිළිවෙළ කුමක්ද යන්නයි.

මගේ තර්කය, ස්ථායීකරණය සඳහා ගත යුතු සමහර පියවර ගැනීම කල් නොයැවිය යුතු බවත්, ඒවා ටිකින් ටික ගන්නා තීරණ මගින් අත්පත් කළ හැකි නොවන බවත් ය. ඉක්මනින් ගත යුතු ඒ පියවර සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග එක පෑන් පහරින් ක්‍රියාත්මක කළ යුතුය. (අවශ්‍යයෙන්ම වචනයේ පරිසමාප්ත අර්ථයෙන් නුවුවත්). අවශ්‍ය සියලුම රෙගුලාසි, එකක් නැර, එකම දවසක ක්‍රියාවට නැගිය යුතු යයි මම නොකියමි. පහත දැක්වෙන කාල සටහන මගේ අදහස විස්තර කිරීමට ඉදිරිපත් කරන්නක් විනා, නියත වශයෙන් ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් ලෙස ඉදිරිපත් කෙරෙන්නක් නොවේ.

බලයට පැමිණ වසරක් ගත වීමට පෙර ස්ථායීකරණය සම්බන්ධ පියවර ගණනාවක් ගැනීමට නව රජයට පුළුවන් විය යුතුය. එම 'සැත්කම' යම් නිශ්චිත දිනයකින් ආරම්භ කොට, මූලික වැඩ කොටස වසරකින් නිම කිරීම සුදුසු ය. මෙම ක්‍රියාමාර්ගයෙහි දී පුරෝකථනය කළ හැකි යම් යම් පියවරවල් කල් තියාම මහජනයාට දැනුම් දිය යුතුය. 'සැත්කමට පසු' ගනු ලබන, පුරෝකථනය කළ හැකි පියවරවල් ගැන ද, සැත්කමට පෙර හා සැත්කම කෙරෙන කාලය තුළ මහජනයා දැනුවත් කළ යුතුය.

නව ආණ්ඩුව පිහිටුවන විට, මෙම මෙහෙයුමට අදාළ වැදගත් දේශපාලන හා ආර්ථික කරුණු පිළිබඳ එකඟත්වයක් ඇතිකර ගැනීම අවශ්‍ය ය. ඒවා නව රජයේ ආර්ථික ප්‍රතිපත්තියේ මුල් කනු බවට පත් වෙනු ඇත.

මේ පිළිබඳ සූක්ෂම කරුණු සිතා මතා වැඩි විස්තර වැඩි දියුණු කිරීමට ආණ්ඩුවේ පරිපාලන යන්ත්‍රයට වසරක පමණ කාලයක් දිය හැකි ය.[27]

---

27. කුමන තත්ත්වයක් යටතේ වුවද, මේ සා මහත් මෙහෙයුමක් පිළිබඳව දේශීය හා විදේශීය විශේෂඥයන් ගේ සේවය අවශ්‍ය වනු ඇත. රාජ්‍ය තන්ත්‍රයට කිසිම සම්බන්ධකමක් නොමැති පුද්ගලයන්ගේ සේවය ද මේ සඳහා අවශ්‍ය වනු ඇත. මේ සම්බන්ධයෙන් එක් ප්‍රශ්නයක් මම ඉස්මතු කොට දක්වමි.

තීරණයක් ගැනීමේදී, විවිධ දේශපාලනික හා මතවාදී දෘෂ්ටීන් ඇති සෑම විශේෂඥයකුම සමග සාකච්ඡා කොට තීරණ ගන්නා ආණ්ඩු ලෝකයේ කොහේවත් නැත. බ්‍රිතාන්‍යයේ කම්කරු පක්ෂ ආණ්ඩුවක් පැවති කල්හි, එය කොන්සර්වේටිව් පාක්ෂික විශේෂඥයන්ගෙන්

විශේෂඥයන් විශාල පිරිසක් මාස ගණනාවක් තිස්සේ කළ යුතු කටයුත්තක් පිළිබඳ විස්තර මේ කෘතියට ඇතුළත් කිරීම කළ නොහැකි බව පැහැදිලිය. මගේ අරමුණ ඊට වඩා බොහෝ සරල ය. මා මෙහි වෑයම් කරන්නේ ප්‍රධාන සිද්ධාන්ත කීපයක් හැකි තාක් පැහැදිලි අන්දමින් ඉදිරිපත් කිරීමට පමණි.

මෙවැනි ස්ථායීකරණ වැඩ පිළිවෙළකට අදාළ විෂය කරුණු සිය ගණනින් දැක්වීමට පුළුවන. මෙම අධ්‍යයනය එවැනි වැඩ පිළිවෙළක පළමු වන කටු සටහන ලෙස සැලකුව මනා ය. කටු සටහනක් ලෙස වුවද, එය පරිපූර්ණ එකක් නොවේ. වැදගත් මාතෘකා කීපයක් ඒ තුළ සම්පූර්ණයෙන්ම නොතකා හැර ඇත.

මා පහත ඉදිරිපත් කරන සිද්ධාන්ත ගැන ප්‍රශ්න මතු කළ හැකිය. එහෙත් ඒ කිසිවක් නොතකා අත්හැර ලිය හැකි නොවන බව නම් මට ස්ථිරවම කිව හැකිය. මෙම ප්‍රශ්න යට ගැසීමට පක්ෂ මැතිවරණ ප්‍රකාශන උත්සාහ ගත නොහැක්කේ නොවේ. ඉතාම හොඳින් ඡන්ද ලබා ගැනීමට මහජන මතය හැඩ ගස්වන අයුරු දේශපාලන පක්ෂවලට කියා දීම මගේ කාර්යය නොවේ. දේශපාලන පක්ෂයක් කල් තියාම ඡන්දදායකයාට දැනුම් දිය යුතු හා පසු අවස්ථාවක සාකච්ඡාව සඳහා කල් දැමිය යුතු ප්‍රශ්න කවරේද යන ප්‍රශ්නයේ තිබෙන සදාචාරාත්මක හා දේශපාලන පිළිවෙත් සම්බන්ධයෙන් එක පැත්තක් ගැනීමට මට අනවශ්‍ය ය. නිදසුනක් වශයෙන්, පක්ෂ අතර සන්ධානයක් බිහි කිරීමට කරනු ලබන මූලික සාකච්ඡාවලදී තීරණය කළ යුතු හා පසුව නව කැබිනට්ටුව තුළ සාකච්ඡා කළ යුතු යනුවෙන් ප්‍රශ්න ලැයිස්තු දෙකක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු නොවෙමි. මේ අනුව මා පිළිතුරු දීමට තැත් කරන්නේ නව ආණ්ඩුව කළ යුතු කටයුතු කවරේද යන ප්‍රශ්නයට ය.

මා මෙහි ඉදිරිපත් කරන දළ සැලැස්මට එකඟ නොවන විවේචකයන් සිටීමට පුළුවන. ඔවුන් විවේචන එල්ල කළ යුත්තේ කුමන ක්ෂේත්‍ර පිළිබඳ මගේ අදහස් කෙරෙහිද යන්න ගැන මට සීමා පැනවීමට නුපුළුවන. මා යෝජනා කරනුයේ, මේ පිළිබඳව පැන නගින ද්විතීයික කරුණු, දැනට පසෙක තැබීමට ය. කෙසේ හෝ, පසු කාලයෙහි ඒවාට විසඳුම් විශාල විශේෂඥ පිරිස් විසින්

අදහස් විමසුවේ නැත. මෙම විශේෂඥයන් එහිදී කෙළේ ආණ්ඩුවේ ක්‍රියා මාර්ග පිළිබඳ විවේචන හැටියට තම මත ඉදිරිපත් කිරීම ය. මාගුට් තැචර් බලයට පැමිණි විට කම්කරු පක්ෂයේ උපදේශකයන් විමසුවේ නැත. තැචර් ගේ ප්‍රතිපත්තිවලට විරුද්ධ වාමාංශික අර්ථ ශාස්ත්‍රඥයෝ විරුද්ධ පක්ෂයේ සිටින ඡායා ආණ්ඩුවලට උපදෙස් දුන්හ. සාමාන්‍යයෙන් බලන කල්හි ආණ්ඩුව හා එය තම සේවයට ගන්නා විශේෂඥ පිරිස් අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් **මුල සිටම ගොඩනැගී** තිබිය යුතුය. වෙනත් වචනවලින් කිවහොත්, ඔවුන් අතර, මූලික දේශපාලනික හා මතවාදී දෘෂ්ටියෙන් අන්‍යෝන්‍ය අවබෝධයක් තිබිය යුතුය. මේ අනුවම හංගේරියාවේ අනාගත ආණ්ඩුව සිය උපදේශකයන් ලබා ගත යුත්තේ සිය වැඩ පිළිවෙළේ මූලික ප්‍රතිපත්තිවලට පක්ෂපාතිත්වය දක්වන දේශීය හා විදේශීය ආර්ථික විද්‍යාඥයන් අතුරිනි.

විදේශීය උපදේශකවරුන් ලබා ගැනීමේදී නිල වශයෙන් හංගේරියාව පිළිබඳව වැඩ කරන ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වැනි ආයතනවල සේවය කරන, විෂය පරිචයක් ඇති පුද්ගලයන් පමණක් ගැන සිතීම වැරදි ය.

ලෝකයේ සිටින ඉතාම නිපුණ අර්ථ ශාස්ත්‍රඥයන්ගෙන් බොහෝ දෙනකු හංගේරියාවට උපදෙස් දීමට කැමති වනු ඇතැයි මම විශ්වාස කරමි. ඉන් සමහරුන් අනාගත හංගේරියානු ආණ්ඩුවට සහයෝගය පළ කරනු ඇති අතර, සමහරුන් ආණ්ඩුවට එරෙහි වන විවිධ විරුද්ධ පක්ෂ පිටුපස සිටිනු ඇත.

සොයා ගැනෙනු ඇත. දේශපාලන හා ආර්ථික විවාදයන්හි දී සැබැවින්ම මූලික වන කරුණු ඉස්මතු කරනු ලැබිය යුතුය.

ස්ථායීකරණ මෙහෙයුම පියවර ගණනකින් සමන්විත වේ. පළමුව එම අංශ එකින් එක ගෙන විස්තර කොට, පසුව, ඒවා **එක්වර** ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මම පෙන්වා දෙමි.

2.1 උද්ධමනය අවසන් කිරීම

උද්ධමනය අර්බුදකාරී ප්‍රශ්නයක්ය යන විශ්වාසයෙහි පිහිටා අපගේ මෙහෙයුම ඇරඹිය යුතුය. මේ කරුණ හැම දෙනාටම පැහැදිලි සත්‍යයක් නොවේ. රජයේ නිලධාරීහු හා ආර්ථික විද්‍යාඥයෝ බොහෝ දෙනෙක්, උද්ධමනය 'ආරක්ෂා සහගතව තමන් හාරයෙහි' පවතිතැයි යන විශ්වාසය උඩ මෙම ප්‍රශ්නය සුළුවෙන් සලකති. ඔවුන් කටයුතු කරන්නේ, ඉරණම විසින් උද්ධමනය හංගේරියාව තුළ බිහි කොට ඇති නිසා, එය ඉවසා සිටිය යුතු, නොවැළැක්විය හැකි දෙයකැයි යන අදහසිනි.

තමන් බලයට පැමිනුණහොත් උද්ධමනය ඉවත් කරමුයි යන පැහැදිලි පොරොන්දුවක් ආණ්ඩු පක්ෂයවත්, විරුද්ධ පක්ෂයවත් දී නොමැත.

මුදල් ඇමති ලැස්ලෝ බෙකෙසිගේ ප්‍රකාශයක් මෙසේ ය: 'ඉදිරි වර්ෂ තුළ උද්ධමනය මග හරවා ගත නො හැකි බැව් කණගාටුවෙන් වුවද කිව යුතුය. එක් අතකින් බලන කල, කලින් අනුගමනය කළ ස්වේච්ඡා ස්වරූපයේ ආර්ථික පිළිවෙතෙහි වූ විසංතුලන හා ආකාර්යක්ෂමතා හේතු කොට ගෙන උද්ධමනය ඇති වී තිබේ. අනෙක් අතින් බලන කල, උද්ධමනය වනාහී රටක ප්‍රතිසංස්කරණ (හැඩගැසුම්) කටයුතු හා අතිනත ගෙන ගමන් කරන ස්වාභාවික උණ රෝගයකි.'[28] යට කී කියමන සමග මට එකඟ විය නොහැක. උද්ධමනය පවත්නේ වර්තමාන මුදල් ඇමති හා ඔහුට පෙර සිටි මුදල් ඇමතිවරුන් 'උද්ධමනය පැවතුණාවේ' යන විධියේ ආකල්පයකින් කටයුතු කර ඇති බැවිනි. 'උද්ධමනය නැවැත්විය යුතුය' යන ප්‍රතිපත්තියෙහි පිහිටා වර්තමාන හා ඉදිරි මුදල් ඇමතිවරුන් කටයුතු කළහොත් පමණි, උද්ධමනය නැවැත්විය හැක්කේ. උද්ධමනය ස්වාභාවික ආපදාවක් නොව, ආණ්ඩු හෝ ඒවා පිටුපස ඇති දේශපාලන බලවේග හෝ විසින් නිර්මාණය කරනු ලැබූවකි. එබැවින් එය වැළැක්විය හැක්කේ ද ඔවුන්ටමය.[29]

මෙය තදබල ප්‍රකාශයකි. උද්ධමනයේ එකම නිර්මාතෘවරයාත්, එහි එකම විනාශකයාත් **තනිකරම** රජයේ පරිපාලන යන්ත්‍රය ය යන සීමාන්තික වන වැරදි

---

28. I. Wiesel (1989, පිටුව 19). එල්. බෙකෙසි සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකින් උපුටා ගන්නා ලද්දෙකි.

29. නිෂ්පාදක මිල ගැන වූ සංවාදයකට 1986 දී මා ලියූ ලිපියකිනි, පහත සඳහන් පාඨය උපුටා ගත්තේ. 'මෙම සංවාදයට ඉදිරිපත් කළ ලිපි ලේඛනවලින් උද්ධමනය අපෙදඟලික වූත්, නිරායාසයෙන් සිදු වෙන්නා වූත්, උද්ධමන විරෝධී පිළිවෙතක් මගින් සීමා කර ගත යුත්තා වූත් ක්‍රියාවලියක් ලෙස විස්තර කෙරේ. මෙය වැරදි අදහසක් බව මගේ විශ්වාසයයි. ධනවාදී හා සමාජවාදී යන දෙවර්ගයේම රටවල, පිස්කල් හා මූල්‍ය බලධාරීන් විසිනි අවසාන වශයෙන් මුදල් මැවෙනුයේ. ආණ්ඩුව උද්ධමනයන් හට ගන්වන නිසා ය උද්ධමනයක් පවතිනුයේ. හංගේරියාව තුළ උද්ධමනීය සිද්ධිදාමයක් බිහි වූයේ ආණ්ඩුව උද්ධමනකාරී ප්‍රතිපත්ති අනුගමනය කළ බැවිනි. හංගේරියානු ආණ්ඩුව එම ප්‍රතිපත්තිය වෙනස් නොකරන තාක් කල් උද්ධමනය අප අතරින් ඉවත් නොවේ.' (J. Komai 1989)

අදහසට එය තුඩු නොදිය යුතුය. මෙහි ලා සහභාගි වන ක්‍රීඩකයෝ බොහෝය. රටක මූල්‍ය ක්‍රියාදාමයන් හැඩ ගස්වන්නා වූත්, මිල හා වැටුප් තීරණය කරන්නා වූත් සියලුම දෙනා අත උද්ධමනය රැඳී තිබේ. අවසාන වශයෙන් කල්පනා කරන විට, භාණ්ඩ මිල ඉහළ යාම පිළිබඳව පවත්නා අපේක්ෂාවන් තම තමන්ගේ ආර්ථික සැලසුම් පිළියෙළ කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාමාන්‍ය ජනතාව ද එහි කොටස්කරුවෝ වෙති. උද්ධමනීය සිද්ධිදාමයක දී **උද්ධමන අපේක්ෂා** අනිවාර්යයෙන්ම පැන නගී. අද හංගේරියාවේ තත්ත්වය එය වීම කණගාටුවට කරුණකි. මේ **අපේක්ෂාව** යම් සීමාවන් ඉක්මවා ගිය විට උද්ධමන අපේක්ෂා **ඒ තිසාම සැබෑ වන තත්ත්වයක්** ඇති වේ.[30] වැටුප් ලබන්නන් සියයට 20 ක උද්ධමනයක් බලාපොරොත්තු වෙතොත් ඔවුහු සියයට 20 ට නො අඩු වැටුප් වැඩිවීම් බලාපොරොත්තු වෙති. භාණ්ඩ හා සේවා අලෙවි කරන අයද සියයට 20 ක අවම මිල වැඩි වීමක් අරමුණු කර කටයුතු කරති. මෙම බහු චරිත නාට්‍යයේ පෙනී සිටින නළු නිළියන් අතර, ප්‍රධාන චරිත හා අතිරේක චරිත රඟපාන අය වෙන් කොට දැක්වීම අවශ්‍ය ය. කුමන සමාජ ක්‍රමයක් රටක පැවතුණත්, උද්ධමන නාට්‍යයේ ප්‍රධාන ජවනිකාව රඟපාන්නේ ආණ්ඩුව යි; වඩා නිශ්චිතව කිවහොත් මූල්‍ය පරිපාලනයයි. මේ තත්ත්වය ධනවාදී රටවලට වඩා මධ්‍යගත ක්‍රම සම්පාදනය සහිත සමාජවාදී රටවල ප්‍රබලව ක්‍රියාත්මක වන්නේ, මිල හා වැටුප් තීරණය කිරීමේදී ද, ණය දීම, ආයෝජනය හා අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම්වල දීද රජයේ මැදිහත් වීම ඒවා තුළ වඩා බලවත් නිසා ය.

බැංකු නෝට්ටු මුද්‍රණාලය ආණ්ඩුවේ පාලනය යටතේ පවතී. රාජ්‍ය වියදම් හා අයභාරය අතර හිඟයන් පියවා ගැනීමට අවශ්‍ය අමතර බැංකු නෝට්ටු එය නිකුත් කර දෙනු ඇත. තවද රාජ්‍ය අංශය ප්‍රබල රටක, අලාභ විඳින ව්‍යාපාර නඩත්තු කිරීමටත්, නිතර ඉහළ නගින වැටුප් ගෙවීමටත් රජය මුදල් නෝට්ටු මුද්‍රණය කර ගනු ඇත. උද්ධමනය අවසන් කිරීමේ මූලික වගකීම රජය සතු බැව් කීවේ මේ හේතුන් නිසා ය.

උද්ධමනකාරී ප්‍රතිපත්ති ප්‍රවේසම් සහගතව පවත්වා ගෙන යාමේ වරදක් නැතැයි රටේ සුප්‍රසිද්ධ ආර්ථික විද්‍යාඥයින් (මේ අතර බොහෝ දෙනෙක් ප්‍රතිසංස්කරණවාදීහු ද වූහ) පවසා ඇත. ආර්ථික විද්‍යාඥයින් එසේ උපදෙස් දුන්හයි ඉහත කී කරුණු පිළිබඳ වෙනසක් ඇති නොවේ. මෙම අවවාදය වැරදී ගොස් ඇති බව සනාථ වී අවසානය. සෑම ආණ්ඩුවක්ම කෙළේ, මෙවැනි ප්‍රතිපත්තියක් ගෙන යාමට උපදෙස් දෙන තමන්ගේම උපදේශකයන් පත් කර ගැනීමයි.

එසේම වෙනත් රටවලත් උද්ධමනය ඉහළ ගොස් ඇති බව පෙන්වා දීම, හංගේරියාවේ උද්ධමනය යුක්ති සහගත බව පෙන්වීම සඳහා නිදහසට යොදා ගත හැකි කරුණක් නම් නොවේ. තමන් කළා යයි චෝදනා කොට ඇති වරද, තවත් මිනිසුන් ගණනාවක්ම කර ඇති බව, උසාවිය ඉදිරියේ තමන්ගේ නිදහසට කරුණක් ලෙස ප්‍රකාශ කිරීමට විත්තිකරුවකුට නො හැකිය.

---

30. උද්ධමනීය අපේක්ෂා හා උද්ධමනයේ අනිකුත් සංයුක්ත අංග පිළිබඳ ගැඹුරු විග්‍රහයක් එෆ්. විසි ගේ ලිපියේ (1989) දක්නට ලැබේ. උද්ධමනය ගැන හංගේරියාවේ ලියැවී ඇති ලිපි අතර K.Csoor and P.Mohacsi (1985) Z.M.Petschig (1986) සහ T. Erdos (1989) යනාදිය සඳහන් කළ හැක.

මා විශ්වාස කරන්නේ අද හංගේරියාවේ උද්ධමනය සංඛ්‍යා ලේඛනවලින් කියැවෙනවාට වඩා බොහෝ සේ වැඩි බවයි. නිල සංඛ්‍යා උද්ධමනය මැනීමේදී පෞද්ගලික අංශයේ මිල ගණන්වලට ප්‍රමාණවත් බරක් දෙන්නේ නැත. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ නිල වශයෙන් ලියා පදිංචි කර නැති ශායා ආර්ථිකය තුළ පවත්නා මිල ගණන් ය. ඒවා රාජ්‍ය අංශයේ මිල ගණන්වලට වඩා බොහෝ සේ වේගවත්ව ඉහළ යනු පෙනේ. පෞද්ගලික අංශයෙන් ලැබෙන නිෂ්පාදන හා සේවා ප්‍රමාණය රටේ සමස්ත පරිභෝජනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් බැව් අමතක නොකළ යුතුය. එම ප්‍රතිශතය ක්‍රම ක්‍රමයෙන් වැඩි වී ඇත. උද්ධමනය පිළිබඳ වාර්තාවේ වෙනත් විකෘති ද ඇත. ආණ්ඩුවේ ආයතනයක් වන මධ්‍යම සංඛ්‍යා ලේඛන කාර්යාලයයට **ස්වාධීන** ක්‍රියා කරන පර්යේෂක කණ්ඩායමක් කිසිවකු හෝ විසින් තවමත් බිහි කර නොතිබීම හා ඒ සඳහා සෑහෙන තරම් මුදල් යොදවා නොතිබීම ඛේදයකි. එවැන්නක් ඇතොත්, එය අපක්ෂපාතී ලෙස කටයුතු කරමින්, නිවැරදි ආර්ථික හා සංඛ්‍යානමය නිර්නායක යටතේ කටයුතු කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. ඒ සමඟම එය ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය ජනකායක්, නිල වාර්තාවල පිළිගැනෙනවාට වඩා වැඩි වේගයකින් උද්ධමන වේගය ඉහළ නගිමින් ඇතැයි දරන විශ්වාසයද තම කටයුතුවලදී සැලකිල්ලට ගතමනා ය.

ගණනය කිරීමේ ගැටලුව මොහොතකට අමතක කොට උද්ධමනයේ අද පවතින වාර්ෂික වේගය දළ වශයෙන් සියයට 15-20 ක් වනු ඇතැයි සිතමු. යටත් පිරිසෙයින් හේතු දෙකක් නිසා, මම මෙය පවා බරපතල ප්‍රශ්නයක් ලෙස සලකමි.

1. උද්ධමනය රටේ ජනතාව කෙරෙහි අනුකම්පා විරහිතව බලපායි. තම තමන්ගේ පුද්ගලික ඉතිරි කිරීම් අතේම දිය වී යනු දකින ඔවුහු, සදාකාලික ව අසහනයට පත් ව සිටිති.

   මේ දිනවල කිසියම් **පුනර්ව්‍යාප්තික** ක්‍රියා මාර්ගවල අවශ්‍යතාව පිළිබඳ කථා බහ නිතර ඇසේ. එහෙත් රටේ දුප්පත් කොටස් වන වැටුප් ලබන්නන්ට හා විශ්‍රාමිකයන්ට අහිතකරව බලපාමින්, උද්ධමනය එක්තරා විශේෂ ආකාරයක පුනර්ව්‍යාප්තියකට තුඩු දෙන බැව් මෙහි දී අමතක කෙරේ. තමන් ගේ විශ්‍රාමික වැටුප වසර කිහිපයකින් දියවී යන අයුරු බලා සිටින්නට, වැන්දඹුවන්ට හා වයස්ගත වූවන්ට සිදු වේ. තවද, ළමා හා පවුල් දීමනාවන්හි ක්‍රය ශක්තිය නොකඩවා අඩු වේ. ඉහළ නගින මිලට අනුපාතික වන පරිද්දෙන් තම වැටුප වැඩි කර ගැනීම සඳහා, සෙමින් වැඩ කිරීම්, විවෘත හා සංවෘත වැඩ වර්ජන යනාදිය යොදා ගැනීමට අපොහොසත්, සංවිධාන ශක්තිය හා දේශපාලන බලපෑම් නැති අය භාණ්ඩ මිල හා වැටුප් අතර සිදුවන කඹ ඇදිල්ලෙන් පැරදෙති.

   ශුභසාධක ප්‍රතිපත්ති දුප්පතුන්ට උදව් විය හැකි අන්දම පිළිබඳ ලියවිලි හා දේශපාලන ප්‍රකාශන මම අසා ඇත්තෙමි. මෙම යෝජනා ගැන සලකා බැලීම මම පසුවට කල් තබමි. මේ ගැන පැත්තක් නොගෙන මෙහි දී එක් කරුණක් සඳහන් කළ හැකියි. එනම් ඉහත කී ප්‍රකාශන, උද්ධමනය ගැන සලකා බැලීම අමතක කිරීම පුදුම උපදවන සුළු බවය. වත්මන් හංගේරියාවට ගැළපෙන ශුභ සාධක ප්‍රතිපත්තියක් හෝ ප්‍රකාශයක් නිකුත් කරන අය, පළමුව උද්ධමනය පිළිබඳ ඔවුන්ගේ මතය ප්‍රකාශ

කළ යුතුය යන්න මගේ විශ්වාසයයි. එය දිගටම පැවතීමට ඔවුන් ඉඩ දෙනවා ද? වඩාත් වැදගත් ප්‍රශ්නය වනුයේ උද්ධමනය වැඩි කරවන සුළු පියවර ඔවුන් යෝජනා කරනවා ද නැද්ද යන්නයි.

2. ආර්ථිකයේ පරිවර්තනය හා බැඳුණු මූලික අරමුණුවලට පටහැනි වන සේ උද්ධමනය ක්‍රියා කරයි. මෙය මෙසේ වන්නේ, විශේෂයෙන්ම, උද්ධමනය, තාර්කික ගණනය කිරීම්වලට අවහිර කරන බැවිනි. සාමාන්‍ය මිල මට්ටම ඉහළ නගින විට, භාණ්ඩ අතර සාපේක්ෂ මිල වෙනස්වීම් හරියාකාරව බලා ගත නොහැකි වන නිසා, සම්පත් විභාජනය මෙහෙයවමින් මිල ගණන්වලින් කෙරෙන සංඥා දීමේ කාර්යය නවතී. **ඒ** හා **බී** නිෂ්පාදන එකිනෙකට ආදේශක යයි සිතමු. යම් දෙන ලද ආන්තික ආදේශන අනුපාතිකයක් යටතේ, **බී** වලට සාපේක්ෂව **ඒ** වඩා ලාබ යයි සිතමු. එසේ නම් සරල ආර්ථික තර්කය වනුයේ **ඒ** හි මිල ඉහළ ගිය යුතු බව ය. මෙහිදී **ඒ** නිෂ්පාදිතයේ මිල වැඩිවීමත් සමග **බී** හි මිල ද උද්ධමනකාරී ලෙස වැඩි වේ නම්, සාපේක්ෂ මිල වෙනස් කිරීමෙන් අත්පත් කර ගත හැකි වැදගත් කිසිම දෙයක් නැත.

වෙළෙඳ පොළ ආර්ථිකයක නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව නිෂ්පාදකයාට ලැබෙන ලාභය මගින් පිළිබිඹු කෙරේ. අකාර්යක්ෂම නිෂ්පාදනය පාඩුවලට තුඩු දෙන අතර, පාඩු විඳින නිෂ්පාදකයා ඉක්මනින්ම වෙළෙඳ පොළින් ඉවතට වීසි වේ. වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවට දායක වන්නේ මේ ආකාරයෙනි. අව්‍යාජ වෙළෙඳ පොළ ආර්ථිකයක පවා, සියයට 100 ක්ම ස්ථිර වශයෙන්, නිෂ්පාදකයන් අතර මෙම වරණය සිදු නොවුවද, එම තත්ත්වය ලබා ගත හැකි වීමේ සංඛ්‍යාත්මක සම්භාවිතාව ඉහළ මට්ටමක පවතී. උද්ධමනකාරී පසුබිමක හොඳ, නරක නිෂ්පාදන දෙවර්ගය ම ජය ගන්නා බැවින් කාර්යක්ෂම, අකාර්යක්ෂම නිෂ්පාදකයන් එකිනෙකාගෙන් තෝරා වෙන් කර ගැනීමේ ක්‍රියාදාමය යටපත් වේ. යම් ව්‍යාපාර ඒකකයක නිෂ්පාදනය ගුණාත්මක බවින් අඩු වුව ද, භාණ්ඩ මිල වැඩි වීම නිසා, ඊට සිය පිරිවැය පියවා ගැනීමට පුළුවන් වනු ඇත. තම භාණ්ඩ මිල වැඩි කිරීමට ඕනෑ ව්‍යාපාර, එය තමන්ගේ අකාර්යක්ෂමතාව නිසා වන බැව් නොපෙන්වා, මිල වැඩි කිරීම පිරිවැය ඉහළ යාම නිසා කිරීමට සිදු වූ බැව් ප්‍රකාශ කරනු ඇත. මෙවැනි තත්ත්වයක් යටතේ පෞද්ගලික අංශයේ දේපොළ හිමිකරුවන්ට වුවද, තම ව්‍යාපාරික අය-වැය දැඩි ලෙස පාලනය කර ගත හැකි නොවේ. උද්ධමනය පෞද්ගලික අංශය තුළ පවා අය වැය පාලනය ලිහිල් කරවයි. දැන් අපි හංගේරියාවේ පුද්ගලික වෙළෙන්දකු, තම කටයුතු රජය සතු ව්‍යාපාරයකට වඩා හොඳින් නොකොට, ගනුදෙනුකරුවන් අතර අප්‍රසාදයට ලක් වෙතැයි සිතමු. එහෙත් කිසියම්ම හෝ ක්‍රමයකින් ඔහු සිය භාණ්ඩ මිල ඉහළින් තබා ගැනීමට සමත් වේ. මෙහි දී ඔහු ගිනි කන්නකු යයි අවලාද නැගීම වැරදි ය. රටක අර්ථ ක්‍රමයක්, ආත්ම විනයකින් යුක්ත සාන්තුවරයින්ගෙන් සැදුම් ලද්දේ නොවේ. මෙතැන පවතින ප්‍රශ්නය නම්, පුද්ගලික වෙළෙඳුන්ගේ අයහපත් සේවාවට පවා, ඔවුන් ඉල්ලන තරමේ ඉහළ මිල ගෙවීමට සැහෙන තරම් මුදල් ප්‍රමාණයක් උද්ධමන ක්‍රියාදාමය හේතු කොට ගෙන, හංගේරියානු ගනුදෙනුකරුවන් අත ගැවසීමයි.

හංගේරියාවේ රාජ්‍ය අංශය සම්බන්ධයෙන් මෙම නිරීක්ෂණය වඩාත් නිවැරදි වේ. කිසියම් සංගීතයක රිද්මයට නටන නැටුමක් අපට මෙහි දැකිය හැකිය. පහත දැක්වෙන්නේ ඊට සහභාගි වන්නන් ය: රජයේ නිල මිල ගණන් නියම කරන මිල පාලන කාර්යාලය; තමන්ම තීරණය කරන මිල ගණන් වලට නිදහසේ විකිණිය හැකි වන පරිදි, එම භාණ්ඩ නිෂ්පාදනය කරන රජයේ ව්‍යාපාර; රජයේ අරමුදල් ණයට දෙන වෙළෙඳ බැංකුව; රටේ මුදල් සංසරණයට පත් කරවන හා මුදල් සැපයුම පාලනය කරතැයි කියන ජාතික බැංකුව; නිතරම ආදායම්වලට වඩා වියදම් කරන, රජයේ අය-වැය භාරව සිටින මුදල් අමාත්‍යාංශය. මේ අතරින් අවසාන වශයෙන් දැක්වුණු ආණ්ඩුව හා ඒ පිටුපස සිටින දේශපාලන බලවේග, ඉහත කී ආයතන සියල්ල අතර ඉතාම වැදගත් ඒවා වෙයි. රංගනයේදී මේ ආයතන අතුරින් එක එකක් අනිකට චෝදනා එල්ල කරයි; හැම විටම වරද අනෙකා පිට පැවරීමට උත්සාහ දරයි. මේ සෑම ආයතනයක්ම එකම රාජ්‍යයේ අංග උපාංග වෙයි. එකිනෙකින් ස්වාධීනව කටයුතු නොකරන මේවායිනි, 1.2 කොටසේ විස්තර වන 'රාජ්‍ය අංශය' නිර්මාණය වී ඇත්තේ.

ආර්ථිකයේ ප්‍රධාන අංශය වශයෙන් නිලධාරිවාදී ලක්ෂණ සහිත රාජ්‍ය අයිතිය පවතින තාක් කල්, රජයේ ව්‍යාපාර මත කිසිසේත්ම දෘඪ අය-වැය සංරෝධක පැනවීමට නොහැකි ය. මෙයට මූලික වන හේතු සමාජ විද්‍යාත්මක ය. රජය තමන්ගේ ව්‍යාපාරවල කළමනාකරුවන් හා සේවකයන් සේවයට යොදවා ගැනීමේදී, කැමැත්තෙන්ම හෝ අකමැත්තෙන් ඔවුන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය පිළිබඳ යම් සහතික වීමක් කළ යුතු වීම හා මෙය සම්බන්ධය. විශාල වශයෙන් රැකියා කපා හැරීමට ප්‍රායෝගික වශයෙන් ඊට නොහැක. (මේ ගැන පසුව නැවත කථා කරමු.) මේ සාධකයට ද, වෙනත් සමාජ විද්‍යාත්මක සාධකවලට ද එකතු කර සලකා බැලිය යුත්තකි, උද්ධමනයේ ප්‍රතිඵල. දැනටමත් ලිහිල්ව පවත්නා අය-වැය සංරෝධකය, උද්ධමනය කරණ කොට ගෙන වඩ වඩා ලිහිල් බවට පත් වේ. රජයේ ව්‍යාපාර හොඳින් කටයුතු කරන්නේද නැද්ද යන්න නිශ්චය කර ගැනීමටත්, එසේම ඉහළ නගින පිරිවැයට හේතු සොයා ගැනීමටත් පුළුවන්කමක් නැත. පිරිවැය විශ්ලේෂණය මගින් නිෂ්පාදනයක කාර්යක්ෂමතාව ගැන යම් අදහසක් ඇති කර ගත හැක්කේ, නිෂ්පාදන සාධක කීපයක මිල ඉහළ නගිතත්, අනිත් ඒවායේ මිල එසේ ඉහළ නොනැග ඇති විටක දීය. මෙ පරිද්දෙන්ම, භාණ්ඩ විකුණුම් මිල ද, සියල්ලේම නොව සමහරක පමණක් වන පරිදි ඉහළ යන තත්ත්වයක් තිබිය යුතුය. එහෙත් සෑම පිරිවැයකම හා විකුණුමකම මිල ඉහළ නගිමින් පවතී නම්, රජයේ ව්‍යාපාරවල වැඩ කටයුතු ගැන ඇගයීමක් කොහෙත් ම වාගේ කළ නොහැකි තත්ත්වයක් හට ගනී.

අවට ලෝකය දෙස බලමු. දේශපාලනඥයකු හෝ අර්ථ ශාස්ත්‍රඥයකු වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයකට පක්ෂ වූ තරම වැඩි වන්නට වන්නට ඔහු උද්ධමනයට දක්වන විරුද්ධතාව ද ඉහළ නගිනු දැකිය හැක; අනෙක් අතට රාජ්‍ය අංශයට පක්ෂපාතී වන තරමට උද්ධමනය ගැන ඔහු දක්වන උනන්දුව අඩු වේ.

එබැවින් ස්ථායීකරණ සැත්කමෙහි මූලික කාර්යයකි උද්ධමනකාරී ක්‍රියාවලිය අවසන් කිරීම. මේ සඳහා සාර්ව සැපයුම හා සාර්ව ඉල්ලුම තුලනය විය යුතුය. මෙසේ බලන කල්හි සැත්කමෙහි හරය ඉතා සරල ය. යම් දෙන ලද සාර්ව සැපයුමක් එක් පසෙකින් ද, එසේම දෙන ලද සාර්ව ඉල්ලුම අනෙක් පසින්

ද තිබේ. සමස්තයක් වශයෙන් අපි මිල ගණන් නිදහසේ තීරණය වන්නට ඉඩ හරිමු. එවිට යම් මිල මට්ටමකදී සමතුලිතතාව පිහිටනු ඇත. මේ සම්බන්ධතාවේ දැකිය හැකි විචල්‍ය තුන පරීක්ෂා කර බලමු.

1. අපේක්ෂිත **සාර්ව සැපයුම** නිශ්චිතව තක්සේරු කළ නොහැකිය. හැඩගැසුම් ක්‍රියාදාමය යටතේ යම් යම් අංශවල නිෂ්පාදනය අඩු වන අතර වෙනත් අංශවල නිෂ්පාදනය වැඩි වේ. තවද, යම් යම් අංශවල, ව්‍යාපාරවල හෝ පළාත්වල තිබෙන ශ්‍රම අතිරික්තය උරා ගත හැකි, ශ්‍රම හිඟයන් පවතින අංශ, ව්‍යාපාර හා ස්ථාන බිහි වනු ඇත. මේ අන්දමින් ශ්‍රමය හා භෞතික සම්පත් පුනර් විභාජනයකට අවස්ථාව සැලසේ. මෙහි දී වැදගත් කරුණ නම් 1.1 කොටස යටතේ නම් කළ අවශ්‍යතා කෙතරම් හොඳින් ක්‍රියාත්මක කෙරේද යන්න උඩ, පෞද්ගලික අංශයේ ප්‍රගතියට ඇති ඉඩකඩ වැඩි වනු ඇති බවයි. පෞද්ගලික අංශය නිෂ්පාදනයට දක්වන සූදානම අඩපණ කිරීමට හේතු වන කිසිම පියවරක් ස්ථායීකරණ සැත්කමෙහි අඩංගු නොවිය යුතුය. මෙතෙක් අප විස්තර කළ කරුණු අනුව අප සිතිය යුත්තේ, ජාතික ආර්ථිකය සමස්තයක් වශයෙන් ගත් විට, එනම් සාර්ව මට්ටමෙහි දී, ස්ථායීකරණ මෙහෙයුම අරඹා වසරක් දෙකක් පමණ යන තෙක් **සැපයුම නොවෙනස්ව** පවතිනු ඇතිය යනුවෙනි.

2. සැත්කම ආරම්භයේදී **සාර්ව ඉල්ලුම** ද පැවති ආකාරයෙන්ම තිබෙන්නට පුළුවන. එහෙත් කෙටි පරිවර්තන කාලයක් තුළ එය සුළු වශයෙන් ඉහළ යාම නම් නොවැළැක්විය හැකිය. එහෙත් මෙහෙයුම ආරම්භ වී ඉතා කෙටි කාලයකින් එය තදින් පාලනය කර තබා ගත යුතුය. මෙහෙයුමේ මූලික කටයුත්තක් වන්නේ, සාර්ව ඉල්ලුම හා එහි සංරචක දැඩි ලෙස සීමා කර තබා ගැනීමය. 2.3 කොටසෙහි මේ කරුණු සවිස්තරව සලකා බැලේ.

3. යම් මට්ටමක පවත්නා සාර්ව සැපයුමක්, එලෙසම යම් මට්ටමක පවත්නා සාර්ව ඉල්ලුමකට මුහුණ දෙන විට පැන නගින ප්‍රශ්නය නම්, සැපයුම හා ඉල්ලුම සමතුලිත කරවන **සාමාන්‍ය සාර්ව මිල මට්ටම** කුමක්ද යන්නයි. මෙය කුමක් වනු ඇද්දැයි කිසිවකුටත් නිශ්චිත වශයෙන් කීමට නුපුළුවන. චක්‍රාකාරව සිදු වන, සංකීර්ණ වූ පිරිවැය මිල සම්බන්ධතාවල සමස්ත ප්‍රතිඵලය නිශ්චිතවම ගණනය කිරීමට ක්‍රමයක් නැත.[31] මේ සම්බන්ධව මා ඉදිරිපත් කරන යෝජනා, සෝවියට් දේශයේ නිරන්තරයෙන් භාවිතා කළා වූ ද, නැගෙනහිර යුරෝපයේ කුඩා රටවල වරක්, දෙවරක් අත්හදා බලා ඇත්තා වූද යෝජනාවලට කිසිදු නෑකමක් නොදක්වයි. එලෙස මේ රටවල ගත් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවලදී, කල් තියාම, මිල ගණන් හා පිරිවැය සම්බන්ධව, සමගාමීව ඇති වන වෙනස්කම් ගණන් බැලීමේ ප්‍රයත්නයක් ගැනිණි. මිල අධිකාරීන් ගේ කාර්යාලය තුළ දී ලක්ෂ සංඛ්‍යාත මිල ගණන් කල් තියා තීරණය කිරීමක් අපගේ කාර්යයට අවශ්‍ය නොවේ. මා විශ්වාස කරන පරිදි, ඒවා යථා කාලයේදී, වෙළෙඳ පොළින්ම මතු වී එනු ඇත.

---

31. එසේ වතුදු, පවත්නා නවීන විද්‍යාත්මක උපක්‍රම භාවිත කරමින්, මෙහෙයුම තුළ හා ඊට පසු ඇති විය හැකි ක්‍රියාදම පුරෝකථනය කිරීමේ ප්‍රයත්නයක් ගැනීම අවශ්‍යය. මෙහි ලා නවීන සාර්ව ආර්ථික විද්‍යා ආකෘති යොදා ගත හැකි වනු ඇත.

මෙම මෙහෙයුමෙන් අනතුරුව රටේ අනාගත මිල මට්ටම දැනට පවතින මිල මට්ටමට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ මට්ටමක තීරණය වීමට ඉඩ තිබේ. එහෙත් ආණ්ඩුව මුල සිටම උද්ධමන විරෝධී පිළිවෙතක් අනුගමනය කළහොත් මෙලෙස මිල මට්ටමේ වන ඉහළ යාම නැවත නැවත සිදු වන දෙයක් බවට පත් නොවනු ඇත. මෙහෙයුම හා සම්බන්ධව ඇති වන මිල ඉහළ නැගීම අවශ්‍යයෙන්ම උද්ධමනයකට තුඩු නොදෙනු ඇත. සිදු වන මිල මට්ටමේ වන මෙම ඉහළ යාම, පූර්ව මෙහෙයුම් අවධියේ උද්ධමන අනුපාතයට වඩා වැඩි වුවද, පසු අවස්ථාවන්හි උද්ධමන වේගය වඩා ශීඝ්‍රගාමී වීමට එය හේතුවක් නොවිය යුතුය. උද්ධමනය ගතික ක්‍රියාවලියක් බව අප හොඳින් තේරුම් ගත යුතුය. එය මිල, වැටුප් හා වෙනත් සාධක පිරිවැයවල ආවර්තිත ඉහළ නැගීමකි. මෙම ආවර්තනය යම් තැනකින් කපා දමා, සාර්ව ඉල්ලුම් අතිරික්තය නැවත නැවත ඇති වීම වැළැක්වුවහොත්, උද්ධමනය නැති කර ලීමට හොඳටම ඉඩකඩ තිබේ. අප අත්පත් කර ගැනීමට මහන්සි ගත යුත්තේ මෙයයි.

2.2 අය-වැය සමතුලිතතාවේ ප්‍රතිෂ්ටාපනය

මේ සම්බන්ධයෙන් ද දැනට රටේ දක්නට ලැබෙන්නේ කිසිවක් කර කියා ගත නොහැකි විධියේ ආකල්පයකි. මූල්‍ය අසමතුලිතතාවට ප්‍රතිකාර නොමැති යැයිද, එබැවින් ඒ පිළිබඳව කළ හැකි කිසිවක් නැතැයිද යන විධියේ හැඟීමක් රටේ පවතී.

මේ සම්බන්ධයෙන් විවිධාකාර වන විදේශීය නිදසුන් ඉදිරිපත් කෙරේ. මේ නිදසුන් අතරින් එකකි, අමෙරිකා එක්සත් ජනපදයේ නිරන්තරයෙන් පවතින උග්‍ර අය-වැය හිඟය. අමෙරිකානුවන්හට නොකළ හැකි දෙයක් හංගේරියානුවන් වන අපි කෙසේ කරන්නෙමුද යන ප්‍රශ්නය මෙහිදී ඇසේ. මෙවැනි තර්ක අවිචාරවත් ය. අමෙරිකා එක්සත් ජනපදයේ තත්ත්වය හංගේරියාවේ තත්ත්වයට හාත්පසින්ම වෙනස් ය. අමෙරිකානු අය-වැය තත්ත්වය හංගේරියාවේ අය-වැයට කිසිසේත් අදාළ නොවේ. මේ අතරම අමෙරිකානුවන් පිළිබඳවද කිවයුත්තක් ඇත. එහි සිටින සෑම ආර්ථික හා දේශපාලන කණ්ඩායමක්ම අමෙරිකාවේ අය-වැය හිඟය උග්‍ර ව්‍යාධියක් බැව් පිළිගනී. එහෙත් ඊට පිළියම් සෙවීමේදී, ජනතාව හා ඔවුන් නියෝජනය කරන කොන්ග්‍රස් සභාව තුළින් විවිධ මත ඉස්මතු වේ. සමහරුන් බදු වැඩි කිරීමට පක්ෂ වන අතර, තවත් සමහරු මේ විකල්පය හෙළා දකිමින්, ඒ වෙනුවට අය-වැය හිඟයේ දුර්විපාකවලට මුහුණ දීමට එකඟත්වය පළ කරති.

අමෙරිකා එක්සත් ජනපදය හැරුණු විට අය-වැය හිඟය අර්බුදකාරී එකක් බවට පත්ව ඇති වෙනත් ධනවාදී රටවල් ද කිහිපයක් ඇත. මේ සමඟම සිහි තබා ගත යුත්තේ, අය-වැය හිඟයන් නොමැතිව තම ආර්ථිකය පවත්වා ගෙන යන ධනවාදී රටවල් ද කිහිපයක් ලෝකයේ ඇති බව ය.

අය-වැය තුලනය වීමේ අවශ්‍යතාවත්, අය-වැය හිඟයක් ඇති වුවහොත් එහි තුලනය නැවත ඇති කර ගැනීමේ අවශ්‍යතාවත් පිළිබඳ ව, බටහිර අර්ථ ශාස්ත්‍රඥයින් අතර දැඩි ලෙස මතභේද පවතී. නූතන ධනවාදී රටවල දක්නට ලැබෙන විවිධ අය-වැය ප්‍රතිපත්ති පිළිබඳව විනිශ්චයක් දීම මේ පොතේ

අරමුණ නොවේ.[32] මෙහිදී අය-වැය තුලනය පවත්වාගත **නොහැකි** ය, හෝ එය ළඟා කර ගත යුතු නොවන හෝ නොහැකි අරමුණක් ය යන අදහසට ධනවාදී ඉතිහාසය තුළින් සහයෝගය **නො ලැබේ** ය යන අදහස දැක්වීම පමණක් සෑහේ. මේ අවස්ථාවේදී නූතන ධනවාදය වෙත ඇහිලි දිගු කිරීම නවතා, අපේම රටේ පසුබිම දෙසට අවධානය යොමු කිරීම වඩා මැනවි.

ස්ථායීකරණ සැත්කම කැරි ගෙන යන අවස්ථාවේදී, දැඩි පියවර යොදා හෝ අය-වැය තුලනය කර තබා ගත යුතුම ය. වසර ගණනාවක්ම පැවතී ඇති විසංතුලනයට පසු, එකතු වන අයහාරයෙන්ම රජයේ වියදම් පියවා ගැනීමේ ක්‍රමයක් ඇති කිරීමට ලැබී ඇති මෙම මහඟු අවස්ථාව පැහැර නොහැරිය යුතුය. අය-වැය තුලනය පිළිබඳ විවාද තුළ හා දේශපාලන ප්‍රකාශන වල පොදු වියදම් කපා දැමීමේ අවශ්‍යතාව සඳහන් වේ. වියදම් අඩු කර ගැනීමට කරන ඉල්ලීමට මම සම්පූර්ණයෙන්ම එකඟ වෙමි. මෙහිලා කළ යුතු ආශ්‍රිත කටයුතු පිළිබඳව දිගින් දිගට කථා කිරීමට මම නොපෙළඹෙමි. පිහිටාධාර නැවැත්වීම, පොදු වියදම් සමහරක් දැඩි ලෙස කපා දැමීම, යෝජිත ස්ථායීකරණ මෙහෙයුමේ කොටස් වෙයි. මෙවැනි වැය කපා හැරීම් කළාට පසුව ද, රාජ්‍ය පරිපාලනය, සන්නද්ධ හමුදා, ආණ්ඩුව හා රාජ්‍ය අංශය ගත් විදේශ ණය සඳහා පොළී හා ණය කොටස් ආපසු ගෙවීම, ආර්ථික හා ශුභසාධන වැය යනාදිය උදෙසා වියදම් දැරීමට සිදු වේ. මා කරන යෝජනාවේ හරය ඉතා සරලය; වාර්ෂිකව එකතු කරන බදුවලින් යට කී වාර්ෂික වියදම් පියවා ගත හැකි වන පරිදි එම බදු ප්‍රමාණය තීරණය කළ යුතුයි. මෙහෙයුමට සූදානම් වෙද්දී, අපේක්ෂිත ප්‍රමාණයන්ට වඩා වැඩියෙන් වියදම් කප්පාදු කළ හැකි වනු ඇතැයි යන සැකසහිත බලාපොරොත්තුව සිත්හි තබා ගත යුතු නොවේ. ආණ්ඩුවේ අයහාරය වැඩි කිරීමට වඩා, රජයේ වියදම් කපා හැරීමේ යෝජනාවලට ජනතාව පක්ෂපාතී නිසා, මෙවැනි වැය කැපීමේ ම ක්‍රියා මාර්ගයන් යෝජනා කරන දේශපාලනඥයින් ජනතාව අතර වඩා ජනප්‍රිය වීමට ඉඩ තිබේ. එහෙත් ජනප්‍රිය වීමේ තරඟ පවත්වා මෙම ප්‍රශ්නය විසඳිය නොහැකිය. අවශ්‍ය වියදම් පියවා ගැනීමට නම් තිබිය යුතු අයහාරය කොපමණ දැයි පරිස්සමින් හා පැහැදිලි ලෙස තීරණය කළ යුතුය. වැදගත් කරුණ අයහාරය වියදමට වඩා අඩු නොවිය යුතු බවයි. එය සුළුවෙන් වියදමට වඩා වැඩි වුවාට කමක් නැත.

මේ සියල්ල සඳහා බදු පද්ධතියේ විප්ලවකාරී වෙනසක් ඇති කිරීම අවශ්‍ය වෙයි. සමාජවාදී අර්ථ ක්‍රමයක දක්නට ලැබෙන ජනතා හිතවාදී ආදායම් පුනර් ව්‍යාප්තිය ද, තුන්වන ලෝකයේ අසරණ රටක පිස්කල් කරුණු අතින් දැකිය හැකි කිසිවක් කර කියා ගත නොහැකි බවද, ස්කැන්ඩිනේවියානු ශුභසාධක රාජ්‍යයක ඇති දියුණු වූ ප්‍රගතිගාමී (= අනුක්‍රම) අය බදු ක්‍රමය ද යන මේවායේ එකතුව තුළින් ඇති වූ අවුල් සහගත බදු පද්ධතියකි, අද හංගේරියාවේ දක්නට ඇත්තේ. බටහිර රටවල සමකාලීන ප්‍රාග්ධන වෙළෙඳ පොළ ගැන මීට ඉහත පරිච්ඡේදය තුළ කථා කරන විට හංගේරියාව තුළ ඇති, නූතන ධනවාදයේ ව්‍යාජ අනුකරණයන් ගැන සඳහන් කෙළෙමි. හංගේරියාවේ අද පවතින බදු ක්‍රමය ගැන

---

32. කේන්සියානු ආර්ථික පිළිවෙතින් මෙහෙයවනු ලැබ වුවමනාවෙන්ම අය වැය හිඟයන් බිහි කැරුණු කාල පරිච්ඡේද තිබුණි. එහි අරමුණ වූයේ, කෘත්‍රිම ලෙස බිහි කැරුණු අධික ඉල්ලුමකින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමයි. මෙම ප්‍රතිපත්තියේ ප්‍රතිඵල සැකසහිත ඒවා වී ඇත.

ද එම දේම කිව හැකිය. එරටේ නව බදු රෙගුලාසි හැඩගැස්වූ අය, එහි ප්‍රතිඵලයක් වශයෙන්, හංගේරියාව පුංචි ස්වීඩනයක් සේ කටයුතු කරනු ඇතැයි, රටේ නායකත්වයට ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුට ද, ජනතාවගේ කොටසකට ද ඒත්තු ගැන්වීමට සමත් වූහ. බුඩාපෙස්ට්හි ප්‍රචලිත කෘෂර විහිළුවකින් කියැවෙන පරිදි, අපට දැන් ඇත්තේ ස්වීඩනයේ බදු අඩු කළ පසු එන හංගේරියානු වැටුප් පමණෙකි. නව බදු ප්‍රතිපත්තිය හංගේරියාවේ 'බටහිරකරණයේ' සංකේතයකැයි ප්‍රකාශ කරන, කරුණු මතු පිටින් පමණක් නිරීක්ෂණය කළ හැකි, අදක්ෂ බටහිර නිරීක්ෂකයෝ ද ඉහත කී අදහස්වලට මුළා වී සිටිති.

ස්ථායීකරණ සැත්කමේ කොටසක් ලෙස නව අයබදු ක්‍රමයක් ගොඩ නැංවීම සඳහා වෑයම් කරන තැනක දී පළමුවෙන්ම කළ යුත්තේ ඇත්ත වශයෙන්ම නුණත්, අඩු ගණනේ අප හේ සිතුවිලිවලින් වත් දැනට ඇති බදු පද්ධතිය මුලිනුපුටා දැමීම ය.

නව බදු පද්ධතිය පදනම් විය යුතු මූලික සිද්ධාන්ත කවරේදැයි මුල සිටම ක්‍රමානුකූලව විමසා බලමු.[33] සම්පූර්ණ විග්‍රහයක් ඉදිරිපත් කිරීමට මම වෑයම් නොකරමි. මා මෙහිදී අවධාරණය කරන්නේ, බදු පද්ධතිය නැවත නැවත සංශෝධනය කිරීමේදීත්, ස්ථායීකරණ සැත්කමට සූදානම් වීමේදීත් වැදගත් යැයි මා සලකන මූලික සිද්ධාන්ත කීපයක් පමණි.[34]

1. ශිල්පීය වශයෙන් ඉතාම සරල බදු ක්‍රම වලට මුල් තැන දෙමින්, බදු පැනවිය යුත්තේ ඒවා 'එකතු කර ගත හැකි' තැන්වලිනි. මේ අදහස බදු අය කිරීමේ ශිල්ප ක්‍රම හා සම්බන්ධව සදාචාරමය වැදගත් කමකින් තොර වූවක් ලෙස පෙනී යතුදු, එහි සදාචාරමය හා දේශපාලන කරුණු ද අන්තර්ගත ය.

   අප කතා කරන්නේ හංගේරියාව ගැන මිස, ස්කැන්ඩිනේවියාව ගැන නොවේ. පසුගිය කාලයේ රජයේ නිල ප්‍රචාරවලින් රජය ජනතාවගේ යැයි හඬ ගා කී තරමටම ජනතාව එය විශ්වාස නොකිරීමට පුරුදු වූහ. රජයට වංචා කිරීම, රජයේ දේපොළ කොල්ලකෑම හෝ තම යුතුකම් පැහැර හැරීම ලජ්ජා විය යුතු කරුණක් ලෙස නොව, ප්‍රශංසා කටයුතු දෙයක් වශයෙන් සලකන තත්ත්වයට අද ජනයා පත් ව සිටින බව අප පිළිගත යුතුය. මෙවැනි හැසිරීම්වලින් වැළකී සිටින්නෝ මෝඩයින් සේ සැලකෙති. රජය සතු ට්‍රැම් රථයක ගාස්තු නොගෙවා ගමන් කිරීම හපන්කමක් ලෙස තරුණයෝ සලකති. පසුගිය දශක ගණනක් තුළ මෙවැනි වංචා, වැඩිහිටියන් අතර පවා, සාමාන්‍ය හැසිරීම් රටාවක් බවට පත් වී තිබේ. මෙම චර්යා රටා, කොතරම් විශාල දේශපාලන විපර්යාසයක් සිදු වුවද, එක් රැයකින් නවතිනු ඇතැයි බලාපොරොත්තු තැබිය නොහැකිය. ඡන්දයෙන් තේරී පත් වන ජනතා නියෝජිතයින් අතට භාණ්ඩාගාරයේ

---

33. මෙහි ඉදිරිපත් කර ඇති බදු යෝජනා පිළිගැනුණොත් ඒවා නීතිමය භාෂාවෙන් විස්තර කිරීම මේ කෘතියේ කාර්යයක් නොවේ. පවතින බදු නීති සංශෝධනය කළ යුතු ද, පැරණි නීති වෙනුවට නව නීති සකස් කළ යුතු ද යන්න සොයා බැලීම නීතිමය කටයුත්තකි. මේ පිළිබඳව **සංකල්පීය වශයෙන්** පහසුම කාරණය අලුත්ම නීති පෙළකින් පටන් ගැනීම ය.

34. බදු අයකිරීමේ මූලධර්ම ගැන සාමාන්‍ය වශයෙන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය අයට පහත සඳහන් ග්‍රන්ථ කියවිය හැකි ය. R.A. සහ P.G. Musgrave (1980) සහ J. Stiglitz (1986)

පාලනය භාර වූ විගස ඉහත විස්තර කළ හැසිරීම් රටා ක්ෂණිකව වෙනස් නොවෙනු ඇත. ජනතාව ගේ පුරුදු වෙනස් වීමට කෙතරම් කාලයක් ගත වේදැයි කිසිවකුටත් කිව නොහැකිය. මෙහිදී කිව හැක්කේ ඉදිරි වසර දෙක තුනේදී නම් එවැනි වෙනසක් සිදු නොවනු ඇති බව ය. (මේ අධ්‍යයනයේ කාල ක්ෂිතිජය එය වෙයි.)

මේ අනුව බදු අයහාරයන් ගැන සිතා බැලීමේ දී කටයුතු කළ යුත්තේ, පුරවැසියන්ගෙන් සෑහෙන පිරිසක්, බදුවලින් බේරීමට දැඩි වෙහෙසක් ගනු ඇතැයි සිතා ගෙන ය. එසේ කිරීමට ඇති හැකියාවේ සීමාවන් තුළ, ඔවුන් සිය ආදයම් අඩුවෙන් ප්‍රකාශ කරනු ඇත. ඔවුහු බටහිර රටවලද එසේ කරති. මෙසේ කිරීමේ තීව්‍රතාව නම් රටින් රටට වෙනස් වනු ඇත. මෙම ප්‍රශ්නය යුරෝපයේ උතුරු කොටස්වල දී ට වඩා, දකුණු කොටස්වල උග්‍රය. එහෙත් ස්කැන්ඩිනේවියාවේ පවා බදු ගෙවීමේ සදාචාරය පහළ යමින් ඇතැයි සැලකේ. හංගේරියාව සම්බන්ධයෙන් වැදගත් වන තවත් කරුණක් ඇත. එනම් පෞද්ගලික අංශයෙන් විශාල කොටසක් තවමත් ඡායා ආර්ථිකය තුළ පවත්නා අතර, එම කොටස් සෙවනැල්ලෙන් ඉවත් ව, සිය කැමැත්තෙන් එළිමහනට ඒමට සෑහෙන කාලයක් ගත විය හැකි බව ය. මෙය සිදු වීම දිරි ගැන්වීම සඳහා අවශ්‍ය කරුණුවල සවිස්තර ලැයිස්තුවක් 1.1 කොටසෙහි දැක්විණ.

මේ තත්ත්වය යටතේ, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කෙරෙන ආදයම් ප්‍රකාශයන් මත බදු අය කර ගත හැකි වෙතැයි යන විශ්වාසය මත බදු ක්‍රමය ගොඩ නැංවීම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

මෙයට දිය හැකි ප්‍රථම පිළිතුර නම්, ආණ්ඩුව මෙහි දී අහසේ මාලිගා හදතැයි යන්න ය. එය තමන්ට එකතු කර ගත හැකි ආදයම් ගැන බලාපොරොත්තු රඳවා තැබීමෙන් කරන්නේ තමන් ම රවටා ගැනීමකි. අපේක්ෂා කරන බදුවලින් වැඩි කොටසක් ඊට කවදවත් ම අය කර ගැන්මට නොහැකි වනු ඇත.

මේ සම්බන්ධයෙන් ගත හැකි දෙවන ක්‍රියාමාර්ගයක් ඇත. එනම් බදු ගෙවීම් පැහැර හැරිය හැකිය යන්න පිළිගනිමින් තත්වානුරූප බදු පද්ධතියක් ගොඩ නැගීමයි. මෙවැනි දර්ශනයක් පදනම් විරහිත නොවූවද එහි යම් ආකාරයක වංචාකාරී බවක් ඇත. බදු නීති පනවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද, ක්‍රියාත්මක කරවන විධායක නිලධාරීන් ද, එම බදු පැහැර හරින පුද්ගලයින් ද එකිනෙකා දෙස බලමින් පහත දැක්වෙන ප්‍රකාශය වැන්නක් ගැන එකඟ වන්නා සේය: 'බදු ගෙවන ශිෂ්ට සම්පන්න මෝඩයන් ඔවුන් ගෙවිය යුතු බදු ගෙවන බව අපි හොඳින් දනිමු. එහෙත් බදුවලින් මිදීමට අදිටන් කොට ඇති වංචාකාරීන්ගෙන් අප පනවන බදු අය කිරීමට අපේක්ෂාවක් වත් මෙහි නැත.

ඇති විය හැකි තෙවන තත්වය, මෙලෙස එකිනෙකා දෙස හොරෙන් බැලීමක් නැතිව, පුද්ගලික ආදයම් බදු එකතු කර ගැනීමට තදින් පියවර ගැනීම ය. එහෙත් බදු සදාචාරය පහළ මට්ටමක පවතින රටක රජයට කුමක් කළ හැකි ද? ඊට කළ හැක්කේ දැනටමත් බදු නිලධාරීන් කරන දේමය. එනම් බදු ගෙවන්නන් ගේ වත ගොත, එනම් ආදායම් මූලාශ්‍ර හා වියදම් කරන ආකාරය ගැන ඔත්තු සොයා බැලීමයි. බදු අධිකාරිය,

සුඛෝපභෝගී ජීවිත ගෙවන අසල්වාසී පොහොසතුන් බදු නොගෙවනු ඇතැයි සැක සිතේ නම් ඔවුන් ගැන පොලිසියට ඔත්තු දීමට, මිනිසුන් දිරි ගන්වයි. මෙයට ඇති අවසාන විසඳුම ඕර්වේලායානු ක්‍රමයකි. එනම් සෑම නිවසකම පවුලේ ආදායම හා වියදම පරීක්ෂා කිරීමට බදු පරීක්ෂකවරයකු බැගින් පත් කිරීමය. බදු ගෙවීමට හසු කර ගන්නා එක් එක් පුරවැසියකු වෙනුවෙන් මේ පරීක්ෂකයනට දීමනාවක් ද ගෙවීමට සිදු වනු ඇත.

පුද්ගල ස්වාධීනත්වය, නිදහසේ මුදල් වියදම් කිරීමට ඇති අයිතිය හා කෙනකු ගේ පෞද්ගලිකත්වයට ඇති ගෞරවය වැනි ගුණාංග අගය කරන අයකුට මෙවැනි ඉඩ ප්‍රස්ථා ගැන ඇසීම පවා බිය උපදවන සුළුය.[35]

මෙසේ බලන කල්හි අංක 1 යටතේ දැක්වුණු අවශ්‍යතාව හුදෙක් බදු පිළිබඳ ශිල්පීය කරුණක් පමණක් නොවේ. ඉන් ඊට වඩා වැඩි දෙයක් කියැවේ. මුළු ලෝකයේම බදු පාලකයන්ට සරිලන පිළියම් ඉදිරිපත් කිරීමට මට වුවමනාවක් නැත. මට මෙහිදී කීමට වුවමනා වනුයේ ඉහත දැක්වූ ගැටලුවලින් මිදුණු බදු එකතු කිරීමේ ක්‍රමයක් හංගේරියාවට අවශ්‍ය බවය. එලෙස ඇති කර ගනු ලබන බදු ක්‍රමය පුරවැසි පක්ෂපාතීභාවය පරීක්ෂා කිරීමේ අවස්ථාවක් කර නොගත යුතුය. එසේම ඒ යටතේ මිනිසුන් ගේ පෞද්ගලික ජීවිත ගැන සොයා බැලීම සඳහා ව්‍යවස්ථාවදායකට හෝ පරිපාලන තන්ත්‍රයට ඉඩක් නොතිබිය යුතුය. ඒ සමගම අප තෝරා ගත යුතු බදු ක්‍රමය, රජය පවත්වා ගැනීම සඳහා සැහෙන අයහාරයක් එකතු කර ගැනීමට සමත් විය යුතුය. එසේම තෝරා ගන්නා බදු වර්ග හැකි තාක් දුරට **අපෞද්ගලික** ඒවා විය යුතුය. මේ

---

35. බටහිර රටවල භාවිතය ගැන නැවතත් මට ඇසේ. එම රටවල පුරවැසියන් හා රජය අතර විශ්වාසී සබැඳියාවක් තහවුරු කරන විධියේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් ගොඩ නැගීමට, දශක ගණනාවක්, සමහර විට, ශතවර්ෂ කීපයක් ගත විය. එම රටවල පුරවැසියන්ගේ පුද්ගලික ජීවිතවලට බදු අධිකාරීන් ඇඟිලි ගැසීම නීතියෙන් තහනම් කර ඇත. එමෙන්ම ඕනෑම ආකාරයේ රජයේ ක්‍රියාවකට විරුද්ධව අධිකරණයේ පිහිට සෙවීමට පුරවැසියාට ඉඩ තිබේ. එවැනි පසුබිමක පවා, බදු අධිකාරීන් තම බලය අනිසි ලෙස පාවිච්චි කරන අවස්ථා ඇත.

ලෝක ප්‍රසිද්ධ චිත්‍රපට අධ්‍යක්ෂක ඉන්ග්මාර් බර්ග්මාන් බදු පැහැර හැරීමේ චෝදනාවක් සම්බන්ධව, චිත්‍රපටයක් කැමරා ගත කරමින් සිටි අවස්ථාවකදී බලෙන් ගෙන ගොස් උසාවියට ඉදිරිපත් කළ සිද්ධියේ ඇති කෘෘරභාවය ඉතා ප්‍රසිද්ධ ය. මෙය සිදු වූයේ බොහෝ විට ආදර්ශයක් කොට හුවා දැක්වෙන ස්වීඩනය තුළය. වේදනාවට පත් වූ ඔහු රටින් පිට වී වසර ගණනාවක්ම සිය කැමැත්තෙන් වෙනත් රටවල ජීවත් වූයේය. මේ කාලය තුළ වුවද ඔහු ස්වදේශයට තිබූ ලැදියාව අඩු කෙළේ නැත. අවුරුදු ගණනාවකට පසු ඔහු නැවතත් සිය රටට ගෙන්වා ගනු ලැබ පුනරුත්ථාපනයට පත් කරන ලදි. එහෙත් නොසැකිලිමත් දරදඬු බදු අධිකාරයකින් බර්ග්මන්වද, විශ්ව මානව සංස්කෘතියටද සිදුවූ හානිය පිරිමසා ලිය නොහැකිය.

ස්වීඩනයේ හෝ වෙනත් බටහිර ප්‍රජාතාන්ත්‍රික රටක බදු පද්ධතිය ගැන නිගමනවලට පැමිණීම මෙම පොතේ කාර්යයක් නොවේ. එත්මන් හංගේරියාවේ පුද්ගලික අයබදු ක්‍රමයක් ක්‍රමානුකූලව පවත්වා ගෙන ගියහොත්, මෙවැනි සිද්ධීන් ඇති වීමට තිබෙන ඉඩ ප්‍රස්ථා ඉහත කී රටවලට වඩා බොහෝ සෙයින් වැඩිය. මූලික සදාචාර ප්‍රශ්නය පැන නගින්නේ මෙතැන්හි දිය. වැඩි සාපය කුමක්ද? මිනිසුන් 100ක් අතුරෙන් සිටිය හැකි අවංක එක තැනැත්තකු හෝ ගැන නොසිතා 100 දෙනාටම බදු පැහැර හැරීමේ වරදට දඬුවම් දෙමුද? නොඑසේ නම්, අවංක එක් පුද්ගලයකු හෝ වේදනාවට පත්වීම වළකනු වස් 99 දෙනාටම ගැළවී යාමට ඉඩ දෙමුද? පෞද්ගලිකව මගේ නම් කැමැත්ත දෙවැන්නට ය.

සියල්ල හොඳින් ඉටු වුවහොත්, ප්‍රජාතන්ත්‍රවාදය හංගේරියාවේ මුල් බැස ගනු ඇත. පුරවැසියන් නැවත රජයට සමීප වනු ඇත. පෞද්ගලික අංශයේ නීත්‍යානුකූල හා මෘදු ක්‍රියාකාරිත්වයට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වනු ඇත. පුද්ගලික ආදායම් බදු ක්‍රමයක් ගැන සීතීමට පටන් ගත හැක්කේ මෙවැනි තත්ත්වයක් උදා වීමෙන් පසුව පමණි.

2. බදු ක්‍රමය හැකිතාක් දුරට **අපක්ෂපාතී** (= **මධ්‍යස්ත**) විය යුතුය. යුක්තිසහගත අවස්ථාවලදී හැරෙන විට, රජය බදු පද්ධතිය ප්‍රයෝජනයට ගෙන ත්‍යාග දීම හෝ දඬුවම් දීම හෝ නොකළ යුතුය. ශුභසාධක, සංස්කෘතික හෝ වෙනත් සමාජයීය හේතුවක් උඩ, ජාතික හෝ ප්‍රාදේශීය ව්‍යවස්ථාදායක සභාවක්, කෙනකුට පිහිටාධාර සලස්වන්නේ නම්, එය විවෘතව කළ යුතුය.[36] **අයහාර අංශයෙන්** බදු අඩු නො කර, **වැය පක්ෂයේ** යම් යම් අයිතම මෙම අරමුණ සඳහා වෙන් කොට තබා ගත යුතුය. පාසල් යන සෑම දරුවකුටම නොමිලයේ පාසල් පොත් සැපයිය යුතු ද යන්න ගැන දැනට රටේ පවතින විවාදයට හවුල් වීමට මම අදහස් නොකරමි. එවැනි ප්‍රතිපත්ති ගැන තීරණ ගැනීමට පාර්ලිමේන්තුවට අයිතිය ඇත. එවැන්නකට මුදල් වෙන් කිරීමේදී, එක්කෝ වෙනත් අංශයකින් වැය කප්පාදු කළ යුතු බවත්, නොඑසේ නම්, අතිරේක බදු පැනවිය යුතු බවත් සිහියේ තබා ගත යුතුය. නොමිලයේ පාසල් පොත් දීමට පක්ෂව මන්ත්‍රීවරුන් සිය ඡන්දය පාවිච්චි කළ පසු, ඊට වියදම් වන මුදල අය-වැයෙහි 'අධ්‍යාපන වැය' යන මාතෘකාව යටතේ හා 'සංස්කෘතික සහන' යටතේ දැක්විය යුතු වෙයි. ග්‍රන්ථ ප්‍රකාශකයින්ට හෝ බෙදා හරින්නන්ට හෝ සැලසෙන බදු සහන මැද්දේ මෙම වැය ශීර්ෂ ගිලී යාමට ඉඩ දිය යුතු නොවේ.

මේ අනුව, ඉහතින් 2 වන අවශ්‍යතාව ලෙස දැක්වුණු කරුණෙහි තේරුම නම්, බදු වර්ගය කුමක් වුවද (පාරිභෝගික බද්ද, වැටුප් බද්ද යනාදිය), අය කරන බදු අනුපාතිකය දැඩි ලෙස **එක සමාන** වීම වැදගත් වන බව ය. විවිධ වර්ගයේ නිෂ්පාදන, සේවා, ක්‍රියාකාරකම් හෝ සමාජ කණ්ඩායම් වෙනුවෙන්, අත්තනෝමතික බදු සහන සැලැස්වීමට කරන ඉල්ලුම ඉවත දැමිය යුතුය. රජයේ සහනාධාර අවශ්‍ය වන ශුභසාධන, සෞඛ්‍ය හා සංස්කෘතික කටයුතු පිළිබඳව ප්‍රතිපත්තියක් අපට අවශ්‍ය බැව් සැබවි. එහෙත් ඒ සඳහා වුවමනා කරන මුදල් සොයා ගැනීමට, බදු අනුපාතික අඩු වැඩි කිරීම මම අනුමත නොකරමි. මේ සම්බන්ධයෙන් කෙරෙන තර්ජන, බලපෑම් යනාදියට තමන් යටත් නොවන බවටත්, ඒකාකාර බදු අනුපාතික ප්‍රතිපත්ති ඉවත් නොකරන බවටත්, දේශපාලන බලය ඇත්තෝ පොරොන්දු විය යුත්තා හ.

වෙළෙඳ පොළ ආර්ථිකය පැත්තෙන් බැලූවද, මෙවැනි බදු මූලධර්මයක් රටකට අවශ්‍ය බැව් පෙනේ. නිර්ව්‍යාජ මිල ක්‍රමයක් නැති තැනක නිර්ව්‍යාජ වෙළෙඳ පොළක් බිහි නොවේ. පක්ෂග්‍රාහි බදු සහන මිල

---

36. නැති බැරිකම් ඇති අයට දෙනු ලබන යම් මුදල් ආධාර වර්ගයක් 'නිෂේධන ආදායම් බදු' නමින් බටහිර සාහිත්‍යයේ දක්වේ. ඉහත තර්කය මෙවැනි මුදල් ආධාර දීමට විරුද්ධ වන්නේ නොවේ. එය තෑගි දීමක් හෝ දඬුවමක් හෝ නොවන බැවිනි. වෙනත් වචනවලින් කිවහොත්, එය දිරි දීමනාවක් (හෙවත් ප්‍රෝත්සාහකයක්) ලෙස කටයුතු නොකරයි.

පද්ධතියට ඇතුළු වුණු විට, ඒ ඒ භාණ්ඩයේ සැබෑ පිරිවැය දැන ගැනීමට අවකාශ නොලැබේ. මිල පද්ධතියක සියලුම කොටස් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධය. සැම මිලක්ම සමස්ත මිල ගණන් හා වැටුප් පද්ධතිය තුළ පිරිවැයක් බවට පත් වේ. මේ නයින් බලන කල, විශේෂණය කරන ලද, කිසි පිළිවෙළක් නැති බදු, මිල ගණන් විකෘති කරයි. වෙළෙඳ පොළ ආර්ථිකයක් ඇති වෙනු දකින්නට සැබැවින්ම කැමති අය, ඒකාකාරී හා මධ්‍යස්ත (අපක්ෂපාති) බදු ක්‍රමයක් පිහිටුවා ගැනීමට බල කළ යුතුය.

3. අනුක්‍රමික බදු ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාවක් මට නොපෙනේ. අනුක්‍රමික බදු ක්‍රමයකට කැමැත්තක් දක්වන්නා වූ බහුතරයක් සිටින හංගේරියාවේ බොහෝ දෙනා, මා ඉදිරිපත් කරන මෙම යෝජනාවෙන් තැති ගනු ඇත. ඒ බව දැන දැනත්, මම බහුතර මතයට විරුද්ධව යාමට කැමැත්තෙමි.

ආදායම් ව්‍යාප්තිය මූලික වශයෙන් **සදාචාර** ප්‍රශ්නයකි. තනිකර තර්කානුකූලව 'නිවැරදි' ආදායම් ව්‍යාප්තිය මේ යැයි පෙන්වා දීමට කිසිවකුටත් නොහැකි වන්නේ මේ නිසා ය. ආදායමේ හා ශුභසාධනයේ **සමානත්වයට** සමහරු ආවේණික වටිනාකමක් දෙති. නිෂ්පාදිත භාණ්ඩ සමානව බෙදා හැරීම (හෝ යටත් පිරිසෙයින් එය හැකි තාක් සමානව බෙදා හැරීම) වෙනුවෙන්, ජාතික ආදායම හෝ නිෂ්පාදන කාර්යක්ෂමතාව හෝ තරමක් අඩු වීමට ඉඩ හැරීමට ඔවුහු සූදානම් ය. අනිකුත් සදාචාර ප්‍රශ්නවලදී මෙන්ම මෙහිදී ද මෙම තර්කයට විරුද්ධව ඉදිරිපත් කළ හැකි තාර්කික ප්‍රතිචාරයක් නැත. මට මෙහිදී කිව හැක්කේ මා මෙම සමානාත්මතාවාදී අදහසට එකඟ නොවන බව ය. පොහොසතුන් පහළ මට්ටමකට ඇද දැමීමෙන් මම මානසික තෘප්තියක් නොලබමි. දුප්පතුන්, අබ්බගාතයින් හා අනාථයන් ගේ යහපත සඳහා යමක් කළ යුතු බව මම පිළිගනිමි. එහෙත් එසේ කළ යුත්තේ, පොහොසතුන් ගේ ඉපැයීම් හා දේපොළවලින් කොටසක් ඔවුනට අහිමි කළ යුතුද යන ප්‍රශ්නය හා එය පටලවන්නේ නැතිව ය.

'සමානාත්මතාව' යනු පැති කීපයකින් යුතු, සංකීර්ණ වූ ආචාර ධර්මානුගත පුරුෂාර්ථයකි. එහි අන්තර්ගත සමහර කොටස්වලට මම සපුරා එකඟ වෙමි. මා එකඟ වන කරුණු අතර, නීතිය ඉදිරියේ සමානාත්මතාව, සමාජ පංතිය හෝ හමේ පැහැය අනුව ලැබෙන වරප්‍රසාද ප්‍රතික්ෂේප කිරීම, ආගම හෝ ලිංග භේදය අනුව වෙනස්කම් නොකිරීම, මූලික මිනිස් අයිතිවාසිකම්වලට ඇති අයිතිය යනාදිය ඇත. මේවා මගේ සාරධර්ම පද්ධතියේ ප්‍රමුඛතාව ගන්නා කරුණු වෙයි. මෙම සාරධර්ම පිළිගැනීම හා භෞතික ආදායම සම කිරීමට ගන්නා උත්සාහය ප්‍රතික්ෂේප කිරීම යන කරුණු දෙක සහමුලින් එකිනෙක හා ගැලපෙන්නේ වෙයි.

මේ අතර **ව්‍යාප්තියේ සමාජ සාධාරණත්වය** පිළිබඳ මූලධර්මය ක්‍රියාත්මක කිරීමට කැමති අය ගේ අදහස් සමග මම එකඟ වෙමි. මෙහිදී සමාජ සාධාරණත්වය නිර්වචනය කරන්නේ කෙසේද යන ප්‍රශ්නය

පැන නගී.[37] මේ පිළිබඳ නිර්වචන අතුරින්, ව්‍යාප්තිය සාධාරණ වන්නට නම් පහළම සමාජ ස්ථරයන්හි ජීවන තත්වය දිගුකාලීන වශයෙන් දියුණු විය යුතුය යන අදහසට මම ද දායක වෙමි.[38]

ඉහත කී වචනවලින් ගම්‍ය වශයෙන් ඇහවෙන අදහස් දෙසට අවධානය යොමු කරමු. මෙය **ගතික** අවශ්‍යතාවක් වන බව ඉන් ඇහවේ. කිසියම් අවස්ථාවක, පවත්නා ජාතික ආදායමින් කුමන නිශ්චිත කොටසක් සමාජයේ පහළම ස්ථරයට ලැබේ දැයි මින් විමසා නොබැලේ. මෙසේ බලන කල, මෙය පුනර් ව්‍යාප්ති අවශ්‍යතාවක් නොවේ. දුප්පතුන් ගේ තත්ත්වය පොහොසතුන්ගේ ධනය හා සන්සන්දනය කර මැන බැලීමක් මින් සිදු නොවේ. එසේම ඉහත දැක්වුණු විධියට, සමාජ සාධාරණත්ව අවශ්‍යතාව, කාලය හා සම්බන්ධ කොට නිර්වචනය විණි. අද දුප්පතුන් ගේ තත්ත්වය හෙට තත්ත්වය සමග සැසඳීමක් මෙහි ඇත. හෙට තත්ත්වය සතුටුදායක ප්‍රතිඵල ලබා දීමට සමත් නම්, අපට අවශ්‍ය එවැනි ක්‍රමයකි. දුප්පතුන්ට සදාකාලිකවම අගහිඟකම්වල ගැලී, බලාපොරොත්තු විරහිතව සිටීමට ඉඩ නොදී, අනාගතය ගැන බලාපොරොත්තු තැබිය හැකි තත්ත්වයක් ඇති කිරීම අවශ්‍ය වේ. ගණිතමය තේරුමකින්, ඔවුන් ගේ තත්ත්වය එක සමාන වේගයකින් කාලය ගත වීමත් සමග ඉහළ නැගිය යුතු බවක් මින් නො කියැවේ. සියලුම දුප්පතුන් ගේ තත්ත්වය සතිපතා හොඳ අතට හැරෙතැයි යන ප්‍රතිඥාවක් මෙහි නැත. එහෙත් අවුරුද්දක්, දෙකක් වැනි ඉදිරියේ දැකිය හැකි කාලයක් තුළ, අගහිඟකම් ඇති අයගේ මූල්‍ය තත්ත්වයන් බලා ගත හැකි තරමකින් ඉහළ යනු ඇතැයි ප්‍රතිඥාවක් මෙහි අන්තර්ගතය. මෙවැනි සහතිකයක් නොදෙන සමාජය අසාධාරණ එකකි.

සමාජයේ පහළම ස්ථරයන්හි පසු වන පුද්ගලයන් හැරුණු කල, අන්‍යයන් අතර ආදායම් ව්‍යාප්තිය කෙබඳු එකක් විය යුතුද යන ප්‍රශ්නය ඉහතින් විස්තර කළ අවශ්‍යතාව යටතේ විවෘතව පවතී. මේ ප්‍රශ්නයෙහි ද ආචාර ධර්මානුගත අංශ ඇත. ඒවා සලකා බැලීම මේ පොතේ කාර්යයට පරිබාහිර ය. විෂයයට අදාළ කරුණුවලට පමණකි මා අවධානය යොමු කරනුයේ. දුප්පතුන් ගේ ආදායම **තොකඩවා** වැඩි වීමට නම්, සමාජයේ සමස්ත ආදායම වැඩි විය යුතුය. ඒ සඳහා දිය හැකි **උපරිම දිරිය** ආදායම් ව්‍යාප්තිය තුළින් ආ යුතුය. ආදායම් පුනර් ව්‍යාප්තියකින් පමණක් දිළින්දන් ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමක් ඇති කළ හැක්කේ පටු සීමාවන් තුළ පමණකි. නිදසුනක් ලෙස අපි පාන් කැබැල්ලක් ගෙන n නැමැති සංඛ්‍යාවක් වන පුද්ගලයන් අතර බෙදුවහොත් එකකුට ලැබෙන්නේ 1/n ක් වන පංගුවකි. කලින් අප විස්තර කළ සමාජ සාධාරණත්ව කොන්දේසි ඉටු වීමට නම් බෙදා දීමට ඇති පාන් කැබැල්ලේ ප්‍රමාණය වැඩි විය යුතුය. මෙසේ බලන කල, සමාජ

---

37. සාධාරණය පිළිබඳව රෝල්ස් ඉදිරිපත් කරන මිනුම් දණ්ඩ මම මූලික වශයෙන් පිළිගනිමි. ඒ අදහස මේ පොතේ සරලව ඉදිරිපත් කෙරේ. යටකී ගැටළුව වැඩි දුර පරීක්ෂා කිරීමට අවශ්‍ය අයට කියවීම සඳහා පුළුල් සාහිත්‍යයක් තිබේ. J. Rawls (1971), R.Nozick(1974), A. Sen(1988); J.Kis (1986)

38. මෙය සමාජ සාධාරණත්වය සඳහා අවශ්‍ය කොන්දේසියක් වන නමුදු, එය ඒ සඳහා සෑහෙන කොන්දේසියක් නොවේ.

සාධාරණත්ව අවශ්‍යතාව රටේ නිෂ්පාදිතය වැඩි කර ලීම සඳහා අවශ්‍ය දිරි දීමනාවලින් වෙන් කළ නොහැකිය. මෙම තත්ත්වය අවබෝධ කර නොගන්නා අර්ථ ශාස්ත්‍රඥයා හෝ දේශපාලනඥයා එක්කෝ දඩබ්බර අදහස් ඇත්තෙකි, නැතහොත් ජනතා හැඟීම් ඇවිස්සීමට යොමු වූවෙකි. මෙය බදු ක්‍රමයක තිබිය යුතු ඊළඟ ලක්ෂණය ගැන සලකා බැලීමට අවස්ථාවයි.

4. රටේ ආර්ථික ප්‍රගතියට හා ආයෝජනය වැඩි කර ලීමට **දිරි නොදෙන සුළු** අංග ලක්ෂණ බදු ප්‍රතිපත්තියේ අඩංගු නොවිය යුතුය. තම විවේක කාලය කැප කර අතිකාල සේවයෙහි යෙදෙමින් අතිරේක මුදල් උපයන්නට සූදානම් අය මත, අනුක්‍රමික බදු නොපැනවිය යුතුය: මේ බව රජයට හෙළි නොකර වංචා කිරීමට ඔවුන් පෙළඹවිය යුතු නැත. තම මුදල් මෙට්ට යට සඟවා තබා නොගෙන, පොළියක් ඉපයීමට බැංකුවේ තැන්පත් කරන්නෝ බදු ක්‍රමයෙන් දඬුවම් ලැබිය යුතු නොවෙති.

පැනවීමට යන නව බදු නීතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන දිනය කවදා වුවද, මන්ත්‍රීවරුන් සිහි තබා ගත යුතු කරුණක් ඇත. එනම් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය, නිෂ්පාදනය හා ආයෝජනය මත, බදුවල බලපෑම කෙබඳු වේද යන්නයි. නව බදු නීතිය ඉන් එක් අංශයක් මත වුවද අහිතකර බලපෑමක් ඇති කරන්නේ නම්, එම නීතිය සම්මත නොකිරීම වඩාත් හොඳ ය. එවැනි බදු නීතියක් හංගේරියානු ආර්ථිකයේ අනාගත වර්ධනයට අහිතකර වනු ඇත. ශුභසාධන දෘෂ්ටි කෝණයෙන් ද එවැනි බදු නීතියක් අහිතකර වනු ඇත. (3 වන කරුණ යටතේ, දුප්පතුන්ට දිය යුතු සහන ගැන මා ඉදිරිපත් කළ තර්ක ගැන අවධානය යොමු කරන්න). අවසාන වශයෙන් බලන කල, ෆිස්කල් අර්ථයෙන් එය රටට අවැඩදායක වනු ඇත. බදු අනුපාතික හා අයහාරය අතර පවතින වැදගත් සබඳතා පෙන්වා දෙන න්‍යායාත්මක ආකෘති හා ප්‍රත්‍යක්ෂ මූලක ගණනය කිරීම් යොදා ගනිමින් ෆිස්කල් ප්‍රතිපත්තිය පිළිබඳව ලියැවුණු ප්‍රසිද්ධ ග්‍රන්ථ ඇත. එක තැන රැඳුණු හෝ හයානක ලෙස හෙමින් වැඩෙන ජාතික ආදායමකින්, වැඩි අයහාරයක් එකතු කර ගැනීමේ මූලාව යටතේ, ඉහළ බදු අනුපාතික නියම කිරීම වැරදි ෆිස්කල් ප්‍රතිපත්තියකි. පුද්ගලයන් අධෛර්‍යමත් කරවන සුළු අධික බදු පැනවීමෙන් වැළකුණහොත්, රජයේ අයහාරය වඩා සාර්ථක ලෙස වැඩි කර ගැනීමට, මුදල් අමාත්‍යාංශය සමත් වනු ඇත. ඒ මගින් ජාතික ආදායම ශීඝ්‍රයෙන් ඉහළ නංවා ගත් විට, පහළ බදු අනුපාතිකයකින් වුවද වැඩි අයහාරයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

බදු අය කිරීමේ මූලික සිද්ධාන්ත ගැන කරන ලද මෙම කෙටි සමීක්ෂණයෙන් පසු, අප විස්තර කළ විධියේ බදු පද්ධතියක් පවත්වා ගෙන යාමට අවශ්‍ය වන බදු වර්ග මොනවාදැයි දැන් අපි සොයා බලමු. නියත වූ අය බදු සූත්‍ර ගැන සම්පූර්ණ විස්තර ඉදිරිපත් කිරීම මෙම පොතට අයත් කාර්යයක් නොවේ. හංගේරියාවේ දැනට පවතින තත්වය අනුව, අයහාරයෙන් විශාලතම කොටස ලබා ගැනීම සඳහා යොදා ගත යුතු බදු වර්ග පැහැදිලි කිරීමට පමණක් මම අදහස් කරමි.

(අ) ඉතාම වැදගත් වන්නේ රේඛීය පාරිභෝගික බද්දක් හෝ එහි ඉතා නවීන ස්වරූපය වන එකතු කළ වටිනාකම් බද්දකි.[39] අද බලපැවැත්වෙන බදු ක්‍රමය මත ඉතාම හොඳින් රැඳෙමින් යොදා ගත හැකි බද්ද මෙයයි. එහෙත් එය කිසිම තැනක වෙනසක් කරන්නේ නැතිව හැම තැනම එක සමාන මට්ටමකින් අය කළ යුතුය. ඒ අතින් එය දැනට පවතින බදු ක්‍රමයෙන් වෙනස් වේ. හැම පරිභෝජන වියදමක්ම, වෙනසක් නැතිව, එකම බදු අනුපාතිකයකට යටත් කළ යුතුය.[40]

(ආ) රේඛීය (අනුක්‍රමික නොවන) තනි බද්දක් වැටුප්වලින් අය කර ගත යුතුය. **සේවා යෝජකයින් තම සේවකයින්ට** ගෙවන කුමන අන්දමේ හෝ ගෙවීම්වලින් මේ බද්ද අය කළ යුතුය:

උපයන ආදායමින් අනුක්‍රමික බදු අය කිරීමට මම විරුද්ධ වෙමි. තම විවේක කාලය කැප කරමින් අතිකාල වැඩ කරන හෙදියන්ට, ගුරුවරුන්ට, කම්කරුවන්ට හෝ ලිපිකරුවන්ට මෙවැනි බදු මගින් දඬුවම් කිරීමට රජයට ඇති අයිතිය කුමක්ද?

වැඩ කරන පැය ගණන දීර්ඝ කිරීම මෙන්ම කරනු ලබන කර්තව්‍යයේ ගුණය අනුව වෙනස්කම් කිරීමේ පුරුද්ද ද විවේචනය කළ යුතුය. නිදසුනක් වශයෙන් **බී** රැකියාවට අයිති කාර්යයට වඩා, **ඒ** රැකියාවට අයිති කාර්යය තුන් ගුණයක් වටිනැයි සිතමු. **ඒ** රැකියාව සඳහා වඩා හොඳ කුසලතා, වැඩි වගකීම් දැරීමක් හෝ වැඩි ශාරීරික වෙහෙසක් අවශ්‍ය නිසා ය. **ඒ** කම්කරුවාට, **බී** කම්කරුවාට වඩා සිව් ගුණයකින් වැඩි දළ වැටුපක් ගෙවා, අය කෙරෙන අනුක්‍රමික අය බදු වලින් පසුව, ඔවුන් දෙදෙනාගේ ශුද්ධ වැටුප 3:1 අනුපාතය දක්වා අඩු කිරීමේ යුක්ති සහගත භාවය කුමක්දැයි මම මෙහිදී අසමි. මෙය ඔවුන් වැඩ කරන කාර්ය ස්ථානයේ වැටුප් හදන ලිපිකරුවන් ගේ ද, අයබදු දෙපාර්තමේන්තු ලිපිකරුවන් ගේ ද වැඩ කටයුතු අධික කරවන බදු පිළිවෙතකි. එය සහමුලින්ම අනවශ්‍ය ක්‍රියාදාමයකි.[41]

---

39. යෝජිත ක්‍රමය අනුව බදු පැනවෙනුයේ මූලික වශයෙන් **පරිභෝජනයට** යොදවන ආදායම මත ය. මේ නිසා පරිභෝජනයට නොයෙදවෙන ආදායම බද්දෙන් නිදහස් වේ. එය ඒ අනුව වක්‍ර වශයෙන් ඉතිරි කිරීමත්, ආයෝජනය කිරීමත් දිරිමත් කරනු ඇත. ආදායම් බද්ද ඉතිරි කරන්නන්ට අවාසිදායක වෙතැයි යන අදහස ජෝන් ස්වුවට් මිල් කරා දිවේ. අර්වින් පිෂර් (1942) මේ අදහස තව දුරටත් අවධාරණයෙන් ඉදිරිපත් කෙළේය. පරිභෝජන බද්දෙහි හා විශේෂයෙන්ම එකතු කළ වටිනාකම් බදදෙහි වාසි අවාසි දැන ගැනීමට R. A. Musgrave සහ P.B. Musgrave (1980) කෘතිය කියවන්න.

40. මීට වෙනස් විය යුතු තැන් ගැන හොඳින් සිතා බලා ගෙනෙන අදහස් පිළිගැනීමට මම කැමැත්තෙමි. (නිදසුනක් වශයෙන් මත්පැන් වලින් විශේෂ බද්දක් අය කිරීමේ වරදක් නැත). මෙය දරුවන් පිළිබඳව පියකුගේ මැදිහත්වීමක් වැනි බව සිහි තබා ගෙන පාර්ලිමේන්තුව ඒ පිළිබඳව විශේෂ නීති පැනවීමට සූදානම් නම් එහි වරදක් නැත.

බදු පැනවීමෙන් මත්පැන් භාවිතය මග හරවා ගත හැකි වේද යන්න සැක සහිත කරුණකි. පරිපාලන සීමාවලින් මෙන්ම, ඕනෑවට වඩා අධික බදු අය කිරීමෙන්ද දැඩි ලෙස මත්පැන් භාවිත කිරීමේ පුරුදු නැති කර ලිය නොහැකි බව නම් සහතිකය. ඒ වෙනුවට එයින් සිදු වන්නේ නීත්‍යානුකූල බද්දට යටත් මත්පැන් පෙරීම අඩුවී නීති විරෝධී මත්පැන් පෙරීම වැඩි වීම පමණි.

41 පුද්ගලික ආදයම් බදු ක්‍රමය ස්ථාපිත කිරීමට පෙර මේ වේතන සැකසීමේ ක්‍රියාදමය **ප්‍රතිලෝම ආකාරයට** කිරීමට සිදු වූ අවස්ථාවේදී එහි අර්ථ ශූන්‍ය භාවය වඩාත් පැහැදිලි ලෙස ප්‍රදර්ශනය විය.

(ඇ) රේඛීය (අනුක්‍රමික නොවන) තනි **ලාභ බද්දක්** තිබිය යුතුය. මෙහි බදු අනුපාතිකය දැඩි ලෙස ඒකාකාරී විය යුතුය. ඒ අනුව නීත්‍යානුකූලව ලියා පදිංචි කර ඇති සෑම ව්‍යාපාරයකින්ම, එය රජයේ හෝ පෞද්ගලික අංශයේ වේවා, හංගේරියානු හෝ විදේශීය වේවා, එකම බද්දක් අය කළ යුතුය.

(අ) සහ (ඇ) යන මාතෘකා යටතේ සාකච්ඡා වුණු බදු වර්ග, සාමාන්‍ය තත්ත්වයන් යටතේ ලියා පදිංචි කළ හඳුනා ගත හැකි ව්‍යාපාර වලින් බැහැරව උපදින ආදායම් සම්බන්ධව බල නො පවත්වතැයි කෙනකු දොස් කියන්නට පුළුවන. මේ ගණයට වැටෙන ආර්ථික කටයුතු වලින් ඉතා ඉහළ ආදායම් ඉපැයෙන්නටත්, ඒවා මත අය බදු ගෙවීම පැහැර හරින්නටත් ඉඩ ඇති නිසා, ඉහත කී තත්ත්වය අසාධාරණ වන බවට සැකයක් නැත.

මේ උභතෝකෝටිකය සැබෑ බැව් පිළිගනිමි. එහෙත් ඊට මුහුණ දිය හැකි ප්‍රායෝගික ක්‍රමයක් යෝජනා කිරීමට කැමැත්තෙමි. මේ ප්‍රශ්නය දෙස විමසිලිමත්ව බලන කල 'අදෘශ්‍යමාන' ආදායම් සියල්ල එක ගොඩකට දමා සැලකීම වැරදි බවක් පෙනේ. විශ්ලේෂණය සඳහා මෙහිදී පහත දැක්වෙන වර්ගීකරණය යොදා ගනිමු.

(i) පුරවැසියෝ සිය ප්‍රධාන රැකියාවට අමතර නොයෙක් ආකාරයේ වැඩ කරමින් මුදල් උපයති; එසේ නැතහොත් ද්‍රව්‍ය වලින් ගෙවුම් ලබති. සමහරු තම ගෙවතුවල වගා කළ පලතුරු විකුණති. ලේඛිකාවෝ අමතර යතුරු ලියන වැඩ කරති. පරිවර්තකයෝ අමතර පරිවර්තන වැඩ කරති. පාසල් ශිෂ්‍යාවෝ ළදරුවන් බලා ගෙන ආදායම් උපයති. මේ ක්‍රියාකාරකම් සියල්ල ජාතික ආදායමට එකතු වේ. ඉන් මුළු සමාජයටම සෙතක් සැලසේ. මෙවැනි ආදායම් බදුවලට හසු නොවී පවතිතැයි අපි සිතමු. මා අදායම් බදු ගැන මුලින් කී දේ මෙවැනි ආදායම්වලට වඩාත් වලංගු ය. සෑම පුරවැසියකුම උපයන ආදායම් ගැන වාර්තා තැබීමට පැය විසි හතරක් මුළුල්ලේ පරීක්ෂකවරුන් යෙදවීම කළ නොහැක්කකි. ප්‍රායෝගික වශයෙන්, මේ නිසා, මේ ආදායම් බද්දෙන් නිදහස්ව තැබීම හැර වෙන කළ හැක්කක් නැත. එසේ කිරීම මෙවැනි සේවා හා නිෂ්පාදිත සැපයුම වැඩි කර ලීමට ධෛර්යයක් වනු ඇත. රටේ 'විධිමත්' නිෂ්පාදන කටයුතු එක තැන රැඳී තිබෙන අද වැනි අවධියක, ස්වයං පරිත්‍යාගයෙන් කටයුතු කරන මෙවැනි අය වැඩි වැඩියෙන් භාණ්ඩ හා සේවා නිපදවීම මුළු සමාජයටම හිතකරය.

තවද කෙනකු තම රැකියාව කිරීමේදී, පරිභෝජකයන්ගෙන් ලබන සන්තෝෂ දීමනාවලින් හා බොනස්දීමනා වලින් බදු අය කිරීම සඳහා ඒ පිළිබඳ දරදඬු රෙගුලාසි පැනවීමට යාමේදී අපි විශේෂයෙන් ප්‍රවේසම් විය යුතු වෙමු. සැබැවින්ම එවැනි සන්තෝෂ දීමනා ලබන අය, එවැනි බදු නිසා, තමන්ට සැබැවින්ම අයත් නොවන ගෙවීම් වර්ග බලහත්කාරයෙන් ලබා ගැනීමට පෙළඹෙන්නට පුළුවන. අනෙක් අතින්, මෙම මාර්ගවලින් විශාල මුදල් ප්‍රමාණ

උපයන්නන්ට ඒවා සහවා තැබීම පහසු ය. අන්තිමේ දී මෙවැනි බදු නීතියකින් සිදු වන්නේ නීති පද්ධතියේ බලාධිකාරය තවත් සැහැල්ලුවට පත් වීම පමණි.

(ii) එක් කුඩා වැඩ පලක ප්‍රමාණයේ පෞද්ගලික ව්‍යවසායකයින්ගෙන් ලාභ බදු අය නොකළ යුතු යැයි මගේ යෝජනාවලින් අදහස් නො කෙරේ. පෞද්ගලික අංශයේ 'අලුපාට' හෝ 'අඳුරු' කලාපය හෙවත් නීතියෙන් බැට කන්නේ ද නැති, එහෙත් සම්පූර්ණයෙන්ම නීත්‍යනුකූල ද නොවන ආර්ථික කටයුතු රටේ බහුලව දක්නට ලැබේ. මගේ මෙම ලියැවිල්ලේ නියම පණිවිඩය නම් බියක් හෝ ලැජ්ජාවක් නොමැතිව මෙවැනි පෞද්ගලික ව්‍යවසායයන් හා ඒවායේ අයිතිකරුවන් නීත්‍යනුකූල ක්ෂේත්‍රයට පිවිස එළියේ කටයුතු කළ යුතු බව ය. අප මෙහිදී කරන්නේ පෞද්ගලික ව්‍යවසායකයා එක්තරා අන්‍යෝන්‍ය හිතකර ගනුදෙනුවකට සම්බන්ධ කර ගැනීම ය. ඔහුට නීතිමය ආරක්ෂාව ද අන්‍යයන් සමඟ ඇති කර ගන්නා පුද්ගලික කොන්ත්‍රාත්තු නීතියෙන් ක්‍රියාත්මක කරවීමේ සහතිකය ද ලබා දෙන අතර, ඒ වෙනුවෙන් ඔහු පහසුවෙන් බදු දැලට අසු කර ගත හැකි අනිකුත් ව්‍යාපාර මෙන්ම රජයට බදු ගෙවන තත්ත්වයට පත් විය යුතුය. මොවුන් අතුරෙන් සමහර පුද්ගලයන් හෝ කණ්ඩායම් අඳුරු (හෝ කලු) ආර්ථිකයෙන් එළියට නොඑනු ඇත. ඔවුන් නම් බදු ගෙවීම් පැහැර හැරීම හා වෙනත් අයථා දේ සම්බන්ධයෙන් නීතියේ රැහැනට හසු වීමේ තර්ජනයට මුහුණ දිය යුතුය. එසේම රජයේ හෝ පෞද්ගලික අංශයේ ව්‍යාපාර, ගැනුම්කරුවන් හෝ විකිණුම්කරුවන් මොවුන් සමඟ එළඹෙන ගිවිසුම් කඩ කළහොත් නීතියේ පිහිට සෙවීමට තමන්ට නොහැකි බව ඔවුන් වටහා ගත යුතුය. එසේම මෙම 'අඳුරු' කලාපය සමග ගනුදෙනු කරන්නන්ට ද එවැනිම අවදානම් දැරීමට සිදු වනු ඇත. එසේම යම් නිල ආයතනයකින් සිදු වන වරදක් සම්බන්ධයෙන්, ඊට විරුද්ධව නඩු පැවරීමට ඔවුනට ඉඩක් නො ලැබේ. එවැනි ආයතනයක් පොරොන්දු කඩ කළ විට, ඔවුනට නීතියේ හවුහරණක් සෙවිය නොහැකිය. 1.1 කොටසෙහි දැක්වුණු පරිදි, පෞද්ගලික දේපොළෙහි සුරක්ෂිතභාවය හා අධිකාරය රැකීමට රට සමත් වන තරමට එළිමහනේ කටයුතු කරමින් බදු ගෙවීමේ යුතුකම් ඉෂ්ට කිරීමට පෞද්ගලික අංශය පෙළඹෙන්නට ඉඩ තිබේ. පුද්ගලික අංශයෙන් බදු අය කර ගැනීමට ඇති එකම යථාර්ථවාදී මග මෙයයි.

අනුක්‍රමික අය බදු ක්‍රමයකට විරුද්ධව ඇති තර්ක නැවත වරක් සාකච්ඡාවට ගනිමු.

හංගේරියාවේ පවතින වර්තමාන තත්ත්වය යටතේ, අනුක්‍රමික බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වීම මහත් මුලාවකි. නිල වාර්තා වලින් නිවැරදි ආදායම 'සොයා ගත හැකි' පුද්ගලයින් මත පමණි බදු බර වැටෙනුයේ. තමන් මත වැටෙන බදු බර, අන් අයට හැරවීමට තරම් ආර්ථිකමය, සමාජමය හා දේශපාලනමය ශක්තියක් නොමැති අය මත ය, ඉතාම ඉහළ බදු බර පැටවෙනුයේ. තමන්ගේ ආදායම් වාර්තා

ගතව තිබුණ ද, වැඩි කේවෙල් කිරීමේ ශක්තියක් තිබෙන අය, බද්දේ ප්‍රමාණයෙන් සිය දළ වැටුප් ඉහළ නංවා ගැනීමට සැබැවින්ම සමත් වෙති. සේවකයින් වැඩ කිරීමට සූදානම් දළ වැටුප ගෙවනවා හැර සේවා යෝජකයාට කරන්නට වෙන දෙයක් මෙහිදී නැත. මේ ආකාරයෙන් සේවකයා තම බදු බර තව කෙනකු පිට පටවයි. එසේම මිල වැඩි කරමින් තම බදු බර ගනුදෙනුකරුවන්මත්තට පැටවිය හැකි පුද්ගලික ව්‍යවසායකයන්ට ද අනුක්‍රමික අය බදු බලපාන්නේ නැත. අවසාන වශයෙන්, බදු බර අඩුවෙන්ම දරන්නේ, එය වැඩියෙන්ම දරා සිටිය යුතු යයි බදු ප්‍රචාරකයින් පවසන 'අදෘශ්‍යමාන ආදායම්' ලබන්නන් ය.

දැන් අපි රාජ්‍ය අය-වැයේ අයහාර අංශය පිළිබඳ අපේ සමීක්ෂණයට නැවත එළඹෙමු.

(ඇ) ශිල්පීය තේරුමකින්, එකහෙළා අය බදු ගණයට අයත් නොවූවත්, **රේගු බදු** ගැන මෙහි සඳහන් කිරීම වටී. වියදම් පියවා ගැනීමට රේගු බද්ද අවශ්‍යම නම්, එවැන්නක් තිබුණාට කම් නැත. එහෙත් රේගු බද්දේ ප්‍රමාණය, එමගින් මිල ගණන් විකෘති වීම හැකි තාක් අඩුවෙන් වන පරිදි ඉතා සුළු විය යුතුය. ආනයන කටයුතුවලින් ඒකාකාරී රේඛීය රේගු බද්දක් අය කර ගැනීම ප්‍රධාන වශයෙන් අවශ්‍ය කරුණකි. ආනයනය ආරම්භ වන රට අනුව වෙනස් වන, දඩ බදු යම් යම් ආනයන ගනුදෙනු වලින් අය කළ යුතුද යන සාකච්ඡාවට ඇතුළු වීමට මට මෙහිදී වුවමනාවක් නැත. මෙහිදී අප සලකා බලන්නේ අයහාරය ගැන පමණක් නිසා මම මගේ සාකච්ඡාව ඊට සීමා කරමි. නව මිල ක්‍රමයේ අවශ්‍යතා ගැන විස්තරයක් 2.4 කොටසේ දැක්වේ. සාධාරණ හේතු උඩ එසේ කළ යුතු විශේෂ අවස්ථාවලදී හැර විවිධ භාණ්ඩ සඳහා අය කරනු ලබන රේගු බදු එකිනෙකින් වෙනස් විය යුතු නොවේ.[42] අදාළ ආනයන භාණ්ඩය කෝපි හෝ කොම්පියුටර් වේවා, මෝටර් රථ හෝ ළමා ඇඳුම් වේවා, ඒ හැම එකකටම පනවන රේගු බද්ද ස්ථිර වශයෙන්ම එක සමාන විය යුතුය.

සංචාරකයින් සඳහා රේගු බද්දෙන් නිදහස් සීමා සහිත සලාකයක් වෙන් කළ හැකිය. එහෙත් එම සලාකයට වඩා වැඩි සෑම භාණ්ඩයක්ම තීරු බද්දට යටත් විය යුතුය. එසේම, ඒකාකාරී තීරු බද්ද ගෙවන ඕනෑම කෙනකුට, ඕනෑම ප්‍රමාණයකින්, කැමති ඕනෑම භාණ්ඩයක් ආනයනය කිරීමට නිදහස තිබීම අවශ්‍යය. අදට ගැළපෙන නිදසුනක් අපි ගනිමු. පුද්ගලික විදේශීය විනිමය වෙළෙඳ පොළින් මිලට ගත් විදේශීය විනිමයෙන් තමාට අවශ්‍ය තරම් කොම්පියුටර් ප්‍රමාණයක් මිලට ගැන්මට හා ඒවා ආනයනය කිරීමට ඕනෑම පුද්ගලයකුට නිදහස තිබිය යුතුය. ඒකාකාරී රේගු බද්ද ගෙවන ලද පසු, එම කොම්පියුටර් තොගය, එක එකක් සඳහා ගැනුම්කරුවන් ගෙවීමට කැමති ඕනෑම මිලකට විකිණීමට ද එම පුද්ගලයාට නිදහස තිබිය යුතුය.

පුරවැසියකු සතු විය යුතු කොන්දේසි විරහිත නීත්‍යනුකූල අයිතියකි, නිර්බාධී ලෙස කැමති දෙයක් ආනයනය කර ගැනීමේ අයිතිය. ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය ලබා ගන්නා මූලාශ්‍ර මොනවාද යන්න මෙහිදී මතු වන

---

42. රටේ පවතින ළදරු කර්මාන්ත ආරක්ෂාව සඳහා ආරක්ෂණ රේගු බදු අවශ්‍ය වන්නට පිළිවන. මේ ගැන වැඩි විස්තර අපි නිෂ්පාදන සහනාධාර පිළිබඳ සාකච්ඡාවේ දී ඉදිරිපත් කරමු.

ප්‍රශ්නයකි. 1.1 කොටසේ අප කළ සාකච්ඡාව අනුව පුද්ගලික වෙළෙඳ පොළෙන් විනිමය මිලට ගන්නා තාක් කල් ආර්ථික ප්‍රශ්න පැන නොනගී. මතු 2.5 කොටසේ තව දුරටත් විස්තර කෙරෙන පරිදි, ස්ථායීකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන කාලය තුළ දී යථාර්ථ වූද, ඒකාකාරී වූද විනිමය අනුපාතිකයක් ගොඩ නැගී ආ යුතුය. ඒ සමගම, මෙම අවස්ථාවෙහිදී, දේශීය මුදලේ පරිවර්ත්‍යතාව ද ඇති කළ යුතුය. තම ෆොරින්ට් මුදල් රජයේ බැංකුවකට දී විදේශ විනිමය බවට හරවා ගැනීමේ හැකියාව, නීතියෙන් ආරක්ෂා කෙරෙන, හංගේරියානු ප්‍රජා අයිතියක් බවට මේ අනුව පත් වනු ඇත.

මේ අවස්ථාවේ අපගේ ප්‍රධාන තේමාව ස්ථායීකරණ වැඩ පිළිවෙළ වුවද, පුද්ගලික ආනයනවලට සම්බන්ධ වෙනත් ප්‍රශ්නයක් මෙහිදී සඳහන් කිරීම වැදගත් ය. ස්ථායීකරණය සම්පූර්ණයෙන් නිම වී යථාර්ථ වූ විනිමය අනුපාතිකයක් වර්ධනය වී, මුදලේ පරිවර්ත්‍යතාව සම්පූර්ණයෙන් අත්පත් කර ගත් තත්ත්වය එළඹෙන්නට ප්‍රථමයෙන් අපි කුමක් කරමුද? යථාර්ථ නොවන විනිමය අනුපාතිකයක් පවතින අවස්ථාවක, මිනිසුන් ගේ ප්‍රජා අයිතියක් සේ සලකා ඔවුන් ඉල්ලන තරම් විදේශ විනිමය දීමට රාජ්‍ය බැංකුවලට නියම කිරීම නම් අනුවණ කමකි. පෞද්ගලික ආනයනයට ඉඩ සැලසීම හා ෆොරින්ට් මුදලේ පරිවර්ත්‍යතාව ස්ථායීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය යුතුය. එම තත්ත්වය ඇති වීමට සුදුසු පසුතලයක් තිබිය යුතුය. එනම් තාර්කික නිර්බාධ මිල ගණන් පැවතීම (2.4 කොටස) හා විචාරවත් විදේශ විනිමය අනුපාතිකයක් තිබීම (2.5 කොටස) යන කරුණු ය.

දැන් අයහාරය පිළිබඳ මෙම මූලික සිද්ධාන්ත පිළිබඳ තවත් සාමාන්‍ය අදහස් කීපයක් සලකා බලමු. මෙතෙක් අයහාරය ලැබිය හැකි මාර්ග ගොනු පිළිබඳව කළ සාකච්ඡාවේ දී අයහාර මූලාශ්‍ර ගැන පූර්ණ විස්තරයක් ඉදිරිපත් කිරීමේ අරමුණක් නොවිණි. මෙහිදී වැදගත් මූලාශ්‍ර කිහිපයක් අත හැරෙන්නට ඇත (නිදසුනකි - ගාස්තු).[43] වැදගත්ම කරුණ වනුයේ යොදා ගත් බදු වර්ග කවරක් වුවත්, ඒ සියල්ලෙන් (පාරිභෝගික බද්ද, වැටුප් බද්ද, ලාභාංශ බද්ද සහ ආනයන බද්ද) එකතු වන ආදායමින්, සැබෑ වියදම් **පියවා ගැනීමට හැකි වීම** ය. බදු අනුපාතික තීරණය කළ යුත්තේ නිසැකවම අය කරනු ලබන බදුවලින් මුළු වියදම් පියැවෙන පරිදි ය.

රටේ අය වැය හා බදු නීතිය පිළිබඳව මීට ඉහත කෙරී ඇති පාර්ලිමේන්තු විවාදවලදීත්, දේශපාලන කථාවලදීත්, පුවත් පත් ප්‍රකාශනවලදීත් රාජ්‍ය අයවැයේ අයහාර අංශය ගැන තැති ගන්වන සුළු ප්‍රකාශන කරනු ලැබ ඇත. මෙහිදී ඉදිරිපත් කැරුණු සමහර අදහස්වලදී මතු කැරුණු මූලික ප්‍රශ්නය යමක් පිළිබඳ වියදම් දැරිය යුත්තේ අය-වැය ද ජනයා ද යන්නයි. වියදම් බර කෙසේ හෝ ජනතාව මතට පැවරීමට හැකි වූ විට පිස්කල් අධිකාරිහු සතුටට පත් වූහ. එය අය වැය මතට පැටවීමට සමත් වූ විට ‘ජනතාවගේ ගැළවුම්කරුවෝ’ සතුටු වූහ. මේ අතර, රට තවත් ණයගැති කරවමින් තාවකාලිකව විදේශීය ණය මගින් පියැවුණු වියදම් හැර අන් සියලුම පිරිවැය අවසානයේ දී උසුලන්නට සිදු වන්නේ ජනතාවට බැව් මොවුහු අමතක කරති. දිගුකාලීනව බලන විට, මෙම විදේශීය ණය පවා ගෙවීමට සිදු වන්නේ, වර්තමාන හා අනාගත පරම්පරාවන් ඇතුළු

---

43. මෙම අධ්‍යයනය බදු පද්ධතිය පිළිබඳ ගැටලු කීපයක් විවෘතව තිබෙන්නට හැර ඇත. දේපොළ බදු, ස්වයං රැකියා නියුක්තිකයන්ගෙන් අය කෙරෙන බදු යනාදිය පිළිබඳ ප්‍රශ්න මේ ගණයට වැටේ. නව බදු ක්‍රමය මෙම ගැටලු ද විසඳිය යුතු බවට සැකයක් නැත.

ජනගහණයටම ය. මෙහිදී විමසිල්ලට භාජනය වන ප්‍රශ්නය, අය වැය හා ජනගහණය අතර **තෝරා ගැනීම** පිළිබඳ ප්‍රශ්නයක් නොවේ, අදාළ ජන සංඛ්‍යාවේ විවිධ කොටස් ද, වර්තමාන හා අනාගත පරම්පරාවන් ද අතර **වියදම් බර ව්‍යාප්ත වන ආකාරයයි**. මෙහිදී පැන නැගෙන තවත් ප්‍රශ්නයකි, ජනතාවගෙන් අවශ්‍ය පිරිවැය අය කර ගන්නා විධි කවරේද යන්න. මෙහිදී තෝරා ගත හැකි විවිධ ක්‍රම ඇත. පරිභෝජකයන්ගෙන්, බද්ද ද ඇතුළත් වන පරිදි මිල අය කිරීම එක් ක්‍රමයකි. (පාරිභෝගික බද්ද) සේවා යෝජකයා බදු ගෙවතැයි යන අදහස ඇති කෙරෙන පරිදි බදු අය කිරීම තවත් ක්‍රමයකි. (වැටුප් බද්ද) උද්ධමනය හේතු කොට ගෙන වක්‍ර ලෙස බදු ගෙවීමට සිදුවීම තවත් ක්‍රමයකි. ක්‍රමය කවරක් වුවද, අවසානයේ දී බිල ගෙවන්නේ ජනතාවයි. මේ තත්ත්වයෙන් කිසිවකුටත් ගැළවීමක් නැත. එබැවින් යටත් පිරිසෙයින් බදු ක්‍රියාවලිය ඉතාම සරල හා ඉතාම කාර්යක්ෂම විය යුතු යයි මම යෝජනා කරමි. මගේ යෝජනා ක්‍රියාත්මක කළහොත්, අලුතින් ඉදි කරන ලද දැවැන්ත බදු අධිකාරියේ ප්‍රමාණවත් කොටසක් වසා දැමීමට පුළුවන් වෙයි. මෙයම රටට ලාභයකි.

දැන් අපි වැය පක්ෂය වෙතට හැරෙමු. ස්ථායීකරණ සැත්කම අරඹන අවස්ථාවේ, පවතින වියදම් කෙසේ හෝ දැරිය යුතු දෙන ලද වියදමක් ලෙස සලකමු. මෙයින් වියදම් වර්ග දෙකක් පමණක් ඉවත් කළ යුතුය.

ඉන් පළමුවැන්න නම් සමහර පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් රජයේ **අය වැය මගින් දෙනු ලබන මිල සහනාධාර** ය. පසුගිය කෙටි කාලය තුළ, ඒවා ඉවත් කෙරෙමින් පවතින අතර ස්ථායීකරණ සැත්කම ආරම්භ කිරීමට පෙර තව දුරටත් මෙම සහනාධාර ඉවත් කිරීම සඳහා අර්ධ පියවරවල් ගැනීමට ඉඩ ඇත. මෙම ක්‍රියාදාමය ඒ වන විට කෙතෙක් දුරට ගෙන ගොස් ඇත්තේ වුවද සැත්කම පටන් ගැනීමට පෙර මෙම වේදනාකාරී කටයුත්ත නියත වශයෙන්ම නිම කිරීම අතිශයින්ම වැදගත් වේ. ඊට ප්‍රතිවිරුද්ධව නැගෙන ප්‍රතිචාර කුමක් වුවද, ඒවා, අවශ්‍ය පියවර නොගැනීම වෙනුවෙන් නිදහසට කරුණු බවට පත් කර ගැනීමට ඉඩ නොතිබිය යුතුය.

ආදයම් පුනර් ව්‍යාප්තිය ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී යට කී ප්‍රශ්නය ගැන යන්තමින් සඳහන් කර ඇත. මම ජනතාව සම්බන්ධයෙන් රජය මානවහිතවාදී ලෙස ක්‍රියා කළ යුතුයැයි විශ්වාස කරන්නෙක්මි. රටේ හැකියාවන්ට අනුකූල ව ශුභසාධන ප්‍රතිපත්ති සඳහා අවශ්‍ය වියදම් දැරීම පාර්ලිමේන්තුවේ අයිතිය පමණක් නොව යුතුකමක් ද වන්නේය. (කලින් පොරොන්දු වූ පරිදි මේ ප්‍රශ්නය මම පසුවට සාකච්ඡා කරමි). එහෙත් රජය භාර ගත යුතු මෙම වියදම්, මිල සහනාධාර වශයෙන් පවත්වා ගැනීම අර්ථශූන්‍ය වන්නේ සහන අවශ්‍ය අයට මෙන්ම අනවශ්‍ය පුද්ගලයින්ටද එමගින් ඒවා ලැබෙන නිසා ය. රටේ සංස්කෘතිය නගා සිටුවීමට රජයේද, වෙනත් ආයතනවල හා පුද්ගලයින්ගේද කැප වීම වැදගත් බව මම පිළිගනිමි. එහෙත් ඒ සඳහා ද මිල සහනාධාර යොදා නොගත යුතු බව මගේ අදහසයි. අපට පුළුවන්කම තිබේ නම්, සිසුනට පොත් මිලදී ගැනීම සඳහා වවුචර දිය හැක. එහෙත් පොත්වල මිල ගණන් තාත්විකව පවත්වා ගත යුතුය. එනම් පොත්වල මිල, නිෂ්පාදන පිරිවැය හා ලාභය කැපී යන මට්ටමක විය යුතුය. වෙළෙඳ පොළේ මිල ගණන් වලට පොත් ලබා ගැනීමට හැකියාවක් ඇති අයට සහනාධාර දීමේ අවශ්‍යතාවක් නැත.

විශේෂයෙන් වැදගත් කරුණක් වනුයේ, අද හංගේරියාවේ පවතින ආර්ථික මට්ටම දෙස බලන විට, ආහාර සහනාධාර යුක්ති යුක්ත කළ නොහැකි බව ය. රටේ දැනට පවතින ආර්ථික ප්‍රගතිය අනුව, සෑම මනුෂ්‍යයකුටම සිය ජීවිත පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය දේ ලබා ගැනීමට පුළුවන්කම තිබේ. එසේ නම්, සැබෑ වෙළෙඳ මිල ගෙවීමට පුළුවන්කම තිබෙන අය සඳහා ද, ආහාර මිල කෘත්‍රිම වශයෙන් පහළින් තබා ගෙන සිටීමේ මිල සහනාධාරවල අරමුණ කවරේද? අපගේ අසල්වාසී ඕස්ත්‍රියානු සංචාරකයෝ තම රටේ මිලෙන් අංශුවකට හංගේරියාවේ දී මස් මිලට ගනිති. මෙමගින් අප භාස්‍යයට ලක් කිරීමට ඔවුනට ඉඩ දිය යුතුද? මේ අතර අද පවතින මිල ගණන් යටතේ වුවද යන්තම් ජීවිතය ගැට ගසා ගන්නා පිරිසක් අප රටේ සිටින බව මම පිළිගනිමි. පහළ විශ්‍රාමික වැටුප් ලබන විශ්‍රාමිකයින් හෝ වෙනත් බාධකයන්ගෙන් පෙළෙන අය හෝ වැනි පුද්ගලයෝ මේ ගණයට වැටෙති. ද්‍රව්‍යමය ආධාර හෝ ආපන ශාලා වවුචර හෝ මගින් ඔවුනට සෘජු මුදල් ආධාර ලබා දිය යුතුවා විනා, විකෘති කරන ලද මිල ක්‍රමයක් ඇසුරින් එවැනි ආධාර ලබා දීම නිශ්චය වශයෙන්ම වැරදි ය.

වැය පරක්ෂයෙන් ඉවත් කළ යුතු දෙවැන්න නම් විශාල ධනස්කන්ධයක් වැය වන විවිධාකාර නිෂ්පාදන සහනාධාරයන් ය. මෙහිදී ව්‍යාතිරේකයන් කීපයක් තිබෙන්නට පුළුවන. ඒවා මෙම නිගමනයෙන් නිදහස් කළ හැක. පාඩු විඳින රජයේ ව්‍යාපාර හා විශාල කෘෂිකාර්මික සමුපකාර පිළිබඳව දශක දෙකක් මුළුල්ලේ කෙරුණු විවාද පසෙකට දැමීමට හොඳම අවස්ථාව මෙයයි. ඉහතින් සඳහන් කළ ව්‍යාතිරේක දෙකක් පහත සඳහන් වේ.

(අ) ස්ථායීකරණ සැත්කම නිසා ඇති වන කම්පන අතර උග්‍රම ඒවා නිසා ඇති වන දුෂ්කරතා මග හරවා ගැනීම් වස් පරිවර්තන අවධියේදී දිය හැකි අනුග්‍රහයන් (මෙය මෙහි සඳහන් කරන්නේ අපගේ සාකච්ඡාව සම්පූර්ණ කර ගැනීමට පමණි. දීර්ඝ විස්තර පසුවට තබමි).

(ආ) ළදරු කර්මාන්ත හෝ ව්‍යාපාර ශාඛා සඳහා දිය හැකි පරිවර්තනීය අනුග්‍රහයන්. ජාතික නිෂ්පාදනය ආරක්ෂා කිරීම සඳහා ළදරු ව්‍යාපාර ආරක්ෂා කිරීමට පක්ෂ තර්ක ඕනෑ තරම් සාහිත්‍යයෙහි ඇත. පුරෝගාමී හංගේරියානු ව්‍යාපාර දියුණු වී ප්‍රායෝගික දැනුම ලැබ පරිමාණ පිරිමැසුම් ලබනා තෙක්, බලා සිටීමට අපට සිදු වේ. එතෙක් ඒවා රාජ්‍ය සහනාධාර මගින් හෝ ආරක්ෂණ තීරු බදු මගින් හෝ ආරක්ෂා කර ගත යුතු බව මම අනුමත කරමි. එහෙත් එම ආරක්ෂාවට දින නියමයක් තිබිය යුතුය. ඒ වන විට නව නිෂ්පාදකයින් ශක්තිමත් වීමට අපොහොසත් වුවහොත් රජයේ අනුග්‍රහය නැවැත්විය යුතුය. දිගට ස්වශක්තියෙන් පවත්වා ගත නොහැකි ව්‍යාපාර, කෘත්‍රිම ආධාරක මගින් පවත්වා ගෙන යාමට කිසිම අවශ්‍යතාවක් නැත.

මෙතෙක් කළ සාකච්ඡාව සාරාංශ කරමු. ස්ථායීකරණය අය-වැය සමතුලනය ඇති කර ගැන්මට සමත් විය යුතුය. උද්ධමනය අවසන් කර ගැනීමට නම් එය නැතිවම බැරිය. 2.1 කොටසෙහි උද්ධමනය ගැන මා ලියූ කරුණුවලින් අවධාරණය කෙරුණේ, උද්ධමනය බලයේ සිටින රජයේ ප්‍රතිපත්ති නිසා සිදු වන්නක් බවයි. ඉන් මා ප්‍රධාන වශයෙන් අදහස් කෙළේ උද්ධමන ක්‍රියාවලිය උත්සන්න කිරීමට රජයේ පිස්කල් ප්‍රතිපත්තිය මූලික වන බවයි. අය-වැය සමතුලනය රැක ගැනීම අවසාන වශයෙන් රඳා පවතින්නේ, රජයේ අයහාරය

හා වියදම තීරණය කරන හා ඒ ගැන නීති පනවන ආණ්ඩුව හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අත ය.[44]

යටකී ප්‍රතිපත්ති ස්ථාපිත වූවාට පසුව, රජයේ වියදම් කැපීමේ ප්‍රයත්නය දිගටම පවත්වා ගෙන යාමත්, අවශ්‍ය වෙතොත් එය වඩාත් තීව්‍ර කිරීමත් වැදගති. මෙම ප්‍රයත්නය සාර්ථක වූ තරමට බදු අනුපාතික අඩු කිරීමේ හැකියාව ද වැඩි වේ. මින් ආණ්ඩුවේ ජනප්‍රියතාව වැඩි වනු ඇත. එහෙත් අනාගතයේදී කප්පාදු කිරීමට බලාපොරොත්තු වන වැය ශීර්ෂ කප්පාදුවෙන් ඉතුරු විය හැකි මුදල්, ස්ථායීකරණ මෙහෙයුම ගෙන යන අවස්ථාවේ වියදම් නොකිරීමට අප ප්‍රවේසම් විය යුතුය.

2.3 සාර්ව ඉල්ලුම් පාලනය

ඉහත දැක්වෙන මාතෘකාව ගැන සම්පූර්ණ සාකච්ඡාවක් කිරීමේ අරමුණක් නැතත්, මෙහිදී අදහස් කීපයක් ඒ ගැන මතු කිරීමට කැමැත්තෙමි. විශේෂයෙන්ම ස්ථායීකරණ වැඩ පිළිවෙළෙහි සාර්ථකභාවය කඩාකප්පල් කිරීමට මුල් විය හැකි සාධක ගැන අනතුරු ඇහවීම මෙහි මූලික අරමුණ වෙයි.

මෙම වැඩපිළිවෙළ ආරම්භ කරන අවස්ථාවේ දී පෞද්ගලික අංශය අත තිබෙන මුදල් ප්‍රමාණය ස්ථාවරව පවතීය යන මතයෙහි පිහිටා දැන් අපි කථා කරමු. එවිට ක්‍රය ශක්තිය ඉහළ යාම පාලනය කර ගත නොහැකි තත්ත්වයකට පත් වීමේ තර්ජනයක් නැත. මීට කලින්ද මා අවධාරණය කළ පරිදි, රජයේ බැංකුවලින් පෞද්ගලික අංශයට සැපයෙන ණය සලාක යම් නිශ්චිත මට්ටමක නියම කළ යුතුය. එක අතකින් බලන කල, මෙම ණය ප්‍රමාණය පෞද්ගලික අංශයේ ඉල්ලුම අනුව ඊට ලබා දිය යුතු ය; එනම් රාජ්‍ය අංශයට එම සම්පත් ප්‍රමාණය උදුරා ගැන්මට ඉඩ නොතිබිය යුතුය. අනෙක් අතට, මෙම වැඩ පිළිවෙළේ පළමු හාරදූර අවධිය තුළදී දෙන ලද ණය සීමාවන් ඉක්මවා කටයුතු කිරීමට පෞද්ගලික අංශයට ඉඩ නොතැබිය යුතුය. ස්ව-ශක්තියෙන් නැගී සිටීමට පෞද්ගලික අංශයට පුළුවන් වූ දිනෙක, ණය ඉල්ලුමට සරිලන පරිදි ණය සැපයුම වැඩි කර දීමට හැකි වෙනු ඇත. මේ අතර පෞද්ගලික අංශයේ විවිධ ඒකකවලට තම තමන් අතරේ ණය ගනුදෙනු කර ගැනීමට හැකි වන පරිදි අන්‍යෝන්‍ය ණය සබඳතා ගොඩ නැගී ආ යුතුය. ඊට අවශ්‍ය නීතිමය පාදකව්‍යුහ පහසුකම් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය ය.

රජයේ අය - වැය පිළිබඳව සවිස්තර වශයෙන් ඉහත සාකච්ඡා වී ඇත. එම සාකච්ඡාවේ අන්තර්ගත වූ සිද්ධාන්ත - එනම් රාජ්‍ය අය වැය නිසා ඇති වන ඉල්ලුම තදින් පාලනය වී තිබීම - ළඟා කර ගෙන ඇතැයි අපි සිතමු. මෙහි දී පැන නැගිය හැකි අනතුර නම් රජයේ ව්‍යාපාර (හා අර්ධ රාජ්‍ය අයිතිය යටතේ පවතින විශාල සමුපකාර) තුළින් ඇති වන ඉල්ලුම පාලනය කර ගත නොහැකි ලෙස ඉහළ යාමට ඇති ඉඩ කඩය. අපි දැන් 1.2 කොටසේ සඳහන් කළ ගැටලු මෙහොතකට ආවර්ජනය කර ගනිමු. රජයේ ව්‍යාපාරවල වැය පක්ෂය සීමා කිරීම සඳහා නීතිමය රෙගුලාසි අවශ්‍ය යයි එහිදි මම යෝජනා කෙළෙමි. එම අවශ්‍යතාව නැවතත් අවධාරණය කරමින්, මා පවසන්නේ රජයේ

---

44. මේ සඳහා අය-වැය පිළිබඳව පාර්ලිමේන්තුවට මනා දැනුමක් ලබා දීම වැදගත් වෙයි. අය වැය හිඟයේ බැරෑරුම් කම මූල්‍ය ප්‍රයෝගවලින් වසන් නොකළ යුතුය. එමෙන්ම හමුදාමය වියදම් ආදිය ගැන ද සම්පූර්ණ අවබෝධයක් පාර්ලිමේන්තුවට ලබා දිය යුතුය.

වැය සීමා කෙරේ ද යන්න බලා ගැනීමට ඇති හොඳම පරීක්ෂණය, ස්ථායීකරණ වැඩ පිළිවෙළ වන බවයි. පසුගිය දශකය, දෙක තුළදී මූල්‍ය අධිකාරිහු **දැඩි මූල්‍ය සීමාකරණ ප්‍රතිපත්තියක්** ක්‍රියාත්මක කළහ.[45] මෙම ප්‍රතිපත්තිය සඵල වූයේ මඳ වශයෙනි. සාර්ව ඉල්ලුම වැඩි වීම පාලනය කර ගත නොහැකි තත්වයකට පත් වීම වළක්වා ගැනීමටත්, යුගෝස්ලාවියාවේ හෝ පෝලන්තයේ සිදුවූ විධියේ අධි උද්ධමනයක් ඇති වීම වළක්වා ගැනීමටත් මේ ප්‍රතිපත්තිය උපකාරි විය. එහෙත් මේ සියල්ල මධ්‍යයේම වුව, 15-25% පමණ අධික උද්ධමනයක් රටේ පවතින බව සිහි තබා ගත යුතුය. මූල්‍ය සීමාකරණ ප්‍රතිපත්තිය හේතු කොට ගෙන අවැඩදායක අතුරු ප්‍රතිඵල ද ඇති වුණි. සැබැවින්ම ලාභදායක ක්ෂේත්‍රවල පවා නිෂ්පාදන හා ආයෝජන කටයුතුවල ප්‍රගතියට එය බාධා පැමිණවූයේය. මෙතෙක් මූර්ත පොළී අනුපාතිකය ඉතා පහළ මට්ටමක (එනම් සුළු වශයෙන් හෝ විශාල වශයෙන් සෘණ මට්ටමක) පැවත ඇත. එවැනි තත්වයක් යටතේ, විචාරවත් මූල්‍ය ප්‍රතිපත්තියක් ගොඩ නගා ගැනීමට පුළුවන් කමක් නොතිබිණි. කෙසේ වුවද, අප රටේ දැන් පවතින පසුබිම යටතේ මූල්‍ය සීමාකරණයක් දියත් කිරීමට **පුළුවන් බව** මේ අත්දැකීම කියාපායි. එහෙත් අනාගතයේ දී අනුගමනය කරන මේ පිළිවෙත මීට වඩා ප්‍රවේසම්කාරීවද, වඩා ශක්තිමත් පදනමක් ඇතිව ද කළ යුතුය. මෙම ප්‍රතිපත්තියේ වැදගත්ම උපකරණයක් වනුයේ ණය සම්බන්ධ මූර්ත පොළී අනුපාතික ඉහළ අගයන් ගත යුතු බවයි.

කෙසේ හෝ, මූල්‍ය සීමා කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ මෑත ඉතිහාසයෙන් උගත හැකි පාඩමක් ඇත. එනම් ස්ථායීකරණ වැඩ පිළිවෙළෙහි සියලු අංග එක්වර ක්‍රියාවට නැංවිය යුතු බවයි. ඒ හා අතින'ත ගෙන ගමන් කළ යුතු අනෙකුත් අංග අමතක කොට ක්‍රියාත්මක කරන ලද මූල්‍ය සීමාකරණය බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබා දීමට අසමත් වී ඇත. එයින් උද්ධමනය කෙළවර වී නොමැත. අකාර්යක්ෂම ව්‍යාපාර කෘත්‍රිම ලෙස පණ ගන්වා තබා ගැනීමේ සිරිත කෙළවරකට පත් කර නැත. මෙහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ බොහෝ දෙනා මූල්‍ය සීමාකරණය අවිශ්වාස කරන තත්ත්වයකට පත් වීමත්, එබැවින් අනාගතයේ දී එය යොදා ගැනීම වඩාත් දුෂ්කර වී තිබීමත් ය.

සාර්ව ඉල්ලුම සීමා කිරීම සමග ඇති වන සංසිද්ධි පිළිබඳව අප දැනුවත්ව සිටිය යුතුය. ඉන් කරුණු දෙකක් මෙහි සඳහන් කරමි.[46]

1. සම්භාව්‍ය සමාජවාදී විධායක අර්ථ ක්‍රමය තුළ ණය සැපයුම රාජ්‍ය බැංකු පද්ධතියේ ඒකාධිකාරයක් විය. 'වෙළෙඳ ණය', එනම් **රජයේ ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය ණය ගනුදෙනු** දැඩි ලෙස තහනම් විය. කෙසේ වුවද, 'වෙළෙඳ පොළ සාමාජවාදී' ප්‍රතිසංස්කරණ හා රජයේ ව්‍යාපාර අර්ධ නිර්බාධීකරණයට යොමු කිරීම හේතු කොට ගෙන, එවැනි අන්තර්-ආයතන ණය ගනුදෙනු ක්ෂණිකව ඇති වූවා පමණක් නොව, සමාජවාදී ප්‍රතිසංස්කරණ සිදුවූ සියලුම රටවල එය සාමාන්‍ය සිද්ධියක් බවට පත් විය. මෙවැනි ගනුදෙනු ණය දෙන්නා හා ණය ගන්නා අතර අර්ධ ස්වේච්ඡාවෙන් හා අර්ධ බල කිරීමකින් සිදු වන්නකි. මෙහිදී භාණ්ඩ ගැනුම්කාර ව්‍යාපාරය, මිලට ගන්නා දේ සඳහා ගෙවීම ප්‍රතික්ෂේප

---

45. මේ සම්බන්ධයෙන් B. Varhegyi (1989) ලිපිය කියවන්න.

46. මේ හා අතිනත ගෙන යන වැදගත්ම සංසිද්ධියකි, විරැකියාව වැඩි වීමේ ප්‍රවණතාව. මේ පිළිබඳ වැඩි විස්තර 3.2 කොටසේ දැක්වේ.

කරමින්, භාණ්ඩ තොගය ණයට දීමට විකුණුම්කාර ව්‍යාපාරයට බල කර සිටී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විකුණුම්කාර ආයතනය ද තමන්ට ගෙවීමට ඇති මුදල් ගෙවා ගත නොහැකි තත්ත්වයකට පත් වුවහොත්, එයද තම සැපයුම්කරුවනට ගෙවීම ප්‍රතික්ෂේප කරයි. අවසානයේදී රටේ ද්‍රවශීලතා අර්බුදයක් උදාවී, තම ණය ආපසු ඉල්ලමින් ණය හිමියෝ ණයකරුවන් ඉදිරියේ පෙළ ගැසෙති. දරා ගත නොහැකි මෙම තත්ත්වය දෙස අනුකම්පාවෙන් බලන රාජ්‍ය බැංකු, ණයගැතිකමේ පත්ලටම වැටී සිටින ආයතනවල පොරොන්දු නෝට්ටු වට්ටම් කිරීම මගින් ඒවාට ණය සැපයීමට ඉදිරිපත් වේ. හංගේරියාවේ දක්නට ඇති ව්‍යාජ ණය, ව්‍යාජ බැංකු හා ව්‍යාජ ප්‍රාග්ධන වෙළෙඳ පොළ පද්ධතිවල දක්නට ලැබෙන විකෘති තත්ත්වයන් අතුරින් එකක් ලෙස මෙය හැඳින්විය හැකිය. නිර්ව්‍යාජ මූල්‍ය ගනුදෙනු සේ පෙනුණද, මෙහිදී දක්නට ඇත්තේ ව්‍යාපාරවල නිෂ්පාදන කටයුතු නවත්වා දැමීමට නොහැකි වීම නිසා ඇති වූ ප්‍රතිචාරයකි. ඒවා නැවැත්වුවහොත් කම්කරු විරෝධතා පැන නැගීම, නිෂ්පාදන ඉලක්ක අතපසු වීම, බරපතල භාණ්ඩ හිඟයක් ඇති වීම, ජාත්‍යන්තර කොන්ත්‍රාත්තු කඩ කිරීමට සිදු වීම වැනි තත්ත්වයන් පැන නැගෙනු ඇති බැවිනි.

ව්‍යාපාර අතර කෙරෙන වාණිජ ණය ගනුදෙනු, ඒවා අතර වන වෙළඳ ගනුදෙනු හා මූල්‍ය සම්බන්ධතා සමඟ අතින්ත ගන්නා ස්වාභාවික සංසිද්ධියකි. වාණිජ ණය යන්න 'මුදල් නිර්මාණ' ('මුදල් මැවීම්') ක්‍රියාවලියේම කොටසකි. එබැවින් මුදල් සැපයුම් පක්ෂයට අඩංගු අයිතම අතරට ඒවාද එකතු කළ යුතුය. එවිට මූල්‍ය සමතුලනයක් ඇති වීම සහතික කළ හැකි වේ. වාණිජ ණය රටේ පවතින බව යථාර්ථයක් සේ පිළිගැනීමට, ස්ථායීකරණ ක්‍රියාවලිය තුළ ප්‍රමාණාත්මක සැලසුම්කරණ අවධියේදී අපි සුදානම්ව සිටිය යුතු වෙමු. ඒ සමගම වාණිජ ණය පද්ධතියේ විකෘතීන් වශයෙන් දක්නට ලැබෙන, ණය දෙන්නන් තම ණය ඉල්ලමින් 'පෝලිම් ගැසීම්' හා ඉන් ඇති වන ද්‍රවශීලතා අර්බුද අවසන් කිරීම ද අවශ්‍ය ය. වෙළෙඳ පොළ ආර්ථිකයකට සුපුරුදු වාණිජ ණය ආයතන හා නීතිමය විධි වැඩි දියුණු කර ගත යුතුය. ව්‍යාපාර අතර සිදු වන ස්වේච්ඡා ණය සබඳතා දිරිමත් කළ යුතු නමුදු, ණය ගැති ව්‍යාපාර බලහත්කාරයෙන් ණය ගැනීමේ තත්ත්වයට ඉඩ තැබිය නොහැක. මේ අතර පොරොන්දු නෝට්ටු හුවමාරුවද, බිල්පත් ආදිය වට්ටම් කිරීම ද වාණිජ හා මූල්‍ය ජීවිතයේ සාමාන්‍ය අංග බවට පත් විය යුතුය.

මුදල් අමාරුකම්වලට පත් වී රජයේ ව්‍යාපාර සිය ණය එකතු කර ගැනීමට 'පෝලිම් ගැසීම' සමහර පුද්ගලික සැපයුම්කරුවන්ද විනාශයට පත් කළ හැකිය. ස්වේච්ඡාවෙන් තොරව ණය දීමට සිදු වී, ණය එකතු කර ගැන්මට පෝලිම් ගැසෙන්නන් ගේ පෝලිම්වල අගටම පෞද්ගලික ව්‍යවසායයන් දැමීමට රජය උත්සාහ දරනු ඇත. කිසිවකුගෙන් පිහිටක් නොමැති පුද්ගලික ව්‍යාපාරයනට වඩා, බලපුළුවන්කාර රජයේ ව්‍යාපාරයනට ණය ආපසු ලබා ගැනීමේ හැකියාව වැඩිය. නිදසුනක් ලෙස රාජ්‍ය බැංකු අංශයේ මැදිහත් වීමක් තුළින් ණය ආපසු ලබා ගැනීමට රජයේ ව්‍යාපාරයකට පුළුවන්කම තිබේ. අප 1.1 කොටසෙහි

දැක්වූ කරුණු අනුව බලන කල, පුද්ගලික අංශයට නියම වශයෙන් ම ආරක්ෂාව අවශ්‍ය වන එක් ක්ෂෙත්‍රයකි මෙය. එහි දැක්වුණු 2 වන අවශ්‍යතාව අනුව රජයේ හා පෞද්ගලික ව්‍යාපාර අතර කොන්ත්‍රාත්තු සහතික කිරීම අවශ්‍යය. රජයේ ව්‍යාපාරයක් යම් හෙයකින් පුද්ගලික ව්‍යාපාරයක් සමග විකුණුම්කරු හෝ ගැනුම්කරු හෝ ලෙස කොන්ත්‍රාත්තුවකට බැඳුණහොත්, එකී රජයේ ව්‍යාපාරය අදාළ කොන්දේසි සියල්ල පිළිපැදිය යුතු තත්ත්වයක් ඇති කළ යුතුය. මේ අවශ්‍යතාව පුද්ගලික ව්‍යාපාරවලට එක ලෙස අදාළ වන බව අමුතුවෙන් කිව යුතු නොවේ.[47]

2. **වැටුප් ප්‍රශ්නය,** ස්ථායීකරණ සැත්කමේ ඉතාම දුෂ්කර වූත්, දේශපාලනමය වශයෙන් ඉතාම සංවේදී වූත් ප්‍රධාන ප්‍රශ්නයයි. රජයේ ව්‍යාපාර අංශය ගෙවන සමස්ත වැටුප් ප්‍රමාණය, ස්ථායීකරණ වැඩ පිළිවෙළ මගින් දැක්වෙන සීමාවන් නොඉක්මවන බවට වග බලා ගත යුතුය. පූර්ව ස්ථායීකරණ අවධියේ පැවති නාමික වැටුප් මට්ටම හා සසඳන විට මේ සීමාව කොපමණ විය යුතු දැයි නිශ්චය වශයෙන් කීමට මම අපොහොසත් වෙමි. කෙටි කලක් සඳහා අතිරික්ත ක්‍රය ශක්තිය යම් ප්‍රමාණයකට මුදා හැරීමට පුළුවන්කම තිබේ. මේ සමග මිල වැඩි වීම් මාලාවක් සිදු වනු ඇත. එමගින්, මෙතෙක් වියදම් නොකළ ඉතිරි කිරීම් වලින් කොටසක් උරා ගැනීමට ද, ඕනෑවට වඩා ඇති මුදල් ප්‍රමාණ (Monetary Overhang) විනාශ කර දැමීමට ද හැකි වන පරිදි, ´නිවැරදි කිරීමේ මිල මට්ටම් වැඩි වීමක් බිහි කෙරෙනු ඇත. මෙවැනි තත්ත්වයක් ඇති වීම අනවශ්‍ය වීමට ද ඉඩ තිබේ. කෙසේ වෙතත් කළ යුතු දේ කවරක්ද යන්න නිගමනය කළ හැක්කේ පුළුල් විශ්ලේෂණයකට පසුව ය.[48]

ටික කලක් තුළ වෙනස් වන්නට නොදී පවත්වා ගත යුතු මෙම සාමාන්‍ය වැටුප් මට්ටම තීරණය කර ගත් විට, එය ස්ථායී කිරීමට විවිධ උපකරණ භාවිත කළ හැකි වේ. මෙම උපකරණ අතුරින් කවරක් තෝරා ගත යුතු ද යන්න ගැන නියත වූ මතයක් ප්‍රකාශ කිරීමට මම මැළි වෙමි. ව්‍යාපාරවලට දෙනු ලබන ණය, වැටුප් ප්‍රමිතීන්ට දක්වන අනුකූලතාව මත රඳා සිටුවිය යුතුය යන්න ඉන් එක් අදහසකි. මෙය පමණක් ප්‍රමාණවත් වේදැයි සැක සහිතය. මීට වඩා ප්‍රබල පියවර ගැනීම අවශ්‍ය

---

47. සමමිතික බවක් මතු පිටින් පෙනුණ ද, සත්‍ය වශයෙන් දක්නට ලැබෙන්නේ අසමමිතික බවකි. රජයේ ව්‍යාපාරයක් සමග ඇති කර ගත් කොන්ත්‍රාත්තුවක් කඩ කොට උසාවි යන පුද්ගලික ව්‍යාපාරිකයාට, එහිදී නියම කරන ෆොරින්ට් මිලියනයක දඩය තම ධනයෙන් ගෙවා දැමීමට සිදු වේ. අනෙක් අතට, කොන්ත්‍රාත්තු කඩ කරන රජයේ ව්‍යාපාරයකට ෆොරින්ට් මිලියනයක් ගෙවීමට සිදු වුවහොත්, එහි කළමණාකරු එම මුදල ගෙවන්නේ සිය මුදලින් නොව රජයේ මුදලිනි. මේ හේතුව නිසා රජයේ ව්‍යාපාර උසාවියට බියක් නොදක්වයි. අංශ දෙක අතර සිදු වන ව්‍යාපාර සබඳතාවලදී මෙය බැරෑරුම් ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. මීට අවසාන හා සාර්ථක විසඳුමක් නැත. කෙසේ වුවද, රාජ්‍ය ව්‍යාපාරවල කළමණාකරුවන් හා වගකීම දරන සෙසු නිලධාරීන් අදාළ වරද වෙනුවෙන් ගෙවිය යුතු දඩයෙන් කොටසක්වත් තමන්ගේම සාක්කුවලින් ගෙවීමට සිදු වන තත්ත්වයකට පත් කළහොත් කොන්ත්‍රාත්තුවල අධිකාරය තරමක් ශක්තිමත් කිරීමට පුළුවන.

48. පෝලන්තයේ දියත් කළ ස්ථායීකරණ වැඩ සටහනේ දී නම් මේ හා සමාන ´නිරවද්‍යකරණ නාමික වැටුප් වැඩි වීමක් දීම නොවැළැක්විය හැකි සේ පෙනෙන්නට තිබිණි. එය හංගේරියාවටත් අවශ්‍ය ද යන්න නම් ස්ථිරවම කිව නොහැකිය.

වෙතැයි මට හැඟේ. අතීත අත්දැකීම් නැවත මතකයට නගා ගතහොත් සාපේක්ෂ වශයෙන් ඉතාම එලදායී රෙගුලාසි විධි හඳුනා ගැනීමට පුළුවන. අනුගමනය කළ යුතු සූත්‍ර හා වට්ටෝරු පිළිබඳව කිසියම් මතයක් නියත වශයෙන් දැක්වීමට මම අපේක්ෂා නොකරමි. නිදසුනක් වශයෙන් ව්‍යාපාරයක සමස්ත වැටුප් අරමුදලට සීමාවන් පැනවිය හැක. නොඑසේ නම් සමස්ත වැටුප් අරමුදල නිෂ්පාදනයේ අනුපාතයක් ලෙසින් තීරණය කළ හැකි ය; එසේත් නැතහොත් එවැනි වෙනත් සූත්‍රයක් යොදා ගත හැක. මෙවැනි රෙගුලාසි නිසා ව්‍යාපාර කළමනාකරුවන් ගේ ස්වාධීනත්වය අඩු වීමට ද, නිෂ්පාදන සාධක ප්‍රශස්ත ලෙස යොදා ගැනීමේ තීරණ වඩාත් දුෂ්කර වීමට ද ඉඩ ඇති බව මම හොඳාකාරව දනිමි. කෙසේ වෙතත්, අප මෙවැනි පියවර නොගතහොත්, රජයේ ව්‍යාපාර කළමනාකරුවන් අවිචාරවත් ලෙස වැටුප් ඉහළ දැමීම නොකඩවා කර ගෙන යනු ඇත. එවිට මීට වසර කීපයකට උඩදී චීනයත්, අද යුගෝස්ලාවියාව හා පෝලන්තයත් සිටින තත්ත්වයට අප ද අනිවාර්යයෙන්ම ඇද වැටීමට ඉඩ තිබේ. අනියම් ක්‍රම මගින් මේ තත්ත්වය පාලනය කර ගත නොහැක. තවද, නිලධාරිවාදී රාජ්‍ය අයිතිය පවතින රටක, රජයේ ව්‍යාපාර කළමනාකරුවන් ස්වේච්ඡාවෙන්ම වැටුප් පාලනය කර ගනු ඇතැයි සිතීම ආත්ම වංචනයක් වනු ඇත.

තුන්වන පරිච්ඡේදයේදී මෙම ප්‍රශ්නයේ දේශපාලන ප්‍රතිවිපාකත්, ඒ පසුබිමෙහි ලා වෘත්තීය සමිති වල කාර්ය භාරයත් සලකා බැලේ. දැනට අවශ්‍ය වන්නේ ඒ පිළිබඳ ආර්ථිකමය තර්ක ඉදිරිපත් කිරීමයි. අසීමිත වැටුප් වැඩිවීම් සීමා කිරීමට පරිපාලන විධි යොදා ගැනීමෙන් නොයෙකුත් විධිවලින් හානි සිදු වීමට ඉඩ ඇති බව මම දනිමි. මේ තත්ත්වය වෙනස් කිරීමට ඇති එකම මග රාජ්‍ය අයිතිය වෙනුවට පෞද්ගලික අයිතිය ස්ථාපිත කිරීමයි. තම වැටුප් වැඩි කර ගැනීමට උද්ඝෝෂණය කරන සේවකයාට 'එරෙහිව' සිටිය හැකි එකම පුද්ගලයා තම පසුම්බියෙන් වැටුප් ගෙවන පුද්ගලික ව්‍යාපාර අයිතිකරු ය. මෙතැන ඇත්තේ අවංක වූත්, ස්වාභාවිකව පැන නගින්නාවූත් ගැටුමකි. 'අයිතිය පිළිබඳ ව්‍යාජ ප්‍රතිසංස්කරණ' මගින් එහි නියම ස්වභාව එළිදරව් කළ නොහැකිය. රාජ්‍ය අයිතිය ප්‍රබලව ඇති තාක් කල්, වැටුප් වැඩි වීම සඳහා පහළින් එන පීඩනය මෙල්ල කර ගත හැක්කේ නිලධාරිවාදී පියවර තුළින් පමණි.

පරිණත ධනවාදී ආර්ථිකයක නම්, මූල්‍ය සීමාකරණ ප්‍රතිපත්තියකින් වැටුප් වැඩි වීම් ඇණ හිටුවීමට හෝ වැටුප් පහළ හෙළීමට හෝ පුළුවන් වෙතැයි සිතීම යථාර්ථයෙන් ඈත් වීමක් නොවේ. එවිට තමන්ට අවශ්‍ය මුදල් ප්‍රමාණයන් නොලැබෙන නිසා සේවක වැටුප් වැඩි කිරීමට ව්‍යාපාර ඉදිරිපත් නොවේ. මෙම යන්ත්‍රණය පරිණත ධනවාදී ආර්ථිකයක වුවද සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වෙතැයි සහතික කළ නොහැකි වුවද, එවැනි තැනක සාර්ථකව ක්‍රියා කිරීමට ඊට යම් ඉඩකඩක් හෝ තිබෙන්නට පුළුවන. එහෙත් හතරෙන් තුනක් සමාජවාදී ද හතරෙන් එකක් ධනවාදී ද වන හංගේරියානු ආර්ථිකය තුළ නම් තත්ත්වය මීට වෙනස්ය. ඉතාම දුෂ්කර අවස්ථාවල පසු වෙද්දී පවා, ආත්ම සංයමයකින් තොරව සිය සේවක වැටුප් වැඩි කළ රජයේ

ව්‍යාපාර පිළිබඳ නිදසුන් බහුලය. අනෙක් කටයුතු සඳහා කෙසේ වෙතත්, වැටුප් වැඩි කිරීමට නම් අවශ්‍ය වන මුදල් කෙසේ හෝ සෙවිය හැකිය යන විශ්වාසයෙනි ඒවා මෙහිදී කටයුතු කර ඇත්තේ. නරකම තත්ත්වයන් යටතේ, මෙසේ කිරීම සඳහා ඒවා සිය සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම වුවද පැහැර හරී. හංගේරියානු රාජ්‍ය අංශයේ වැටුප් සම්බන්ධයෙන් සෘජු නිලධාරිවාදී සීමා පැනවීම නොවැළැක්විය හැක්කේ මේ නිසා ය.[49] නව වෙළෙඳ පොළ ප්‍රතිසංස්කරණ රාජ්‍ය අයිතිය තුළට හඳුන්වා දෙනු ලැබූ ගත වූ දශක කීපය තුළදී වැටුප් සීමා කිරීම දිගින් දිගටම පැහැර හරින ලදී.[50] මෙහි ලා අදාළ කටුක සත්‍යයනට මුහුණ දීමට කාලය පැමිණ තිබේ.

ස්ථායීකරණ මෙහෙයුමේ සියුම්ම හා බරපතලම පියවර වැටුප් විනය පවත්වා ගෙන යාම බැව් නැවතත් අවධාරණය කරමි. මෙය අසාර්ථක වුවහොත්, එම ක්‍රියාවලිය මුළුමනින්ම කඩා හැලෙනු ඇත.

2.4 විචාරවත් මිල ක්‍රමයක් ඇති කිරීම

විචාරවත් මිල ක්‍රමයකින් බිහි වන ප්‍රතිඵලය කෙබඳු දැයි විමසමින් අපි මෙම සාකච්ඡාව ආරම්භ කරමු. දැනට පවතින දරදඬු වූද, ආර්ථික දෘෂ්ටිකෝණයෙන් අවිචාරවත්වූද මිල ක්‍රමය වෙනුවට, ජනතාවට අර්ථවත් වන පරිදි ආර්ථික තොරතුරු සපයන වෙළෙඳ පොළ මිල ක්‍රමයක් ඇති කර ගතහොත් ස්ථායීකරණ මෙහෙයුම සාර්ථක වනු ඇත. මෙම වෙනස කොන්දේසි කීපයකට යටත්ව කළ යුතුය. ඉන් සමහරක් සාපේක්ෂ වශයෙන් ඉටු කර ගැනීමට පහසු කෙළින් ම පැහැදිලි ඒවා වෙයි. තවත් සමහරක් ඉටු කර ගැනීමට අපහසු එමෙන්ම නොවැළැක්විය හැකි පරස්පර විරෝධතා ඇති කරවන සුළු ඒවා වෙයි.

---

49. ඉහතින් දැක්වූ අදහස් මාලාව, කෙළින්ම පිළිගැනෙන තර්කානුකූල එකකැයි මම බලාපොරොත්තු වෙමි. ඒ නිසා ඒ ගැන විශේෂඥ අදහස් උපුටා දැක්වීමේ අවශ්‍යතාවක් මට නොපෙනේ. පහත සඳහන් කරුණු මා ඉදිරිපත් කරන්නේ හුදෙක් ඒවායේ ඇති සිත් කාවදින ලක්ෂණ නිසාය.

1986 දී චීනයේ අත්හදා බැලූණු ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ගැන උපදෙස් ලබා ගැනීමට චීන ආණ්ඩුව සාකච්ඡාව සඳහා විදේශීය විශේෂඥයන් හත් දෙනකු කැඳවිය. උද්ධමනයේ ඇති අනතුරු සහිත භාවය සාකච්ඡාවට නතු කැරුණු එක් මාතෘකාවක් විය. මෙම අමුත්තන් අතුරින්, ජර්මානු බුන්ඩස් බැංකුවේ හිටපු සභාපති ඔට්මාර් එමින්ගර් ද, කෙනඩි පරිපාලනයේ ආර්ථික උපදේශකවරයකු වූද, නොබෙල් ත්‍යාග ලාභී වූද අමෙරිකානු ආර්ථික විද්‍යාඥ ජේම්ස් ටෝබින් ද මම ද එම අනුපිළිවෙළින් උද්ධමනය පිළිබඳව මෙම සාකච්ඡාවට සහභාගී වුණෙමු. ධනවාදී ක්‍රම තුළ සිය ජීවිතය ගෙවමින්, එම ක්‍රමයේ ඇතුළත සියලු විස්තරත්, එහි පිටත න්‍යාය හා භාවිතය පිළිබඳ කාරණාත් හොඳින් දැන සිටි ඉහත කී බටහිර අර්ථ ශාස්ත්‍රඥයින් දෙදෙනාම පරිපාලන රෙගුලාසි භාවිතා කරමින් චීනය වැටුප් සීමා කර ගත යුතු බවට නොපිරිහෙළා, තරයේ උපදෙස් දුන්හ. සපේක්ෂ ආර්ථික පද්ධති පිළිබඳ න්‍යාය හා සමාජවාදී ආර්ථිකය පිළිබඳ විශේෂඥතාවක් ඇති මම ද එම අදහස අනුමත කෙළෙමි.

එහෙත් චීන රජය එම උපදෙස් නො සලකා හැරියේය. සිදු වූයේ දිගින් දිගට වැටුප් වැඩි වීම තුළින් බිහි කැරුණු වැටුප් උද්ධමනය හා ආයෝජනය සඳහා ඇති අතෘප්තකර ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩි වීමයි.

50. මේ සම්බන්ධව ව්‍යතිරේකයන්ට ගරු කළ යුතුය. මේ පිළිබඳව බලන්න: I.R. Gabor (1988) හා I.R. Gabor and Gy. Kovari (1987)

මෙහිදී අපි කිරීමට තිබෙන දේ අතර පැහැදිලිවම පෙනෙන ඒවායින් පටන් ගනිමු. පුද්ගලික අංශයේ ගනුදෙනු සම්බන්ධ මිල ගණන්වලට, රජයේ මැදිහත් වීමකින් තොරව, නිර්බාධීව හැසිරීමට ඉඩ තැබිය යුතුය. එහෙත් මෙසේ වර්ධනය වන 'පුද්ගලික මිල පද්ධතිය' සමස්ත ආර්ථිකයටම බලපාන පරිදි විචාරවත් එකක් වේ යයි සහතික කළ නොහැක්කේ, පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය සමග විකුණුම්කරුවන් හෝ ගැනුම්කරුවන් හෝ වශයෙන් ගනුදෙනු කරන නිසා ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය අංශයේ මිල පෞද්ගලික අංශයේ පිරිවැය හා මිල බවට පත් වේ. එනමුත් සමහර නිෂ්පාදිත හා සේවා ක්ෂේත්‍රයන්හි පෞද්ගලික අංශය තුළම සිදු වන යෙදවුම්-නිමැවුම් ගලණය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී. එබැවින් මිල ගණන් රාශියක් සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ මිල ගණනය කරන විට එය කළ යුත්තේ පෞද්ගලික අංශ මිල ගණන් සම්මතයක් ලෙස තබා ගෙන ය.

රාජ්‍ය අංශයේ මිල ගණන් ප්‍රතිසංවිධානය කිරීම වඩා බැරෑරුම් කාර්යයකි. මේ පිළිබඳ විශ්ලේෂණයක් කිරීමට පළමු, ස්ථායීකරණ මෙහෙයුම නිමාවට පත් වන අවස්ථාවේදී රාජ්‍ය අංශයේ මිල කෙබඳු විය යුතු ද යන්න ගැන අප තුළ පැහැදිලි අදහසක් පැවතිය යුතුය. මේ සම්බන්ධයෙන් වෙළෙඳ පොළවල් හිස් කරවන විටියේ මිල ගණන් සකස් කිරීම අපේ අරමුණ විය යුතුය. ව්‍යතිරේකයන් හැරුණු විට, මෙහිදී අවශ්‍ය වනුයේ **මිල පිළිබඳ පූර්ණ නිර්බාධිකරණයකි**. මෙම අරමුණ ඉක්මනින් ළඟා කර ගත් තරමට හොඳය.

බටහිර පරිණත වෙළෙඳ පොළ ආර්ථිකයන් තුළ පවා දැක ගත හැකි, සදාකාලිකව ක්‍රියාත්මක වන ව්‍යතිරේක කිහිපයක් ඇත. එනම් පොදු සේවාවන්, ස්වභාවික ඒකාධිකාරයන්හි නිමැවුම් යනාදියේ මිලයි.

ස්ථායීකරණ මෙහෙයුමේ අවසාන ප්‍රතිඵලය වශයෙන් මිල නිර්බාධීකරණය ළඟා කර ගත යුතු බැව් මට නොපැකිළ කියා සිටිය හැක. එහෙත් මෙම සතුටුදායක තත්ත්වය කරා ළඟා වීමට ගත යුතු මග සම්බන්ධයෙන් කොන්දේසි සහිත **යෝජනා පමණි**, මට ඉදිරිපත් කළ හැක්කේ. සැලකිල්ලට ගත යුතු පළමු කොන්දේසිය නම්, ස්ථායීකරණ සැත්කම ඇරඹීමට පෙර හංගේරියානු ආර්ථිකය ලබා ගෙන තිබූ මිල නිර්බාධීකරණයේ තරම ය. අර්ධ මිල රෙගුලාසි හා බාගෙට කැරුණු මිල නිර්බාධීකරණය යටතේ, තනි තනිව ද අන්‍යෝන්‍ය බලපෑම් අතින් ද ඇති විය හැකි අවදානම ඉහළ ය. මෙම පොතේ කතෘ අර්ධ මිල නිර්බාධීකරණයට පක්ෂපාතීද නැද්ද යන්න මේ අවස්ථාවේදී වැදගත් නොවේ. මෙහෙයුම ආරම්භ කරන අවස්ථාවේ පවතින තත්ත්වය යටතේ පුද්ගලික අංශයේ මෙන්ම, රාජ්‍ය අංශයේ ද කර්මාන්තවල නිදහස් මිල ගණන්වලට ඇති ඉඩකඩ පුළුල්ව පවත්නා බැව් **දෙන ලද** දෙයක් ලෙස සැලකිල්ලට ගත යුතු වේ. කරුණු මෙසේ හෙයින්, මෙම ක්ෂේත්‍රයෙහි දී, පවතින සීමා පැනවීම් ආපස්සට හැරවීම නුවණට හුරු නොවන බැව් පැහැදිලිය. (මෙහිදී මතක තබා ගත යුතු ව්‍යතිරේකයක් ඇත. පරිණත ධනවාදී රටවල පවා, මිල ගණන් සීමා කර පවත්වා ගැනෙන ක්ෂෙත්‍රවල, නිර්බාධී මිල ගණන්වලට ඉඩ දෙමින් වැරදි ක්‍රියාමාර්ග අනුගමනය කර තිබීම හෝ එසේ කිරීමට ඉඩ තිබීම එම ව්‍යතිරේකයයි).

මිල පද්ධතිය ගැන සලකා බලන විට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ, බලශක්තිය හා අමුද්‍රව්‍ය යන මේවායේ පවත්නා සැපයුමේ තත්වය ද තොග ප්‍රමාණ ද සැලකිල්ලට ගත යුතුව ඇත. (2.7 කොටස කියවන්න). ආණ්ඩුවේ

යම් වැරැද්දකින් හෝ යම් අවාසනාවක් නිසා හෝ වෙළෙඳ පොළේ උග්‍ර භාණ්ඩ හිඟයක් ඇති වී, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල අහස උසට නැගෙන්නට ඉඩ හැරීම වටිද යන්න ස්ථායීකරණ මෙහෙයුම ආරම්භයේදීම සලකා බැලිය යුතුය. මෙවැනි තත්වයන් යටතේ කෙටි පරිවර්තන කාලයක් තුළ මිල සීමා කර තබා ගැනීමේ තීරණයක් ගැනීමට සිදු වනු ඇත. එහෙත් හැකි තාක් ඉක්මනින්, භාණ්ඩ ආයාත කිරීම වැනි ක්‍රමයකින් සැපයුම වැඩි කොට, මිල සීමා කිරීම් ඉවත් කර, මිල නිර්බාධීකරණය සිදු කළ යුතු වේ. සදාකාලිකව මිල සීමා පනවා ඇති යම් යම් සීමාසහිත ක්ෂෙත්‍ර හැරුණු විට, වෙනත් අංශවල පවත්නා රෙගුලාසිගත කිරීම්, හැකි තාක් ඉක්මනින් ඉවත් කළ යුතු, පරිවර්තනීය ව්‍යාධියක් ලෙස ගත යුතුය. භාණ්ඩ ආයාත කිරීමට පුද්ගලික අංශය ඇතුළු සැමට නිදහස දෙමින්, රාජ්‍ය අංශය පවතින්නට ඉඩ හැර ඇති හිස් තැන් පිරවීමට පෞද්ගලික අංශයට වැඩි අවකාශයක් දුන් විට, එවැනි රෙගුලාසි ඉවත් කර ගැනීම ඉක්මන් කර ගත හැකි වේ.

නිර්බාධී මිල ගණන් නුපුරුදු රජයේ ව්‍යාපාර, ස්ථායීකරණ ක්‍රියාවලිය පටන් ගන්නා විට, තමන්ගේ **ආරම්භක** මිල ගණන් තීරණය කර ගැනීමේ දුෂ්කරතාවලට මුහුණ පානු ඇත. එවිට ආරම්භයේදී පමණක් බලපාන පරිද්දෙන්, යම් යම් දළ පිළිවෙත් යොදා ගැනීමට සිදු වනු ඇත. පසු කලෙක දී වෙළෙඳ පොළේ බලවේග දියුණු වී රාජ්‍ය ආයතන තීරණය කරන එවැනි ආරම්භක මිලට වඩා වෙනස් මිල ගණන් ගොඩ නැගෙනු ඇත.

වෙළෙඳාමට නතු වන භාණ්ඩවල (Tradeable Products) දේශීය මිල ධනවාදී රටවල මිල ගණන්වලට අනුව හැඩ ගැසිය යුතුය යන්න කලක් තිස්සේ මුල් බැස ගෙන ඇති ප්‍රාථමික සිද්ධාන්තයකි. පළමුව අප කළ යුත්තේ ධනවාදී රටවල විදේශීය වෙළෙඳමේ යෙදෙන්නවුන් එක් එක් භාණ්ඩයකට නියම කරන මිල ගණන් සැලකිල්ලට ගැනීමයි. පසුව ඒවා පෞද්ගලික අංශයේ විනිමය අනුපාතිකයට අනුකූලව දේශීය මුදලට හැරවූ විට විදේශීය හා දේශීය මිල ගණන් අතර කැපී පෙනෙන වෙනසක් නොතිබිය යුතු බව මින් කියැවේ. (එම ප්‍රකාශය ඕනෑවට වඩා සරල එකක් බව සිහි තබා ගැනීම වටී). එනම් නිදසුන් ලෙස වියනාවේ හා බුඩාපෙස්ට්හි විදුලි උපකරණ ද, නැගෙනහිර ඕස්ට්‍රියාවේ හා බටහිර හංගේරියාවේ මස් ද, මියුනික්හි හා බුඩාපෙස්ට්හි මෝටර් රථ ද පිළිබඳ මිල අනුපාත අතර විශාල වෙනසක් නොතිබිය යුතුය. මේ තත්ත්වය ළඟා කර ගත හැකි වුවහොත් පරිපාලනමය තහංචි නොමැතිවම, අනවශ්‍ය විදේශීය සාප්පු සවාරි නවතිනු ඇත. එවිට අදාළ දෙපක්ෂයේ සාපේක්ෂ වාසිවලට අනුකූල ගනුදෙනුවලට පමණක් සාප්පු යාමේ සංචාර සීමා වනු ඇත.

මෙම සංකල්පය ළඟා කර ගැනීමට නම්, මෙම පරිච්ඡේදයේ මීට ඉහතින් සඳහන් කළ කරුණු සියල්ල ක්‍රියාවට නැංවිය යුතුය. එනම් පාරිභෝගික බදු අනුපාතික හා රේගු බදු අනුපාතිකය භාණ්ඩ වර්ග අනුව ඒකාකාරී වීම, පාරිභෝගික හා නිෂ්පාදන සහනාධාර ඉවත් කිරීම යනාදී වශයෙනි.

1946 සිදු කළ ස්ථායීකරණයේ දී, ෆොරින්ට් මුදලින් කියැවුණු ආරම්භක සාපේක්ෂ මිල පද්ධතිය සකස් කරන ලද්දේ එවකට තිබූ 'පෙන්ගෝ' නමැති හංගේරියානු මුදලින්, 1938 මිල ගණන් පදනම් කර ගනිමිනි. ඒ හා සමාන සරල වැඩ පිළිවෙළක් අදට ද අවශ්‍යව ඇත. එහෙත් අද මිල සාධනයේ පදනම විය යුත්තේ, අතීතයේ පැවැති හංගේරියානු මිල ගණන් නොව,

සමකාලීන ධනවාදයේ මිල ගණන්ය. නිදසුනක් ලෙස හංගේරියානු ව්‍යාපාරවලට, වර්තමාන ඕස්ත්‍රියානු හෝ බටහිර ජර්මානු මිල ගණන්, තම ආරම්භක මිල තීරණය කිරීමේ දී පදනම ලෙස ගත හැක. මා එසේ පවසන්නේ ශුද්ධ ආර්ථික න්‍යාය අනුව බලන කල, මේවා ආදර්ශමත් ප්‍රශස්ත මිල ගණන් යැයි මා විශ්වාස කරන නිසාම නොවේ. මෙම මිල ගණන් පවා සාධක ගණනාවක් හේතු කොට ගෙන විකෘත වී ඇත. තවද, හංගේරියාවේ ඉල්ලුම් - සැපයුම් හා පිරිවැය ව්‍යුහය, අන් රටවලට වඩා වෙනස් බව ද පිළිගත යුතුය. ඒ කෙසේ වෙතත්, ඕස්ත්‍රියානු හා බටහිර ජර්මානු මිල ගණන් අව්‍යාජ මිල ගණන් ය. වෙළෙඳ පොළ ආර්ථිකයන් අතුරින් හංගේරියාව වඩාත්ම ශක්තිමත් සබඳතා ගොඩ නගා ගෙන ඇත්තේ ද යටකී රටවල් සමගය. හංගේරියානු ව්‍යාපාරිකයෝද සංචාරකයෝද, වැඩි වශයෙන්ම, හංගේරියාව එම රටවල් හා සසඳති. අප සලකා බලන්නේ රජය තීරණය කරන ආරම්භක මිල වුවත්, රජයේ ව්‍යාපාර නිර්බාධිව තීරණය කරන මිල ගණන් වුවත්, මේවායේ දී ඇසිය යුතු ප්‍රශ්නය නම් ඕස්ත්‍රියාවේ හෝ බටහිර ජර්මනියේ අදාළ භාණ්ඩය විකිණෙන්නේ හා මිලට ගැනෙන්නේ කවර මිලකට ද යන්නය. මෙම මිල පවතින විනිමය අනුපාතිකයට අනුකූලව ෆොරින්ට් මුදලට පරිවර්තනය කළ යුතු වේ. (මීළඟ කොටසෙහි විනිමය අනුපාතික සාකච්ඡා වේ). මෙහි ප්‍රතිඵලය වනුයේ, ස්ථායීකරණ මෙහෙයුම ආරම්භ කරන විට, රාජ්‍ය අංශයේ විකිණුම්කරු වෙළෙඳ පොළට අවතීර්ණ වන දේශීය මිල නිර්මාණය වීමය.

හංගේරියානු පෞද්ගලික අංශයේ පවතින වර්තමාන සාපේක්ෂ මිල ගණන්, ස්ථායීකරණයේ ආරම්භක මිල නියම කිරීමේදී යොදා ගත හැකි තවත් පදනමකි. පෞද්ගලික විදේශීය විනිමය අනුපාතිකය සම්බන්ධයෙන් කථා කරන විටෙකදී අප යට කී ප්‍රස්තුතය ගැන සඳහන් කොට ඇත. එහෙත් මෙම අදහස එහි දැක්වූවාට වඩා පුළුල් එකකි. දැනටමත් යම් යම් ක්ෂෙත්‍රවල අව්‍යාජ මිල ගණන් වර්ධනය වී ඇත. පෞද්ගලික වෙළෙඳ පොළේ ආහාර මිල, පෞද්ගලික අයිතියේ පවත්නා නිවාසවල කුලී, වතුපිටි වෙළෙඳ පොළේ මිල ගණන්, සේවා අංශයේ මිල ගණන් යනාදී වශයෙනි. එබැවින් රජයේ ව්‍යාපාර, සිය භාණ්ඩ, ස්ථායීකරණ කාලය තුළ වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේදී, කාර්යාලයයක තීරණය කරන කෘත්‍රිම මිල ගණන් මෙන් නොව, අව්‍යාජ වෙළෙඳ පොළ මිල ගණන් වන මේවා භාවිත කිරීම යෝග්‍ය ය.

විවිධ භාණ්ඩ හා සේවාවල **සාපේක්ෂ මිල ගණන්** තීරණය කර ගැනීමේදී ඉහත සාකච්ඡා කෙරුණු විදේශීය හා දේශීය මිල ගණන්වලින් යම් මග පෙන්වීමක් ලබා ගත හැකි වේ. ස්ථායීකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ද, සිය භාණ්ඩ වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේදී ද මෙම සාපේක්ෂ මිල ගණන් ප්‍රයෝජනයට ගැනීමට රජයේ ව්‍යාපාරවලට පුළුවන් වේ. **සාමාන්‍ය මිල මට්ටම** පිළිබඳ ප්‍රශ්නය මීට වඩා වෙනස් එකකි. එය වෙනත් සාර්ව ආර්ථික සාධක ගණනාවක් මත රඳා පවතී. (ණය සැපයුම, වැටුප් මට්ටම, සාර්ව සැපයුම, සාර්ව ඉල්ලුම යනාදී වශයෙනි). මෙම සාර්ව ආර්ථික සබඳතාවන් ගැන මීට ඉහත දී සඳහන් කොට ඇත. අපි ඒ ගැන සලකා බැලීමට පසු අවස්ථාවන්හිදී ද යොමු වෙමු.

රජයේ ව්‍යාපාරයක් සිය ව්‍යාපාරික ගණනය කිරීම්වලදී, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් විසින් තීරණය කරනු ලැබ, රජයේ බැංකු පද්ධතිය විසින් අනුමත

කරනු ලබන **විනිමය අනුපාතිකය** සැලකිල්ලට ගනී. (පරිච්ඡේදයේ ඊළඟ කොටස කියවන්න). එමෙන්ම මෙම ව්‍යාපාර රාජ්‍ය බැංකුවලින් අය කරනු ලබන ධන **මූර්ත පොළි** අනුපාතිකය ද යම් තාර්කික මට්ටමක තීරණය කොට සැලකිල්ලට ගත යුතුය. ස්ථායීකරණ මෙහෙයුම ආරම්භයේදී වත්, භාවිතයට ගැනෙන මෙම අනුපාතික කල් ඇතුව දැනුම් දීමක් තිබීම අවශ්‍යය. සැබෑ ණය වෙළෙඳ පොළ තත්වයන්ට අනුකූල වන පරිදි පසුව ඒවායේ වෙනසක් සිදු කළ හැකිය.

ස්ථායීකරණය නිසා රාජ්‍ය ව්‍යාපාරවලට වෙළෙඳ පොළට ඇතුළු වීමට සිදු වේ. ඒවාට සිය මිල ගණන් තීරණය කිරීම සඳහා සහාය වන නිර්නායක තිබෙන්නට පුළුවන. එහෙත් ඒවා වෙළෙඳ පොළට සැබවින්ම ඇතුළු වන විට ඒවාට සිදු වනුයේ, ආරම්භ මිල, අඳුරේ අතපත ගාමින් තීරණය කිරීමටය.

සිදු වන දේ ඉල්ලුමේ හා සැපයුමේ නිර්බාධී ක්‍රියාකාරිත්වයෙන් තීන්දු විය යුතුය. සියලුම මිල ගණන් හැකි තාක් ඉක්මනින් නිර්බාධී කිරීම අතිශයින් වැදගත් වේ. (සදාකාලිකවම මිල පාලනය කර තිබිය යුතු ඒකාධිකාරී භාණ්ඩ මීට ඇතුළත් නැත). ඉල්ලුම හා සැපයුම සමතුලනය වී, 'වෙළෙඳ පොළ හිස් කෙරෙන' සමතුලිත මිලක් වර්ධනය වීමට කාලයක් ගත විය හැකිය. ඒ සමගම විදේශීය වෙළෙඳාම සිදු වෙමින් පවතින බවත්, සිදු කෙරෙන ගනුදෙනුවලින් වැඩි ප්‍රමාණයක් විදේශීය පුද්ගලික වෙළෙඳුන් විසින් සිදු කෙරෙන බවත් සිහි තබා ගත යුතුය. අදාළ ආනයනයිකයන් හංගේරියානු රජයේ ව්‍යාපාර, හංගේරියානු පුද්ගලික ව්‍යාපාර, විදේශීය ධනේශ්වර ව්‍යාපාර හෝ බද්ධ ව්‍යාපාර යන කවරක් වුවද, ආනයනකරුවෝ වෙළෙඳ පොළට අවතීර්ණ වී දේශීය නිෂ්පාදකයින් හා තරඟ වදිති. මෙහිදී ආරම්භක මිල තීරණය වූ මට්ටම අනුව අධික ලාභ ඉපයීමට පුළුවන් වේ නම් රට තුළට වැඩි වැඩියෙන් ආයාත ඇදී විත්, ඉක්මනින්ම හෝ කල් ගත වී හෝ මිල ගණන් පහළ වැටෙනු ඇත. මීට ප්‍රතිවිරුද්ධ තත්වයන් යටතේ මේ ක්‍රියාදාමය ප්‍රතිවිරුද්ධ දිශාවට ද ක්‍රියා කරනු ඇත.

අවසාන වශයෙන් බලන කල, නිර්බාධීකරණය නිසා, මූලික වශයෙන් **ඒකාකාරී** මිල ගණන් වර්ධනය වනු ඇත. එහෙත් සියයට සියයක්ම ඒකකාරී මිල ගණන් වර්ධනය වන්නේ ආර්ථික න්‍යායයේ කියැවෙන පූර්ණ තරගය පවතින වෙළෙඳ පොළ ව්‍යුහයන් තුළ බැව් කවුරුත් දනිති. එහෙත් අපූර්ණ තරගය (මෙය දියුණු වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක බොහෝ අංශවල දැකිය හැකිය). පවතින කල මිල ගණන් විසිරුණු තත්ත්වයක පවතී. මේ තත්ත්වය හංගේරියාවේද සිදු වනු ඇතැයි අපි අපේක්ෂා කළ යුතු වෙමු. කෙසේ වුවද, මේ තත්ත්වය 'ස්වභාවික විසිරීමකි'. ස්ථායීකරණ මෙහෙයුම මගින් අවසානයකට පත් කළ යුත්තේ, 'සුදු' වෙළෙඳ පොළේ මිල ගණන්, හා 'අලු පාට' හෝ 'කළු' කඩ මිල ගණන් අතර වෙනස, වෙළෙඳ පොළේ මිල ගණන් හා 'වෙළෙඳ පොළ හිස් කරන' මිල අතර වෙනස, අධිකාරීන් විසින් නියමිත මිල හා නිදහස් වෙළෙඳ පොළ මිල ගණන් අතර වෙනස, රජයේ ව්‍යාපාර වල මිල හා පුද්ගලික අංශයේ මිල අතර වෙනස යනාදී වශයෙන්, කෘත්‍රිම පරිදි කැබලි කරන ලද මිල පද්ධතියක පැවැත්ම ය. මිල ගණන් එකිකෙකින් වෙන් කොට තබන මෙම බැම් කඩා බිඳ දැමූ විට, ස්ථායීකරණ මෙහෙයුම බොහෝ දුරට ඒකාකාරී මිල පද්ධතියක විකාශනයට තුඩු දෙනු ඇත.

වෙළෙඳ පොළ හිස් කරන මෙවැනි ඒකාකාරී මිල ගණන් වැඩි දියුණු වීමට කොතරම් කාලයක් ගත වේදැයි කිසිවකුටත් කිව නොහැකිය. මේ පිළිබඳ

ව්‍යාජ අපේක්ෂා සිත්හි තබා ගත යුතු නැත. ප්‍රෑන්ක්ෆර්ට් හෝ සුරික් නගරවල දක්නට ලැබෙන ආකාරයේ සංවිධානාත්මක හා ඒකාබද්ධ වෙළෙඳ පොළක් ස්ථායීකරණයෙන් වසරකට පසුව හංගේරියාවේ වර්ධනය වේයයි බලාපොරොත්තු තැබිය නොහැකිය. එහෙත් වෙළෙඳ පොළේ පවත්නා 'අරාජිකත්වය' ගැන බිය නොවෙමු. අධික ලාභ ලැබීම, හා පාඩු විඳීම මෙන්ම මිල උච්චාවචන ද මෙම ක්‍රියාදාමයේ ස්වාභාවික කොටසකි. මෙතෙක් කල් හංගේරියානු මහජන මතය මෙහිදී දැරීමට සිදු වන පාඩුවලට මුහුණ දීමට පුරුදු වී සිට ඇත. මෙලෙසම අතිවිශාල ලාභ ලබන අය දෙස ඊර්ෂ්‍යා සහගත ව නොබැලීමට ද අප පුහුණුවක් ලැබිය යුතු බවත් මෙහිදී කිව යුතුය. වෙනස් වීම්වලට අනුවර්තනය විය හැක්කේ මේ පරිද්දෙනි. මෙසේ ටික දෙනකුට පමණක් වුවද අධික ලෙස මුදල් ඉපයීමට ඉඩ ප්‍රස්ථාව ඇති බව පෙනී යන විට, පුද්ගලයන් දස දහස් ගණනින් ව්‍යාපාර ක්ෂෙත්‍රයේ අවදානම්වලට මුහුණ දීමට ඉදිරිපත් වනු ඇත; නිර්ව්‍යාජ වෙළෙඳ ව්‍යාපාරවලට සම්බන්ධ වීමට පෙළඹෙනු ඇත.

නූතන හංගේරියාවේ ආර්ථික ව්‍යුහය අසමබරතාවන්ගෙන් හා නොගැළපීම්වලින් පිරී ඇත. එහෙත් නිර්ව්‍යාජ නිර්බාධී ව්‍යවසායකත්වයක් පවතී නම්, යටකී තත්ත්වය ව්‍යවසායකයින් පළවා හැරීමට නොව ආකර්ෂණය කර ගැනීමට තුඩු දෙනු ඇත. (1.1 කොටස බලන්න). ඉල්ලුම හා සැපයුම අතර පවතින අසමබරතාව වැඩි වන තරමට, ඒවායේ සමතුලිතතාවට තුඩු දෙන ක්‍රියා මාර්ගයකින් වැඩි වැඩියෙන් මුදල් උපයා ගත හැකි වේ. ඒ අතර මනා ගැළපීමකින් යුක්ත ආර්ථික ව්‍යුහයක් දක්නට ඇති රටක නම්, වැඩිපුර ආදායම් ඉපැයීම සඳහා, තාක්ෂණික නවෝත්පාදන හෝ වැදගත් නව නිෂ්පාදිත හඳුන්වා දීම හැර වෙනත් මගක් නැත. මුදල් උපයා ගැනීමට ඕනෑකම් ඇති අයට, හැල හැප්පීම් බහුල වර්තමාන ලෝකය රන් ආකරයක් වනු ඇත. කෙසේ වුවද, මේ තත්ත්වය උදා කර ගැනීමට නම් 1.1 කොටසේ කියැවුණු විධියේ ආකල්ප පිළිබඳ වෙනස්කම් හා ජනයා ගේ සදාචාර විනිශ්චයන් පිළිබඳ වෙනස්කම් අවශ්‍යය. දශක ගණනාවක් තුළ හංගේරියාවේ පැවතුණු ආර්ථික න්‍යාය, මුදල් ඉපයීමට විරුද්ධ ආකල්ප ගොඩ නැංවීමට තුඩු දී තිබිණි. එම න්‍යාය ධර්මයනට අනුව, සදාචාරමය අතින් පිළිගත හැකි එකම ආදායම් විධිය ශ්‍රමය යොදවා උපයන ආදායම් වෙයි. 'ලාභ ලැබීම' හෝ 'සමපේක්ෂණය' අපහාස කටයුතු වරදක් සේ සැලකිණි.[51] පවතින භාණ්ඩ හිඟය ප්‍රයෝජනයට

---

51. අතරමැදි වෙළෙන්දාගේ කටයුතු නැති කොට, කෘෂි නිෂ්පාදකයා හා නාගරික පාරිභෝගිකයා අතර සෘජු සම්බන්ධතාව ඇති කරවීමට දරනු ලබන ප්‍රයත්න ගැන යමක් කීමට මම කැමැත්තෙමි. සියලු නාගරික ආහාර වෙළෙඳ පොළවල් වර්ගවලට හේතු වූ මුල් බීජය මෙම පෞරාණික සම්බන්ධතාවයි. කෘෂි නිෂ්පාදකයා හා නාගරික පාරිභෝගිකයා අතර ඇති අතරමැදි වෙළෙඳාම තවමත් සැහෙන පමණින් වර්ධනය වී නොමැති වත්මන් හංගේරියාව තුළ යටකී ක්‍රමය තාවකාලික වශයෙන් භාවිත කළ හැකිය. මෙම සෘජු සම්බන්ධකම නිසා නිෂ්පාදකයා හා ගැනුම්කරුවා යන දෙපක්ෂයටම ගනුදෙනුවලින් තම තමන්ට වාසි අත් වූහයි යන හැඟීමක් ලැබේ. කෙසේ වුවද, මෙම තත්ත්වය පැවතිය හැක්කේ තාවකාලිකව පමණකි. මේ සඳහා ඇති කල් පවත්නා විසඳුම නම්, නිෂ්පාදකයින් හා ගැනුම් කරුවන් සම්බන්ධ කරන නවීන හා දියුණු අතරමැදි වෙළෙඳ ක්‍රමයක් ගොඩ නගා ගැනීමයි. විවිධ ගැනුම්කාර හා විකුණුම්කාර සංවිධාන එකිනෙක හා තරඟ වැදිය යුතුය. මේ කටයුත්ත පුද්ගලික වෙළෙන්දන් විසින් වැඩි වැඩියෙන් කර ගෙන යා යුතුය. මෙහිලා නිර්ව්‍යාජ නවීන වෙළෙඳ පොළ ක්‍රමයක් බිහි විය යුතුය. එවැනි වෙළෙඳ පොළක් තුළ, තරගය හා ව්‍යවසායකයන් අලුතෙන් ඇතුළු වීම තුළින්, වෙළෙඳාම නමැති අතරමැදි කර්ව්‍යයේ පිරිවැය හා ලාභ ක්‍රමයෙන් පහළ වැටෙනු ඇත.

ගනිමින් ලාභ ඉපයීම වංක ක්‍රියාවකැයි යන්න මෙහිලා ප්‍රචලිත තවත් සාරධර්ම විනිශ්චයකි. වෙළෙඳ පොළේ භාණ්ඩ හිඟයක් පවතින විට විකිණුම් මිල ඉහළ දැමීම ගත හැකි එකම ඥනාන්විත ප්‍රතිචාරය නොවන්නේ ද? මිල යන්න ආචාර ධර්මානුගත දෙයක් නොව ආර්ථික දෙයකි. කරුණාවෙන් මිල වැඩි නො කොට, ස්වයං විනයකින් කටයුතු කරන ලෙස විකුණුම්කරුවන්ට උපදෙස් දීමෙන් භාණ්ඩ හිඟය අවසන් කළ නොහැකිය. ලාභ ලැබීමට ඇති අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමෙන් විකුණුම්කරුවන් වළකා ලීමට බණ කීමෙන් හෝ පොලිස් ක්‍රියා මගින් නුපුළුවන. ඒ වෙනුවට අප කළ යුත්තේ, ඔවුන් 'විකුණන්නන්ගේ වෙළෙඳ පොළක්' දරන ආධිපත්‍යය අවසන් කරලීමයි. (මෙම ගැටලුවද, ආර්ථිකයේ භාණ්ඩ හිඟය අවසන් කර ගත හැකි ආකාරයද 2.8 කොටසේ සලකා බැලේ).

මිල ගණන් විෂය කර ගත් අප සාකච්ඡාව තුළම සිටිමින්, රාජ්‍ය අයිතිය යටතේ පවතින ව්‍යාපාර වෙතට නැවත වරක් යොමු වෙමු. පාඩු විඳින රජයේ ව්‍යාපාරවලට සහනාධාර දීම අවසන් කිරීමේ අවශ්‍යතාව ගැන අපි පරිච්ඡේදයේ ඉහත කොටසක සඳහන් කෙළෙමු. ඉදිරියේ ක්‍රියාත්මක වනු ඇති නව මිල පද්ධතිය පසුබිම් කර ගෙන, අපි නැවතත් මෙම අදහස ගැන සලකා බලමු. කුමන රාජ්‍ය ආයතනයක් සත්‍ය වශයෙන්ම පාඩු විඳීද, කුමන රාජ්‍ය ආයතනයක් ව්‍යාජ පාඩු වාර්තා කරන්නේද යන්න හරියටම දැන ගැනීම දුෂ්කරය. පතල් කර්මාන්තයේ දී නම් ලාභ, පාඩු ගණනය කිරීම සාපේක්ෂ වශයෙන් පහසුය. හංගේරියාවේ යුරේනියම් ආකර නිත්‍ය වශයෙන්ම පාඩු විඳින බැව් පහසුවෙන්ම දැන ගත හැකිය. එම කර්මාන්තයේ පිරිවැයට අන්තර්ගත වී ඇති සාධක සංඛ්‍යාව අඩු බැවින් හා ලෝක වෙළෙඳ පොළේ පවතින මිල ගණන් අනුව එහි නිමවුමෙහි වටිනාකම පහසුවෙන් ගණනය කළ හැකි බැවිනි. එහෙත් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙම ගණනය කොහෙත්ම නිවැරදිව කළ නොහැකි තරම්. ඊට හේතුව ඒවායේ පිරිවැය කෙරෙහි, ව්‍යාකූලවූ සහනාධාර හා බදු ව්‍යතිරේකයන් රැසකින් බලපෑම් ලබන යෙදවුම් මිල ගණන් රාශියක් බලපාන බැවිනි. සමහර විට, අද පාඩු විඳින රජයේ ව්‍යාපාර ගණනාවක්, ස්ථායීකරණ මෙහෙයුමෙන් පසුව, එම දෝෂාරෝපණයට ලක් නොවුවහොත් එය පුදුමයට කරුණක් නොවනු ඇත. මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ඇති වුවත් එයද පුදුම විය යුතු කරුණක් නොවේ. අද ලාභ විඳින රජයේ ව්‍යාපාර, ස්ථායීකරණ මෙහෙයුමෙන් පසුව, සැබෑ පිරිවැය දැරීමට හා බදු බර ඉසිලීමට සිදු වන නිසා පාඩු විඳින තත්ත්වයකට පත් වීමට ඉඩ තිබේ.

2.5 ඒකාකාර විනිමය අනුපාතිකයක් හා මුදලේ පරිවර්ත්‍යතාව හඳුන්වා දීම

ස්ථායීකරණ මෙහෙයුම ක්‍රියාවට නංවන කල, අන්‍යෝන්‍ය වශයෙන් ඉතා සම්බන්ධ පහත සඳහන් කටයුතු ඉටු කළ යුතු බැව් මම යෝජනා කරමි. (පසුව ලියවෙන කොන්දේසි සපුරා ලීමෙන් අනතුරුව).

බොහෝ ආර්ථික විද්‍යාඥයින් මා ඉහතින් කී අදහස්වලට සමාන අදහස් දරන බව මට විශ්වාසය. 'වෙළෙඳ පොළ විරෝධී' හා 'අධි ලාභ ලබන අතරමැදි වෙළෙඳාමට' විරුද්ධ ව්‍යාපාරය අයුක්ති සහගතය. ඉන් සිදු වන්නේ ආහාර ද්‍රව්‍ය වෙළෙඳාමට සහභාගි වෙමින් තරගයට එළඹීමට සුදානම් ව්‍යවසායකයින් බිය වැද්දීම පමණි.

1. **ඒකාකාර** විනිමය අනුපාතිකයක් යොදා ගත යුතුය.
2. හංගේරියානු ෆොරින්ට් මුදල **පරිවර්ත්‍ය** විය යුතුය. හැම හංගේරියානු පුරවැසියකුටම, ආයතනයකට හෝ ව්‍යාපාරිකයකුටම තම ෆොරින්ට් මුදල් විදේශ විනිමය බවට පරිවර්තනය කර ගැනීමට හංගේරියානු රාජ්‍ය බැංකුව ඉඩකඩ ලබා දිය යුතුය.
3. රජයේ ව්‍යාපාර හා පුද්ගලික අංශය මගින් සිදු කෙරෙන **සියලුම ආනයන - අපනයන කටයුතු නිර්බාධකරණය කළ යුතුය**

පුද්ගලික විනිමය ගනුදෙනු තහනම් කිරීමෙන් හා පුද්ගලික විනිමය අනුපාතිකය නීති විරෝධී බවට ප්‍රකාශ කිරීමෙන්, ඉහත සඳහන් කළ පළමු කටයුත්ත රාජ්‍ය බලය යොදා කළ නොහැකිය. මේ සම්බන්ධයෙන් 1.1 කොටසේ සඳහන් කළ සියලුම කරුණු නැවතත් අවධාරණය කරමි. රටේ සෑම පුරවැසියකුටම විනිමය මිලට ගැනීමටත්, විකිණීමටත් නිදහස තිබිය යුතුය. පුද්ගලික විනිමය අනුපාතිකයට අඩු නොවන මිලකට දේශීය මුදල් රජයේ බැංකුවේදී විදේශීය මුදලට විකිණීමටත්, ඊට වැඩි නොවන මිලකට විදේශීය මුදල් මිලට ගැනීමටත් හැකි වේ නම්, ඒකාකාරී විනිමය අනුපාතික ක්‍රමයක් පරිපාලන බලය පාවිච්චි කිරීමට සිදු වීමකින් තොර ව වැඩි දියුණු කර ගත හැක. රජයේ බැංකු මෙම තත්ත්වයට ඉඩකඩ සලසන්නේ නම්, පුද්ගලික විනිමය අනුපාතිකය තව දුරටත් පහළ බසිනු ඇත. (අනෙකුත් සාධක එක සමානව පැවතුණහොත්, අවදානමට මුහුණ පෑමේ වන්දිය ද ඇතුළත්ව සැකසී ඇති කළු කඩයේ අද පවතින අනුපාතිකයට වඩා අඩු මට්ටමක විනිමය අනුපාතිකය තීරණය වනු ඇත).

රජයේ බැංකු පද්ධතිය භාවිත කරන විනිමය අනුපාතිකය නිසා හංගේරියානු මුදල් වෙළෙඳ පොළේ උග්‍ර විෂමතා පැන නගිනු වැළැක්වීමට නම් **වෙළෙඳ පොළ හිස්කරන** විනිමය අනුපාතිකයක් අවශ්‍ය වේ. මෙය කුමක් විය යුතු දැයි නිශ්චිතවම කිව නොහැකිය. එය ස්ථායීකරණ වැඩ පිළිවෙළෙහි ප්‍රගතියත්, එය පටන් ගන්නා තුරු උද්ධමන අනුපාතිකය හැඩ ගැසෙන ආකාරයත් මත රඳා පවතිනු ඇත. ඒ කෙසේ වෙතත්, දැනට පවත්නා අලුපැහැ වෙළෙඳ පොළේ පෞද්ගලික විනිමය අනුපාතිකය, නිවැරදි විනිමය අනුපාතිකය තීරණය කිරීමට යොදා ගත යුතු ප්‍රධාන පදනමක් වනු ඇත. තවද 1.1 කොටසේ විස්තර වූ පරිදි ස්ථායීකරණ මෙහෙයුම ආරම්භ කිරීමට පළමුව පෞද්ගලික මුදල් වෙළෙඳ පොළේ කටයුතු නීත්‍යානුකූල කරන ලද හොත්, ඉන් බිහිවන සුදු පැහැ වෙළෙඳ පොළේ පුද්ගල විනිමය අනුපාතිකය මෙහි ලා වඩාත් වැදගත් මිනුම් දණ්ඩක් වනු ඇත.

ෆොරින්ට් මුදල අවප්‍රමාණය කිරීම මෙහෙයුමේ එක් අංගයක් විය යුතු බව පැහැදිලිය. අවප්‍රමාණය කළ යුතු ප්‍රමාණය තීරණය විය යුත්තේ, මෙතෙක් අප සාකච්ඡා කළ සාධක හා මෙහෙයුමට පෙර කාලයෙහි නිල හුවමාරු අනුපාතිකය හැසිරෙන ආකාරය අනුවය.

රාජ්‍ය බැංකු අංශය, මුදලේ පරිවර්ත්‍යතාව ඇති කිරීමට යාමට පෙර කොන්දේසි ගණනාවක් සම්පූර්ණ විය යුතුය. ඉන් දෙකක් ඉස්මතු කොට දැක්වීමට මම කැමැත්තෙමි.

ඉන් ප්‍රධානම කාර්යය වනුයේ වෙනත් පරිවර්ත්‍ය වන විදේශීය විනිමය සඳහා ඇති ඉල්ලුම පාලනය කර ගැනීමයි. මේ සම්බන්ධයෙන් දුෂ්කරම ගැටලු ඇති වන්නේ **රාජ්‍ය අංශයෙනි**. එවැනි විදේශීය විනිමය වර්ග සඳහා රජය සතු

ව්‍යාපාරවලින් කෙරෙන ඉල්ලුම (හෝ පරිවර්ත්‍ය මුදලින් ගෙවිය යුතු ආනයන වලට ඒවායින් කෙරෙන ඉල්ලුම) පාලන විරහිතව ඉහළ යාම වළක්වා ලිය යුතුය. මේ පිළිබඳ අපගේ අතීත අත්දැකීම් එ තරම් සහනශීලී නොවේ. ලිහිල් අය වැය සංරෝධක යටතේ රජයේ ව්‍යාපාර, බටහිර රටවලින් කෙරෙන ආනයන සඳහාත්, පරිවර්ත්‍ය විදේශීය විනිමය සඳහාත් දක්වා ඇත්තේ අතෘප්තිකර ආශාවකි. ඒ සඳහා පසුව ගෙවීම සඳහා කෙසේ හෝ පොරින්ට් මුදල් සපයා ගත හැකි වූ නිසා විදේශීය විනිමය මිලට ගැනීම ඒවා සිය ප්‍රමුඛතාව කොට ගති. මෙම ආශාව අඩු කර ගැනීමට නම් රජයේ ව්‍යාපාර අතට පත් වන පොරින්ට් මුදල් ප්‍රමාණය අඩු කළ යුතු අතර, යථාර්ථවත් වූද, වෙළෙඳ පොළ හිස් කරන්නාවූ ද විනිමය අනුපාතිකයක් භාවිත විය යුතුය. මේ සම්බන්ධයෙන් මතු වන තීරණාත්මක ප්‍රශ්නය නම්, 1.2 හා 2.3 කොටස් වල සඳහන් කෙරුණු දෘඪ මූල්‍ය ප්‍රතිපත්තියක් හා රාජ්‍ය අංශයට දෙන ණය පිළිබඳ දැඩි සංරෝධක පවත්වා ගත හැකි ද යන්නයි. මෙය කළ හැකි නම්, රටේ විදේශ විනිමය ශේෂයට හානියක් සිදු නොවන පරිදි මුදලේ පරිවර්ත්‍යතාව පවත්වා ගත හැකි වේ. නොඑසේ නම්, නැවත වරක් ගැටලු පැන නගිනු ඇති අතර, එහිදී රජයේ ව්‍යාපාරවලට දෙනු ලබන විනිමය සලාක කිරීම හැර කළ හැකි අනිකක් නොවනු ඇත. මෙම විසඳුමෙහි දුර්වලතා ඇතත්, රාජ්‍ය අංශය ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගන්නා තාක් කල් ගත හැකි ක්‍රියාමාර්ග අතර විනිමය සලාක කිරීම විකල්පයක් හැටියට තබා ගත යුතුමය. ස්වභාවයෙන් ම දැඩි අය-වැය සංරෝධකයන්ගෙන් බැඳී සිටින පෞද්ගලික ව්‍යාපාරවලින් නම් මෙවැනි තර්ජන ඉදිරිපත් නොවේ.

තවද, සුදුසු වේගයට වඩා වැඩි වේගයකින් නාමික වැටුප් මට්ටම් ඉහළ ගියහොත් විදේශීය විනිමය සඳහා කුටුම්බවලින් එල්ල වන ඉල්ලුම ද, සැලසුම් ගත මට්ටමට වඩා වැඩි විය හැකිය. අනෙක් අදාළ අවස්ථාවන්හි දී මෙන්ම මෙහි දී ද දැඩි වැටුප් විනය මූලික අවශ්‍යතාවකි.

විනිමය අනුපාතිකය යථාර්ථවත් මට්ටමක ස්ථාවරව තබා ගැනීමටත් මුදලේ පරිවර්ත්‍යතාව රැක දීමටත්, අවශ්‍ය තවත් කොන්දේසියකි, රජය සතුව සෑහෙන විනිමය සංචිත ප්‍රමාණයක් තිබීම. ඒවා ජාතික බැංකුව සතුව ඇත්ත වශයෙන් පවතින විනිමය වශයෙන් හෝ, කැමති විටක පාවිච්චි කළ හැකි පරිදි, විදේශවලින් ලබා ගත් ණය වශයෙන් හෝ තබා ගත හැකිය. රජය සතුව ප්‍රමාණවත් සංචිත තිබේ නම් විදේශීය විනිමය සඳහා අධික ඉල්ලුමක් ඇති වූ කල, එය පාලනය කර ගැනීම සඳහා, නිර්බාධ විනිමය වෙළෙඳාම අත් හිටුවීමට රාජ්‍ය බැංකු ක්‍රමයට සිදු නොවෙනු ඇත. ඒ වෙනුවට, සංචිතවලින් අවශ්‍ය විනිමය ලබා ගැනීමට හැකිය. එහෙත් ඉල්ලුම හා සැපයුම අතර සමතුලනය නැවත ඇති කිරීම සඳහා නියත වශයෙන්ම පියවර ගත යුතුය. එබඳු පියවර නම් දේශීය මුදලින් ප්‍රකාශිත සාර්ව ඉල්ලුම (ඒ අතර අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි විදේශ විනිමයක් ඉල්ලුම් කරන අංශයේ ඉල්ලුම) අඩු කිරීම, නැවත වරක් පොරින්ට් මුදල අවප්‍රමාණය කිරීම යනාදියයි. විදේශ විනිමය සංචිත මාතෘකාවට 2.7 කොටසෙහි දී නැවත අපි යොමු වෙමු.

යථාර්ථවූද, වෙළෙඳ පොළ තුලනය කරන්නාවූද ඒකීය විනිමය අනුපාතිකයක් හා මුදලේ පරිවර්ත්‍යතාව පවතී නම් ආනයන නිර්බාධීකරණයට එය පහසුවක් වේ. (එසේ වන්නේ කලින් සඳහන් කරන ලද කොන්දේසි සියල්ල සපුරා ලුවොත් පමණි.) එවිට ආර්ථිකයේ සෑම කෙනකුටම ආනයන කටයුතු

කර ගෙන යාමට ඉඩදීම නිරවද්‍ය පියවරක් වනු ඇත. එහෙත් මීට ඉහත සඳහන් කළ කොන්දේසි අසම්පූර්ණ වුවහොත්, දැඩි අවධානමකට මුහුණ නොදී නිදහස් කළ හැකි වන්නේ පුද්ගලික ආනයන පමණි. ආනයන සඳහා රාජ්‍ය අංශයෙන් එල්ල වන ඉල්ලුම සඵල වූ පාලනයකට හසු නො කොට, රජයේ ව්‍යාපාරවලට ආනයනය සඳහා පූර්ණ නිදහස දුනහොත් එය භයානක තත්ත්වයක් බිහි කරනු ඇත.

මෙතෙක් සඳහන් කළ සියලු කටයුතු ඉටු කර ගතහොත්, රටේ කෙටි කාලීන බාහිර හා අභ්‍යන්තර මූල්‍ය තුලනය නැවත ළඟා කර ගත හැකි වෙනවා පමණක් නොව, රටේ නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක දියුණුවකට ද ඉන් ඉඩ සැලසෙනු ඇත. රාජ්‍ය හෝ පෞද්ගලික අයිතිය යටතේ ඇති ව්‍යාපාර වේවා, දේශීය හෝ විදේශීය ව්‍යාපාර වේවා, ඒවාට නිර්බාධිව ආනයන කටයුතු කිරීමට ඉඩ සැලසීම විකුණුම් කරුවන් අතර තරගය සඳහා අත්‍යවශ්‍ය වේ. මහජනයාට අවශ්‍ය දේ හොඳින් සපයනු ලැබීමටත් හිඟකම් මුලිනුපුටා දැමීමට හා තාක්ෂණික මට්ටම් ඉහළ යාමටත්, මෙම තරගය දැඩි ප්‍රොත්සාහකයක් වනු ඇත.

2.6 එක්වර ඇයි?

මීට ඉහත විස්තර වූ සියලු කරුණු එක එකක් ගැන සැවොම හොඳාකාරව දනිති. ඉන් බොහොමයක් එක්කෝ අඩ වශයෙන් ක්‍රියාත්මක කර ඇත. නොඑසේ නම් ක්‍රියාත්මක කිරීමට ආසන්න තත්ත්වයක ඇත. මේ අතර උද්ධමන වේගය අඩු කරන බවට නිතර නිතර පොරොන්දු දී ඇත. තවද, රජයේ වියදම් අඩු කිරීමටත්, අයහාරය වැඩි කිරීමටත් පියවර විටින් විට ගෙන ඇත. මූල්‍ය සීමා කිරීම ඉතාමත් උනන්දුවෙන් ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ. එමෙන්ම සමහර මිල ගණන් දැනටමත් නිර්බාධිව ක්‍රියාත්මක වේ.

මෙතැන දක්නට ලැබෙන ගැටලුව මෙම වෙනස්කම් එකිනෙක හා ගැටෙන සුළු හා මන්දගාමී වීම ය. එක් ක්‍රියාමාර්ග පෙළක් ක්‍රියාත්මක කරන විට, එහි පවත්නා නොපැහැදිලි ගතිය, අනිකුත් ක්‍රියාමාර්ගයන්හි කාර්යක්ෂමතාවට බාධා පමුණුවයි. අර්ධ ප්‍රතිඵල ගෙන දෙන, එකිනෙකට වෙනස් ක්‍රියාමාර්ග දහයකින් සම්පූර්ණ ක්‍රියාමාර්ග පහක් සෑදෙන්නේ නැත. ඒ වෙනුවට ඒවා පූර්ණ අසාර්ථක වීම් පහක් වනු ඇත. අප මෙතෙක් සාකච්ඡා කළ සෑම පියවරකම සාර්ථකත්වය අන් ඒවා මත රඳා පවතී. උද්ධමනය අවසන් කළ හැක්කේ අය-වැය තුලනය ළඟා කර ගතහොත් පමණි. අය-වැය තුලනය කර ගත හැකි වන්නේ බදු පිළිවෙත සම්පූර්ණයෙන්ම නව පදනමක් අනුව හැඩගස්වා ගැනීමෙනි. උද්ධමනකාරී තත්ත්වයක් මධ්‍යයේ අය-වැය තුලනය කළ නොහැකි වන්නේ, වැය පක්ෂය හා සසඳන විට අයහාරය සෑම විටම වඩා ප්‍රමාද වී ලැබෙන හෙයිනි. එබැවින් වැය වැඩි වන තරමින් ආදායම වැඩි නොවන පරිදි උද්ධමනය ක්‍රියාත්මක වේ. පාඩු විඳින ව්‍යාපාර සඳහා දෙන සහනාධාර නැවැත්විය හැකි ද නැද්ද යන්න නව බදු පද්ධතියක් හඳුන්වා දීම මත රඳා පවතී. එසේම එය සමතුලිත මිල ගණන් යටතේ නියම වශයෙන් ලාභ හෝ පාඩු විඳින ව්‍යාපාර මොනවා දැයි තීරණය කිරීම මත ද රඳා සිටී. ශීඝ්‍රයෙන් ඉහළ නගින උද්ධමනය මධ්‍යයේ අව්‍යාජ මිල ක්‍රමයක් ඇති විය නොහැකිය. මිල අර්ධ වශයෙන් හැඩ ගැස්වීමෙන් විචාරවත් මිල ක්‍රමයක් ගොඩ නොනැගේ. එවැනි හැඩ ගැස්වීම් උද්ධමන වේගය වැඩි කිරීමට තුඩු දිය හැකිය. මෙකී ව්‍යාකූල

වූ ද, අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ ද ගැටලු අතරට තවත් නිදසුන් දුසිම් ගණනින් එකතු කළ හැකි වේ. මේ සියල්ල එකට ගත් විට, අදාළ ස්ථායීකරණ සැත්කම එක පෑන් පහරින් කළ යුත්තේ ඇයි ද යන්නට ආර්ථික අර්ථකථනයක් ලැබේ.

අවධාරණයය සඳහා **නිෂේධනාත්මක** ප්‍රකාශයක් ප්‍රයෝජනයවත් වනු ඇත: ස්ථායීකරණ සැත්කමෙහි ප්‍රතිපත්ති, සියල්ල එකට ගත් විට වැඩ දායී වන බොහෝ ක්‍රියාමාර්ග, තනි තනියෙන් ක්‍රියාත්මක කරන කල හානිකර හා විනාශකාරී ප්‍රතිඵල ගෙන දෙයි. නිදසුනකින් පැහැදිලි කළහොත්, වැටුප් විනයකින් තොරව, මිල පද්ධතිය පූර්ණ වශයෙන් නිර්බාධී කිරීම දැඩි ලෙස හානිකර වෙයි. තවද, රාජ්‍ය අංශයෙන් විනිමය සඳහා ඇති ඉල්ලුම දැඩි ලෙස පාලනය නොකොට ව්‍යවහාර මුදලේ පූර්ණ පරිවර්ත්‍යතාව ඇති කිරීම අනතුරු දායකය. මෙවැනි නිදසුන් කොතෙකුත් ඉදිරිපත් කළ හැක. ඉහත සඳහන් වූ අනතුරු සැබෑවක්ම මිස සිහිනයක් නම් නොවේ. මෙතෙක් ක්‍රියාත්මක කළ ස්ථායීකරණ ක්‍රියා මාර්ග එකක් පසු අනෙක බැගින් අසාර්ථක වූයේ, ඊට උචිත ආර්ථික පරිසරයක් ගොඩ නැඟී නොතිබුණු නිසා ය. එසේම බලධාරීන් පැවතුණු ආර්ථික පරිසරයෙන් පරිබාහිරව ගොඩ නගා ගත් ඉලක්ක යටතේ ඒවා කඩිමුඩියේ ක්‍රියාත්මක කළ නිසාය.

මෙම **ආර්ථික** විග්‍රහයට තවත් තර්ක දෙකක් මම ඉදිරිපත් කරමි.

ඉන් පළමු වැන්න ආර්ථික - මනෝ විද්‍යාත්මක තර්කයකි. උද්ධමනය අවසන් කිරීමට නම් උද්ධමන අපේක්ෂණයන් මූලික වශයෙන් වෙනස් කළ යුතුය. මෙම කරුණ ගැන මීට පෙර ද අපි කථා කෙළෙමු. උද්ධමන අනුපාතිකය සියයට 20 කින් වැඩිවේ යයි සේවා යෝජකයින්, සේවකයින්, ව්‍යාපාරිකයින් හා මුදල් ළඟ තබා ගන්නන් අපේක්ෂා කරතොත්, වෙළෙඳ පොළේ මිල ගණන් හා වැටුප් සියයට 20 කින් ඉහළ නංවන සේ ඉල්ලීමට හා එලෙස ඉහළ දැමීමට ඔවුහු පෙළඹෙති. උද්ධමන අපේක්ෂණ පිළිබඳ විෂම චක්‍රය ස්ථායීකරණ මෙහෙයුමක් තුළින් විනාශ කර දැමීමට පුළුවන. එහෙත් ඒ සඳහා, කැප වීමෙන් යුතු විශ්වාසදායක හා මහජන සැලකිලි ලබන ආණ්ඩුවක් අවශ්‍ය වේ.

මගේ දෙවන තර්කය මානවහිතවාදී අංශයෙන් ඉදිරිපත් කෙරෙන්නකි. හංගේරියානු ජනතාව තත්කාලීන ආර්ථික ව්‍යාධීන්ගෙන් දැඩි ලෙස පෙළෙමින් සිටිති. රටේ ජනතාවගේ දුක තුරන් කිරීම දේශපාලන සංවිධානවල ද, දේශපාලන පක්ෂවල ද, රාජ්‍ය ආයතනවල ද මූලික යුතුකමකි. රටේ ආර්ථිකය පුනරුත්ථාපනය කිරීමට දැඩි කැප කිරීම් කළ යුතුව ඇතත්, එම කැප කිරීම් අවශ්‍ය වන කාලපරිච්ඡේදය දිගින් දිගට ඇදී යා යුතු නොවේ. පුද්ගලයකු සුව කිරීමට ඇති ප්‍රත්‍යක්ෂ පිළියම කකුලක් කපා දැමීම නම්, සති මාස ගණනක් මුළුල්ලේ වරකට කකුලෙන් කෑල්ලක් බැගින් කපා දමමින් රෝගියාට දුක් විඳීමට නොසලස්වා, නිර්වින්දක පාවිච්චි කොට, එක් ශල්‍ය කර්මකින් එය නිම කර දැමීම වඩා මානුෂික ක්‍රියාවකි. 19 වන සිය වසේ හංගේරියාවේ පහළ වූ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කරණවාදී දේශපාලනඥයකු හා ප්‍රමුඛ පෙළේ ආර්ථික විද්‍යාඥයකු වූ ඉස්ට්වාන් සෙචෙන්යි අතින් ලියැවුණු 'ණය' නැමැති කෘතියේ ඔහු මෙවැනි දත් ගැලවීමේ උපහැරණයක් යොදා ගෙන ඇත. 'යම් දන්ත ශල්‍ය වෛද්‍යවරයකු තේරුමක් නැති අනුකම්පාවකින් යුතුව

ක්‍රම ක්‍රමයෙන් දිගු කලක් මුළුල්ලේ දතක් ටික ටික ගැළවීමට වෑයම් කළ හොත් එය කෘර ක්‍රියාවක් වනු ඇත."[52]

දැනට රටේ මහජන ශුභ සිද්ධියට සති පතා සිදු වන කෙනෙහිලිකම් නිසා මහජනතාව කලකිරීමට පත්ව සිටිති. මස් මිල ඉහළ යාම වැන්නක් මුල් කර ගෙන පවා කම්කරුවන් ලවා වැඩ වරණය කරවිය හැකි තත්ත්වයක් රටේ පවතින අතර, ටිකින් ටික සිදු වන දේ අනුව ඊටත් වැඩියෙන් පාඩු විඳින කුටුම්බයන් ලක්ෂ ගණනින් රටේ තිබුණ ද, ඔවුහු ඒවා ඉවසිලිමත්ව දරා සිටිති. අනාගතයේ දී අදාළ ක්‍රියාමාර්ගය තුළින් උසස් ජීවන මට්ටමක් ලබා ගත හැකි වන බවට විශ්වාසයක් ඇත් නම්, මහජනයා, නිසි ප්‍රතිඵලයක් ගෙන නොදෙන, දිගින් දිගට ඇදී යන වේදනාවන්ටත්, හෙමින් හෙමින් සිදු වන ආර්ථික පහළ බැස්මකට හා ඒ තුළින් විටින් විට ඇති වන සමාජයීය අර්බුදයන්ටත්, මුහුණ දී සිටිනවාට වඩා, එක්වර ඇති කරනු ලබන දැඩි කම්පනයකට මුහුණ දී, සියල්ල විඳ දරා සිටීමට සූදානම් ය යන්න ගැන මගේ හිතේ තදබල විශ්වාසයක් පවතී.

2.7 මානවහිතවාදී හා ආර්ථික සංචිත

ස්ථායීකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන විට ඊට සමාජය සූදානම් කිරීම් වස් උචිත සංචිත පවත්වා ගත යුතුය. මෙහිලා එවැනි සංචිත සිවු වර්ගයක් අත්‍යවශ්‍යය.

1. ඉතාමත් ම වැදගත් වනුයේ 'මානවහිතවාදී' සංචිතයයි. යෝග්‍ය ජනතා අධීක්ෂණයක් යටතේ ඉතාමත්ම දුගී ජනයාට සහන සැලැස්වීමට යොදා ගත හැකි මුදල් සංචිතයකි මේ. මෙහෙයුමෙන් පසුව වෙළෙඳ පොළේ ඇති වන නව නැම්මට කෙදිනක හෝ අනුවර්තනය වීමට සැමටම සිදු වනු ඇත. මෙම අලුත් තත්ත්වයට හැඩ ගැසීමට කිසිදාකත් නොහැකි අයට සහාය වීමට ප්‍රමාණවත් ශුභසාධන ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ. මේ පිළිබඳ සවිස්තර සාකච්ඡාවක් ඊ ළඟ පරිච්ඡේදයේ ඇත. වෙනත් ආකාරයකට කිවහොත්, මා මේ කථා කරන්නේ, සෑම මානවහිතවාදී සමාජයක ම පැවතිය යුතු සදාකාලික ආරක්ෂක දැලක් ගැන නොව, මෙහෙයුම ක්‍රියාත්මක කරන පළමු අවුරුද්ද, දෙක තුළ දී සැපයිය යුතු හදිසි ආපදා සහනයන් සම්බන්ධවය. දෙපයින් සිට ගැනීමට හැකි අයට ද මෙම ආධාර දීම යුක්ති සහගතය. එහෙත් මෙවැනි ආධාර තාවකාලික බව හොඳින් ඒත්තු ගැන්විය යුතු වේ. නව ක්‍රමය යටතේ, දියේ නොගිලී තම ශක්තියෙන් ම පිහිනා යාමට, ඉක්මනින් හෝ කල් පසුවී හෝ හැකි හැම දෙනකුම එසේ කළ යුතු යැයි සමාජය අපේක්ෂා කරයි. සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට පුළුවන් අය වෙනුවෙන් අනුග්‍රහශීලී වීම අනවශ්‍යය.

2. අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය, ඉන්ධන හා වෙනත් බල ශක්ති මූලාශ්‍ර යනාදී **භාණ්ඩ හා ශක්‍යතා සංචිත** පවත්වා ගත යුතුය. මෙහෙයුම ආරම්භයේදී, ඊට හැඩ ගැසීමේ ක්‍රියාදාමය අර්බුදකාරී එකක් විය හැක. එහෙත් රජය සතුව ප්‍රමාණවත් සංචිත තිබේ නම්, එමගින් මෙහිදී පැන නගින අර්බුදකාරී අවස්ථා මග හරවා ගත හැකි වේ.

---

52. Szechenyi (1979) p.214. මෙම කියමන වෙත මගේ අවධානය යොමු කළේ කැතලින් සාබෝ ය.

3. තාවකාලික අර්බුද මග හරවා ගැනීමට උපකාරි වන අසාමාන්‍ය ආනයනයන් සඳහා සැහෙන විදේශ විනිමය සංචිත මුදා හැරීමට රජයට පුළුවන්කම තිබිය යුතුය. එසේම 2.5 කොටසේ විස්තර වූ පරිදි මුදලේ පරිවර්ත්‍යතාව පිළිබඳ සිය පොරොන්දු ඉටු කිරීමට ද රාජ්‍ය බැංකු සතුව මෙවැනි විදේශ විනිමය සංචිත තිබිය යුතුය. විදේශ විනිමය සඳහා බලාපොරොත්තු වූවාට වඩා වැඩි ඉල්ලුමක් ඇති වුවහොත් එම ඉල්ලුම පියවීමට පළමුව මුදල් ගත යුත්තේ මෙම සංචිතවලිනි. (මෙවැනි තැනක මෙලෙස ගනු ලබන පළමු ප්‍රතික්‍රියාවන්ගෙන් පසුව, විදේශ විනිමය වෙළෙඳ පොළේ සමතුලිත භාවය නැවත ඇති කිරීමට ගත යුත්තේ කුමන ක්‍රියා මාර්ගයක් ද යන්න වෙනම කාරණයකි.)

4. රාජ්‍ය අංශයටත්, පෞද්ගලික අංශයටත් වෙන් කොට ඇති සාමාන්‍ය ණය ප්‍රමාණයට අමතරව **ණය සංචිත සලාක** පවත්වා ගත යුතුය. ස්ථායීකරණයෙහි දී රජයේ හෝ පෞද්ගලික අංශයේ යම් ව්‍යාපාරයක් අනපේක්ෂිත ලෙස ද්‍රවශීලතා ප්‍රශ්නවලට මුහුණ දේ නම් ඉන් ගැළවීමට මෙම ණය සලාක උදව් කර ගත හැකි වේ. මෙම ණය මෙවැනි ව්‍යාපාරවලට වෙළෙඳ පොළ පොළී යටතේ දෙනු ලබන ණය මිස, ලිහිල් කොන්දේසි යටතේ පහසුවෙන් ලබා දෙන ආධාර මුදල් නොවිය යුතුය. දෙනු ලබන ණය මුදලේ ආධාරයෙන් ව්‍යාපාරය දුෂ්කර තත්ත්වයෙන් මිදී ඒමට සමත් වෙතොත් එය වටිනා ක්‍රියා මාර්ගයකි. ව්‍යාපාරය අසාර්ථක වුවහොත් ණය මුදල අපතේ යනු ඇත. එවැනි තැනකදී එම ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද කිරීමට හෝ අලුත් ණය මුදල් ගැනීමට හෝ ඊට ඉඩ නොතැබිය යුතුය. ස්ථායීකරණ මෙහෙයුමේ සාර්ථක ප්‍රතිඵලය විය යුත්තේ, වෙළෙඳ පොළේ තරගය තුළින් ඇති වන, කර්කශ වන නමුත් ස්වාභාවිකව සිදු වන, දක්ෂ අදක්ෂ ව්‍යාපාර තෝරා බේරා ගැනීමේ ක්‍රියාවලිය වඩා ශක්තිමත් කිරීමයි. එම තරගය හමුවේ බිඳ නො වැටී පැවතීමට තමන්ට හැකි යයි සිතන ව්‍යාපාරවලට ඒ සඳහා දෙන අවසාන අවස්ථාව මෙවැනි පරිවර්තනමය ණය දීමනා විය යුතුය.

මෙම සංචිත සිවු වර්ගය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය මෙහෙයුම් සැලැස්මට අන්තර්ගත විය යුතුය. ස්ථායීකරණ මෙහෙයුම් ක්‍රියාමාර්ගය වත්කම් බැරකම් තුලනය වන පරිදි සකසා ඇත්තේ වුවද, ඉහත කී අර්බුදකාරි අවස්ථාව ගෙවා ගැනීම සඳහා කේවල සහන දීමනා ක්‍රමද, කලින් සැලසුම් නොකළ ආනයන ගෙන්වීම් ද, ආයතනවලට පරිවර්තනමය ණය දීම් ද කරමින්, පසුව එම තුලනය නැති වී යන්නට ඉඩ දුනහොත්, එය ස්ථායීකරණ මෙහෙයුම අසාර්ථක වීමට නිසැකවම තුඩු දෙනු ඇත. එවැනි අසාමාන්‍ය අරමුණු සඳහා අවශ්‍ය සංචිත කල්තියාම වෙන් කොට තබා ගත යුතුය. එවැනි අරමුණු සඳහා වෙන් කර ඇතිවාට වඩා වැඩිපුර, එකම ෆොරින්ට් ඒකකයක්වත්; ඉහත කී විධියේ අරමුණු සඳහා නොයෙදවිය යුතුය.

2.8 ජාත්‍යන්තර පරිසරය තුළ ස්ථායීකරණ මෙහෙයුම

ස්ථායීකරණ මෙහෙයුම මූලික වශයෙන් හංගේරියාවේ දේශීය සම්පත් හා ස්ව ශක්තිය පදනම් කර ගත යුතුය. සැලසුම් - කරණයේ දී විදේශීය ආධාර

සැලකිල්ලට ගත යුත්තේ එය ලැබෙන බවට ස්ථිර සහතිකයක් ඇත්නම් පමණි. මෙම අර්ථයෙන් බලන කල, සැලැස්ම අශුභවාදී මෙන්ම ප්‍රවේශමිකාරී ද විය යුතුය. බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා වැඩියෙන් විදේශාධාර ලැබුණොත්, අතිරික්තය ප්‍රයෝජනවත් පරිදි පරිහරණය කිරීමේ ප්‍රශ්නයක් නැත.

පළමු පරිච්ඡේදයේ විස්තර කළ වෙනස් කම් හා ස්ථායීකරණ මෙහෙයුම නිසා විදේශාධාර ලැබීමේ අවස්ථා පුළුල් වනු ඇතැයි මම විශ්වාස කරමි. මෙම තත්ත්වය පසු බිමෙහි ලා කළ යුතු වඩාත් වැදගත් කටයුතු මොනවා දැයි දැන් අපි සලකා බලමු.

1. වර්තමාන රජයත්, නව පශ්චාත්-මැතිවරණ රජයත් කොමිකොන් රටවල් සමඟ ඇති සබඳතා පරිස්සමින් නැවත හැඩ ගස්වා ගත යුතුය. මෙහිලා දිගු කාලීන අරමුණු සංකීර්ණය. එක් අතකින්, හංගේරියාව අපනයන හා ආනයන දෙවර්ගයම සම්බන්ධයෙන් එම රටවල් මත ඇති රැඳියාව අඩු කර ගැනීමට උනන්දු විය යුතුය. අනෙක් අතින්, විදේශීය වෙළෙඳාම පිළිබඳ වැඩි වාසි දායක ව්‍යුහයක් ගොඩ නඟා ගත යුතුය.

   කොමිකොන් රටවල් සමග හංගේරියාව ගොඩ නගා ගෙන ඇති අපනයන සබඳතාවල දක්නට ලැබෙන ඉතාම වැදගත් දිගුකාලීන අවාසිය වනුයේ එම රටවල වෙළෙඳ පොළේ, භාණ්ඩවල පහළ ගුණාත්මක භාවය ය. ඉහළ ප්‍රමිතීන් නොමැති කමත්, ඉල්ලුම, ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් භාණ්ඩ සඳහා නොවීමත් නිසාය, මෙම වෙළෙඳ පොළවලට භාණ්ඩ සැපයීමට රජයේ ව්‍යාපාර විශාල කැමැත්තකින් ඉදිරිපත් වනුයේ. පරිවර්ත්‍ය මුදල් භාවිත වන වෙළෙඳ පොළවල අලෙවි කරනවාට වඩා පහසුවෙන් මෙවැනි වෙළෙඳ පොළක භාණ්ඩ අලෙවි කළ හැකිය. ගුණාත්මක බවින් වැඩි භාණ්ඩ ඉල්ලුම් කරන වෙනත් වෙළෙඳ පොළවල් දෙසට ක්‍රමයෙන් හංගේරියාව හැරිය යුත්තේ මේ නිසාය. මේ අතර, සිදු වෙන දේශපාලන වෙනස් වීම් මධ්‍යයේ වුවද කලින් පවත්වා ගෙන ගිය ව්‍යාපාරික සම්බන්ධතා පවත්වා ගෙන යාමට හංගේරියානු රජය විශේෂ උත්සාහයක් දැරිය යුතුය. යම් ව්‍යාපාරික කොන්ත්‍රාත්තුවකට අත්සන් කළ පසු, එම ගිවිසුම ඒක පාක්ෂිකව අවලංගු නොකළ යුතුය යන්න අවංක වෙළෙඳාමක පළමුවෙනි රීතිය වේ. අවශේෂ ලෝකය හංගේරියාව මත තබා ඇති විශ්වාසය කිසි විටෙකත් පලුදු කර නො ගැනීම වැදගත්ය. යම් ආර්ථික ගිවිසුමක් ඒකපාක්ෂිකව අවලංගු කිරීම පිළිගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ හදිසි අවස්ථාවක් සම්බන්ධයෙන් පමණි. එය ද කළ යුත්තේ, පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුවය.

2. හංගේරියාව හා බටහිර ආර්ථිකයන් අතර සබඳතා පිළිබඳව කථා කිරීමේ දී පෞද්ගලික විදේශීය ප්‍රාග්ධනය ආශ්‍රිත ගැටලු ගැන වචන කිහිපයක් කතා කිරීම වැදගති. බටහිර රටවල් හා ජාත්‍යන්තර සංවිධාන හංගේරියාව සම්බන්ධයෙන් දක්වන ආකල්ප ගැන, පොදු විවාදවලදී ඕනෑවට වඩා වැඩි සැලකිල්ලක් දැක්වීම, මෙම කරුණට වඩාත් වැදගත් තැනක් ලබා දෙයි. හංගේරියාව සම්බන්ධයෙන් සාමාන්‍ය බටහිර ජාතිකයින් හැසිරෙන ආකාරය වැදගත්ය. ඒ සම්බන්ධයෙන් වඩාත් ම වැදගත් වන්නේ, බටහිර ව්‍යාපාරිකයින් ගේ, ව්‍යවසායකයින් ගේ හා

පුද්ගලික ව්‍යාපාර කළමනාකරුවන් ගේ ආකල්ප බැව් මගේ විශ්වාසයයි. 'ධනවාදී ජාත්‍යන්තරයක්' බිහි වී නැත; ලෝක ධනවාදීහු එක්සත් නො වූවාහු ය. වොෂින්ටන් වේවා, බොන් වේවා, ටෝකියෝ වේවා, කිසියම් ධනවාදී කේන්ද්‍රස්ථානයක සංගීතයට මොවුන් නැටවිය නොහැකිය. ඔවුන්ගේ ආර්ථික කටයුතු මෙහෙයවන මූලික බලවේගය නම් වෙළෙඳ පොළේ අදෘශ්‍යමාන හස්තයයි. ඔවුන් කටයුතු කරන්නේ අත්හදා බැලීම් ඇසුරින් වැරදි වැරදී, නැවත නැවත එම වැරදි හරි ගස්සා ගැනීම මගිනි. ඔවුහු හංගේරියානු රජයේ නිල ප්‍රකාශනවලට සවන් දෙති. එහෙත් ඔවුන් වැඩි අවධානයක් යොමු කරන්නේ, සිය ව්‍යාපාරික සගයින් හංගේරියාවේ දී ලැබූ අත්දැකීම් ගැන සමාජශාලා ආදියෙහි කෙරෙන කතා බහටය. හංගේරියාව තුළදී තමන් දන්නා අයකුට විදින්නට සිදු වූ නොයෙකුත් පරිපාලන අතවර ගැන අත්දැකීම් අසන්නට ලැබීම, ආණ්ඩුව නිකුත් කරන සහතික සියයක බලය බිඳ හැරීමට සමත්ය. තමන්ගේ ම පුරවැසියන්ට විරූපී මුහුණක් ද, බාහිර ලෝකයට ප්‍රසන්න මුහුණක් ද යනුවෙන් මුහුණු දෙකක් සමාජ-ආර්ථික පද්ධතියක තිබිය නොහැක. බුඩාපෙස්ට් අගනුවර අලංකාර ලෙස නිමැවුණු බටහිර පන්නයේ බැංකු පවතින අතර, ප්‍රාදේශීය නගරවල ග්‍රාහකයින්ට අගනුවරට දුරකථනයෙන් කථා කළ නොහැකි තත්ත්වයක්, සාමාන්‍ය බැංකු ගනුදෙනුවක දී පවා ප්‍රාදේශීය නගරවල ගනුදෙනු කරුවන්ට පැය ගණන් පෝලිමේ සිටීමට සිදු වීමේ තත්ත්වයක් පවත්වා ගත නොහැකි ය.

කෙසේ වෙතත්, මෙරට පෞද්ගලික අංශයේ ආර්ථික මට්ටම, සංස්කෘතිය හා නිදහස වර්ධනය වන තරමට, එය, බටහිර ව්‍යාපාරික ලෝකයේ ඓන්ද්‍රිය කොටසක් බවට පත් වෙමින්, අදාළ සම්බන්ධතා වැඩි දියුණු වනු ඇත. විශේෂ බදු සහන, විශේෂ විනිමය පරිවර්ත්‍යතා කොන්දේසි, විදේශිකයින්ට පමණක් බලපාන විශේෂ රේගු බදු යනාදී අති **විශේෂ** කොන්දේසි ප්‍රදානය කිරීමෙන්, දැනුම් තේරුම් ඇති, පහසුවෙන් රැවටිය නොහැකි, බටහිර ධනහිමියකු ගේ විශ්වාසය දිනා ගත නොහැකිය. ඔහු විශ්වාසයට ගනු ඇත්තේ, වෙනසක් නැතිව අදාළ සහන සෑම හංගේරියානු පුරවැසියකුටම ලබා දෙන තත්ත්වයකි. 1.1 වැනි කොටසෙහි සඳහන් වුණු පරිදි, ව්‍යවසායකත්වයෙන් යුත් හංගේරියානු පුරවැසියකුට, ලියාපදිංචි කිරීමේ වදයට ලක් නොවී තමාගේ ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි තත්ත්වයක් රටේ උදා වී ඇත් නම්, විදේශිකයින් ද විශ්වාසයකින් යුක්තව හංගේරියාව තුළ ව්‍යාපාරික කටයුතු කිරීමට පටන් ගනු ඇත. විනිවිද පෙනෙන සුළු, සැමට පොදු, ඒකාකාරී බදු ප්‍රතිපත්තියක් හංගේරියානු පුරවැසියන් සම්බන්ධයෙන් ද අනුගමනය කෙරේ නම්, අනාගතයේ දී ඉදිරිපත් වේ යයි සිතන අනුක්‍රමික බදු පිළිබඳ අස්ථාන බියක්, විදේශීය ව්‍යවසායකයින් තුළ ඇති වීමට හේතුවක් නැත. මෙම ලැයිස්තුවට තව තවත් කරුණු එකතු කළ හැකිය. මෙම ක්ෂේත්‍රයේ, අඛණ්ඩ වූ ද, ක්‍රමික වූ හා ඓන්ද්‍රිය වූ ද වර්ධනයක අවශ්‍යතාවක් තිබේ. මෙහෙයුම ආරම්භ කිරීමට පෙර ම, යට කී කරුණු වැඩි ප්‍රමාණයක් ඉටු කර ගැනීම වඩාත් යහපත් බැව් කිව හැකිය.

බටහිර ව්‍යාපාරිකයින් ගේ හොඳ හිත දිනා ගැනීමට, ස්ථායීකරණ මෙහෙයුම ම ඉවහල් වන බැව් මගේ විශ්වාසයයි. උද්ධමනය, අය-වැය හිඟය, විකෘති මිල පද්ධතිය හා තේරුම් ගත නොහැකි බදු ප්‍රතිපත්ති යන සමාජ ගැටලු යටපත් කරමින්, ආර්ථික ස්ථාවර භාවයක් හා ක්‍රමානුකූලත්වයක් රටේ ඇති වීමෙන් ඔවුහු, බිය සැක නැතිව, හංගේරියාව තුළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාමට හැකියැයි විශ්වාස කරන්නට පටන් ගනිති.

3. බටහිර රටවලින් හා ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් හංගේරියාවට ලබා ගත හැකි ආධාරවල වැදගත්කම අවතක්සේරු කිරීමට මම ඉහත දැක්වූ ප්‍රකාශනවලින් අදහස් නොකෙළෙමි. වැඩි විස්තර නොමැතිව මෙහි දී එකක් පමණක් කියනු කැමැත්තෙමි. එනම් බටහිර රටවලින් ප්‍රදානය කරනු ලබන විශාල ආධාර ප්‍රමාණයක් ලබා ගැනීමට ඇති හොඳම මග ස්ථායීකරණ වැඩ පිළිවෙළ දියත් කිරීමයි. 1970 ගණන්වල සීමා බන්ධනවලින් තොරව දෙන ලද ණය, ඒවා ලබා ගත් ආණ්ඩු විසින් අපතේ හැරීම පිළිබඳ කටුක අත්දැකීම් ඇති බොහෝ අය බටහිර ලෝකයේ සිටිති. බලයේ සිටි හංගේරියානු ආණ්ඩු, 1970 ගණන්වල සිට, අවුරුදු පතා, නව ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරමින් ණය ගත් අතර, එමගින් ණය ප්‍රමාණය වැඩි වීමත්, ආර්ථික රෝගී තත්ත්වය උග්‍ර වීමත් නොනැවතුණි. දැන් කදිම අවස්ථාවක් උදා වී තිබේ. එනම් නිදහස් ඡන්දයෙන් පත් වුණු පාර්ලිමේන්තුවක් ද, ඔවුන්ගේ විශ්වාසය දිනූ නව ආණ්ඩුවක් ද හංගේරියාවට ලැබෙන කදිම අවස්ථාවකි. කම්පනික ප්‍රතිකර්ම ද ඇතිව, පැහැදිලි ස්ථායීකරණ වැඩ පිළිවෙළක් දියත් කිරීමට මෙම නව ආණ්ඩුවට අවස්ථාවක් ලැබී තිබේ. මෙම කර්තව්‍යය සඳහා විදේශීය ආණ්ඩුවල හොඳ හිත දිනා ගත හැක. ඔවුන්ගේ සහයෝගය විවිධ මාර්ග ගත හැකඃ ආධාර ලබා දීම, වාසිදායක කොන්දේසි අනුව විශේෂ ණය ලබා දීම, දැනට අප ලබා ගෙන ඇති විදේශීය ණය පිළිබඳව වැඩි අනුකම්පාවකින් සලකා බැලීම යනාදී වශයෙනි. (මෙම අවසාන කරුණ ඉදිරියේ දී වැඩි දුර සාකච්ඡා කෙරේ.) විදේශීය ආණ්ඩු හා ජාත්‍යන්තර සංවිධාන අනුග්‍රහ දැක්වීමට, වඩාත් කැමති වන්නේ, නුදුරු අනාගතයේ දී, එනම් අවුරුද්දකින්, දෙකකින් ක්‍රියාත්මක විය හැකි මෙහෙයුමකටය; අවිනිශ්චිත අනාගතයකදී කෙරෙතැයි යෝජනා කෙරෙන ක්‍රියා මාර්ගයකට නොවේ.

4. රටේ ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ණය දෙන්නන් සමග නැවත සාකච්ඡා අරඹන බවට නව රජය සිය වැඩ පිළිවෙළ තුළින් ජනතාවට පොරොන්දු විය යුතුය. එහෙත් සම්ප්‍රදායික තේරුම්න්, ණය ආපසු ගෙවීමේ කාලය හා වාරික ගණන් හැඩ ගස්වා ගනිමුයි යන වචන භාවිත කිරීමෙන් වැළකී සිටීම සුදුසු වේ. මූල්‍ය ලෝකයේ හංගේරියාව පිළිබඳව ඇති විශ්වාසය මෙවැන්නකින් දෙදරා යාමට ඉඩ තිබේ.

මෙයින් හැඟෙන්නේ, රජය, වර්තමාන හංගේරියානු පුරවැසියනට ඉසිලීමට සිදු වී ඇති ණය සේවා බර ගැන ප්‍රශ්න නොනගා, අන්ධ ලෙස ඒ ගෙවීමට එකඟ විය යුතු ය යන්න නොවේ. සමස්තයක් ලෙස ජාතිය දැනටමත් දුෂ්කරතා රාශියක් විඳ දරා ඇත. එබැවින් ඉදිරි දශකවලදී

ද ඉවසීමෙන් යුතුව කටයුතු කරන ලෙස කරන නව ඉල්ලීම්වලට කන් දීමට එය සූදානම් නොවනු ඇත. එසේම වර්ෂ 2010 හෝ 2050 වැනි ඈත අනාගත වර්ෂයක ලැබෙතැයි පොරොන්දු වෙන වඩා සැපවත් ජීවිතයක් වෙනුවෙන්, තව තවත් දුක් විඳීමට ජනතාව සූදානම් නොවෙති. වහාම, යටත් පිරිසෙයින් ඊළඟ අවුරුදු දෙක තුන තුළ දීම, හංගේරියානු ජනතාව මත ඇති ණය බර ලිහිල් කරලිය යුතු වේ.

ගත් ණය ගෙවා දැමීමට වෙර දරන තව රටවල් කිහිපයක් ලොව ඇති බැවින්, බටහිර ලෝකයේ ආර්ථික විද්‍යාඥයන්ට හා ආර්ථික සැලසුම් කරුවන්ට ද මෙය අවුල් සහගත ප්‍රශ්නයක් වී ඇත. මේ ප්‍රශ්නයේ දී රාජ්‍ය මහ බැංකු කරුවන් කටයුතු කරනුයේ ණයගැත්තා සමාජවාදී රටක් වේවා, ධනවාදී රටක් වේවා, එක හා සමානව ය. ඔවුන් යොදා ගන්නා මිනුම් දණ්ඩ නිෂේධාත්මක එකකි: 'ණය දෙන බැංකු අමනාප නොකර ගැනීමට වග බලා ගන්න'! ජාත්‍යන්තර බැංකු කරුවන් ගේ හමුවක දී කෙරෙන ගුණ වැනුම්වලින් පිනා යන්නෝ, රට තුළදී ඇසීමට සිදු වන විවේචන හා මැසිවිලි අමතක කරති. දේශපාලනයේ ඉහළ තලවල සිටින්නෝ, ජාත්‍යන්තර මූල්‍ය කටයුතු ගැන නොදන්නාහු, තම රටේ බැංකු කරුවන් පවසන දෑ ඉහළින් විශ්වාස කරති. ණය නොගෙවීම අනතුරුදායක බැව් ඔවුන් පැවසුවහොත්, මහජනතාව ලවා තව තවත් පටි තද කරවීමට ඔවුහු පහසුවෙන් පෙළඹෙති.

ණය ගන්නා ණය දෙන්නා ගේ අනුකම්පාවට යටත් වන්නා සේම, ණය දෙන්නා ද ණය ගන්නාගෙන් පහර කෑ හැකි තත්ත්වයක සිටී. දියත් කරනු ලබන ස්ථායීකරණ වැඩ පිළිවෙළ ප්‍රකාශයට පත් කිරීම හා සමාන්තරව යන පරිදි, ණය බර අඩු කිරීමේ සිය අධිෂ්ඨානය ද නව රජය ප්‍රකාශයට පත් කළ යුතුය. හදිසි ක්‍රියා මාර්ග ගැනීමේ අවශ්‍යතාවක් නොමැත. කිසිම හේතුවක් නිසාවත්, ආණ්ඩුව තනි කැමැත්ත උඩ ණය සම්මුති කිසිවක් කඩ නොකළ යුතුය. එහෙත් ණය හිමි කණ්ඩායම් වෙන් වශයෙන් ගෙන එක් එක් කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීම අවශ්‍යය: එනම් පැරිස් ක්ලබ් නමින් හැඳින්වෙන බටහිර ණය දෙනුවන්, විවිධාකාර ආණ්ඩු, ජාත්‍යන්තර මූල්‍ය ආයතන, නැගෙනහිර යුරෝපීය වෙළෙඳ හා මූල්‍ය හවුල්කරුවන් යනාදී වශයෙනි. යෝජිත මුල් කාල සීමාවන් තුළ ණය ආපසු ගෙවීමට හංගේරියාව අපොහොසත් වන බවත්, එය එසේ නොකරන බවත් මෙම කණ්ඩායම්වලට අවධාරණයෙන් හා නිස්කලංකව ප්‍රකාශ කළ යුතුය. ණය ගෙවීම් කල් දමා ගැනීම සඳහා අද අප කළ යුත්තේ, කල්පනාකාරීව හා ඥානාන්විතව නැවත සාකච්ඡා ඇරඹීම මිස, ණය හිමි කණ්ඩායම් හවුලේ එකඟ වන ලැජ්ජා සහගත හා භයානක සම්මුතියකට අනුව ණය ආපසු ගෙවීම් කල් දමා ගැනීම නොවේ. මෙහෙයුම ආරම්භ කිරීම තෙක් කාල සීමාව තුළ, ඉහත කී විධියේ ණය ගිවිසුම් සංශෝධන හැකිතාක් ප්‍රමාණයක් නිම කර ගැනීම අවශ්‍යය. ඉන් පසුව, ආරම්භ කෙරෙන ස්ථායීකරණ මෙහෙයුම ම ණය නැවත ගිවිස ගැනීම් දිගින් දිගට කර ගෙන යාමට අවස්ථාව සලසා දෙනු ඇත.

ණය පිළිබඳ සාකච්ඡා කර ගෙන යන අතර ද, ඉන් අනතුරුව ද, කෙටිකාලීන පොළී ගෙවීම් සම්බන්ධ අපගේ යුතුකම් සම්පූර්ණයෙන් ඉෂ්ට

කළ යුතුය. මධ්‍ය කාලීන හා දිගු කාලීන වගකීම් නම් අඩු කර ගැනීමට අවස්ථා ඇත. පසුගිය වසර කීපය ඇතුළත, රටවල් කීපයක් ම එවැනි සාර්ථක සම්මුතීන්ට එළඹී ඇත. හංගේරියාවට ඇතැයි දක්වා ඇති ණය ආපසු ගෙවීමේ ශක්තිය ගැන දැනට ඇති තක්සේරු කිරීම් මෙමහින් තාවකාලිකව පළුදු වීමට ඉඩ ඇත. එහෙත් මෙම කැප කිරීම පිළිගත යුතු කැප කිරීමෙකැයි ප්‍රකාශ කරන අය සමඟ මම එකඟ වෙමි. එක් අතකින්, ණය ප්‍රමාද කර ගෙවීමට සම්මුතීන් ඇති කර ගත් පසුව වුව ද, ගෙවීමේ ශක්තිය අතින් සෙසු රටවල් පරදවා හංගේරියාව ඉදිරියෙන් සිටිනු ඇත. අනෙක් අතට, (මෙයයි තීරණාත්මක තර්කය) ස්ථායීකරණ වැඩ පිළිවෙළින් ජනතාව මත ඉසිලිය නොහැකි තරම් අධික බර පැටවෙනු වැළැක්වීමට නම් මෙලෙස ණය ප්‍රතිව්‍යුහගත කිරීම් අත්‍යාවශ්‍යම කාරණයකි.

2.9 අග හිඟකම් ආර්ථිකය අවසන් කර ගැනීම

අද මෙ රට තුළ උද්ධමනය හා භාණ්ඩ හිඟය සමගාමීව පවතී.[53] අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වී පවතින මෙම සංසිද්ධි දෙකේම අවසානයක් දැකීමට සමත් ආර්ථික ප්‍රතිපත්තියකි මෙම ග්‍රන්ථය තුළින් ඉදිරිපත් කරන ලද්දේ. මෙහි දී මා ඉදිරිපත් කරන්නේ, ස්ථායීකරණ වැඩ පිළිවෙළට සම්බන්ධ අදහස් කීපයක් වනුදු, අදාළ ප්‍රතිපත්තිමය කර්තව්‍යය පළමු පරිච්ඡේදයෙන් විස්තර වුණු ක්‍රියා මාර්ගයන්ට ඉතාමත් සමීපය.

භාණ්ඩ හිඟකම් පැවතීම සංකීර්ණ සංසිද්ධියකි. එය පැන නැගීමට මුල් වූ සාධක රාශියකි. එය රටේ සූක්ෂම මට්ටමේ මෙන්ම සාර්ව මට්ටමේ ද පවතින ගැටලුවකි. ඊට මුල් වූ හේතු සෙවිය හැක්කේ, සමාජවාදී පද්ධතියක පවතින දේපොළ සබඳතා, පාලන ක්‍රම, මූල්‍ය හා මිල පද්ධති තුළ ය. පසුගිය කාලයේ සිදු වූ යම් යම් වෙනස් වීම් ද, අනාගතයේ දී ඇති වන යම් යම් වෙනස් වීම් ද, සමගාමීව මෙම ක්ෂේත්‍ර සියල්ල කෙරෙහි බලපාන බැවින්, හංගේරියාව තුළ අග හිඟකම් ආර්ථිකය නැති කර දැමීමේ අවස්ථාවක් උදා වනු ඇත.

මෙහෙයුම අවසානයේ දී, සලකුණක් වත් නොතබා භාණ්ඩ හිඟය අවසන් වේ යයි කෙනකුට බලාපොරොත්තු විය නොහැකිය. කලක් යන තුරු, අප සතු වන නව වෙළෙඳ පොළ ක්‍රමය තුළ, ක්‍රියාත්මක වීමේදී, කලක් තිස්සේ වෙළෙඳ පොළ ක්‍රම පැවති රටවල නැති විධියේ ගැටලු හා දුර්වල තැන් මතු වී එන්නට ඉඩ තිබේ. එහෙත් පළමු පරිච්ඡේදයෙන් විස්තර කෙරුණු සමාජ පෙරළිය හා දෙවන පරිච්ඡේදයෙන් විස්තර කෙරුණු ස්ථායීකරණ මෙහෙයුම කරණ කොට ගෙන, ආර්ථිකයේ කැපී පෙනෙන උග්‍ර භාණ්ඩ හිඟයට මුල් වූ මූලික හේතූන් මග හැරී යනු ඇතැයි අපේක්ෂා කළ හැක.

භාණ්ඩ හිඟය අවසන් කර ගැනීමට අවශ්‍ය කොන්දේසි මීට ප්‍රථමයෙන් ඉදිරිපත් කර ඇති බැවින්, මේ අවස්ථාවේ දී ඒ පිළිබඳ සංක්ෂිප්ත ලැයිස්තුවක් දැක්වීම සෑහේ.

---

53. G.W. Kolodko and W.W. McMohan (1987) මේ සංසිද්ධිය හැඳින්වූයේ හිඟකම් උද්ධමනය (shortageflation) යනුවෙනි. මෙය අවපාතය (stagnation) හා උද්ධමනය (inflation) යන වචන දෙකේ එකතුවෙන් සෑදුණු අවපාතෝද්ධමනය (stagflation) යන වචනය පසුපස යමින් සාදා ගන්නා ලද වචනයකි.

1. ස්ථායීකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන කාලයෙහි සාර්ව ඉල්ලුම හා සාර්ව සැපයුම සමතුලනය විය යුතුය. මෙහෙයුම් අවස්ථාවේදී මේ තත්ත්වය ළඟා කර ගෙන, එය එලෙසින් පවත්වා ගෙන යාමට අප සමත් වුවහොත්, භාණ්ඩ හිඟයට ප්‍රධාන වශයෙන් මුල් වන හේතුවක් මග හරවා ගත්තා වනු ඇත. එම හේතුව නම්, සාර්ව මට්ටමේ අධි ඉල්ලුමය.

   නැවත වතාවක් ඉල්ලුම විශාල වශයෙන් ඉහළ ගියහොත් එය උද්ධමනයටත්, භාණ්ඩ හිඟයටත් තුඩු දෙන බැව් පාඨකයාට අවධාරණයෙන් කිව යුතුය. නිශ්චිතව ම කිවහොත්, අධි ඉල්ලුම නිසා විය යුතු මිල ඉහළ නැගීම රජයේ මැදිහත් වීමෙන් වළක්වා ලුවහොත්, යළි මර්දිත උද්ධමනය ඇති වී, ඒ සමග යන ලක්ෂණය වන භාණ්ඩ හිඟය නැවතත් මතු වෙනු නො අනුමානය.

   මෙසේ වීමේ නියම අවදානමක් ඇත. ස්ථායීකරණ මෙහෙයුම අසාර්ථක වුවහොත් හෝ පශ්චාත් මෙහෙයුම් කාලයේ දී සාර්ව ඉල්ලුම පාලනය කර ගත නොහැකි වුවහොත්, සිදු වන මිල ඉහළ නැගීම් පාලනය කරන ලෙස කෙරෙන ඉල්ලීම් දස දෙසින් ඇසෙන්නට පුළුවන. මෙවැනි අවස්ථාවක විවිධ කණ්ඩායම්, දේශපාලන බලපෑම් යොදා ගනිමින්, නැවත වරක් මිල පාලනයට හා මිල වැඩි වීම් සීමා කර තබා ගැනීමට යොමු වෙති. එහි ප්‍රතිඵලය භාණ්ඩ හිඟයන් මවන මර්දිත උද්ධමනය යළි බිහි වීමයි.

   ස්ථායීකරණයෙහි දී සාර්ව ආර්ථික මට්ටමින් සමතුලනයක් ඇති කර ගැනීම අවශ්‍ය බැව් පෙන්නුම් කරන තවත් තර්කයකි මේ. වරදක් වීමට ඉඩ දෙතොත්, එසේ විය යුත්තේ අතිරික්ත සැපයුම් පක්ෂයෙන් මිස අතිරික්ත ඉල්ලුම් පක්ෂයෙන් නම් නොවේ.

2. රාජ්‍ය අංශයේ ඉල්ලුම මත දැඩි පාලනයක් තිබීම අවශ්‍යය යන්න, පළමු කරුණ යටතටම වැටෙන්නක් වුවද, එය වෙනම කරුණක් ලෙස හුවා දැක්වීම සුදුසු යයි මම හඟිමි. මින් පෙර 1.2 වැනි කොටසෙහි සඳහන් වූ පරිදි රාජ්‍ය අංශය ප්‍රබලව පවතින රටක රජයේ ව්‍යාපාර මත දෘඪ අය-වැය සංරෝධක පැනවිය හැකි යැයි සිතීම මුලාවකි. 'දෘඪ අය-වැය සංරෝධක' යන යෙදුම මෙහි දී භාවිත කරන්නේ, යම් ව්‍යාපාරයක් අභ්‍යන්තරයෙන්ම ඇති වන පෙළඹීමකින්, ස්වේච්ඡාවෙන් ම තම වියදම් අඩු කර ගැනීම යන අර්ථයෙනි. එහෙත් ලාභය පෙරටු කර ගත් අව්‍යාජ ප්‍රෝත්සාහක ක්‍රමයක් රජයේ ව්‍යාපාර තුළ වර්ධනය වනු ඇතැයි සිතිය නොහැක. ආයෝජන වැඩි කර ගැනීමටත්, වැටුප් ඉහළ දැමීමටත් ඇති නැඹුරුව රාජ්‍ය අංශය තුළ වරින් වර ඉස්මතු වනු ඇත. අසීමිතව වියදම් කිරීමට රාජ්‍ය අංශයේ ඇති නැඹුරුව, බැහැරින් හා ඉහළින් කෙරෙන බලපෑමක් මගින් සීමා කළ යුතු යැයි මා යෝජනා කරන්නේ එබැවිනි.

   එහෙත් මෙය කළ හැකි ක්‍රම තවමත් සොයා ගෙන නැත. ඒවා මතු වී ඒමේ අවස්ථා නම් වැඩි දියුණු වෙමින් පවතී. අතීතයේ පැවතියේ මීට වෙනස් තත්ත්වයකි. එකල, රජයේ ව්‍යාපාර සමග සමීප සබඳතා ගොඩ නගා ගත් නිලධාරිවාදය අත ය, රෙගුලාසි පැනවීමේ බලය රැඳී තිබුණේ. මෙම බලගතු නිලධාරිවාදය, එහි හැම මට්ටමකදී ම, වැය පක්ෂය වැඩි

කර ගැනීමට නැඹුරුවක් පෙන්වීය. එහෙත් අද ඊට **ප්‍රතිවිරුද්ධ ස්වාධීන බල වේගයක්** ලෙස බහු පාක්ෂික පාර්ලිමේන්තුවක් ගොඩ නැගෙමින් පවතී. ජනතා බලය දරා ගෙන සිටින මෙම පාර්ලිමේන්තුව, නිලධාරිවාදයට සම්බන්ධ නොවුණු, ඊට වඩා ඉහළින් සිටින ව්‍යවස්ථාදායකය මණ්ඩලයක් වනු ඇත. රාජ්‍ය වියදම් මත සීමා පැනවීමට එය සමත් වනු ඇත. නිලධාරිවාදයේ මැදිහත් වීමෙන් තොරව කටයුතු කරන, ඇත්ත වශයෙන් ඊට ඉහළින් සිටින, ව්‍යවස්ථාදායකයට, අසීමිත ලෙස වියදම් කරන රජයේ ව්‍යාපාරවල වියදම් මර්දනය කිරීමට පුළුවන් වේ යයි මම සිතමි. සැබෑ සිදුවීම් ඇසුරින් මෙය අභව්‍ය ප්‍රාර්ථනයකැයි පෙන්වා දෙන තුරු මම එලෙස විශ්වාස කරමි. ඒ අනුව මුළු ආර්ථිකය පුරාම විහිදී යන පරිදි, රාජ්‍ය අංශය මත දෘඪ අයවැය සංරෝධක පැනවීමට ව්‍යවස්ථාදායකයට හැකි වනු ඇත. මෙම කාර්යය සාර්ථක ලෙස කිරීමට එය සමත් වුවහොත්, භාණ්ඩ හිගයක් යළි ඇති වීම මග හරවා ගත හැකි වේ. එය එසේ කිරීමට අසමත් වුවහොත්, භාණ්ඩ හිඟය යළිත් වරක් හිස ඔසවනු ඇත.

3. ආර්ථිකයේ ඇති විය හැකි භාණ්ඩ හිඟය මග හරවා ගැනීමට ඇති හොඳම ක්‍රමය පුද්ගලික අංශය පුළුල් කිරීමයි. රටේ පුද්ගලික අංශය අතින් මෙම කාර්යය අඩ වශයෙන් වුව ද දැනටමත් ඉටු වී ඇත. ඉටු කර ලීමට රාජ්‍ය අංශය අසමත් වූ සෑම ඉල්ලුමකට ම සාර්ථක ලෙස මුහුණ දීමට, පෞද්ගලික අංශයේ විධිමත් හා අවිධිමත් අංශ පොහොසත් වී තිබේ. භාණ්ඩ හිඟකම් අන් සමාජවාදී රටවල පවතිනවාට වඩා අඩු උග්‍රතාවෙන් හංගේරියාව තුළ පැවතීමට හේතුවක් වී ඇත්තේ, රාජ්‍ය අංශය වන 'ප්‍රථම ආර්ථිකය' විසින් නොපුරවා හරින ලද හිස් තැන්, පෞද්ගලික අංශය වන 'ද්විතීය ආර්ථිකය' විසින් සාර්ථක පරිදි පුරවන ලද බැවිනි.

පෞද්ගලික අංශයේ අය- වැය සංරෝධක ඉතා දෘඪ ඒවා වෙයි. එය තම වියදම් සීමා කර ගන්නේ, එම මුදල් පෞද්ගලික අයිතිකරුගේ පසුම්බියෙන් වැය වන බැව් දන්නා හෙයිනි. එම නිසා පෞද්ගලික අංශයෙන් අසීමිත ඉල්ලුමක් ඉදිරිපත් වීමේ අවදානමක් දැකිය නොහැකිය. ඒ අනුව රාජ්‍ය අංශයේ සිදු වන පරිදි, තමා ඇතුළතින් ම අතිරික්ත ඉල්ලුමක් බිහි වීමේ ආවේණික ලක්ෂණ, පෞද්ගලික අංශය සම්බන්ධයෙන් දක්නට නොමැත.

1.1 හා 1.3 යන කොටස්වල කියැවුණු ආකාරයට, පෞද්ගලික අංශය දියුණුවට පත් වෙතැයි මම බලාපොරොත්තු වෙමි. මෙවැනි පසුබිමක, වෙළෙඳ පොළ හා පෞද්ගලික අංශයේ ආරම්භක ශක්තීන් කුමන ආකාරයකින් ක්‍රියාත්මක වේ දැයි ජනතාව දැන සිටීම යහපත්ය. ආර්ථිකයේ පවතින භාණ්ඩ හිඟය කාන්දම් බලයකින් මෙන් ව්‍යවසායකයා ආකර්ෂණය කර ගනී. එවැන්නක් සිදු වන්නේ භාණ්ඩ හිඟයෙන් ලාභයක් උපයා ගැනීමට ඔහුට අවස්ථාවක් ඇතොත් පමණි. ඕනෑ තරමින් භාණ්ඩ පිරි ඇති වෙළෙඳ පොළකට විශාල ලාභ ඉපැයීමේ අවස්ථා ලබා දිය නොහැක. සැපයුම අඩු වී ඇති අවස්ථාවක, සඵල ඉල්ලුමක් ඇති වුවහොත්, සාමාන්‍යයෙන් සංචල වන ප්‍රාග්ධනය එතැනට වැද ව්‍යාපාර ආරම්භ කරයි. මේ ආකාරයේ නම්‍යතාව, ආරම්භක ශක්තිය, අවස්ථා ක්ෂණිකව හඳුනා ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමේ

හැකියාව, ව්‍යාපාරවලට පිවිසීමට ඇති නිදහස හා තරහය යන සියල්ල එක් තැන් වුවහොත්, සූක්ෂ්ම වෙළෙඳ පොළේ දහස් ගණනින් දක්නට ලැබෙන හාණ්ඩ හිඟකම් පාලනය කර ගැනීමට මග හෙළි වේ.

පෞද්ගලික නිර්බාධී ආනයනයට ඇති නිදහස සමග නිෂ්පාදන හා වෙළෙඳ ක්ෂේත්‍ර තුළට නිදහසේ පිවිසීමට පෞද්ගලික ව්‍යවසායයට ඇති ඉඩකඩ, සාමාන්‍යයෙන් මිලට ගන්නන්ගේ වෙළෙඳ පොළක් ලෙස හැඳින්වෙන වෙළෙඳ පොළ තත්ත්වයක් උද්ගත කිරීමට සමත් වෙයි. ඒ වනාහී ගැනුම් කරුවන් ග්‍රහණය කර ගැනීමට විකුණුම් කරුවන් අතර ඇති වන තරගයකි.[54]

4. මිල ගණන්වල නම්‍යතාව හා නිදහස යන අවශ්‍යතාව මීට පෙර සඳහන් කළ කරුණු තුනටම සම්බන්ධ ය. ඉල්ලුම හා සැපයුම අතර සාර්ව-සමතුලනයක් ඇති කර පවත්වා ගැනීමටත්, එසේම සූක්ෂ්ම මට්ටමේදී ඉල්ලුම හා සැපයුම එකිනෙක කෙරෙහි ක්ෂණිකව හැඩ ගස්වා ගැනීමටත්, මෙය අත්‍යවශ්‍යය. 2.4 වැනි කොටසෙහි අවධාරණය කරන ලද පරිදි, ස්ථායීකරණ මෙහෙයුම ක්‍රියාත්මක වන විට, මුල් තැන ගත යුත්තේ නිදහස් මිල පද්ධතියකි.

එක් පියවරකින් ක්ෂණිකව කළ යුතු කාර්යයන් හා පියවරින් පියවර ටිකින් ටික කළ යුතු කාර්යයන් යනුවෙන් වර්ග දෙකක් පොතේ හැඳින්වීමෙහි අපි පැහැදිලි කෙළෙමු. හිඟකම් ආර්ථිකය මග හරවා ගැනීමට නම් මෙම කාර්යයන් දෙවර්ගය එකට සම්බන්ධ කළ යුතුය. හිඟකම් අවසන් කර ගැනීමට අවශ්‍ය කරන සමහර කොන්දේසි ස්ථායීකරණ වැඩ පිළිවෙළ නිසා මතු වී එනු ඇත (සාර්ව සමතුලනය, පුළුල් මිල නිර්බාධීකරණය). එහෙත් මෙහි ලා අදාළ වන අවශ්‍යතා ලැයිස්තුව සම්පූර්ණ කර ගැනීම සඳහා ඉටු විය යුතු තවත් කොන්දේසි ඇත. ඒ වනාහී පෞද්ගලික අංශයේ ප්‍රගතියට ද රාජ්‍ය අංශයේ ඉල්ලුම ඵලදායී ලෙස පාලනය කර ගැනීමට ද මුල් වන දිගු කාලීන කාර්යයන්ය.

2.10. ස්ථායීකරණ මෙහෙයුම හා පුනරුත්ථාපනය

මෙතෙක් ස්ථායීකරණ මෙහෙයුමේ ප්‍රධාන සංරචක විමසා බලා ඇත. දැන් මේ සම්බන්ධ අවසාන වශයෙන් අදහස් කීපයක් දැක්විය යුතුය.

මෙම අධ්‍යයනයෙන් යෝජනා කර ඇති සැත්කම මින් පෙර කිසිදු රටක් විසින් ක්‍රියාත්මක කර නැත. ලෝක යුද්ධ දෙක නිම වීමෙන් අනතුරුව, උද්ධමනය මුලිනුපුටා දැමීමට හෝ සීඝ්‍රයෙන් පහත හෙළීමට සෝවියට් දේශය සමත් විය. කෙසේ වෙතත්, එකල සෝවියට් දේශයේ එම වැඩ පිළිවෙළ පසුපසින් තිබූ දේශපාලන හා සමාජ පරිසරය අද හංගේරියාවේ පවතින තත්ත්වයට වඩා හාත්පසින් වෙනස්ය.

---

54. ධනවාදී තත්ත්වයක් යටතේ මූලික වශයෙන් මේ තත්ත්වය ඇති වන්නේ, අපූර්ණ තරගය නමින් හැඳින්වෙන වෙළෙඳ පොළ ව්‍යුහයක් තුළය. ගැණුම්කරුවන් ග්‍රහණය කර ගැනීමට, විකිණුම්කරුවෝ ගුණයෙන් වඩා හොඳ හාණ්ඩ ඉදිරිපත් කිරීමෙන් ද වඩා කාරුණික සේවයක් සැපයීමෙන් ද වඩා ඉක්මනින් හාණ්ඩ බෙදා හැරීම මගින් ද තරගකාරී විකුණුම්කරුවන් හා තරග වදිති. T.Scitovsky (1951), (1971) හා E.Domar (1987) යන කෘති බලන්න.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව, ධනවාදී ලෝකයේ ද මහා පරිමාණ ස්ථායීකරණ මෙහෙයුම් කිහිපයක් සිදු කෙරිණි. ලෝක ඉතිහාසයෙහි පැවති ඉතාම අධිවේගී උද්ධමනයක් පැවැති හංගේරියාව, 1946 දී එම උද්ධමනය කෙළවර කරන විට, එරට පැවතියේ පෙර අපර සමාජ ක්‍රම අතර මැද්දෙහිය. ඉදිරියෙහි බලයට ආ සමාජවාදී ක්‍රමයේ ලක්ෂණ කීපයක් තිබුණ ද (කොම්යුනිස්ට් පක්ෂය බලය අල්ලා ගැනීමට ඉදිරියට ඇදී ඒම, සෝවියට් හමුදාව රටේ සිටීම), සමස්තයක් ලෙස ආර්ථිකය ක්‍රියාත්මක වූයේ පෞද්ගලික දේපොළ ක්‍රමය මුල් කර ගෙනය. එකල ක්‍රියාත්මක වූ ස්ථායීකරණ වැඩ පිළිවෙළට යුද්ධයෙන් පසු රටේ ප්‍රතිසංස්කරණ කටයුතුවලදී එක්ව කටයුතු කළ සෑම දේශපාලන පක්ෂයකම සහයෝගය ලැබිණි. ඒ සඳහා පෞද්ගලික ප්‍රාග්ධනයේ හා සංවිධානය වූ කම්කරු පන්තියේ ද සහාය ලැබිණි.

1948 දී සාර්ථකව ක්‍රියාත්මක වුණු බටහිර ජර්මානු ප්‍රතිසංස්කරණ මාලාව නිතර නිතර උපුටා දැක්වේ. මෙය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දැඩි ලෙසින් ක්‍රියාත්මක වුණු **සැත්කමකි**. එක් පැන් පහරින් හඳුන්වා දෙන ලද වෙනස්කම්, පූර්ණ ආර්ථික නිර්බාධීකරණයක් කරා රට ගෙන යාමටත්, ස්ථාවර ව්‍යවහාර මුදල් ක්‍රමයක් හඳුන්වා දීමටත් සමත් විය. එහෙත් මෙය සිදු වූයේ පෞද්ගලික ආර්ථික ක්‍රමයක් හරය කොට ගත් රටකය. පැවතුණු විශාල ඒකාධිකාරී සංවිධාන කීපයක් කඩා බිඳ දැමුව ද, දේපොළ සබඳතා එලෙසින්ම පැවතීමට ඉඩ හැරිණි. මේ කටයුත්තේ දී එර්හාඩ්ට් හා ඔහුගේ උපදේශකයින්ට සිතා බැලීමට සිදු වූ සාධක රාශියක් තිබුණ ද, විද්‍යාගාරයක් තුළ කෙරෙන්නාක් මෙන් පෞද්ගලික දේපොළ හිමියන් කෘත්‍රිම වශයෙන් නිර්මාණය කිරීමට ඔවුනට සිදු නොවිණි. ලේ, මස්, නහරවලින් සැදුණු සැබෑ පෞද්ගලික දේපොළ හිමියෝ ඔවුන් වටා සිටියහ.

ඊශ්‍රායලය, බොලිවියාව වැනි වෙනත් රටවල සිදු කෙරුණු විප්ලවකාරී ස්ථායීකරණ මෙහෙයුම්වලට සම්බන්ධ අත්දැකීම් විමර්ශණය කිරීම මෙම පොතට පරිබාහිර කාර්යයකි. මෙම රටවල, මෙකී මෙහෙයුම් ක්‍රියාත්මක කැරුණේ දුස්සාධ්‍ය ලෙස රෝගී ව පැවති ආර්ථික පද්ධතීන් යටතේ බව සඳහන් කිරීම පමණක් සෑහේ. මේවා තුළ එර්හාඩ්ට්ගේ ජර්මනියට වඩා විශාල රාජ්‍ය අංශ පැවතුණ ද, ඊස්රායලය, බොලිවීයාව යන මෙම රටවල් මූලික වශයෙන් පෞද්ගලික ආර්ථික ක්‍රම විය.

පෞද්ගලික අංශයේ ආධිපත්‍යය වෙත ආර්ථිකය පරිවර්තනය කිරීමත්, සාර්ව ආර්ථිකයෙහි මූලික හැඩ ගැසුම් හා ස්ථායීකරණ ක්‍රියාවලියත් යන මෙම ප්‍රධාන කර්තව්‍යයන් දෙක එකවිට කිරීමට ඉදිරිපත් වී ඇති පුරෝගාමී රටවල් දෙකකි, හංගේරියාව හා පෝලන්තය. මේ දෙක එකතු කොට කිරීමේ කාර්යය අති දුෂ්කර එකකි.

ස්ථායීකරණ මෙහෙයුම ඉක්මනින්, එක එල්ලේ ක්‍රියාත්මක කෙරෙන තරමට, නුදුරු අනාගතයේ දීම අර්බුදකාරී වේදනාවන්ගෙන් ගැළවිය හැකිය යන තදබල විශ්වාසයක් මිනිසුන් තුළ ඇති වේ. බරපතල රෝගී තත්ත්වයක සිටි අයකුට හෝ සිය ආදරණීයයකු වේදනා විඳිමින් සිටිනු දැක ඇති අයකුට, වෛද්‍යවරයකු වෙත ගොස් මට තව දුරටත් මේ තත්ත්වය දරා සිටිය නොහැක. කුමක් හෝ සිදු කර මා මේ දුක්ඛිත තත්ත්වයෙන් මුදවනු මැනවි. ශල්‍යකර්මයේ අවදානම දැරීමට මම සූදානම්. මේ රෝගය ගැන කුමක් හෝ කරන්න යනුවෙන් ඉල්ලීමක් කරන රෝගියකුගේ මානසික තත්ත්වය තේරුම්

ගත හැකිය; තව දුරටත් දුක් විඳීමට අකමැති තත්ත්වයකට හංගේරියානු ජනයාද පත්ව ඇතැයි මට හැඟේ. නිරන්තරව කෙරෙන සුළු පිළියම් හා එමගින් ඇති වන අවිනිශ්චිත තත්ත්වය මිනිසුන් කලකිරවන සුළුය. ඉන් ගැළවීමට මූලික සැත්කමක අවදානමට භාජනය වීමට වුවද ඔවුන් සූදානම් හයි මම විශ්වාස කරමි. තාවකාලිකව එයින් දුෂ්කරතා විඳීමට ඔවුනට සිදු වනු ඇත. එහෙත් අනාගතයේ දී රටේ සැබැවින්ම නිරවුල් හා නිසංසල පරිසරයක් එමගින් ඇති කළ හැකි වෙතැයි යන විශ්වාසය නිසා එවැනි දැඩි පිළියමකට ඔවුහු සූදානම් ව සිටිති.

3. දේශපාලන දෘෂ්ටි කෝණයකින් ආර්ථික පරිවර්තන කර්තව්‍යය

3.1 වැඩ පිළිවෙළෙහි ජනප්‍රිය භාවය

මුල් පරිච්ඡේදවලින් විස්තර වූ වැඩ පිළිවෙළ කෙතරම් ජනප්‍රිය විය හැක්කේද? හැමෙකකු, සෑම අතින්ම සතුටු කිරීම කළ නොහැකිය. මෙම අධ්‍යයනයේ අඩංගු පරිවර්තන වැඩ පිළිවෙළ ජනප්‍රියවාදී එකක් නම් නොවේ. ඊට විරුද්ධව ඉදිරිපත් විය හැකි කරුණු සාකච්ඡා කිරීමට පළමු, එහි අන්තර්ගත, ජනප්‍රිය වීමට විභවතාවක් ඇති කරුණු හුවා දැක්වීමට මම කැමැත්තෙමි. මෙම කරුණු වුවද, **හැම දෙනාගේම** ප්‍රිය මනාප භාවයට තුඩු දෙතැයි සිතිය නොහැක. ඒවාට පුද්ගලයින් ඇදී එනු ඇද්ද නැද්ද යන්න රඳා ඇත්තේ සදාචාරාත්මක හා දේශපාලනික මතිමතාන්තර ද, පුරවැසියන්ගේ ආර්ථික ඕනෑඑපාකම් ද මතය.

1. මෙම ග්‍රන්ථයේ ඉදිරිපත් කෙරෙන සංකල්පය ආකර්ෂණීය වන්නේ නියම වශයෙන්ම **ලිබරල්** වාදීන්ටය.[55] සමාජ ශුභ සාධනය, සමානාත්මතාව, සමාජ සාධාරණත්වය, පුද්ගලික ශුභ සිද්ධිය අබිබවා යන ජාතික ශුභ සිද්ධිය යනාදී සාරධර්මයන් ගරු කරන හංගේරියානුවෝ මෙකී දේ නැතත් පුද්ගලික නිදහස අගයන්නෝ නොවෙති. මෙම සාරධර්ම බොහෝ විට අන්‍යෝන්‍ය වශයෙන් පැහෙන සුළු වුවද, ඒවා අතර ගැටීම් ද පැවැතිය හැක. මෙහි අඩංගු සංවර්ධන මාවත, ආකර්ෂණීය වන්නේ පුද්ගලික නිදහසට හා පුරවැසි ස්වාධිපත්‍යයට, ඉහතින් දැක්වුණු අවශේෂ සාරධර්මයනට වඩා ඉහළ හෝ ඒ හා සමාන හෝ තැනක් දීමට සුදානම් වන අයට ය. මෙවැනි අය රජයේ ඕනෑඑපාකම්වලට හා දේශපාලන ව්‍යාපාරවල, හෝ පක්ෂවල නායකයින් සමාජයේ සාමූහික අවශ්‍යතා ලෙස දක්වා ඇති දේට, පුද්ගලයාගේ ඕනෑඑපාකම් යටපත් කිරීමට විරුද්ධ වෙති.

   ඉහත ඡේදවල 'පුද්ගලයා' යන වචනය වෙනුවට, 'පවුල' යන්න කැමැති නම් භාවිත කළ හැක. පුද්ගලයා හා කුඩාම මිනිස් සමාජ ඒකකය වන පවුල අතර වෙනසක් යෝජිත වැඩ පිළිවෙළ මගින් නොදැක්වේ. මෙහි අරමුණ වන්නේ හැකිතාක් දුරට ආර්ථික තීරණ ගැනීමේ වගකීමත්, නිදහස හා ස්වාධිපත්‍යයත් පවුලට ලබා දීමයි.

---

55. ('කොන්සර්වේටිව්' යන වචනයට ප්‍රතිපක්ෂව) 'ලිබරල්' යන වචනයට, ඇමරිකන් එක්සත් ජනපදයේ දේශපාලන භාෂාව තුළ විශේෂ තේරුමත් ඇත. මෙම පොත 'ලිබරල්' යන වචනය භාවිතා කරන්නේ නම්, යුරෝපීය දේශපාලන හා බුද්ධිමය සම්ප්‍රදාය අනුගමනය කරමිනි. මීළඟ වාක්‍ය කිපයෙන් එහි අර්ථය වඩාත් පැහැදිලි වේ. පළමු පරිච්ඡේදයේද එම වචනය යොදා ඇත්තේ මෙම අර්ථයෙන්ම ය.

'නිදහස' යන්න වත්මන් හංගේරියාවේ විලාසිතාවක් බවට පත් වී තිබේ. ආර්ථික ක්ෂේත්‍රයේ, මෙම වචනයට නියත අර්ථකථනයක් ලබා දීම මාගේ අධ්‍යයනයේ අරමුණයි. එක් එක් පුද්ගලයාට හා පවුලට, සිය ශ්‍රමය, නිෂ්පාදිත, විවේක කාලය, මුදල් හා ධනය, තමන් රිසි සේ යොදා ගැනීමට නිදහස තිබිය යුතුය. පුද්ගලයාට හා පවුලට නිදහසේ ජීවත් වීමට රජය දැන්වත් ඉඩ දිය යුතුය. රජය මැදිහත් විය යුත්තේ, තම නිදහස නොමනා ආකාරයට පාවිච්චි කරන අයගෙන්, අවශේෂ පුද්ගලයන් හා පවුල් ආරක්ෂා කර ගැනීමට පමණි.

2. තම මුදල් හා ධනය ආයෝජනය කරමින්, ඒවා අවදානමට ලක් කරමින්, (මෙම අධ්‍යයනයේ යොදා ගැනුණු තේරුමින්) **ව්‍යවසායයත්** නිර්භීතව ආරම්භ කිරීමට සුදනම් අය මේ කෘතියේ අඩංගු අදහස් වැලඳ ගනු ඇති බව මට විශ්වාසය.

නිවැරදි මිනිස් හැසිරීම් එක් ආකාරයක් පමණක් විය යුතුයැයි විශ්වාස කරන්නවුන් සමග එකඟ වීමට මට නොහැක. අධීක්ෂක නියමයන් හරි හැටි පිළිපදිමින්, තමාගේ කාලය ප්‍රයෝජනවත්ව ගත කරන, රැකියාවෙන් පසු ගෙදර ගොස් විවේකීව කාලය ගත කරන, එසේ නැතහොත් සිය පවුලේ කටයුතු ගැන සොයා බලන, විනයෙන් යුත් සේවක පිරිස් ජනගහණයෙන් බහුතරය වෙති. මේ අතර, ලෝක ස්වභාව මෙනෙහි කරමින් සෑම දෙයෙහිම දොස් දකින පිරිස් ද වෙති. මොවුන් අතින් ද ඵලදායී චින්තනමය කාර්ය භාරයක් ඉටු කෙරෙනු ඇත. මිනිසුන් අතර තව කොටසක් ඇත. එනම්, අභ්‍යන්තර පෙළඹීමක් තිබුණද, ඔවුන්ගේ ඕනෑකමකින් තොරව බිහි වී ඇති අයහපත් බලපෑම් හේතු කොට ගෙන, ක්‍රියාශීලී වීමට අපොහොසත් වන ජන කොටස් ය. (මෙවැනි පිරිස් පිළිබඳව වෙනම සාකච්ඡා කෙරෙනු ඇත.)

ඉහතින් සඳහන් කළ හැසිරීම් රටාවන් කිසිසේත් මගේ විවේචනයට භාජනය නොවන නමුත් මෙම පොතේ යෝජිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී ඉහතින් කී පුද්ගල කොටස් ගැන විශ්වාසය තැබීමක් නැති බව සඳහන් කළ යුතුය. මෙහි දී අපි ඇඩම් ස්මිත් දෙසට අපගේ අවධානය යොමු කළ යුතු වෙමු. තමන්ගේත්, තම පවුලේත් දියුණුව පිණිස වැඩිපුර මුදල් ටිකක් උපයා ගැනීමට උත්සාහ දරන අය එමගින් අවශේෂ ප්‍රජාවටද සෙතක් සලසති. ජාතික ආදායම හා ජාතික ධනය යනු උත්තරීය සාමූහිකවාදී විචල්‍ය හෝ ගුප්ත ආර්ථික සංඛ්‍යානාත්මක මති මතාන්තර හෝ නොවේ. තම තමන්ගේ ආදායම් වැඩි කර ගැනීමට පුද්ගලයන් දරන උත්සාහය ජාතික අදායමද වැඩි කිරීමට තුඩු දේ. තමන්ගේ ම ලාභ සඳහා ධන සමුච්චය කිරීමෙන් ජාතියේ ධනය ද වැඩි වේ. ඔබ ඔබේ වාසයට නිවසක් තනා ගතහොත් ජාතියට අයත් නිවාස සංඛ්‍යාවද ඉන් වැඩි වේ. ඩොලර් දාහක් ඔබ එකතු කරගත හොත්, ජාතිය සතු විදේශීය විනිමය සංචිත ද වැඩි වේ. ජාතික ශුභ සිද්ධිය වනාහී පුද්ගලික ශුභ සිද්ධීන්හි එකතුව විනා අන් කවරක්වත් නොවේ.

ජනතාව සිය සිතුම් පැතුම් වෙනස් කර ගත යුතුය. ධනවත් වීම ලැජ්ජා සහගත දෙයක් ලෙස කාලාන්තරයක් මුළුල්ලේ සැලකිණි. මෙවැනි වැරදි විශ්වාස මිනිසුන් ගේ ඇට මිදුලු තුළට කා වැදී ඇත. මේ අනුව කෙනකු

වැඩිපුර යමක් උපයා ගනිතැයි කියන්නේ අන්‍යයන්ට අයත් දේ උදුරා ගැනීමකි යි සිතීමට මිනිස්සු පුරුදුව සිටිති. වැඩිපුර අදායම් එකතු කර ගත්තෝ, එමගින් අන් අය පහළට මිරිකා තබා ගනිති. වත්පොහොසත් කමක් ඇති අය තම දේපොළ අනුන්ට බෙදා නොදීම ලජ්ජා සහගත කරුණකි. ඔවුන් සිය කැමැත්තෙන් එය ඉටු නොකළහොත්, බලහත්කාරයෙන් හෝ ඔවුන්ගෙන් ධනය පැහැර ගත යුතුය.

භයානක ආර්ථික අර්බුදයක් රට ග්‍රහණය කර ගෙන ඇත. කාර්යාලයයෙන් කාර්යාලයයට යමින් හිඟමන් යදිමින්, කන්නලව් කරන අය නොව, අපගේ ගෞරවය දිනා ගත යුත්තේ **තම තමන්ගේ** ආර්ථික තත්ත්වයන් ඉහළ නංවා ගැනීමට උත්සාහ දරන්නන්ය. මැසිවිලි නොනගා, අතිකාල සේවාවන්හි යෙදීම, තම ගෙවත්තේ පලතුරු හෝ එළවළු වගා කිරීම, තමන්ගේම ව්‍යාපාරවල ආයෝජනය කිරීම, අන්‍යයන් හා හවුල් වී ව්‍යාපාර ඇරඹීම, මෙරට වැඩි ඉල්ලුමක් ඇති භාණ්ඩ ආනයනය කර අලෙවි කර ගැනීම යනාදී කටයුතුවලට ඔවුන් යොමු විය යුතුය. දැන් සැමට දහස් ගණනින් ඉඩ ප්‍රස්ථා විවෘත ව ඇත. 'තමාට පිහිට වන්නාහට දෙවියෝ පිහිට වෙති' යන පැරණි කියමන අද තරම් උචිත වන අවස්ථාවක් නැති තරමය. රජයේ ආධාර ලබා දිය යුත්තේ, තම තමන්ගේ එදිනෙදා දිවි පෙවෙත සලස්වා ගැනීමටවත් නුපුළුවන් අයට පමණි. තමන්ට ශක්තිය තිබුණද නුවුවමනාව, බියගුළුකම හෝ කම්මැලිකම නිසා දියුණු වීමට මහන්සි නොගන්නා අය හෙළා තලා කතා කිරීමක් හෝ ඔවුනට අනුකම්පාව දැක්වීමක් හෝ අනවශ්‍යය. පසුගිය දශක කීපය මුළුල්ලේ රජය මොවුන් තුළින් පුද්ගල උනන්දුව උදුරා දමා ඇත. ඔවුහු එම ක්‍රියාදාමයේ ගොදුරු බවට පත් වුවාහු, වැඩ කිරීමේ උනන්දුවෙන් තොර ව සිටිති. මේ නිසා දැන් නව සදාචාර අධ්‍යාපනයක් අවශ්‍ය වුවත්, ඒ මගින්ම පමණක් රටෙහි වෙනස්කම් ඇති කර ගත නොහැකිය. ජනතා ආකල්පවල වෙනස් කම් සමාජ විපර්යාසයන් තුළින් ම බිහි වේ. එවිට තමන්ගේ වාසනාව උදා කර ගැනීමට තමාම මුල් විය යුතු බැව් මිනිසුන් ඉක්මනින් ම හෝ කල් පසු වී හෝ වටහා ගනු ඇත.

මෙය (1) කරුණ යටතේ දැක්වුණු ආකර්ෂණය කර ගැනීමේ බලවේගයට ඌන පූරකයෙකි. මෙම අධ්‍යයනයෙන් මතු කර ඇති සංකල්පය වැදගත් වන්නේ පුද්ගලික (හෝ පවුලේ) ස්වායත්තතාව ගරු කරන හා ඉන් ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය කරන අයට ය. තමාගේ උනන්දුවෙන් යමක් ඇරඹීමටත්, තමන්ගේ ම කටයුතු හා ව්‍යවසායයන් ආරම්භ කිරීමටත් පුළුවන් කමක් ඇති හා ඊට සුදානම් අය මීට ආකර්ෂණය වෙති.

3. තවද, දැනටමත් **දේපොළ** අයිතියක් ඇති හෝ තමන්ගේ ම දේපොළ අයිති කර ගැනීමට කැමැති අයටද මෙම සංකල්පය ප්‍රිය මනාප වනු ඇත. මා දැන් කථා කරන්නේ ඉතාම කුඩා ඒකකවල සිට (කුඩා ගෙවත්තක්, පුද්ගලික ඉතිරි කිරීම් සුළු ප්‍රමාණයක්) කුඩා හා මධ්‍යම පරිමාණ ඒකක (පුද්ගලික නිවාස, පුද්ගලික සාප්පු හෝ වැඩ පොළ යනාදිය) හා විශාල පරිමාණ ඒකක දක්වා ඇති සියලු දේපොළ ගැනය. දේපොළ ප්‍රමාණය කුමක් වුවද, ඒවායේ අයිතිකරුවෝ රජයේ අවිචාරවත් ක්‍රියා කලාපයන්ගෙන් ආරක්ෂා කර ගත යුත්තාහ.

විවිධ දේශපාලන මතිමතාන්තර පැවතීමට ඉඩ දී ඇති රටවල දේපොළ හිමි යම් යම් විශේෂිත කණ්ඩායම්වල ඕනෑඑපාකම් ගැන අවධානය දක්වන දේශපාලන පක්ෂ හා සංවිධාන බිහි වේ. මෙයින් සමහරක්, සහමුලින්ම හෝ මූලික වශයෙන් හෝ කුඩා පරිමාණ ගොවීන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියා කරනු ඇත. තවත් සමහරක් නාගරික පහළ මධ්‍යම පංතිවලටද, අනික්වා මහා පරිමාණ ව්‍යවසායකයන්ටද අනුග්‍රහ දක්වනු ඇත. මීට වඩා පුළුල් දේශපාලන වැඩ පිළිවෙළවල් ඇති, දේපොළ හිමියන් අතර ඇති විවිධ උප කොටස් හරහා යන සංවිධාන ද තිබෙනු විය හැක. මේ සංවිධානවලට උපදෙස් දීම මෙම අධ්‍යයනයේ අරමුණ නොවේ. සියලුම වර්ගයේ පෞද්ගලික දේපොළවල ආරක්ෂාව හා නිදහස් වැඩි දියුණුව ප්‍රමුඛතාවක් ලෙස අගයන සියලුම දේශපාලන බලවේගවලට මෙහි අඩංගු යෝජනා සමග එකඟ විය හැකි ය.

පුද්ගලික ධනය රැස් කිරීමට ධෛර්‍යය දීම පමණක් නොව, එම මාවතේ ඇති අවහිර බාධක ඉවත් කිරීමේ ප්‍රතිපත්තියක් යෝජනා කිරීම ද මෙම අධ්‍යයනයෙන් සිදු විය යුතු කාර්යයකි. කෘෂිකර්මය තුළින් නිදසුනක් ගනිමු. මීට පෙර අවධියක දී අමානුෂික ලෙස විනාශ කරන ලද කුලැක්[56] පෙළැන්තිය නැවත වරක් රාජ්‍ය රෙගුලාසි මගින් ඇති කිරීමට මෙම අධ්‍යයනය යෝජනා නොකරයි. කෘත්‍රිම ලෙස කුලැක් ක්‍රමයක් ඇති කිරීම වෙනුවට, ග්‍රාමීය ධනේශ්වරකරණයට පක්ෂව මේ අධ්‍යයනය තර්ක කරයි. ඩෙන්මාර්කයේ, බටහිර ජර්මනියේ හා අමෙරිකාවේ දක්නට ලැබෙන පරිදි, නවීන තාක්ෂණික උපකරණ භාවිතා කරමින් ද, ශ්‍රම භාවිතය අඩු කර ගනිමින් ද, කටයුතු කරන ප්‍රාග්ධන සුක්ෂ්ම ගොවි පලවල් මෙරට තුළ ද ඓන්ද්‍රිය වූ ධනේශ්වර සංවර්ධනයක් තුළින් පැන නැගෙතොත් අපි ඒ ගැන සතුටු වෙමු.[57]

---

56. රුසියන් බසින් ධනවත් ගොවියා හැඳින්වූයේ 'කුලැක්' යන නමිනි. ස්ටැලින් සමයේ සමූහ ගොවි පොළවල් ඇති කළ සමයෙහි කුලැක් පෙළැන්තිය සාහසික ලෙස සමූලඝාතනය කරන ලදහ.

57. මීට ඉහත කළාක් මෙන්ම මම මෙහිදීද බටහිර රටවල් ම නිදසුනට ගනිමි. 'අමෙරිකාවේ හා වෙනත් බටහිර යුරෝපා රටවල කුඩා පරිමාණ ගොවීන්ට රජය සහනාධාර පිරිනමන බව' මෙහි සඳහන් කිරීම නොවටී. මෙය විවාදයට මුල් වන ප්‍රශ්නයකි. මෙය බටහිර රටවල ආර්ථික ප්‍රතිපත්තියේ යහපත් ලක්ෂණයක් නොව අඩුපාඩුවක් ලෙස බොහෝ දෙනා සලකති. ඒ රටවල පාර්ලිමේන්තු නියෝජිතයන් සමහර දෙනකු ඡන්ද වැඩියෙන් ලබා ගැනීම උදෙසා සහනාධාර දීමට පක්ෂ වනු ඇත. මේ කරුණ නිසාම හංගේරියානු පාර්ලිමේන්තු නියෝජිතයන් ද එවැනිම ස්ථාවරයක් ගනු ඇත. මට පාර්ලිමේන්තු අසුනකට තරග වැදීමේ අධ්‍යාශයක් නැති බැවින්, සිතේ ඇති දෑ නිර්බාධිතව කියා පෑමට මට නිදහසක් තිබේ.

රටේ සිදු වන පරිවර්තනයේදී පැවැතිය යුතු යයි මා සඳහන් කළ මානවවාදී අවශ්‍යතා මෙහිදී ද අදාළ වේ. හංගේරියාවේ කෘෂිකාර්මික නවීකරණය, මානවවාදී පසුබිමක ඉටු විය යුතුය. නිදසුනක් වශයෙන් සමූපකාර ගොවි පොළකින් ඉවත්ව යාමට කුඩා ගොවි පොළකට සිදු වෙතැයි සිතමු. එවිට ඔවුන්ට දෙන 'ආරම්භක දිරි ගැන්වීමක්' වශයෙන් පුනරාවර්තන නොවන මූල්‍ය සහනයක් හෝ දිගු කාලීන ණයක් හෝ දිය යුතුය. නව ගොවිපොළ පවත්වා ගෙන යාමට මෙය උදව් වනු ඇත.

එහෙත් කාලයක් ගත වූ පසුව පෞද්ගලික ක්ෂේත්‍රයේ වෙනත් අංශවලට බලපාන දැඩි වෙළෙඳ පොළ කොන්දේසිවලට පෞද්ගලික ගොවිපොළවල් ද විවෘත කළ යුතුය. මෙම ගොවිපොළවලට දිය යුත්තේ සදාකාලික රාජ්‍ය සහනාධාර නොව කෙටි, මධ්‍යම හා දිගු කාලීන ණය මුදල්ය. ඒ ද, පුද්ගලික අංශයේ අන් ව්‍යාපාරවලට වඩා ලිහිල් ණය කොන්දේසි යටතේ නම් නොවේ.

කෘෂිකර්මයට අමතරව, ධනවත් වීමේ වුවමනාවෙන් කැප කිරීම් කරමින්, ඉතිරි කිරීමට ඉදිරිපත් වන අය ද මෙම පරිවර්තන මාවතට පක්ෂව ඇදී එනු ඇත. අවස්ථාවෙන් යමක් සූරා ගෙන ලාභ ලැබ, පලා යන වර්ගයේ අවස්ථාවාදී ව්‍යාපාරිකයින් ධෛර්යමත් කිරීමට මට වුවමනාවක් නැත. වසරක් පාසා ඉතිරි කරමින් තමන්ගේ ම ව්‍යාපාරයක ආයෝජනය කොට, එය කුඩා පරිමාණයෙන් මධ්‍යම පරිමාණයටද, ඉන් අනතුරුව විශාල පරිමාණයකට හෝ හැකිනම් යෝධ ව්‍යාපාරයක තත්ත්වයකට ද දියුණු කර ගන්නා අයට අවශ්‍ය භෞතික, ආධ්‍යාත්මික හා නීතිමය සහතිකයන් ලබා දීම මෙහි යෝජිත ආර්ථික ප්‍රතිපත්ති මාලාවේ අරමුණ වේ. කුඩා පරිමාණයේ නිෂ්පාදනය තුළින් දවසින් දවස, පැයෙන් පැය ධනවාදය බිහි වන බව ලෙනින් කියා ඇත. ඔහු නිවැරදිය. ඉතාම සෞභාග්‍යමත් වන කුඩා පරිමාණ නිෂ්පාදකයන් පවා කුඩා පරිමාණ නිෂ්පාදනයෙහි ම රඳවා තබා ගැනීමට රිසි වන්නෝ, ඉහත කී වෙනස් කම් ගැන බිය වන්නාහු, යෝජිත සංවර්ධන වැඩ සටහනට සහයෝගය නොදෙති. කුඩා ගෙවත්තක් හෝ වැඩ පොළක් හෝ අයිති කර ගැනීම වරදක් නොවෙතැයි සිතන ඔවුහු, එය සාර්ථක වෙතොත්, ඒවායේ අයිතිකරුවන් සුඛෝපභෝගී සංචාරයන් වෙනුවෙන් හෝ අතර්ස ගිම්හාන නිවාස මිලට ගැනීම සඳහා හෝ තම මුදල් යෙදවීම වරදක් නැතැයි සිතති. එහෙත් කුඩා පරිමාණ නිෂ්පාදනයෙන් මිදී නියම ධනවාදී නිෂ්පාදකයකු බවට පත් වීමට එවැන්නකු ගන්නා ප්‍රයත්නය නිලධාරිවාදී මැදිහත්වීම් තුළින් හෝ වළක්වා ලිය යුතු යැයි ඔවුහු සිතති. මෙම අධ්‍යයනය, එකී අදහස සහමුලින් ප්‍රතික්ෂේප කරයි. කෘත්‍රිම ධනවාදී ව්‍යාපාර නිර්මාණය කිරීම උදෙසා රාජ්‍ය ආඥා පැනවීම වෙනුවට, පෞද්ගලික ප්‍රාග්ධනය රැස් කර ගැනීමට අවශ්‍ය වන ස්වාභාවික පරිසරය උදා කර දීම වැදගත් බව එය පෙන්වා දෙයි. මෙවැනි අවස්ථාවක් උදා වීමෙන් ඇති වන වාසි දක්නා අය මෙම වැඩ පිළිවෙළට පක්ෂපාතී වෙති.

4. **උද්ධමනය නවතා දැමීමේ** අවස්ථාව ස්ථායීකරණ මෙහෙයුමෙන් සැලසේ. උද්ධමන ක්‍රියාවලියෙන් අයුතු ප්‍රයෝජන ගන්නා කිහිප දෙනකු හැරුණු විට, මෙම වැඩ සටහන මිලියන ගණන් ජනයා ගේ සිත් ගන්නවා ඇත. බලයට ඒමට අපේක්ෂා කරන දේශපාලන කණ්ඩායම්, උද්ධමනය නවතා දැමීමේ පොරොන්දුවක් දී, ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ වගකීම බාර ගෙන, එම පොරොන්දුව **හරියට ඉටු කරතොත්**, එමගින් ඔවුනට ලැබෙන දේශපාලන සහයෝගය කොපමණ දැයි සිතා බලනු

අකාර්යක්ෂම සමුපකාර ගොවිපොළකට වඩා, දිගු කාලයේදී, කුඩා ගොවි පොළක් ඵලදායී වීමට ඉඩ තිබේ. එහෙත්, රාජ්‍ය මැදිහත්වීම් තුළින් උපකාර නොකෙරෙතත්, නවීන කුඩා හා මධ්‍යම පරිමාණ ගොවිපොළවල් සමඟ තරග වැදීමට නොහැකි තත්ත්වයකට දුර්වල නිෂ්පාදන පහසුකම් ඇති සමහර කුඩා ගොවිපොළවල් යම් අවස්ථාවකදී පත් වීමට පුළුවන. මෙවැනි අවස්ථාවකදී කළ යුත්තේ, තමාට ගැළපෙන වෙනත් ජීවන ක්‍රමයක් සොයා ගන්නා තෙක් මෙවැනි කුඩා ඉඩම් හිමියනට රජයේ තාවකාලික සහනාධාර ලබා දීමය. එහෙත් වැඩ කළ හැකි මිනිසුන්ගෙන් යුත් යම් සමාජ ස්ථරයක් හෝ යම් විශේෂ ගණයක ආර්ථික කටයුතු වර්ගයක් හෝ දිගින් දිගටම සිය පැවැත්ම සඳහා රජයේ අයවැය මගින් දෙනු ලබන උපකාර මත රඳා සිටින තත්ත්වයක් බිහි වීම වළක්වා ගත යුතුය.

මැනවි. උද්ධමනය නවතා ලීමට පමණක් වුවද, නොයෙකුත් කැප කිරීම්වලට සූදානම් අය බොහෝ වෙති.

අප්‍රමාණ වන මිල වැඩිවීම් මධ්‍යයේ වුවද කිසිවකුත් තවම මෙවැනි පොරොන්දුවක් දී නොතිබීම කණගාටුවට කරුණකි. මෙය ජනතාව බලාපොරොත්තු සුන් වූ තත්ත්වයක පසු වීමට එක් හේතුවකි. සතිපතා නිල වශයෙන් ප්‍රකාශ වන මිල වැඩි වීම් නිසා කෝපයට පත් වන ජනතාව, ඊළඟ දිනයේ කිසිම නිල ප්‍රකාශයකින් තොරව සිදු වන මිල වැඩි වීම් හේතු කොට ගෙන තව තවත් ප්‍රකෝප වෙති. එහෙත් **මූර්ත** පරිභෝජනය ඇසුරින් බලතොත් ජාතික ආරථිකයේ සාමාන්‍ය තත්ත්වය ජනතාව සිතන තරම් ම භයානක නොවේ. මිල වැඩි වීම් හා සමාන්තරව හෝ ඊටත් වඩා වැඩියෙන් හෝ නාමික වැටුප් වැඩි කර ගත් පුළුල් සමාජ ස්ථර රටේ ඇත. එසේ වුවද නිරන්තර මිල ඉහළ යාම් සම්බන්ධයෙන් මේ සියලු දෙනාම කෝප වෙති. නැවත නැවත ඇති නොවන පරිදි සිදු වන දැඩි මිල වැඩි වීම් සහිතව වුවද, සෑහෙන කම්පනයක් ජනතාවට ගෙන දෙන ස්වරූපයෙන් වුවද, නිශ්චිත හා පැහැදිලි ස්ථායීකරණ මෙහෙයුමක් ජනතාව අතර ජනප්‍රිය වෙතැයි සිතීමට ඉඩ ඇත්තේ මේ නිසාය.

මෙම ජනප්‍රියතාව රඳා පවතින්නේ නම් දෙන ලද පොරොන්දු ඉටු කිරීම උඩ බැව් නැවත වරක් අවධාරණය කළ යුතුය.

5. මෙම වැඩ පිළිවෙළෙහි අන්තර්ගත එක් ආකර්ෂණීය සාධකයක් නම් ආර්ථිකයේ පවතින **භාණ්ඩ අග හිඟකම්** අවසන් කර ලීමට එමගින් ඉඩ කඩ තිබීම ය. උද්ධමනය සම්බන්ධයෙන් මෙන්ම, නිසි වැඩ පිළිවෙළක්, මේ සම්බන්ධයෙන් ද, කිසිම දේශපාලන පක්ෂයකට නොතිබීම බේදනීය ය. ජනතාවගේ ඉතාම මූලික චෝදනාව මෙයයි: ග්‍රාමීය-නාගරික, තරුණ-මහලු, දුප්පත්-පොහොසත් භේදයකින් තොරව සමාජයේ හැම දෙනාම භාණ්ඩ හිඟකම්හි ආදීනවවලින් පෙළෙති; බඩු මිලට ගැනීමට පොලිම් සැදෙමින්, විකුණන්නාගේ අනුකම්පාව මත ජීවත් වෙති. භාණ්ඩ හිඟකම් පාරිභෝගිකයින්ට හිරිහැර ගෙන දෙයි. එය නිෂ්පාදකයන්ගේ කටයුතු ද අවුල් කරයි. මිලක් ගෙවීමට හැකි ඕනෑම කෙනකුට තම අවශ්‍යතා ඉටු කර ගැනීමට අවස්ථාවක් තිබෙන බව, හංගේරියානු - ඕස්ට්‍රියානු දේශ සීමාව පසු කර ඇති ඕනෑම කෙනකුට අත්දකින්නට ලැබුණු ප්‍රධාන පෙළේ කරුණක් වී ඇත. සමාජ ක්‍රම දෙකෙහි දක්නට ලැබෙන පැහැදිලි වෙනස්කම් අතර මෙය ඉතාම වැදගත් එකකි. භාණ්ඩ හිඟකම් අවසන් කර ගැනීමට පුළුවන් වුවහොත් මෙරටටද මේ හා සමාන පැහැදිලි වෙනසක් ඇති කර ගැනීමට පුළුවන. එවිට රටේ සැබෑ වෙනසක් සිදු වී ඇතැයි හංගේරියානුවන්ට දැනෙනු ඇත. අවසානයෙහි තමන්ට ද ගැනුම් කරුවන්ගේ වෙළෙඳ පොළක ඇති වාසි භුක්ති විඳ ගැනීමට පුළුවන් වී ඇතැයි ඔවුනට ඒත්තු යනු ඇත.

6. **රජයේ මුදල්වලට** අත්වන ඉරණම ගැන උපේක්ෂාව නොදක්වන, එම මුදල් නාස්ති කිරීම නුරුස්සන අයට මෙම කෘතියේ යෝජිත ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රිය මනාප වනු ඇත. මෙ වැන්නෝ රාජ්‍ය අරමුදල් භාරව ඉන්නා සෑම නිලධාරියකුම දැඩි දේශපාලන අධීක්ෂණයකට යටත් කළ යුතු යයි ඉල්ලා සිටින්නෝ වෙති.

7. **රාජ්‍ය අයිතිය මුල් කර ගත් ප්‍රතිපත්ති** අනුමත කරන අයට මෙම වැඩ පිළිවෙළ දැඩි ලෙස සිත් ගන්නා සුළු හෝ අධික වශයෙන් බිය උපදවන සුළු හෝ නොවනු ඇත. අප මෙහි කතා කරන්නේ රජයේ ව්‍යාපාර භාර කළමනාකරුවන් ගැන පමණක් නොව, කලක් තිස්සේ සමාජවාදී සිද්ධාන්තවලට සහයෝගය දෙමින් සිටි, තවමත් එසේ කරන, නිෂ්පාදන උපකරණවල අයිතිය පුද්ගල සන්තක නො වීම සදාචාර ධර්මයක් ලෙස අගය කරන අය ද ගැන ය. රාජ්‍ය අයිතියට එරෙහිව හේතුරහිතව ප්‍රහාර එල්ල කිරීමෙන් වළකින ලෙසත්, වගකීමෙන් තොරව රාජ්‍ය වත්කම් විනාශ නොකරන ලෙසත් මෙහි යෝජිත ක්‍රියාදාමය මගින් අනතුරු ඇඟවේ. පෞද්ගලික දේපොළ රාජ්‍යසන්තක කළ රැඩිකල් ක්‍රියාදාමය එවැනිම හදිසියකින් හා වගකීමෙන් තොර භාවයකින්, අනෙක් අතට ක්‍රියා කරවීම (එනම් රාජ්‍ය දේපොළ පුද්ගලිකකරණය) ගැන එය අනතුරු අඟවයි. මෙම අංශ දෙක අතර අව්‍යාජ තරගයක් ඇති කිරීම අපගේ බලාපොරොත්තුවයි. නිලධාරිවාදී රාජ්‍ය අයිතියට වඩා පෞද්ගලික අයිතිය උසස් ය යන්න සනාථ කිරීමේ ශක්තියට සමානුපාතිකව ය, දෙවැන්නේ කාර්ය භාරය පුළුල් විය යුත්තේ. තම මුදල්වලින් හෝ (තම වත්කම් උකසට බැඳීමෙන් ලබන) ණය මුදලකින් හෝ රාජ්‍ය අංශයේ කොටස් මිලට ගැනීමට පෞද්ගලික ව්‍යවසායකයන්ට ඇති ශක්තිය වැඩි දියුණු වන වේගයට අනුකූලවය, ඔවුනට රාජ්‍ය අංශයේ දේපොළ මිලට ගැනීමට ඉඩ සලසා දිය යුත්තේ.

සැබැවින්ම ස්වාධීන වන ආයතන යටතේ ආයතනික අයිතිය දියුණු කිරීමට හෝ සැබෑ සමුපකාර අයිතිය වැඩි දියුණු කිරීමට හෝ මෙම වැඩ පිළිවෙළින් බාධා එල්ල නොවේ.

මේ සියල්ල ළඟා කර ගත හැකි වන්නේ ඓන්ද්‍රීය සංවර්ධනයක ප්‍රතිඵලයක් වශයෙනි. ඓන්ද්‍රීය ධනේශ්වරකරණයක් හේතු කොට ගෙන, රටේ දේපොළ අයිතියෙන් රාජ්‍ය අංශයට ඉතිරි වනු ඇති ප්‍රතිශතය කොපමණ දැයි ගණනය කිරීමට සමහර විට අවුරුදු පහක්, දහයක් හෝ විස්සක් වුවද බලා සිටීමට සිදු වනු ඇත. කෙසේ වුවද, දෘඪ අය-වැය සංරෝධක ඇති, නියත වශයෙන්ම වෙළෙඳ පොළ දිශාභිමුඛ වූද, තිරසාර ව්‍යාපාරික ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නා වූද පුද්ගලික අංශයේ හැසිරීමට අනුරූපීව හැසිරෙන රාජ්‍ය අංශයක් බිහි වීමට නම් මෙලෙස ඉතිරි වන රාජ්‍ය අංශය සෑහෙන තරම් කුඩා විය යුතු බව අපගේ අදහසයි.

රාජ්‍ය අංශයේ සාර්ථක භාවය පිළිබඳව විශ්වාසයකින් සිටින අයට මේ අනුව කිරීමට ඇත්තේ දැඩි ලෙස විරුද්ධ වීමක් නොව ක්‍රියාශීලී ලෙස වැඩ කිරීමට පටන් ගැනීම ය. කෙසේ හෝ, රාජ්‍ය දේපොළ ක්‍රමය එක් පහරින් සුණු විසුණු කිරීමට ඉදිරිපත් වන සමහර යෝජනාවලට වඩා, මෙම වැඩ පිළිවෙළ සිත් ඇද ගන්නා සුළු වනු ඇත.

8. කවර හේතුවක් නිසාවත්, **රජයේ සම්පත් හා දේපොළ තැති හංග කරමින් තාස්ති නොකළ යුතු යැයි** මෙහි යෝජිත ප්‍රතිපත්තියෙන් කියැවේ. මෙවැනි සිද්ධියක් මහජනයා කුපිත කරවයි. රජයේ ධනය, ජනතාවගේ ධනය බැව් කියැවෙන සටන් පාඨයක් දශක ගණනාවක් මුළුල්ලේ රට පුරා පැතිරී තිබුණි. මේ කියමන අර්ධ සත්‍යයකි. ඊට හේතුව, පවත්නා සංකීර්ණ

නිෂ්පාදන ක්‍රියාවලිය මිලියන දහයක් වන රටේ ජනතාව විසින් පාලනය කරනු නොලැබීමත්, එසේ කිරීමට ඔවුනට කිසිම පුළුවන් කමක් නොතිබීමත් ය. රජයේ දේපොළ වනාහී සැමටම අයිති, එහෙත් කිසිවකුටත් අයිති නැති දෙයක් බැව් මේ පොතේ වරින් වර කියැවී ඇත.

තවත් අතකින් බලන කල රාජ්‍ය දේපොළ ජනතා සන්තක දේපොළ ය යන සටන් පාඨය නිවැරදිය. රටේ ජනතාවගේ ශ්‍රමය හා කැප කිරීම් සියල්ල රාජ්‍ය ධනය තුළ අන්තර්ගත වී තිබෙන හෙයිනි. මේ මහා ධනස්කන්ධයට හිමි වන ඉරණම පිළිබඳව දැන ගැනීමට ජනතාවට අයිතියක් තිබේ. රජයේ දේපොළ සම්බන්ධ සෑම විකුණුමක් ම සාධාරණ වාණිජ කොන්දේසි මත ජනතාවට දැන ගත හැකි පරිදි ප්‍රසිද්ධියේ සිදු කළ යුතුය යන්න යෝජිත වැඩ පිළිවෙළට අඩංගු එක් අංග ලක්ෂණයකි. ඒ වනාහී අනුගාමිකයින් දිනා ගැනීමට සුදුසු ජනප්‍රිය අදහසක් වේ.

9. දැන් මා පැවසීමට අදහස් කරන කරුණ යට දැක්වුණු කරුණට සම්බන්ධ වුවද, වැඩි අවධාරණය සඳහා එය වෙන් කොට දැක්වීම සුදුසුය. විදේශිකයින්ට, රජයේ දේපොළ බංකොලොත් ව්‍යාපාර මෙන්, කුණු කොල්ලයට විකිණීමට ඉඩ තැබීම වැරදි ය. මේ සම්බන්ධයෙන් ද අප කළ යුත්තේ, අවශේෂ රටවලට බිය වී හුදකලාව සිටීමට තැත් කිරීමක් හෝ බටහිර විරෝධී ආකල්ප දරා සිටීමක් හෝ නොව, බුද්ධිමත් ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නගා ගැනීමයි. හංගේරියානු ජනතාවට එමගින් සෙතක් සිදු වේ නම්, විදේශිකයන්, හංගේරියාව තුළ, ව්‍යාපාර මිලට ගැනීම, කාර්යාල හා සාප්පු පවත්වා ගෙන යාම, හවුල් ව්‍යාපාර ගොඩ නැංවීම යනාදියෙන් රටට අතිමහත් ප්‍රයෝජන අත්පත් වනු ඇත. එහෙත් ෂැම්පේන් සාදයන් සහිතව, ජනමාධ්‍යවලින් කෙරෙන ප්‍රචාර යටතේ, බොහෝ නව හංගේරියානු - බටහිර හවුල් ව්‍යාපාර විවෘත කිරීම් අප මෙහි කතා කරන කරුණ පිළිබඳ සාර්ථක භාවයක් පෙන්නුම් කරන දර්ශක නම් නොවේ. ඒ වෙනුවට, මෙම ගනුදෙනු රටට වැඩදායක බව පෙන්වන විෂයමූලක විශ්ලේෂණ අවශ්‍යය.

සීමා බන්ධනවලින් තොරව, විදේශීය ප්‍රාග්ධනය රට තුළට ආක්‍රමණශීලීව ගලා ඒම වැළැක්වීමට නීතිමය සීමා අවශ්‍ය වේ. නිලධාරිවාදී තහංචි යොදා විදේශීය ප්‍රාග්ධනය රට ගැන දක්වන උනන්දුව නැති කර දමනු වෙනුවට, අප කළ යුත්තේ, විදේශීය ප්‍රාග්ධනය පිළිගන්නා සීමාවන් පැහැදිලිව හා අවංකව ප්‍රකාශ කිරීමත්, 'ඕනෑවට වැඩි', ආක්‍රමණ ශීලී යන අපේ සංකල්ප පැහැදිලිව පෙන්වා දීමත්ය.

අපගේ ස්වායත්තතාව තහවුරු කරන, එහෙත් අනවශ්‍ය විදේශ - විරෝධී ආකල්පවලින් තොර, මෙවැනි ජාතික ප්‍රතිපත්ති, විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමේ හැකියාව වර්ධනය කරනු ඇත.

මෙම වැඩ පිළිවෙළෙහි ජාතික ස්වරූපය කියාපාන තවත් එක් කරුණක් ගැන අදහස් දැක්වීම වැදගති. බටහිර ව්‍යාපාර ලෝකයේ ආයතන අන්ධානුකරණය කළ යුතු නැතැයි මෙම ග්‍රන්ථයේ වරින් වර සඳහන් වේ. මෙම අනතුරු ඇඟවීම කෙළේ නිව්යෝර්ක්, සූරික් හා තෝකියෝ වැනි ව්‍යාපාර වස්තු වෙළෙඳ පොළ පිළිබඳ අත්දැකීම්වලින් ප්‍රයෝජන නොගෙන, අපට ම විශේෂ වූ ව්‍යාපාර කොටස් වෙළෙඳ පොළක්, වහාම

හෝ කල් පසු වී හෝ, හංගේරියාවේ ගොඩ නංවා ගත යුතුය යන විශ්වාසය පදනම් කර ගෙන නොවේ. විදේශීය රටාවන් විචාරයෙන් තොරව අනුකරණය කිරීමට විරුද්ධව මා එල්ල කරන අනතුරු ඇඟවීම පදනම් වී ඇත්තේ, ආයතන ගණනාවක්ම වර්ධනය විය හැක්කේ, ඓන්ද්‍රීය ඓතිහාසික සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස පමණක්ය යන විශ්වාසය මතය. පසුගිය දශක කීපය තුළ, ආයතන රාශියක්ම සමාජයේ මුල් බැස ගැනීමට අපොහොසත් වූයේ, ඒවා මනා සැලසුමකින් තොරව, සමාජය වෙත කෘත්‍රිම වශයෙන් ආරෝපණය කැරුණු බැවිනි. එහෙත් හංගේරියානු ඓතිහාසික වර්ධනයේ මෙම නව අවධිය විසින්, වෙළෙඳ පොළ, ආර්ථික කළමනාකරණය හා ව්‍යාපාරික ලෝකය පිළිබඳ නොයෙකුත් සංවිධාන, නීතිමය ආයතන, හා සමාජ පැවැතුම් විධි බිහි කැරෙනු ඇත. මෙහි දී බටහිර ආකෘති හා බටහිර ව්‍යාපාරිකයන් සමග ඇති කර ගැනෙන සම්බන්ධතා බලපානු ඇත. අපගේ ආත්ම ගෞරවය රැක ගනිමින් හැකි තාක් ඔවුන්ගෙන් උගනිමු. විදේශීය බැංකුකරුවන් ගේ හා කර්මාන්තකරුවන් ගේ අනුමැතිය ලබා ගැනීම අපගේ පළමු ප්‍රමුඛතාව නොවිය යුතුය. කොහොමටත්, ඔවුන් එසේ කරන්නේ රට මතුපිට ගැන පමණක් වන දැනුමක් තුළිනි. ආර්ථික වැඩ පිළිවෙළක් අනුමත කළ යුත්තේ රටේ ජනතාවය.

10. මෙම අධ්‍යයනයෙහි අඩංගු යෝජනා තවත් අතකින් ආකර්ෂණීය වනු ඇත. එනම් ව්‍යාකූල තත්ත්වයක් තුළින් **පිළිවෙළක් ඇති තත්ත්වයක්** බිහි කිරීමට එය සමත් වන නිසාය. හංගේරියානු පුරවැසියන් වැඩි දෙනාගේ අදහස, තම රට අර්බුදකාරී, අවුල් සහගත හා අසංවිධිත තත්ත්වයක පසු වන බවයි. අණපනත් දිනපතා ඇති වෙමින් නැති වෙමින් පවතී. අද පවසන දේට ප්‍රතිවිරුද්ධ දේ හෙට සිදු වේ. පරස්පර විරෝධී පියවරවල් ක්‍රියාත්මක වන බැවින් ඒවා අතුරෙන් කඩ කළ යුත්තේ මොනවාද, අනුකූල විය යුත්තේ මොනවාටද යන්න තෝරා ගැනීමට ආර්ථික කළමනාකරුවන්ට ද පුද්ගලයනට ද නිදහස තිබේ. නීති බලාධිකාරිය බිඳ වැටී ඇත. මහජනයා තුළ නීති කැඩීමට විශේෂ බියක් සැකක් නොමැත. එසේ කඩ කොට අසු වුවහොත් ලැබෙන උපරිම දඬුවම ඔවුන් රැකියාවෙන් එළියට දැමීම වැනි දඬුවමක් වනු ඇත.

අවුල් වියවුල්වලින් තොර 'පිළිවෙළක්' ඇති තත්ත්වයක් ගැන ඇසෙන විට මිනිසුන්ගේ සිතට නැගෙනුයේ යුද්ධ ටැංකි, සිර දඬුවම්, තම අදහස් එළිපිට කියා පෑ මිනිසුන්ට අත් වූ ඉරණම් යනාදියයි. මෙවැනි තත්ත්වයක් ඇති කිරීමට පක්ෂ වීම යනු ස්ටැලින්වාදී වකවානුවට ආපසු යෑමක් සේ මිනිසුන් දකින්නේ එබැවිනි. හංගේරියාවේ ප්‍රසිද්ධ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ විද්‍යාඥයකු වන සැන්ඩෝර් සාලෙයි ගේ කියමනක් නිතර නිතර උපුටා දැක්වේ. 'අපට තෝරා ගැන්මට ඇත්තේ විකල්ප දෙකකින් එකකි. බැරැක්කය හෝ ගණිකා මඩම යනු ඒ දෙකයි'. හමුදා බැරැක්ක විනය නොරිසි අය, ගණිකා මඩමේ පවතින අරාජක භාවය ඉවසා සිටීමට සූදානම් විය යුතුය.

වෙනත් අවස්ථාවන්හි දී කෙසේ වෙතත්, මම මෙතැනදී තුන්වන විකල්පයක් දකිමි. හංගේරියාවට විනයක් අවශ්‍ය වේ. එහෙත් ඒ බැරැක්ක

විනය නම් නොවේ. යෝජිත ප්‍රතිපත්තිය, එලෙස නිරවුල් ක්‍රමානුකූල තත්ත්වයක් හැඩ ගස්වා ගත හැකි ආකාරයක් දක්වයි. උද්ධමනය හේතු කොට ගෙන ඇති වී තිබෙන අනාරක්ෂිත භාවය තුරන් කර ගනිමු. නිරන්තර මිල වෙනස් වීම් නිසා අනාගතය ගැන කිසිම ගණනය කිරීමක් කළ නොහැකි, පවතින ව්‍යාකූල තත්ත්වයෙන් රට මුදවා ගනිමු. පුද්ගලික නිදහස, පුද්ගලික දේපොළ, ඉතිරි කිරීම් හා ආයෝජන සම්බන්ධ ආරක්ෂාව යනාදිය සහතික කරන ස්ථාවර නීති තිබීම වැදගත් ය. රජයේ අය-වැය තුලනය විය යුතුය. සීමාවෙන් තොරව වියදම් කිරීමේ රජයේ පුරුද්ද නවතා දමා, වියදම් පියවීමට මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිළිවෙත නවතා දැමිය යුතුය.

මේ අනුව මෙය වනාහී රටේ නිරවුල් තත්ත්වයක් පවත්වා ගෙන යාමට පක්ෂපාතී වැඩ සටහනකි. මිනිසුන් ඊට කැමැති වීමට ඇති ප්‍රධාන හේතුවක් වන්නේ ද එයම ය.

3.2 අසහනයට හේතු

මෙහි අන්තර්ගත ව ඇති ආර්ථික ප්‍රතිපත්තිය ජනගහණයේ කවර කොටස්වලට, කෙතෙක් දුරට සිත් ගන්නා සුළු වන්නේ ද යන්න පසු ගිය කොටසෙහි විමසා බැලිණි. කෙසේ වුවද, මින් ව්‍යාජ බලාපොරොත්තු ඇති කිරීමට මට වුවමනා නැත. මෙම වැඩ පිළිවෙළ එක් අතකින් ජනතා සිත් පිනවිය හැකි අතර අනෙක් අතට, ජනයාගේ පිළිකුලටද ලක් වීමට ඉඩ ඇත. එක් අතකින් එය වෙත, ජනයාගේ අනුකම්පාව ද, අනෙක් අතට වෛරය ද ඇදී ආ හැක. මෙම වැඩ පිළිවෙළ, එක් පන්තියක වුවමනාවන් ආරක්ෂා කරන, තවත් පන්තියක වුවමනාවන්ට පහර දෙන එකකැයි සරල මාක්ස්වාදී තේරුමකින් එයට පක්ෂ විපක්ෂ අදහස් බෙදී යන අන්දම විස්තර කළ නොහැකිය. 'පන්තිය' යන යෙදුම, මාක්ස්වාදී අර්ථයෙන් ම ගෙන බැලුවහොත්, එකම පන්තියේ සාමාජිකයින් යෝජිත වැඩ පිළිවෙළට විවිධ ප්‍රතිචාර දක්වනු ඇත. වෙනෙකක් තබා එක් තනි පුද්ගලයකු පවා ඒ ගැන දක්වන ආකල්ප පැහැදිලි රටාවක් නොගනු ඇත. සමස්තයක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතුව ඇති මෙම වැඩ පිළිවෙළින් සමහර කොටස් ඉවත ලා, ඉන් කරුණු කීපයක් පමණක් ක්‍රියාත්මක කිරීමට සමහර අය කැමති විය හැක. මෙසේ ඇති විය හැකි ගැටුම් හා අසහනතා විවිධ ය. මේවා අතුරින් කීපයක් පමණකි මෙහි සලකා බැලෙනුයේ.

(අ) රාජ්‍ය අංශයේ සේවක වැටුප් : රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ක්‍රියාකාරී විරෝධතා මධ්‍යයේ යෝජිත ආර්ථික පිළිවෙත අනුගමනය කිරීමට උත්සාහ දැරීමෙන් විනාශකාරී තත්ත්වයක් උද්ගත වීමට ඉඩ ඇත. ඇත්ත වශයෙන් ම එය කළ නොහැකි කාර්යයක් වනු ඇත. මේ සම්බන්ධයෙන් විදෙස් රටවලින් ලැබෙන නිදසුන් ගැන සිතා බැලීම වටී.

එවැනි නිදසුනකි, යුද්ධයෙන් පසු ජර්මනියේ හා බ්‍රිතාන්‍යයේ සංවර්ධන අත් දැකීම් සංසන්දනය. ජයග්‍රාහී බ්‍රිතාන්‍යයේ ආණ්ඩු බලය දිනා ගත් කම්කරු පක්ෂය, කර්මාන්ත රාශියක් ජනසතු කෙළේය. ඒ අතර වෘත්තීය සමිති සතු බලතල අසාමාන්‍ය ලෙස වැඩි විණි. පුනර් ව්‍යාප්තිය සඳහා සටන බ්‍රිතාන්‍ය සමාජයේ ස්ථාවරව පිහිටුවිණි. වෘත්තීය සමිති, සංවිධානය වූ කම්කරුවන්ට, ජාතික නිෂ්පාදිතයෙන් ලැබෙන කොටස වැඩි කර ගැනීම සඳහා වැඩ වර්ජන

දියත් කළහ. අත්‍යවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටි, සාපේක්ෂ වශයෙන් කුඩා කම්කරු කොටස්, නොයෙක් වතාවලදී, සමස්තයක් ලෙස කර්මාන්ත අඩපණ කිරීමට, සිය අංශ තුළ ඇරඹුණු වැඩ වර්ජන මගින් සමත් වූහ. මේ අකාරයෙන් බ්‍රිතාන්‍ය ආර්ථික වර්ධනය නැවතුණේ නැතත්, එය අර්බුද තත්ත්වයකට නො ආවත්, එහි ප්‍රගතිය මන්දගාමී වූ අතර බ්‍රිතාන්‍යය සිය තරගකරුවන්ට පසු බා ගිය රටක් බවට පත් විණි.

පරාජිත බටහිර ජර්මනියේ තත්ත්වය දියුණු වූයේ මීට වෙනස් ආකාරයකිනි. ස්ථායීකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ අවධියේ එරට ආණ්ඩු බලයේ සිටියේ ලිබරල් කොන්සර්වැටිව් සහාග ආණ්ඩුවකි. ඉන් අනතුරුව ලිබරල් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණක් හා මාරු වෙමින්, ජර්මනියේ පාලනය ගෙන ගියේ, දේශපාලන කණ්ඩායම් දෙකකි. ඉතා සුළු කාලයකට පමණක් මේ පක්ෂ දෙකේ මහා සන්ධානයක් ද ඇති විය. කුමන පක්ෂය රට ආණ්ඩු කළත්, එරට ආර්ථික - සමාජ ක්‍රමයේ පැවැති ස්ථාවර සාධකය වූයේ, වෘත්තීය සමිති, රාජ්‍ය හා පුද්ගලික අංශ සමග නිර්මාණාත්මක සහයෝගයකින් වැඩ කිරීම ය. එම තත්වය හෙළා දැකීම සඳහා යෙදෙන බොල්ෂේවික් පක්ෂ වචනයක් භාවිතා කළහොත්, බටහිර ජර්මනියේ 'පන්ති සාමය' ස්ථාපිතව තිබුණි. යුද්ධයෙන් දරුණු ලෙස විනාශ වූ බටහිර ජර්මන් ආර්ථික වේදිකාවේ ප්‍රධාන නළුවන් තිදෙනා ම, එනම් (මහා, මධ්‍යම, සුළු පරිමාණ) යන පෞද්ගලික අංශයට අයිති කොටස, රාජ්‍ය නිලධාරිවාදය හා වෘත්තීය සමිති, තේරුම් ගත්තේ, ආදායම් පුනර්ව්‍යාප්තිය සඳහා අරගල කර ගැනීම සිය දිවි නසා ගැනීමක් හැටියට ය. ඒ වෙනුවට, කළ යුත්තේ, සැම දෙනකුම සඳහා ඇති පාන් කැබැල්ල නොකඩවා වැඩි කර ගැනීමට තැත් කරනවා විනා, එක් එක්කෙනා අත ඇති කොටස ගැන ආරවුල් ඇති කර නො ගැනීම ය.

යුද්ධයෙන් පසුව බටහිර ජර්මනිය හා බ්‍රිතාන්‍යය අතර ආර්ථික වර්ධනය අතින් පැවැති වෙනස්කම්වලට හේතු එක් සාධකයකට පමණක් සීමා කිරීමට වෑයම් නොකරමි. එහෙත් ඊට මුල්වූ සාධක ගණනාවක් අතුරින් ඉහත සලකා බැලුණු වෙනස්කම මුල් තැනක් හෝ සමහර විට ඉතාම වැදගත් තැන ගන්නා සෙයක් දැකීමට පුළුවන.

අපට වඩා කිට්ටු රටක් වන පෝලන්තය දෙස දැන් අපි හැරී බලමු. එරට මෑතක දී නව ජාතික සමගි ආණ්ඩුවක් පිහිටුවන කාලය වන විට, අවුරුදු 10 - 15 ක කාලයක් මුළුල්ලේ, එරට පැවතියේ සේවා යෝජකයා ලෙස පෙනී සිටි රාජ්‍යයත් සේවකයනුත් අතර නිරන්තර සටනකි. මෙහිදී සේවකයන් නියෝජනය කළේ සොලිඩැරිටි ව්‍යාපාරයයි. එහි අරමුණ වූයේ ප්‍රජාතාන්ත්‍රික නිදහස දිනා ගැනීමයි. ඒ සඳහා කැරුණු සටන, නිතර වෘත්තීය සමිති අරගල (වැටුප් වැඩි කරවා ගැනීමේ වැඩ වර්ජන යනාදිය) හා බැඳී පැවතිණි. මේ අනුව එම අරගලය ඉතිහාසයේ අපූර්ව අරගලයක් වී ඇත. එය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම සඳහා කළ සටනක් වන අතර ම, ආර්ථික විනාශයකට සූදානම් වීමක් ද විය. එය තම ප්‍රතිපත්ති පාවා දෙනවාට වඩා මිය යාම යෙහෙකැයි සලකා, ආහාර ප්‍රතික්ෂේප කරමින්, දේශපාලන වීරයකු කරන සත්‍ය ග්‍රහයක් වැනි විය. එහෙත් කෝටි ගණනක ජනතාව නම් එවැනි වීර ක්‍රියාවලට පෙළඹෙනුයේ ටික කලකට, පරිවර්තනමය කාලයකට පමණි. ඉන් පසුව ඔවුන්ට හොඳින් කා බී ජීවත් වීම අවශ්‍යය. පාන් හා මස් පමණක් නොව ඔවුනට සාමකාමී සැපවත් ජීවිත ගත කිරීමට ද අවශ්‍යය. නිරන්තර වැඩ

වර්ජන, එවැනි තත්ත්වයකට අවශ්‍ය භෞතික පදනම විනාශ කරලයි. මෑතක දී පෝලන්තයේ ඇති වූ වෙනස් වීම්, ආර්ථිකයේ ප්‍රධාන නළුවන් (එනම් නිලධාරිවාදය, රාජ්‍ය හා පුද්ගලික අංශවල කළමනාකරුවන්, රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවකයන්) අතර සම්මුතියක් හා සහාගයක් ඇති කිරීමට තුඩු දෙන කොන්දේසි බිහි කරනු ඇතැයි සිතේ.

මෙතෙක් වේලා අප විමසා බැලූ විදේශීය නිදසුන්වලින් මෑත් වී, නැවත වරක් හංගේරියාව දෙසට හැරෙමු. මෙම පොතේ යෝජිත ආර්ථික ප්‍රතිපත්තිය රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබා දෙනු ඇති වරප්‍රසාද කවරේද? පසුගිය කොටසේ දැක්වුණු කරුණු දහයෙන් සෑහෙන කොටසක් ඔවුන්ගේ සිත් ඇද ගනු ඇත. එම කරුණු බොහොමයක් සමාජ පන්ති තත්ත්වය හා බැඳුණු ඒවා නොවන බැවිනි. තමාගේ ම ව්‍යවසායයක් ඇරඹීමට අදහස් නොකරන කම්කරුවකුට, තම සහෝදරයාගේ ගමේ ඇති ගොවිපොළ දියුණු වනු දැකීම හෝ තම පුතා නගරයේ පුද්ගලික ව්‍යාපාරයක වැඩ කරනු දැකීම ප්‍රීතියට කරුණක් වනු ඇත. මෙතෙක් කල් නිලධාරි වාදයේ අසීමිත සීමා කිරීම්වලින් බැට කමින් සිට ඇති ඔහු, නිර්බාධීකරණ ප්‍රතිපත්ති හා තම සිවිල් අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ ලැබීම නිසා සිය ජීවිතය පහසු වනු දැක සතුටු වනු ඇත.

එහෙත් අප මුහුණ දෙන මූලික ම උභතෝකෝටිකය වසන් කිරීමට මට නුවුවමනාය. 1.4 හා 2.3 කොටස්වල විස්තර කළ පරිදි, දැඩි වැටුප් විනයක අවශ්‍යතාව මම තරයේ ප්‍රකාශ කරමි. රාජ්‍ය අංශයේ සේවක වැටුප් වර්ධනය ස්ථායීකරණ මෙහෙයුමේ දී නැවැත්විය යුතු ය; නොඑසේ නම්, වැටුප් වැඩි වීම අවම තත්ත්වයෙන් පවත්වා ගත යුතුය. වැටුප කුමන ප්‍රමාණයකින් වැඩි කළ යුතු දැයි මට කිව නොහැක. එහෙත් ස්ථායීකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, වැටුප් වැඩි විය හැකි නම්, ඒ කොපමණකින් ද යන්න එළිදරව් වනු ඇත. ස්ථායීකරණ මෙහෙයුමෙහි දී පවත්වා ගැන්මට තීරණය කැරුණු නාමික වැටුප් මට්ටම දැඩි ලෙස පවත්වා ගත යුතු බව නම් මම කියමි. මෙම ප්‍රතිපත්තිය ලිහිල් කළහොත් අන් සෑම කටයුත්තක්ම අඩාල වනු ඇත. එවිට ශීඝ්‍රයෙන් වැටුප් වැඩි වී භාණ්ඩ මිල පාලන විරහිතව ඉහළ නගිනු ඇත. ජනප්‍රියතාව අරභයා මිල පාලනය කළහොත්, මහා පරිමාණ භාණ්ඩ හිඟයන් ඇති වී, ප්‍රතිසංස්කරණවලට පෙර තිබූ තත්ත්වයටම රට යළිත් පත් වනු ඇත. මෙවැන්නකින් පසුව නම් ජනතා විශ්වාසය දිනා ගෙන අලුත් ස්ථායීකරණ ප්‍රයත්නයක් ගැනීම අතිශයින් දුෂ්කර කටයුත්තක්, එසේ නැතහොත් කොහෙත්ම කළ නොහැක්කක් වනු ඇත.

වැටුප් විනය යටතේ වැටුප් වැඩි වීම් ඉල්ලා නොසිටීමට සේවකයනට සිදු වෙතත්, කල් තියාම ඊට එකඟ වීමට රාජ්‍ය අංශයේ සේවකයන් කැමති කරවා ගැනීම කොහෙත්ම කළ නොහැකි දෙයක් නොවනු ඇත. ජාතික ආර්ථිකය ප්‍රපාතයට ඇද වැටීමෙන් ගලවා ගැනීමට නම් මෙය අත්‍යවශ්‍ය වන බව ඔවුන්ට තේරුම් කර දීමට මහන්සි ගත යුතුය. මෙම නව ප්‍රතිපත්ති සම්පූර්ණ වූ කල ඔවුහු ද ඒවායේ වාසි භුක්ති විඳින්නෝ වෙති. මෙය එක පැත්තක වාසිවලට සමාන අවාසි ප්‍රමාණයක් අනික් පැත්තට ලැබෙන 'ශූන්‍ය - එකතුව ඇති ක්‍රීඩාවක්' නාවේ. අද බටහිර ජර්මන් කම්කරුවෝ සිය බ්‍රිතාන්‍ය සගයන්ට වඩා උසස් ආර්ථික මට්ටමක සිටිති. ආර්ථිකය පුනර්ජීවනයට පත් ව, නිෂ්පාදනය වැඩි වන විට, උද්ධමනය අඩු වී මිල ගණන් විශ්වාස කළ හැකි තත්ත්වයකට පැමිණි විට, තමන් සතු ෆොරින්ට්

මුදල් තම සාක්කු තුළ දිය වී යාම නැවතී, ඉතිරි කිරීම්වල ක්‍රය ශක්තිය ස්ථාවර වෙයි. මේ සියල්ල සේවකයනටද වාසි ගෙන දෙයි.

කාලයක් තිස්සේ වැඩ වර්ජනය කිරීමේ සේවක අයිතිය ඔවුනට අහිමිව තිබිණ. දැන් ඔවුහු තමන් සතු අවියේ බලගතුකම තේරුම් ගන්නට පටන් ගනිති. එය පාවිච්චි කිරීමට ඔවුන් පෙළඹීම නවත්වා ලීම නම් අමාරු කටයුත්තක් වන බව මම දනිමි.

වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ එදිරිවාදිකම් පැන නැඟී ඇත. ඉතිහාසඥයකු හෝ දේශපාලන විද්‍යාඥයකු ලෙස අද පවත්නා තත්ත්වය නිරීක්ෂණය කරන ඕනෑම තැනැත්තකුට, වෘත්තීය සමිති නිලධාරීන්ගේ ක්‍රියාකලාපයට හේතු විස්තර කිරීම පහසුය. ඔවුන්, මෙතෙක් බලයේ සිටි පක්ෂය හා රාජ්‍ය නිලධාරිවාදය සමග අතිනත ගෙන කටයුතු කළ හයි ද, මේ අයට අවශ්‍ය දේ කරවා දෙන්නන් හැටියට ක්‍රියා කළහයි ද යන චෝදනා මෙම වෘත්තීය සමිති නිලධාරීනට විරුද්ධව එල්ල වෙමින් තිබිණි. තත්ත්වය තව දුරටත් මෙසේ නොවන බව පෙන්වා දීමට මෙය කදිම අවස්ථාවකැයි බොහෝ දෙනකුට දැන් හැඟී යා හැක. එසේ කිරීම කම්කරුවන් අතර ජනප්‍රිය වීමට හේතු විය හැකි අතර, එහි දී මුහුණ දීමට ඇති අවදානමක් ඔවුනට නොපෙනෙනු ඇත. වර්තමානයෙහි වැඩ වර්ජනයක් කිරීමට කම්කරුවන් පෙළඹවූහයි රහස් පොලීසිය විසින් කිසිවකුත් අල්ලා ගෙන යාමක් ගැන අසන්නට නො ලැබේ.

වෘත්තීය සමිති සිය ආයුධ බිම තැබිය යුතු යැයි මම දේශනා නොකරමි. කම්කරුවනට වන නියම හානි ගැන සිහි කල්පනාවෙන් පසු වීම හා ඒවා වැළැක්වීමට කටයුතු කිරීම වෘත්තීය සමිති නිලධාරීන් ගේ කර්තව්‍යය වෙයි.[58] සමාජය තුළ තමන් සතු අතිමහත් ශක්තිය හොඳින් දැන ගෙන, ඔවුහු නව ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති සාධනයේ දී හවුල් විය යුත්තාහ. එහෙත් දෙපැත්ත කැපෙන ආයුධයක් වන වැඩ වර්ජනය ඔවුන් පාවිච්චි කළ යුත්තේ පරිස්සමිනි. රටේ ආර්ථික පුනරුදය මුලින් ම රඳා ඇත්තේ, ආර්ථිකයේ ප්‍රධාන නළුවන් එකිනෙකා හා එකඟ වන තරම හා ඔවුන් එලෙස එළඹෙන එකඟතාවන් තෙකෙත් දුරට ආරක්ෂා කෙරේද යන්න මත ය.

ආ. විරැකියාව: විරැකියා තර්ජනය ගැන මීට ඉහත සඳහන් කොට ඇත. එහෙත් පුනරුක්ති දෝෂයට අසු වෙමින් නමුදු, සමාජ ගැටුම්වලට හේතු වන එක් ප්‍රභවයක් ලෙස නැවත වරක් විරැකියාව සාකච්ඡාවට ගත යුතුව ඇත.

---

58. ජාතික ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයෙහි දී ක්‍රියාකාරී ලෙස සහභාගි නොවිය යුතු බැව් වෘත්තීය සමිතිවලට කියා සිටීමට මම නොකැමැත්තෙමි. 3.3 කොටසෙහි දී මම නැවත නැවත මේ දෙසට හැරෙමි. මා අවධාරණය කරන්නේ, සේවක අයිතිවාසිකම් සුරැකීම, රැකියාවට සුදුසු යහපත් වාතාවරණයක් සැපයීම, තමන්ගේ බලය අයුතු ලෙස යොදා ගන්නා කළමනාකරුවන්ට විරුද්ධව ඒකාබද්ධ පෙරමුණක් ගොඩ නැංවීම හා ව්‍යාපාර තුළ අභ්‍යන්තර ආරවුල් නවතා ගැනීම යනාදී සුක්ෂ්ම මට්ටමින් කළ යුතු කටයුතු අතිමහත් වන බවය. දැනට මෙම ක්ෂේත්‍රයන්හි ලබා ඇති ජයග්‍රහණවලට අමතරව ඉදිරියේදී ලබා ගත යුතු දෑ අපමණය. තවද, සමස්තයක් ලෙස වෘත්තීන්හි අයිතිවාසිකම් දිනා ගැනීමේ දී කළ යුතු බොහෝ දේ ද වෘත්තීය සමිතිවලට ඇත. යට කී කරුණුවලට අවධානය යොමු කරනවා මිස, අන් වෘත්තීන් හා තරගයට තම වෘත්තියේ වැටුප් වැඩි කර ගනිමින් හුදෙක් ආදායම් පුනර් ව්‍යාප්ති අරමුණෙන් ක්‍රියා කිරීම වැරදිය. සියලු වෘත්ති මෙසේ කරන්නට ගියහොත් ඇති වනුයේ, මෙම පොතෙහි අනතුරු අඟවා ඇති දේම ය. එනම් වැටුප් විනය ලිහිල් වී, නැවතත් වැටුප් මිල ආවර්තනයක් ඇරඹීමය.

රැකියාවක් අහිමි කිරීමට පෙරාතුවම, නව රැකියා මං සොයා දිය යුතු ය යන ඉල්ලීම නිතර අසන්නට ලැබේ. එහෙත් මෙම ඉල්ලීම සපුරා ලීම ගැන සහතික විය නොහැකිය යන්න මගේ අදහසයි. රට ආර්ථික පරිහාණියෙන් ගොඩ ගැනීමට උත්සුක වෙතොත්, වෘත්තීය සමිති ව්‍යාපාරයට, යට කී ඉල්ලීම උඩ, උද්ඝෝෂණය කළ නොහැකි ය.

හොඳින් ස්ථාවර වී ඇති වෙළෙඳ පොළ ආර්ථිකයක වුවද රැකියා සහතික කිරීම දුෂ්කර කාර්යයකි. වෙළෙඳ පොළේ පවත්නා තත්ත්වයන්ට ගැළපෙන පරිදි නිෂ්පාදනයේ හැඩ ගැසීම වේගවත් ද පහසුවෙන් හැඩ ගැසෙන සුළු ද වන තරමට, කිසියම්ම හෝ තැනක රැකියා නැති වීම වඩා සුලභ සිද්ධියක් බවට පත් වේ. මෙලෙස ඉක්මනින් හා නම්‍ය ලෙස හැඩ ගැසීමට හැකි වීම යෝග්‍ය අංගයකි.

දෙවන පරිච්ඡේදයෙහි සලකා බැලුණු විධියේ බරපතල ස්ථායීකරණ මෙහෙයුමක දී රැකියා අයිතිය සඳහා ඇති ඉල්ලීම සපුරා ලීම විශේෂයෙන් දුෂ්කර වේ. නව වැඩ පිළිවෙළ අනුව, ඉල්ලුම හා සැපයුම අන්‍යෝන්‍ය වශයෙන් ගළපා ලීම වෙළෙඳ පොළේ කාර්ය භාරයකි. මේසයක් පිටුපස හිඳිමින් කරන පරිපාලන කටයුතු මගින් 'ව්‍යුහමය ප්‍රතිපත්ති' තීරණය කළ නොහැකි බවත්, එසේ නො කළ යුතු බවත් ය දෙවන පරිච්ඡේදයෙන් දෙන ලද පණිවුඩය. එබැවින් යමක මිල ගණන් කෙලෙස හැසිරේද, කවර කම්හලක් දිගින් දිගට පාඩු විඳීද යන්න, ඒවා සිදු වීමට පෙර සොයා ගැනීමේ මඟක් නැත. අප කථා කරන මෙම ස්ථායීකරණය තුළින් දැඩි කම්පනයක් ඇති විය හැකි බව අවංකව පිළිගත යුතු ය. එවැනි විශාල වෙනස්කම් මැද රැකියා අහිමි වන හැම සේවකයකුට ම වෙනත් කම්හලක හෝ කාර්යාලයක හෝ රැකියාවක් ලබා දිය හැකි යයි ස්ථිරවම කිව හැක්කේ කෙසේද?

ඉටු කළ නොහැකි පොරොන්දු දෙනවා වෙනුවට යථාර්ථවාදීව ඉටු කර ගැන්මට කැප විය හැකි දේ ඇත. මෙම අධ්‍යයනය මේ සම්බන්ධයෙන්, පරිවර්තන කාලය තුළ ගත හැකි පියවරත්, ශ්‍රම වෙළෙඳ පොළ හා රැකියා අයිතිවාසිකම් අතර ඇති විය හැකි කල් පවතින දිගු කාලීන සම්බන්ධතාත් අතර වෙනසක් දකී.

මෙහිලා තාවකාලික පියවර හැටියට, 2.6 කොටසෙහි, අපි මෙහෙයුම් කාලය තුළ තිබිය යුතු 'මානවහිතවාදී සංචිත' ගැන කතා කෙළෙමු. ස්ථායීකරණය නිසා අමාරුකම්වලට මුහුණ පෑමට සිදු වන හැම දෙනාටම, ඔවුන් නව තත්ත්වයන්ට හැඩ ගැසෙන තුරු ආධාර සපයා දිය යුතුය. එම ආධාර කුමන ස්වරූපයෙන් දිය යුතුද, ඒ හා බැඳී තිබිය යුතු කොන්දේසි මොනවාද යනාදිය ගැන සැලසුම් ඉදිරිපත් කිරීම මම මෙම පොතේ කාර්යය සේ නොසලකමි. මෙහි ලා මා දක්වන අදහස, දිය යුතු එම ආධාරවල ප්‍රමාණය හෝ ඒ දිය යුතු විධි හෝ ගැන නොවේ. දුප්පතුන්හට දෙන ආධාර දීන භාවයක් ඇති නොවන පරිද්දෙන් දීමට වගබලා ගත යුතු වේ. සමාජයීය පරිවර්තනයේ දී සිදු වන කම්පනයට සාර්ථකව මුහුණ දිය නොහැකි දුර්වල පුද්ගලයන්ට දෙන මෙම ආධාර, ඔවුන්ගේ ආත්ම ගෞරවය නොකෙළෙසෙන අයුරින් දිය යුතු අතර, ඒවා, අවශේෂ සමාජය ඔවුන්ට දක්වන සහයෝගය පෙන්නුම් කරන දර්ශකයක් විය යුතුය.

දිගු කාලීනව කතා කරන කල, සැම විටම සාර්ෂණික විරැකියාවක් පවතින බව පිළිගත යුතුය. (සමාජවාදී ආර්ථිකයන් ඇතුළු සැම තැනකම

සාර්ෂණික විරැකියාව පැවත ඇති බවත්, එහි පරිමාණය අප නොදැන සිටි බවත් මෙහි දී සඳහන් කළ යුතු වෙයි.) ආර්ථිකයක නැමෙන සුළු බව වැඩි වන තරමට, රැකියා පමණක් නොව කම්හල් හා ව්‍යාපාර සහමුලින්ම අහෝසි වී යාම් බහුලය. නිර්මාණාත්මක විනාශය සංවර්ධනයට මඟ පාදයි යන්න ජූම්පිටර් ගේ ප්‍රසිද්ධ කියමනකි. විනාශයක් ඇති තැන රැකියා අහෝසියක් ද සිදු වේ. එසේ නම් විරැකියා දීමනා, සේවකයින් යළි පුහුණු කිරීමේ ක්‍රම, ඔවුනට තැනින් තැනට මාරු වීමේ පහසුකම් ආදී සාර්ෂණික විරැකියාව පිළිබඳ ආයතන හා නීතිමය රෙගුලාසි ගොඩ නගා ගත යුතුය. මේ වනාහී වෘත්තීය සමිති හා ආණ්ඩුව අතර දැඩි සහයෝගය අවශ්‍ය වන එක් වැදගත් ක්ෂේත්‍රයකි.

අවසාන වශයෙන් කිව යුත්තේ, කල් පවතින පුළුල් විරැකියාවට ඇති ඉතාම වැදගත් විසඳුම ආර්ථික වර්ධනය වන බව ය. වඩාත් තීව්‍ර පරිදි කිවහොත්, එය එකම විසඳුම වෙයි. හංගේරියාවේ හා වෙනත් සමාජවාදී රටවල සමාජවාදී සැලසුම් ගත ආර්ථිකයන් ලද විශාලම ජයග්‍රහණය නම් පූර්ණ සේවා නියුක්තියයි. මේ තත්ත්වය උදා කර ගනු ලැබුයේ, වැඩ කිරීමේ අයිතිවාසිකම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු කිරීමෙන් නොව, ආර්ථික වර්ධනය පිළිබඳව යොදා ගැනුණු විශේෂ වැඩ පිළිවෙළක් ඇසුරිනි. මේ තත්ත්වය දිගටම පවත්වා ගෙන යා යුත්තේ, වැඩ වර්ජන, තර්ජන හා දේශපාලන බලපෑම් මගින් පූර්ණ සේවා නියුක්ති අයිතිවාසිකම් බලෙන් දිනා ගැනීමෙන් නොවේ. අපගේ අරමුණ විය යුත්තේ ආර්ථික වර්ධනය තුළින් වැඩි වැඩියෙන් රැකියා අවස්ථා බිහි කර ගැනීම ය.[59]

විරැකියා අවතාරය වනාහී සමහර විට නිවැරදි හේතු උඩ, සමහර විට ඕනෑවට වඩා වැඩියෙන් අප එකිනෙකා තැති ගැන්වීමට සමත් ප්‍රපඤ්චයකි. එසේ වතුදු ආර්ථිකයේ ශ්‍රම හිඟතාව ඇති නොයෙකුත් තැන් ඇත. අනාගතයේදී මෙම ශ්‍රම ඌණතා තත්ත්වය වඩා දැඩි වනු ඇත. සේවා අංශය වඩා වේගවත්ව වර්ධනය විය යුතු බැවින් එම අංශය තුළ රැකියා අවස්ථා දැනට වඩා වැඩි විය යුතුය. මේ සම්බන්ධයෙන් පුද්ගලික අංශය ප්‍රධාන කාර්යයක් ඉටු කළ යුතු බව මම විශේෂයෙන් අවධාරණය කරමි. අනාගතයේ දී, පුද්ගලික අංශයේ වර්ධනයට බාධක එල්ල කරන නිලධාරිතන්ත්‍රය ඉවත් කළහොත්, ස්ථායීකරණ මහා සැත්කමින් පසු රැකියා අහිමි වන්නන්ගෙන් වැඩි දෙනා නැවත ඵලදායී ලෙස උරා ගැනීමේ ශක්තිය පුද්ගලික අංශයේ ව්‍යාප්තිය මගින් ආර්ථිකයට ලැබෙනු ඇත.

ඇ. දරිද්‍රතා ප්‍රශ්නය: ආණ්ඩුවට පක්ෂව ආර්ථික කරුණු අවධාරණය කෙරෙන අතර, රජයට විරුද්ධව මානවවාදී කරුණු ඉදිරිපත් කෙරෙන තත්ත්වයක් නව ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන උදා වූවොත්, එය

---

59. සමාජවාදී අර්ථ ක්‍රමයක් තුළ ශ්‍රම අතිරික්තයන් උරා ගන්නේ **බලහත්කාර වර්ධනය** යන විශේෂ වර්ධන උපාය මාර්ගයක් තුළිනි. මෙහි අවාසි බොහෝය. සම්පත් නාස්තිය, ආර්ථික ව්‍යුහයේ විකෘති තත්ත්වයන් ඇති කිරීම යනාදී වශයෙනි. ඉහතින් අවධාරණය කෙරුණු පරිදි ආර්ථික වර්ධනය නව රැකියා අවස්ථා ලබා දෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු. එහෙත් එය කළ යුත්තේ සුසංයෝගී වර්ධන උපක්‍රමයක් තුළිනි. එනම් බලහත්කාර වර්ධනයේ අසංඛ්‍ය වූ අඩුපාඩු හා විකෘතීන්ගෙන් තොර වය.

ආර්ථික වෘද්ධි ප්‍රශ්නයේ න්‍යායික අංශ ගැන මෙලෙස කෙටියෙන් අවධානය යොමු කළ ද, ඒ ගැන විස්තර සහිත සාකච්ඡාවකට බැසීමට පොතේ ඉඩකඩ ප්‍රශ්නය නිසා මට මෙහි අවකාශයක් නැත

ස්ථායීකරණයටත් ජාතික ආර්ථික සෞභාග්‍යයටත් හානි කර වනු ඇත. මෙම හානිකර ගැටුම වෙනස් ආකාරයට ද ඉදිරිපත් කළ හැකඃ රජය ධනවතුන් වෙනුවෙන් පෙනී සිටියහොත් දුප්පතුන් වෙනුවෙන් පෙනී සිටින අය ආණ්ඩුවට විරුද්ධ විය යුතුය. තවත් ආකාරයක භේද හින්න වීමක් ද දැක්විය හැක. ආණ්ඩුව තාක්ෂණවේදී (technocratic) වන අතර, විරුද්ධ පක්ෂ ශුභ සාධන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටින තත්ත්වයකට පත් වනු ඇත.[60]

මෙම ග්‍රන්ථයේ මූලික අදහස සෑම පුද්ගලයකුටම සැපවත් ජීවිතයක් ගත කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම අවශ්‍ය බව ය. යෝජිත වැඩ පිළිවෙළේ අරමුණ සාමාන්‍ය මහජනයාගේ භෞතික ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම ය. මේ අතර රටේ පවතින දුස්සාධ්‍ය ආර්ථික තත්ත්වය වඩාත්ම බලපාන්නේ සමාජයේ ඉතාම දුප්පත් ජන කොටස්වලටය. එබැවින් ශුභ සාධන ප්‍රතිපත්ති ගැන අදහස් කීපයක් දැක්විය යුතුය.

දැනට ශුභසාධන ප්‍රතිපත්තියක් හැටියට ගත යුතු ප්‍රථම පියවර නම් උද්ධමනය අවසන් කිරීම වන බව මම නැවත ප්‍රකාශ කරමි. එබැවින් දුප්පතුන් ගැන කැක්කුමක් ඇති සෑම කෙනෙක්ම, උද්ධමනය නැති කිරීම අරමුණ කර ගත් ස්ථායීකරණ වැඩ පිළිවෙළට ඉත සිතින් සහයෝගය දැක්විය යුතු අතර, එම වැඩ පිළිවෙළ කඩාකප්පල් කරවන ක්‍රියාමාර්ගවලින් වැළකිය යුත්තාහ.

මේ පිළිබඳව දෙවන යෝජනාව නම්, මීට කලිනුත් දක්වා ඇති, මානවවාදී සංචිතය ය. ප්‍රතිසංස්කරණ නිසා තාවකාලිකව දුෂ්කර තත්ත්වයනට පත් වන්නන්ට ආධාර කිරීමට ය මෙම සංචිතය අවශ්‍ය වනුයේ.

ඉදිරිපත් කළ යුතු තුන්වන අදහස නම් අවුරුදු කීපයක් වසා පැතිර යන ශුභසාධක ප්‍රතිපත්තියක් අවශ්‍ය බව ය. මේ පිළිබඳ විස්තර සලකා බැලීමට, මට වඩා සුදුසුකම් ඇති අය වෙති. මම මෙහිදී අවුරුදු ගණනාවක් තිස්සේ, දුප්පතුන් හා වරප්‍රසාද අහිමි පුද්ගලයින් වෙනුවෙන් කථා කළ, ක්‍රියාවෙන් ඔවුන් වෙනුවෙන් වැඩ කර ඇති විවිධ පිරිස්වලට මගේ ප්‍රනාමය දක්වමි.[61] ශුභසාධන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අන් අය හා එක් වීමට මොවුහු සූදානම් ව සිටිති. මෙම කෘතිය තුළ මම මෙම ප්‍රශ්නයේ ආර්ථික හා සදාචාර පැති කීපයක් සම්බන්ධයෙන් පමණක් යමක් කීමට කැමැත්තෙමි.

ශුභසාධන ප්‍රතිපත්ති වැඩ පිළිවෙළක් සම්පාදනයේදී එකිනෙක හා පැහෙන්නේ නැති මතවාද දෙකක් අතර ගැටුමක් ඇති වීම නො වැළැක්විය හැක. ශුභසාධනයට ඇති ඉල්ලුම අසීමිත ය. එහෙත් එය සපුරා ලීමට යොදා ගත හැකි සම්පත් සීමිතය. ශුභසාධන ප්‍රතිපත්ති සාදන්නන්ට, ශුභසාධන කටයුතුවල යෙදෙන නිලධාරීන්ට හා සමාජ කටයුතු පිළිබඳ ලේඛකයන්ට හා පර්යේෂකයන්ට, දරිද්‍රතාව හා දිළින්දන් විඳින වේදනා ගැන දහස් ගණනින් නිදසුන් දිය හැකිය. තම සහෝදර ජනයා ගැන කැක්කුමක් ඇති කිසිවකුටත් මේවා අසමින් නොසැලී සිටීමට නොහැකිය. අනික් අතට, හංගේරියාව දැන් පවත්නේ ණය බරින් මිරිකුණු ඉතා ඛේදනීය තත්ත්වයකය. රට ආර්ථික

---

60. අමෙරිකානුවන් හා බ්‍රිතාන්‍යයන් 'ශුභසාධන ප්‍රතිපත්ති' යනුවෙන් හඳුන්වන, ජර්මානුවන් "Sozialpolitik" යනුවෙන් හඳුන්වන විධියේ වචනයක් හංගේරියානුවෝ මේ සම්බන්ධයෙන් යොදා ගනිති.

61. I. Kemeni ගේ පුරෝගාමී කෘති ද, Zs. Ferge ගේ ලියවිලි (1988,1989) ද බලන්න. O. Solt (1985) ද කියවන්න.

අහේනියකින් පෙළෙමින් පවතී. සමාජ වගකීමක් ඇති ආර්ථික විද්‍යාඥයකුට පෙනෙන්නේ, මේ තත්ත්වයෙන් ගොඩ ඒමට ඇති එකම ක්‍රමය නිෂ්පාදනයේ සාර්ථක වර්ධනය, ආර්ථික පුනර්ජීවනය වන බවය. මේ සඳහා ආයෝජනය අවශ්‍යය. ඒ සඳහා නියම ප්‍රෝත්සාහක සපයන විධියේ වැටුප් ද, තම ව්‍යාපාර වැඩි දියුණු කරන නියම ව්‍යවසායකයනට ඉහළ ඉපැයුම් ද අවශ්‍යය. දිගු කාලීන සංවර්ධනය සඳහා අධ්‍යාපනය හා විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු විය යුතුය. මේ ආකාරයට කළ යුතු දේ පිළිබඳ ලැයිස්තුව දිගින් දිගට කියා ගෙන යා හැක.

මගේ අදහසේ හැටියට මෙහිදී කළ හැකි එකම දේ විචාරවත් උපරිම සීමාවන් ශුභසාධන වැය පිළිබඳව පැනවීමය. ඒ සම්බන්ධයෙන් 'ශුභසාධනවාදී දේශපාලනඥයින් හා 'දිළින්දන් වෙනුවෙන් කථා කරන අය' ත්, දැඩි හඳවත් ඇති 'භාණ්ඩාගාර නිලධාරීනුත්' අතර, දිනපතා කෙරෙන කුඩා සටන්වලට ඉඩ තැබීම තේරුමක් නැති වැඩකි. ඇත්ත වශයෙන් ප්‍රජාතන්ත්‍රීය පාර්ලිමේන්තුවක් හා වගකීමෙන් යුතු විවාද තිබිය යුත්තේ ජාතික අයවැය පිළිබඳ ඉහත කී විධියේ බුද්ධිමත් තීරණ ගැනීමට ය. තම තමන්ගේ දේශපාලන වගකීම සිහියේ තබා ගනිමින් එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ශුභසාධන වියදම් ගැන තමන්ගේ ම මතයක් ගොඩ නගා ගනු ඇත. මෙහි ලා ඔවුන් තම මතයන්ට එළඹිය යුත්තේ සිදු කළ යුතු අවශේෂ වියදම් වර්ග රැසක් ඇති බවත්, සියලු වියදම් සඳහා මුදල් අයබදුවලින් ලබා ගත යුතු බවත් සිහි තබා ගනිමිනි. අවසානයෙහි, වසරකට වලංගු වන තීරණයක් පාර්ලිමේන්තුවට ගත හැකිය. මට නම් හිතෙන්නේ, මේ කරුණ පිළිබඳ යම් කාලයක් සඳහා අදාළ වන තීරණය, එම කාලය එළඹීමට අවුරුදු දෙක තුනකටවත් පෙර ගැනීම වඩා ප්‍රයෝජනවත් බවය. එවිට රටේ ශුභසාධන ප්‍රතිපත්තිය පිළිබඳ වැඩි විස්තර සැලසුම් කරන ආයතනවලට හා පුද්ගලයනට තම කටයුතු වඩා හොඳින් කිරීමට ඉඩ ලැබේ. එවැනි තීරණයක් ඔවුන්ගේ සැලසුම් කටයුතු සඳහා අවශ්‍ය ව්‍යුහයක් සපයා ලන බැවිනි. ඔවුන් ගොඩ නංවන වැඩ පිළිවෙළ නම්‍ය එකක් විය යුතුය. ඉදිරි තත්ත්වයන් වඩා වාසි සහගත වන පරිදි හැඩ ගැසෙතොත් පමණක් කළ හැකි කටයුතු ද , එසේම ඉදිරි ආදායම් ආදී තත්ත්වයන් වඩා නරක අතට හැරෙතොත් අත් හැර දැමිය යුතු කාර්යයන් ද වෙන් කොට දැක්වීමට ඔවුනට හැකි වනු ඇත. කෙසේ හෝ, අද හංගේරියාවට ශුභසාධන අරමුණු සඳහා කොපමණ වියදම් කළ හැකිද යන්න ගැන සැලසුම් කර ගැනීම අවශ්‍යය. ශුභසාධන ප්‍රතිපත්ති ගැන සිතීම පටන් ගත යුත්තේ එම පදනම උඩ විනා, ස්වීඩනයෙහි සිය මිනිබිරිය රැක බලා ගන්නා මිත්තණිය රජයෙන් වැටුප් ලබන බව වැනි කාරණා මත නොවේ. එවැනි දෑ අපට සිතීමට පටන් ගත හැක්කේ, රටේ පවතින ව්‍යාධි සුව වී, ඒක පුද්ගල ජාතික ආදායම ස්වීඩනයේ මට්ටමට වැඩි වූ පසුව පමණි.

මා මෙහි දී **පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ** කාර්යභාරය වැදගත් කොට දක්වනුයේ හේතු විරහිත ව නොවේ. ඔවුන් සමාජයෙහි කරන කටයුතු අනුව, මහජනයා ඔවුන්ට කිට්ටුය. මුදල් ඇමති පාර්ලිමේන්තුව අමතන විට, ඔහු භාණ්ඩාගාරයේ අදහස් ප්‍රකාශ කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. ඇත්ත වශයෙන්ම එය ඔහුගේ යුතුකම වෙයි. මේ අතර පුවත්පත්, සමාජයේ පවත්නා දරිද්‍රතා තත්ත්වයන් හා දුක් විඳීම් අතර ඇති උග්‍ර ම අවස්ථා එළිදරව් කළ යුතුය. ඒ මගින්, ඒවා මහජන මතය ද, පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ හෘදය සාක්ෂිය ද

කෙරෙහි බලපෑම් කළ යුතු වෙයි. එහෙත් අවසානයෙහි **තීරණයක් ගත යුතු ය:** ආර්ථික විද්‍යාඥයන් ගේ ශාස්ත්‍රීය වචනවලින්, පවතින හිඟ සම්පත් විවිධ අරමුණු අතර බෙදා හැරිය යුතුය. එම තීරණය ගැනීමේ අයිතිය හා දේශපාලන වගකීම ඇත්තේ පාර්ලිමේන්තුවට පමණකි.

දේශපාලනික, සදාචාරාත්මක හා ආර්ථික දෘෂ්ටි කෝණයන්ගෙන් වැදගත් වන විෂයයකට අදාළ කොට, දරිද්‍රතා ප්‍රශ්නය ගැන තවත් නිරීක්ෂණයක් කිරීමට තිබේ. දුප්පතකුගේ ජීවන තත්ත්වය උසස් වන්නේ ඔහුගේ දිළිඳු බව අඩු කිරීමෙන් විනා, කලින් ධනවතුන් ව සිටි අය දුප්පතුන් ගොඩට එකතු කිරීමෙන් නොවේ. මෙම අදහස විවාදයට ලක් විය හැකි මතයක් බව මම දනිමි. එහෙත් මම මගේ අදහස අවධාරණයෙන් කියා පෑමට කැමැත්තෙමි. ඕනෑවට වඩා වැඩි සේ සැලකෙන ඉපැයුම්වලින් හෝ ඉතිරි කිරීම්වලින් හෝ ධනයෙන් හෝ කොටසක් පොහොසතුන්ට අහිමි කිරීම, ඔවුන්ගෙන් අය කෙරෙන සදාචාරමය වන්දියක් ලෙස මම නො දකිමි. ඕනෑවට වඩා වැඩි යැයි සැලකිය හැක්කේ කොපමණක් ද? යමකු මට වඩා සියයට 50 ක් ඉපැයීම නිවැරදි හා සාධාරණ වෙතැයි සිතමු. හොඳයි ඔහුට දැනට උපයනවා මෙන් දෙගුණයක් ඉපැයීමට ඉඩ දෙමු. එහෙත් ඔහුට දැන් මෙන් පස් හය ගුණයක් ඉපැයීමට දීම නිවැරදි ද? මෙය උග්‍ර වූ අසාධාරණයක් නො වන්නේද?

මෙවැනි තර්ක කිසිසේත් නිරවද්‍ය නොවේ. කවර ආදායම් හෝ ධන මට්ටමකට, සදාචාරයට අනුව ඉඩ දිය යුතු දැයි තීරණය කිරීමට කිසිවකුටත් අධිකාරයක් නැත. කවර මට්ටමකට වඩා ඉහළට ඉපැයුම් ගමන් කරතොත් එය සදාචාර විරෝධී වෙතැයි කියා පෑමට කිසිවෙකුටත් අයිතියක් නැත. අප මේ විධියට මිනිසුන්ගේ ඉපැයුම් පුරුදු විනිශ්චය කිරීමට පටන් ගත් කල, අප කෙළින් ම ගමන් කරනුයේ පෞද්ගලික දේපොළ ජනසතු කිරීමේ මාර්ගය දිගේ ය.

දුප්පතුන් සැනසීමට 'පොහොසතුන්ට' විරුද්ධව කතා කිරීමෙන් අප වැළකිය යුතුය යන්න මගේ අදහසයි. හංගේරියාවේ අලංකාර පෙදෙසක් වන බැලටන් විල අසල සුවිසල් මන්දිර ඉදි කරන්නන් හෝ සුඛෝපභෝගී කාර් මිලට ගන්නන් හෝ විවේචනය කරන රූපවාහිනී ප්‍රවෘත්ති වාර්තා නිසා විශ්‍රාමිකයින්ගේ කෑම මේසයට මස් ලැබෙන්නේ නැත. විශ්‍රාමිකයාට මස් ලබා දීමට කටයුතු සැලැස්විය යුතුය. නියම ශුභසාධන ප්‍රතිපත්තිය එයයි, සමානාත්මතාවාදී වචන හරඹය නොවේ.[62]

මෙම රට දිගු කාලයක ධනේශ්වර සංවර්ධනයක් හිමි, පෞද්ගලික දේපොළ ක්‍රමය හොඳින් ස්ථාපිත ව ඇති, අවංක මහන්සියෙන් හා ව්‍යාපාරික ඒකාග්‍රතාව තුළින් උපයා ගැනුණු පෞද්ගලික ධනය දරු මුණුබුරන්ට හිමි වීම පිළිබඳ සැකයක් නැති වීම තුළින් මිනිසුන්ට වැඩ කිරීමට ලැබෙන ප්‍රෝත්සාහක ක්‍රියාත්මක වෙමින් පවතින රටක් විණි නම්, මා විසින් මේ තරම් දැඩි ලෙස

---

62. රෝල්ස්ගේ සමාජ සාධාරණත්ව න්‍යායයේ එන මීට ඉහත සඳහන් කළ කරුණක් මෙහි දී සිහිපත් කළ යුතුය. යම් රටක පහළ මට්ටමේ ජීවත් වන මිනිසුන්ගේ ජීවන මට්ටම ඉහළ දැමීමට ගන්නා අඛණ්ඩ ප්‍රයත්නයක් සමාජ සාධාරණත්වය විසින් අපේක්ෂිතය. මෙවැනි තත්ත්වයක් ළඟා කර ගැනීමට නම්, වඩා සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රෝත්සාහක ලබා දීමත්, ව්‍යවසායකත්වය දිරි ගැන්වීමත් අවශ්‍යය. ඒ සඳහා ඉතාම කාර්යක්ෂම, ඉතාම රැකසුරුවම් හා ඉතාම වාසනාවන්ත මිනිසුන් අත, විශාල වශයෙන් ධනය රැස් වීමට ඉඩ දිය යුතුය.

මගේ අදහස් ප්‍රකාශ කරනු නො ලැබෙන්නට තිබිණි. වෙනත් වචනවලින් කියතොත්, මා, නිදසුන් ලෙස, වර්තමාන ප්‍රංශයේ පුරවැසියකු වුණා නම්, කිසියම් ප්‍රමාණයක පුනර්ව්‍යාප්ති අයබදු කරණයකට පක්ෂ වීමට මා පෙළඹෙන්නට ඉඩ තිබිණි. එහි දී ද ස්වීඩනයේ පවතින පුනර්ව්‍යාප්ති අයබදු කරණය මට පෙනී යනු ඇත්තේ නම් ඕනෑවට වඩා වැඩි එකක් ලෙසිනි. ස්වීඩනයෙහි ද, එවැනි බදු ක්‍රම, ප්‍රෝත්සාහක විනාශ කරමින්, මිනිසුන්ගෙන් ඔවුනට කළ හැකි උපරිම තරමින් වැඩ නොගෙන, හිතකර ධන සමුච්චය අධෛර්‍ය කරන්නක් ලෙස මම හඟිමි. එහෙත් මම ප්‍රංශ ජාතිකයෙක් හෝ ස්වීඩන ජාතිකයෙක් හෝ නොවෙමි. මා පිළිතුරු දිය යුත්තේ වර්තමාන හංගේරියාවේ ප්‍රශ්නවලට ය. මෙහි ලා 1.1 කොටසෙහි මා කියූ දේ කෙරෙහි අවධාරණයෙන් නැවත අවධානය යොමු කරවමි. අපි තවමත් පුනර් - ධනේශ්වරකරණ ක්‍රියාදාමයක මුල් අවස්ථාවේ පසු වන්නෝ වෙමු. අපට කිරීමට ඇති කාරණා පිළිබඳ න්‍යාය පත්‍රයෙහි, පෞද්ගලික අංශයේ හැම අයකු ගේ ම බිය සැක දුරු කරලීම, නවීකරණයට පෙළඹෙන කුඩා ඉඩම් හිමියනට හා ගොවියනට, පෞද්ගලික ශිල්පීනට හා විශාල පෞද්ගලික ව්‍යාපාර හිමියනට අනාගතය ගැන විශ්වාසය ලබා දීම යන කටයුතුවලට ලැබෙන්නේ අතිශයින් වැදගත් තැනකි. බියක් නැතිව මහන්සි වී ධනය ඒකරාශි කර ගන්න යන විශ්වාසය ලබා දෙන දිරි ගැන්වීම ඔවුනට අවශ්‍යය. ඔවුනට හිමි දේ රාජසන්තක නො කෙරෙන බවටත්, කවර ම තත්ත්වයක් යටතේ වුව ඔවුන් සතු අධික ඉපැයුම් බදු මගින් ඔවුනට අහිමි නො කෙරෙන බවටත්, රජය ඔවුනට ප්‍රතිඥා දිය යුතු අතර, මෙසේ කරනු ලබන්නේ, ඔවුන් වඩ වඩා ස්වේච්ඡාවෙන් ආයෝජනය කරනු දැකීමේ රිසියෙන් බව ස්ථිරව ම පෙන්වා දිය යුතුය. එසේම ඔවුන්ගේ උරුමක්කාරයන් රැවටීමට හෝ කිසිම විධියකින් ඔවුනට උරුම වීමට ඇති දෑ ඔවුන්ගෙන් උදුරා ගැනීමට හෝ කිසිසේත් ඉදිරිපත් නොවන බවට රජය ප්‍රතිඥා දිය යුතුය. තම දරු මුණුබුරනට කිසිසේත් තමන් ඉතිරි කර යන දෑ හිමි නොවන නිසා, තම ජීවිත කාලයෙහි ම සිය ඉපැයුම් වැය කළ යුතුය යනුවෙන්, පෞද්ගලික ධනහිමියන් මෙතෙක් සිතූ ආකාරය වෙනස් වන පරිදි කටයුතු කිරීම අවශ්‍යය. කලබලකාරී ලෙස ඉක්මනින් විශාල වශයෙන් මුදල් උපයා, සිය ජීවිත කාලයෙහිම ඒ වියදම් කර ලන අදූරදර්ශී වූද ලෝභී වූද, අයට වඩා, පරම්පරාවෙන් පරම්පරාවට ධන හිමියන් ලෙස ඉදිරියට ඇදී යන පිරිස් මතු වී එනු දැක්මට තමන් රිසි බවට රජය ප්‍රකාශයට පත් කළ යුතු වෙයි.

මේ වන විට ශුභ සාධන ප්‍රතිපත්ති මාතෘකාවෙන් අප සෑහෙන තරම් පිට පැන ඇතැයි කෙනකුට සිතන්නට පුළුවන. එහෙත් එම මාතෘකාව සම්බන්ධයෙන් වුව ඉහතින් කී දෑ අතිශයින් තීරණාත්මක වැදගත් කමක් ගනී. ජනප්‍රියතාව සඳහා සමාජ ප්‍රශ්න ගැන දේශනා පැවැත්වීම හා සමානාත්මතාවාදී වචන හරඹය, ක්‍රියාවන් මත පදනම් වූද, රටට රාජ්‍ය අය-වැය අනුව උසුලා සිටීමට හැකි වූ ද, නිශ්චිත ශුභසාධන ප්‍රතිපත්තියකට ආදේශක නොවන බව, මහජන මතය කෙරෙහි බලපෑම් කළ හැකි හැම දෙනාත්, පාර්ලිමේන්තුව තුළ ජාතියේ මුදල් කටයුතු පිළිබඳ අවසාන තීරණවලට එළඹෙන අයත් හොඳාකාරව ම තේරුම් ගත යුත්තාහ.

3.3 ශක්තිමත් ආණ්ඩුවක අවශ්‍යතාව

මෙම අධ්‍යයනය තුළ දැක්වුණු ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවිය හැක්කේ ශක්තිමත් ආණ්ඩුවකට පමණි. මෙය, ප්‍රධාන වශයෙන් 1 පරිච්ඡේදයෙහි ඉදිරිපත් කැරුණු ක්‍රමික වෙනස්කම් සම්බන්ධයෙන් මෙන්ම, ප්‍රධාන වශයෙන් 2 පරිච්ඡේදයෙහි සඳහන් වුණු 'මහා සැත්කම' සම්බන්ධයෙන් ද නිවැරදි වෙයි. ඉදිරියෙහි කිරීමට ඇති බොහෝ කටයුතු සාර්ථක වීමට නම් ශක්තිය හා දැඩි බව අවශ්‍යය. පෞද්ගලික අංශයේ වර්ධනයට අකුල් හෙළන පරිදි හැසිරෙන්නට පුළුවන්, තම නිල බලය නිසා ඇති වූ ආඩම්බරයෙන් මෙහෙයැවුණු නිලධාරින්ගෙන් ඇති වන බාධක ආණ්ඩුව විසින් මැඩ පවත්වනු ලැබිය යුතුය. එය පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති දැඩි ලෙස ක්‍රියාවේ යෙදවිය යුතු අතර, මූල්‍ය හා වැටුප් විනය ආරක්ෂා කර ගත යුතුය.

නොයෙකුත් ආකාරයේ 'ශක්තිමත් ආණ්ඩු' ඇති බව රහසක් නොවේ. විශාල වෙනස්කම් ඇති කරවන්නාවූ ද, වෙළෙඳ පොළ ආර්ථිකයකට ශක්තිය ලබා දෙන්නා වූ ද, ස්ථායීකරණ වැඩ පිළිවෙළක් සමග මර්දනකාරී ඒකාධිපති පරිපාලනයක් හෝ චිලී රටේ, තුර්කියේ මෙන් ඒකාධිපති යුද්ධ ආණ්ඩුවක් හෝ පැවැතීමට පුළුවන. එවැනි පාලන තත්ත්වයක් පැවැතීමට විරුද්ධ ව, ආර්ථික වූ තර්ක ඉදිරිපත් කිරීමට පුළුවන. පිනෝෂේ වැන්නකුට හෝ කුමන්ත්‍රණයට පසු ඔහු වටා සිටි චිකාගෝ කල්ලියට හෝ විශාල රාජ්‍ය අංශයක් ඇති වර්තමාන හංගේරියානු ආර්ථිකය තුළ සාර්ථක ව කටයුතු කිරීමට කොහෙත්ම ඉඩ නො ලැබෙනු ඇත. ආර්ථික තර්ක අමතක කර දැමුව ද, මම දේශපාලන හා **සදාචාරමය** හේතු උඩ මෙවැනි පාලන තන්ත්‍රයකට නො කැමැත්තෙමි. **ආර්ථික** හේතු උඩ ද එවැන්නක් සලකා බැලීමට මා අකමැති බව අමුතුවෙන් කිව යුතු නොවේ. සිය ශක්තිය මර්දනකාරී ක්‍රියාමාර්ග මත ගොඩ නංවා ගෙන ඇති ආණ්ඩුවක් නිසා ඇති වන ආර්ථික ප්‍රතිඵල කවරක් වතුදු, මම ස්ථායීකරණය සඳහා එවැනි ඉහළ මිලක් ගෙවීමට දැඩි ලෙස විරුද්ධ වෙමි.[63]

මේ සඳහා තිබෙන විකල්පය නම් මහජන සහයෝගයෙන් සිය ශක්තිය ලබන ආණ්ඩුවකි. මෙහිදී ආර්ථිකය දැඩි අධිෂ්ඨානයකින් යුතු ව, නිවැරදි මාර්ගයට ගැනීම සඳහා, නිදහස් මැතිවරණයක් තුළින්, ආණ්ඩුවට මහජන බලය ලැබෙනු ඇත. 2 වන පරිච්ඡේදයේ මා යොදා ගත් උපහැරණය නැවතත් යොදා ගනිමු. ලෙඩාගේ අවසරයක් නැති ව, ඇය සිහි නැති කරවා, දොස්තර නිවැරදි යැයි කියා හිතන ශල්‍යකර්මය ලෙඩා සම්බන්ධව කළ හැකි වුව ද, කිසිම ශිෂ්ට සම්පන්න සමාජයක් එය හොඳ ක්‍රියා මාර්ගයකැයි නො සිතයි. එවැනි සමාජයක් තුළ, ශල්‍ය වෛද්‍යවරයා ලෙඩාට තත්ත්වය පැහැදිලි කර දී, ශල්‍ය කර්මයේ අවශ්‍යතාව ද, අදාළ අවදානම්වල ස්වරූපය ද පෙන්වා දී,

---

63. සාර්ව හැඩගැසුම් කටයුතු ඉටු කර ගැනීමට ද, ස්ථායීකරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමට ද මර්දනකාරී, ඒකාධිපති ආණ්ඩු ක්‍රම වඩා කාර්යක්ෂම වෙතැයි යන මතය පළල් ලෙස පැතිර ගොස් ඇති එකකි. මෙය වැරදි සහගතය. ඒකාධිපති ආණ්ඩු 44 ක් ද ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩු 39 ක් ද, ගැන කරන ලද අධ්‍යයනයකට අනුව, ඉහත කී අරමුණු ඉටු කර ගැනීමේ දී මේ දෙකින් එක් ක්‍රමයක්වත් අනිකට වඩා පැහැදිලි ලෙසම කාර්යක්ෂම බවක් පෙන්වා නැත. බලන්න: (S. Haggard and R.R. Kaufman, 1989, පිටුව 63)

ලෙඩාගේ කැමැත්ත ඇති ව පමණි, ශල්‍ය කර්මයක් කරනුයේ. මා හංගේරියානු ආර්ථිකය පිළිබඳව යෝජනා කළ ශල්‍ය කර්මය සඳහා ද, පවතින නිවැරදි වූ එකම ක්‍රමය, මට හැඟෙන හැටියට එයමැයි. එම ශල්‍ය කර්මය කළ යුතුය. එහෙත් ලෙඩා හැටියට හංගේරියානු ජනතාව, සිය ඡන්දයෙන් තෝරා ගත් නියෝජිතයන් මගින් ඊට කැමැත්ත පළ කළ යුතුය.

අනාගත හංගේරියානු ආණ්ඩුවේ සංයුතිය ගැන අනුමාන කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ නොවේ. එය මගේ විෂය ක්ෂේත්‍රයෙන් බැහැර ව පවතින්නක් වන බැවින්, ඒ ගැන උපදෙස් දීමේ හැකියාවක් හෝ වුවමනාවක් හෝ මට නැත. මේ සම්බන්ධයෙන් එක් අදහසක් පමණක් දැක්වීමෙන් මම සෑහීමට පත් වෙමි. මෙම අධ්‍යයනයෙහි සලකා බැලුණු දේශපාලනික, ආර්ථික හා සදාචාරාත්මක ගැටුම් එක් එක් දේශපාලන පක්ෂයක් හා ව්‍යාපාරයක් **තුළම** පවා දැකිය හැකිය. සමහර විට එය ඒ ඒ පක්ෂය තුළ ඇති කණ්ඩායම් හා කට්ටි හැටියට ප්‍රදර්ශනය වේ. සමහර විට, ඒ ඒ පක්ෂයේ ප්‍රගතියේ විවිධ අවස්ථාවල, කලාතුරකින් නොවන පරිදි පැන නගින අන්තර් ගැටුම් හා මතභේද හැටියට ඒ එළිදරව් වෙයි. එකම අවස්ථාවේදී කිසියම් අදහසක් සමග ඊට විරුද්ධ අදහසක් ද ප්‍රකාශ කෙරෙන තැන් කෙනකුට දැක ගත හැකිය. තවත් සමහර විටෙක, ඉතාම දැඩි ගැටුම් පවා නො සලකා හැරෙන අවස්ථා කෙනකුට හමු වේ. ඒ කෙසේ හෝ වේවා මෙම ගැටුම් පවතින බව නිසැක ය. ආර්ථික දුෂ්කරතා වැඩි වන්නට වන්නට එම ගැටුම් ද වැඩි වනු ඇත.

සාමාන්‍ය ව්‍යවහාරයේ දී ද, දේශපාලන විද්‍යාවෙහි දී ද සහාගය යන්න අර්ථ දෙකකින් යෙදේ. මෙයින් **වඩා පටු** අර්ථය යටතේ ඉන් අදහස් වන්නේ යම් යම් පක්ෂ හා දේශපාලන බලවේග **ආණ්ඩුවක්** පිහිටුවීම සඳහා සහභාගී වීම ය. මෙහි **වඩා පුළුල්** අර්ථයක් ද ඇත. ඒ යටතේ විවිධ පක්ෂ, ව්‍යාපාර, කණ්ඩායම් හා සමාජයීය බලවේග, පොදු කාර්යයන් පෙළක් ඉටු කර ගැනීම සඳහා සහයෝගී ක්‍රියාමාර්ගයකට එළඹීමක් අදහස් කෙරේ. (මෙම තේරුමින් ඇඩිනුවර් හා එර්හාඩ්ට් කාලයෙහි බටහිර ජර්මනිය තුළ, ක්‍රිස්තියානු ප්‍රජාතන්ත්‍රික ආණ්ඩුවත්, පෞද්ගලික අංශයත්, තම වැඩ වර්ජන අයිතිවාසිකම භාවිත කිරීමෙන් **වැළකීමට** ගිවිස ගත් වෘත්තීය සමිති ව්‍යාපාරයත් අතර, මෙ වැනි සහාගයක් පැවැතිණි.) මා මෙහි එම වචනය භාවිත කරනුයේ එම වඩා පුළුල් තේරුමිනි. මේ අනුව මම සහාගයේ කවර බලවේග ආණ්ඩුවෙහි සෘජු කාර්යභාරයක් හිමි කර ගනු ඇද්ද, කවරක් ආණ්ඩුවෙන් පිට සිටිමින්, එහෙත් ඊට අවහිර නොකර සිටීමේ සම්මුතියකට එළඹෙනු ඇද්ද යන්න විවෘත ප්‍රශ්නයක් ලෙස තිබෙන්නට ඉඩ හරිමි. මේ අනුව දෙවනු කී බලවේග, නිර්මාණාත්මක විපක්ෂයක් හැටියට පවතිමින්, මූලික ආර්ථික කටයුතුවල දී ආණ්ඩුවට අවහිර කරන විධියේ ගැටුම්වලින් වැළකී සිටීමට වුව තීරණය කළ හැකිය.

(වඩා පුළුල් තේරුමින්) අනාගත හංගේරියාව තුළ ඇති විය යුතු සහාගය තුළ, නියම වශයෙන්ම ව්‍යවසායක ශක්තීන් ඇති, තමන්ගේ ම අනාගතය ගැන ආත්ම විශ්වාසය ඇති පෞද්ගලික අංශයක් පැවැතීම අත්‍යවශ්‍ය ය. එහෙත් සමාජය තුළ තම බලය නැති වී යාම ගැන බියට පත් වන රාජ්‍ය පරිපාලන සේවය, හැරෙන හැරෙන තැන මෙම පෞද්ගලික අංශයට අකුල් හෙළීමට සූදානම් ව සිටිතොත්, එයින්, අප කතා කළ අරමුණ ඉටු නොවේ. එසේම සිදු වන පරිවර්තනය නිසා තමන්ට අවාසි ඇති වෙතැයි සලකන කාර්මික අංශයේ කම්කරුවන්, තරගකාරී වෘත්තීය සමිති විසින් උසිගන්වනු ලැබ, ආණ්ඩුවේ

ප්‍රතිපත්තිවලට විරුද්ධ වීම ද නො කළ යුතුය. ආර්ථික පරිවර්තනයේ සාර්ථකත්වය රඳා සිටිනුයේ, මෙවැනි බලවේග, ඒවා අතර ඇති වන ගැටුම් සමනය කොට, සාමකාමී ගිවිසුම්වලට එළඹේද නැද්ද යන්න මතය.[64]

වඩා පටු හා වඩා පුළුල් යන තේරුම් දෙකින්ම, හංගේරියාව තුළ අනාගතයෙහි බිහි වන සහාගයන් තුළට එකතු වන අය එකඟ විය යුතු කර්තව්‍ය සාරාංශ කොට දැක්වීමට මෙම අධ්‍යයනය තැත් කොට ඇත. මෙම සහාග සාමාජිකයන් සාර්ථක ව සිය ගිවිසුම් රැක ගැනීමට සමත් වන්නාහු නම්, රටේ ආර්ථිකය යහ මඟට ගැනීමටත්, සංවර්ධනය වේගවත් කිරීමටත් හැකියාව ලැබෙනු ඇත. එම සහාගයන් අසාර්ථක වී, බිඳී විසිරී යතොත්, ආරම්භයේ සිටම හෝ ඉතා කෙටි ප්‍රාරම්භක සහන කාලයකට පසුව හෝ ඒවා පිටින් එන පහරට ලක් වී විනාශ වී ගියහොත්, ආර්ථිකය දිගට ම, අසරණ ව, ප්‍රපාතය කරාම ඇද වැටෙනු ඇත.

---

64. ආඥාදායක පාලන තන්ත්‍රයක් බිඳ දමා පැන නගින නව ප්‍රජාතන්ත්‍රවාදයන්ට පක්ෂපාතීව බිහි වන සහාගයන් ගේ **දුර්වල** භාවය සාකච්ඡා කරන අධ්‍යනයන්ගේ වැදගත් එකතුවකි (J.M. Nelson, 1989) යන කෘතිය. මෙම අධ්‍යයනය පදනම් වනුයේ ලතින් අමෙරිකානු, අප්‍රිකානු හා ආසියානු අත්දැකීම් මත ය. බොහෝ අංශයන්ගෙන් නැගෙනහිර යුරෝපයේ තත්ත්වයන් මීට වඩා වෙනස් වන නමුදු, ඉහත කී ප්‍රදේශයනට සමාන වන තැන් ද එහි නැත්තේ නොවේ. මෙහි ලා විශේෂයෙන්ම වැදගත් වන්නේ යම් යම් මූලික සමාජ කොටස් අතර එකඟතාවක් පැවැතීම, නව ප්‍රජාතන්ත්‍රවාදයක් දේශපාලනික හා ආර්ථික වශයෙන් ස්ථාවර කර ලීම සඳහා නැගෙනහිර යුරෝපයෙහි ද වැදගත් වීමය.

4. පෞද්ගලික පසු සටහනක්

මේ කෘතිය උත්තම පුරුෂයෙන් ලියන ලද්දේ ප්‍රතිසංස්කරණ පිළිබඳව මගේ සිතේ ඇති තද විශ්වාසය නිසාය. කෙසේ වුව ද, විෂයයට අදාළව පමණක් ලිවීමට මම මුල සිටම මහන්සි ගතිමි. පොතේ අවසානයට පැමිණ ඇති මේ මොහොතේ පෞද්ගලික සටහන් කීපයක් ඊට ඇතුළත් කිරීමෙහි වරදක් නැතැයි සිතමි. පෞද්ගලික චරිතාපදාන ලිවීමේ රැල්ලක් අද රටේ පවතී. ඊට දායක වීමට මට වුවමනාවක් නැති වුව ද, මා සම්බන්ධ කරුණක් දෙකක් පමණක් මෙම අවසාන සටහන්වලට ඇතුළත් කිරීමට සිතේ.

1956 ගිම්හානයේ දී, හංගේරියානු විද්‍යා ඇකඩමියට අනුබද්ධ ආර්ථික විද්‍යා ආයතනයේ තරුණ නිලදරුවකු ලෙස මා කටයුතු කළ අවධියේ, හංගේරියානු ආර්ථිකයේ කළ යුතු ප්‍රතිසංස්කරණයන් ගැන යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණින් පිහිටුවන ලද කමිටුවක ප්‍රධානියා ලෙස මම කටයුතු කෙළෙමි. පිටු 150 කින් යුක්ත පොතක් හැටියට එවකට පිළියෙළ කරන ලද වාර්තාවෙහි, පසුව 1968 දී දියත් කළ ප්‍රතිසංස්කරණ තුළින් ක්‍රියාත්මක වූ අදහස්, කිහිප තැනකම අන්තර්ගත විණි. ආපසු හැරී බලන මට, එවකට ඉදිරිපත් කැරුණු යෝජනා ඕනෑවට වඩා සරල ඒවා ලෙස අද පෙනේ. එම යෝජනා සහමුලින්ම ක්‍රියාත්මක කැරුණද, ඒවායින් රටේ මූලික පද්ධතික ආර්ථික ප්‍රශ්නවලට පිළියමක් නොලැබෙන්නට ඉඩ තිබිණ.

ඉන් අවුරුදු 30 ක් ඉකුත් ව ගොස් ඇත. එවැනි පුළුල් ආර්ථික ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීමට මේ කාලය තුළ මම තැත් නොකෙළෙමි. මා ලියූ යම් යම් දෑ තුළ අර්ධ යෝජනා ඉදිරිපත් කෙරුණ ද, පූර්ණ වැඩ පිළිවෙළක් මම ඉදිරිපත් නො කෙළෙමි.

පසුගිය දශක කීපය තුළ සමාජවාදී අර්ථක්‍රමය ('පවතින සමාජවාදය') හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනයක යෙදීම මම මගේ වගකීම කොට සැලකීමි. එමෙන්ම සමාජ යථාර්ථය නිරීක්ෂණය කරන්නකු ලෙසින් ද, විග්‍රහ කරන්නකු ලෙසින් ද ක්‍රියා කිරීමට මම තැත් කෙළෙමි. නිදසුනක් ලෙස මා පසුගිය වසර කිහිපය තුළ වෙහෙසෙමින් සිටියේ, මෙතෙක් කරන ලද අධ්‍යයන තුළින් එක් රැස් කර ගත්, සමාජවාදී ආර්ථික ක්‍රම පිළිබඳ දැනුම් සම්භාරය සම්පිණ්ඩනය කරන පොතක් ලිවීමටය. ඔබ කියවා අවසන් කරන මෙම කෘතිය ලිවීමේ දී මා කර ඇත්තේ මගේ වෘත්තිය හැටියට මා ම සිතා සිටින සීමාවෙන් පිට පැනීමකි. එවැන්නක් කිරීමට මා පෙළඹුණේ, මෙය මග හැරිය යුතු නොවන ඓතිහාසික අවස්ථාවක් ලෙස සැලකූ බැවිනි. අවුරුදු ගණනාවකට පසුව, ආත්ම විශ්වාසයකින් යුතුව මගේ අදහස් ඉදිරිපත් කිරීමට පාරිලිමේන්තුවක් හා ආණ්ඩුවක් බිහි වනු ඇතැයි මට හැඟී ගියේ ය. එපමණක් ද නොව, එම පාර්ලිමේන්තුව හා ආණ්ඩුව සිය රාජකාරිය ආරම්භ කරනු ඇත්තේ දැඩි දුෂ්කරතා මධ්‍යයේය. ඒ නිසා, මා තුළ යම් යම්

යෝජනා වැඩි දියුණු වී ඇත් නම්, මේ, ඒවා ඉදිරිපත් කළ යුතු හොඳම අවස්ථාවයි.

මේ කෘතිය ම විසින් ලියන ලද්දේ ඉතා ඉක්මනිනි. එහෙත් මෙහි ඇති අඩු පාඩු වසා ගැනීමට, එය නිදහසට කරුණක් ලෙස පාවිච්චි නොකරමි. වඩා විවේකීව කෙරෙන පරියේෂණයකදී මෙන් ලියූ දේ විටින් විට සංශෝධනය කිරීම සඳහා කාලය ගත නො කෙළෙමි. මෙම ග්‍රන්ථය ඉක්මනින් ලිවූ නමුත්, එහි ඇති අදහස් එහෙන් මෙහෙන් එකතු කර ගත් අවිචාරමත් ඒවා නම් නොවේ. මෙහි ඇත්තේ අවුරුදු බොහෝ ගණනක් තිස්සේ මා සිතමින් සිටි කාරණා ය. පසුගිය දශක ගණනාවක් තුළ මා අතින් සිදු කෙරුණු පර්යේෂණවලින් එළඹුණු නිගමනවලට මෙහි ලියැවුණු දෑ අනුකූලය. සමාජවාදී ආර්ථිකය පිළිබඳ මා කළ අධ්‍යයන ද, ඒවා අතීත හා වර්තමාන ධනවාදී අර්ථ ක්‍රම සමඟ සන්සන්දනය කිරීමට ගත් ප්‍රයත්න ද විසින් මෙම කෘතියේ දැක්වුණු අදහස් පෝෂණය විණි. පසුගිය දශක කීපය තුළ දීත් විද්‍යාත්මක පර්යේෂණවල නිරතව සිටි, අනාගතයේ දීත් එසේ කිරීමට අපේක්ෂා කරන අයකුගෙන් බිහි වී ඇති 'ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනයක්' ලෙස මේ කෘතිය සැලකිය හැක.

මා අතීතයෙහි යෙදී සිටි හා අනාගතයෙහි දු යෙදී සිටීමට අපේක්ෂා කරන න්‍යායික අධ්‍යයනයන්හි දී හෙවත් හේතු - ඵල විස්තර සොයා බලන විශ්ලේෂණයන්හි දී, වෙනත් වචනවලින් කියතොත්, ප්‍රතිජානික විද්‍යාවෙහි දී, මා ඉදිරිපත් කරන ප්‍රස්තුතයන්හි ඇති **පුරෝකථන ශක්තිය** කවරක් දැයි හැම විටම ප්‍රශ්න කළ යුතුය. මෙතෙක් කල් මේ මේ දේ සිදු විණි නම් අනාගතයෙහි සිදු වෙතැයි කවරක් අපේක්ෂා කළ හැකි ද? මෙම ප්‍රශ්නය, පුරුද්දට මෙන්, මෙම කෘතිය අවසන් කිරීමේදී ද මම මගෙන් ම අසා ගනිමි: මෙම අධ්‍යයනය යෝජනා කරන සියල්ල සිදු වේද? මා මෙකී ප්‍රශ්න සාකච්ඡා කළ හැම දෙනෙක්මත් එම ප්‍රශ්නය නැගූ හ.

මම ඒ ගැන කිසිත් කීමට නො දනිමි. මේ පිළිබඳව මා පෙළන මායාවක් නැත: මෙම පොතේ ඉදිරිපත් කළ අදහස් ක්‍රියාවට නැගීමට යාමේදී, ඊට එරෙහි ව නැඟී සිටින බලසම්පන්න බලවේග ඇති බව මම දනිමි. එම යෝජනා ක්‍රියාවට යෙදීම සඳහා අවශ්‍ය වන සහාගය ගිල ගැනීමට සුදානම් ව සිටින අනතුරු මම දනිමි. මේ සියල්ල පැවතියදීත් මට හිතෙන්නේ යෝජිත ක්‍රියා මාර්ගය අනුගමනය කෙරෙන්නට යම් ඉඩ කඩක් ඇති බවය. අප විසින් එම අවස්ථාව පැහැර හරිනු නො ලැබෙතැයි අපේක්ෂා කිරීමට හා පැතීමට මම කැමැත්තෙමි.

ආශ්‍රිත කෘති

ALCHIAN, Armen A. and Demsetz, Harold. "The Property Rights Paradigm", *Journal of Economic History*, March 1973, Vol. 33, No. 17.

ANTAL, László. "Development - with Some Digression. The Hungarian Economic Mechanism in the Seventies", *Acta Oeconomica*, 1979, Vol. 23' No. 3-4, pp. 257-273.

ANTAL, László. *Gazdaságirányítási és pénzügyi rendszerünk a reform utján.* (The Hungarian system of econmic control and finance in the process of reform). Budapest : Közgazdasági és Jogi Könyvkiadó, 1950.

BARSONY, Jeno "Hol tart a tulajdonreform ügye?" (Whither the ownership Reform?), *Közgazdasági Szemle*, 1989, Vol. 36, No. 5, pp. 585-596.

BAUER, Tamás. "The Contradicrory Position of the Enterprise under the New Hungarian Economic Mechanism", Eastern European Economics, Fall 1976, Vol. 15, No.1, pp. 3-23.

BÉKESI, László. " Jövedelmi reform - elosztási igéretek nélkül" (Reform of Incomes - Without Promise of Distribution), conversation between Iván Wiesel and László Békesi. *Társadalmi Szmle*, 1989, Vol. 44, No. 7, pp. 16-23.

BELYO, Pál and dexler, Béla: *Nem szervezett (elsösorban illegális) keretek között végzett szolgáltatások.* (Services supplied within Non-Organized, Mainly Illegal Framework.) Manuscript. Budapest: Szolgáltatáskutatási Intézet, KSH, 1985.

BERGSON, Abram. "Market Socialism Revisited", *Journal of Political Economy*, 1967, Vol. 75, No. 5,pp. 655-673.

BRUS, Wlodzimierz. *The market in the Socialist Economy.* London: Routledge and Kegan Paul, (1961), 1972).

CONSULATATIVE Committee for Economic Management. " A szocialista piacgazdaság megtaremtése. Tézisek a gazdasági reformkoncepciót kidolgozó munkabizottságok számára" (Creation of the Socialist Market Economy. Theses for the Committees Working out the Concept of Economic Reform), *Figyelö*, December 8, 1988, pp. I and 17-20.

CSOOR, Klára and MOHACSI, Piroska. "Az infláció tényzöi, 1980-1984" (The Main Factors of Inflation, 1980 - 1984). *Gazdaság*, 1985, Vol. 19, No. 2, pp. 21-39.

DEMSETZ, Harold. "Toward a Theory of Property Rights", *American Economic Review*, May 1967, Vol. 57, No. 2, pp. 347, 359.

DOMAR, Evsey D. *The blind men and the elephant. An essay on Isms.* Mimeographed. Cambridge, MA: MIT, Working Paper, Department of Economics, No. 473, 1987.

ERDÖS, Tibor. "Atgondolt gazdaságpolitikát! A külsö és a belso egyensúly, a gazdasági növekedés és az infláció problémái" (A Well- Considered Economic Policy: The Problems of External and Internal Equilibrium, Economic Growth and Inflation). *Közgazdasági Szemle*, 1989, Vol. 36, No. 6, pp. 545-557.

FERGE, Zsuzsa. "Gazdasági és szociális érdekek és politikák (Economic and Social Interests and Policies), *Gazdaság*, 1988, Vol. 12, No. 1, pp. 47-64.

FERGE, Zsuzsa. "A negydik út" (The Fourth Way), *Valóság*, 1989, Vol. 32, No. 4, pp. 7-19.

FISHER, Irwing. *Contructive income taxation*. New York: Harper, 1942.

FURUBOTN, Erik G. and PEJOVICH, Svetozar (eds.) *The economics of property rights*. Cambridge, Mass: Ballinger, 1974.

GABOR, István R. "The Second (Secondary) Economy. Earning Activity and Regrouping of Income Outside the Socially Organized Production and Distribution", *Acta Oeconomica*, 1979, Vol. 22, No. 3-4, pp. 291-311.

GABOR, István R. "Lépéskényszerek és kényszerlépések. Jegyzetek két évtized kormányzati munkaerö - és bérpolitikájáról" (Being Forced to Take Steps and the Forced Steps. Notes on Governmental Labor and Wage Policy over Two Decades), *Közgazdasági Szemle*, 1988, Vol. 35, No. 7-8, pp. 803-807.

GABOR, István R. and Galasi, Péter. *A "második" gazdaság Tények és hipotézisek*. (The "second" economy. Facts and Hypotheses). Budapest: Közgazdasági és Jogi Könyvkiadó, 1981.

GABOR, István R. and KÖVARI, György: "A munkaeröpiac állami koordinációja és a bérszabályzás" (The State Coordination of the Labor Market and the Wage Regulation), *Gazdaság*, 1987, Vol. 21, No. 4 , pp. 48-58.

HAGGARD, Stephan and KAUFMAN, Robert R, "Economic Adjustment in New Democracies", in: J.M. Nelson (ed.), 1989, pp. 57-78.

HANKISS, Elemér. *Kelet- európai alternatívák*. (Eastern European Alternatives). Budapest; Közgazdasági és Jogi Könyvkiadó, 1989.

HAYEK, Friedrich A. (ed). *Collectivist Economic Planning*. London: Routledge and Kegan Paul, 1935.

HAYEK, Friedrich A. *The road to serfdom*. Chicago : University of Chocago Press, 1944.

JUHASZ, Pál: "Társadalmi csoportok együttmuködése az elso, második és harmadik ökonomiában" Cooperation of Social Groups in the First, Second and Third Economies), *Fogyasztói szolgáltatások*, 1981, No. 4.

KIDRIC, Boris. *Sabrana dela*. Begrad: Izdavacki Centar Komunist, 1985.

KIS, János. *Vannak-e emberi jogaink?* (Do we have Human Rights?). Budapest: Független kiadó, 1986.

KOLODKO, Grzegorz W. and McMahon, Walter W. "Stagflation and Shortageflation: A Comparative Approach", *Kyklos*, 1987, Vol. 40, No. 2, pp. 176-197.

KORNAI, János: *Overcentralization in Ecomonic Administration*. London: Oxford University Press, 1959.

KORNAI, János. "Memorandum on the Prices and Inflation", in: *Vision and Reality, Market and State: New Studies on the Socialist Economy and Society*. Hemel Hempsterd - Wheatsheaf and Budapest: Corvina, 1990, forthcoming.

LAKI, Mihály. *Alternatívák. és az alternatívok. Az uj politikai szervezetek gazdasági nézetei.* (Alternatives and the Alternatives. The Economic Ideas of the New Political Organizations). Közgazdasági információs Szolgálat, August 4, 1989, Manuscript.

LANGE, Oscar. "On the Economic Theory of Socialism", *Review of Economic Studies*, October 1936 and February 1937, Vol. 4, Nos 1 and 2, pp. 53-71 and 123-142.

LAVOIE. Don. *Rivalry and Central Planning. The Socialist Calcutation Debate Reconsidered.* Cambridge: Cambridge University Press, 1985.

LENGYEL, László. *Végkifejlet* (Dénoument). Budapest: Közgazdasági és Jogi Könyvkiadó, 1989.

LIBERMAN, Evsey G.: "The Plan, Profit and Bonuses", in: *Socialist Economics: Selected Readings*. Ed.: Nove, A. and Nuti, D.M. Middlesex: Penguin Books, (1962), (1972), pp. 309-318.

MISES, Ludwig Von. "Economic Calculation in the Socialist Commonwealth" (1920), in: Hayek, F.A. (ed.), 1935, pp. 87-130.

MUSGRAVE, Richard A. and MUSGRAVE, Peggy B. *Public Finance in Theory and Practice*. New York: McGraw Hill, 1980, (1973).

NELSON, Joan M. (ed.) *Fragile Coalitions: The Politics of Economic Adjustment*. New Brunswick and Oxford: Transaction Books, 1989.

NISKANEN, William A. *Bureaucracy and Representative Government*. Chicago: Aldine, 1971.

NOZICK, Robert. *Anarchy. State and Utopia*. New York: Basic Books, 1974.

PETSCHNIG, Mária Zita. "Inflációs feszültségek és megoldásaik" Inflationary Tensions and Their Soultions), *Gazdaság*, 1986, Vol. 20, No. 4, pp. 38-51.

PETÖ, Iván. "Polgárosodás, restauráció nélkül" (Embourgeoisement without Restoration), 2000, August 1989, pp. 5-8.

PÉTER, György. "A gazdaságosság jelentoségéröl és szerepéröl a népgazdaság tervszerü irányitásában" (on the Importance and Role of Economic Efficiency in the Planned Control of National Economy), *Közgazdasági Szemle*, 1954a, Vol. 1, No.3, pp. 300-324.

PÉTER, György: "Az egyszemélyi felelös vezetésröl" (On Management Based on One-Man Responsibility), *Társadalmi Szemle*, 1954b, Vol. 9, No. 8-9, pp. 109-124.

PÉTER, György: "A gazdaságosság és jövedelmezöség szerepe a tervgazdaságban I-II" (The Role of Economic Efficiency and Profitability in the Planned Economy I-II), *Közgazdasági Szemle*, 1956, Vol. 3, No. 6, pp. 659-711 and No. 7-8, pp. 851-869.

RAWLS, John. *A Theory of Justice*. Cambridge: Harvard University Press, 1971.

SACHS, Jeffrey D. and LIPTON, David. *Exchange Rate Convertibility*. Mimeographed. Cambridge: Harvard University, 1989a.

SACHS, Jeffrey D. and Lipton, David . *Money and Credit Policy to Achieve Low Inflation.* Mimeographed. Cambridge: Harvard University, 1989b.

SARKÖZY, Tamás. "Egy törvény Védelmében I-II" (In Defence of a Law I-II), *Figyelo,* August 24 and August 31, 1989, p.3.

SCHROEDER, Gertude E. "Property Rights Issues in Economic Reforms in Socialist Countries", *Studies in Comparative Communism,* Summer 1988, Vol. 21, No. 2, pp. 175-188.

SCITOVSKY, Tibor. *Welfare and Competition.* Homewood, Ill: Irwin, [1951], 1971.

SEN, Amartya. "Freedom of Choice. Concept and Content", *European Economic Review,* March 1988, Vol. 32, No. 2-3, pp. 269-294.

SOLT, Ottília. "Szegények pedig nincsenek" (Poor There Are No), in: *Isten éltessen Pista. Kemény István 60. születésnapjára.* (God Bless You, Pista. On the 60th Birthday of István Kemény). Eds.: G. Havas, J. Kenedi and Gy. Kozák, 1985. Budapest: Samizdat.

STIGLITZ, Joseph E. *Economics of the Public Sector.* New York and London: W.W.Norton and Company, 1986.

STOREY, David J. *The Small Firm. An International Survey.* London and Canberra: Croom Helm and New York: St. Martin's Press, 1983.

SUN, Yefang. "Some Theoretical Issues in Theoretical Issues", in: *Social Needs versus Economic Efficiency in China.* Ed.: Fung, K.K . Armonk: N.E Sharpe, 1982. Works originally published between 1958 and 1961.

SZCHENYI, István. *Hitel* (Credit). Budapest: Közgazdasági és Jogi Könyvkiadó, 1979.

SZELÉNYI, Iván. *Szocialista polgárosodás* (Socialist Embourgeoisement), October 1986, Manuscript.

SZELÉNYI, Iván. *Socialist Entrepreneurs: Embourgeoisement in Rural Hungary.* With the contribution of P. Manchin, P. Juhász, B. Magyar and B. Martin. Madison: University of Wisconsin Press, 1988.

TARDOS, Márton. "The Role of Money: Economic Relations Between the State and the Enterprises in Hungary," *Acta Oeconomica,* 1980, Vol. 25, No. 1-2, pp. 19-35.

TARDOS, Márton. "A gazdasági szervezetek és a tulajdon" (The Economic Organizations and the Question of Ownership), *Gazdaság,* 1988a, Vol. 22, No. 3, pp. 7-21.

TARDOS, Márton. "A tulajdon" (The Question of Ownership), *Közgazdasági Szemle,* 1988b, Vol. 35, No. 12, pp. 1405-1423.

TAYLOR, Fred M. "The Guidance of Production in a Socialist State", *American Economic Review,* 1929, Vol. 19, No. I, pp. 1-80.

TIMAR, János. *A társadalmi ujratermelés idöalapja* (The Total of Man-Hours Available for Social Reproduction). Manuscript, Budapest: Marx Károly Közgazdaságtudományi Egyetem, 1985.

VARHEGYI ÉVA. *Results and Failures of Monetary Restriction.* Mimeographed. Budapest: Pénzügykutató Rt, 1989.

VISSI, Ferenc."Infláció a gazdaság stabilizálásának idöszakában" (Inflation During the Stabilization of the Economy), *Gazdaság,* 1989, Vol. 23, No. 1, pp. 5-28.

ISBN 955-9102-04-4

Printed by Karunarathne & Sons Ltd.